ගෝවින්නේ ජී. ඩබ්ලිව්. නෝමිස් සිංඝෝ මහතා

திரு. ஜீ. டபிளியு. நோமிஸ் சிஞ்ஞோ, கோவின்ன

MR. G. W. NOMIS SINGHO, GOVINNA

5. **බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ—මංගල මුණසිංහ මයා.—බුලත්සිංහල—වෙනුවට)

(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு—திரு. மங்கள மூனசிங்க—புலத்சிங்கள—சார்பாக)

(Mr. Bernard Soysa—Colombo South—on behalf of Mr. Mangala Moonesinghe—Bulathsinhala)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කම්කරු විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කොට ඇති ගෝවින්නේ ජී. ඩබ්ලිව්. නෝමිස් සිංඝෝ මහතාගේ අංක 7/20485 දරණ පැමිණිල්ලට කොතෙක් කල්ගත වී ඇත්ද? (ආ) මෙතෙක් විසඳුමක් නොලබා ඇති ඒ ගැන එතුමාගේ සැලකිල්ල යොමුකොට ඉක්මණින් විසඳුම කට පත් කිරීමට කටයුතු යොදනවාද? (ඉ) එසේ නම්, කවදාද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) கோவின்னை திரு. ஜீ. டப்ளியு. நோமிஸ் சிஞ்ஞோ, 7/20485 இலக்கத்தின் கீழ் தொழில் நீதிமன்றத்துக்குச் சமர்ப்பித்துள்ள புகார் சம்பந்தமாக எவ்வளவு காலம் சென்றுள்ளது? (ஆ) இதுவரையும் ஒரு முடிவுக்கும் வராமலிருக்கும் அந்த விடயம் சம்பந்தமாக அவர் கவனத்தைச் செலுத்தி சீக்கிரம் ஒரு முடிவு கிடைக்க அவர் ஏற்பாடு செய்வாரா? (இ) ஆமெனில், எப்பொழுது?

asked the Minister of Labour and Employment: (*a*) What is the period of time that has elapsed since complaint No. 7/20485 of G. W. Nomis Singho of Govinna was submitted to the labour tribunal? (*b*) Will he take early action to dispose of this case which has been long delayed? (*c*) If so, when?

වාචික පිළිතුරු

එස්. ද. එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentry Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) අවුරුදු 5 කි. කම්. වි. සභාපතිවරුන් පත් කිරීමේ වලංගු භාවය පිළිබඳ ව ශ්‍රේෂ්ඨාධිකරණය හා රාජාධිකරණය විසින් දෙන ලද තීරණයන් මෙම ප්‍රමාදයට හේතු විය. (ආ) ඉතා ඉක්මණින් මෙම නඩුව විභාගකර අවසන් කිරීමට කටයුතු කරගෙන යයි. (ඉ) විභාග කිරීම 69.9.29 වැනි දිනට දින නියම කර ඇත.

කො/අල් ඉක්බාල් මහා විද්‍යාලය සහ කණිෂ්ඨ පාසැල සඳහා ඉඩම්

C/அல் இக்பால் மகா வித்தியாலயத்துக்கும் கனிட்ட பாடசாலைக்கும் காணி

LAND FOR C/AL IQBAL MAHA VIDYALAYA AND JUNIOR SCHOOL

6. **පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය—පී. ජී. බී. කෙනමන් මයා.—මෑද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)

(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர் சார்பாக)

(Mr. Percy Wickremasinghe—Kamburupitiya—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ මහා විද්‍යාලයට දැනට අවුරුදු 10 කට පමණ පෙර රජයට පවරා ගත් කොළඹ 2, රැම්සේ පාරේ ඉඩම ප්‍රයෝජනයට ගැනීමට ගත් තීරණය වෙනස් කරන ලද්දේද? එසේ නම් එකී තීරණය ගත්තේ කවදාද? කවර හේතුවක් නිසාද? (ආ) කො/අල් ඉක්බාල් මහා විද්‍යාලය සහ කණිෂ්ඨ පාසල සඳහා වෙනම ඉඩම් කට්ටියක් මිළදී ගැනීම සඳහා දැන් ක්‍රියා ආරම්භ කර තිබේද? (ඉ) එසේ නම් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක්ද? (ඊ) මිළදී ගැනීමට අදහස් කර ඇති ඉඩම් කට්ටිය පිහිටා තිබෙන්නේ කොහේද? එහි ප්‍රමාණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොපමණද? (උ) මෙම මිළදී ගැනීම අවසාන කිරීමට බලාපොරොත්තුවන්නේ කවදාද? (ඌ) කොළඹ 2, රැම්සේ පාරේ රජයට පවරා ගත් ඉඩමේ ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අදහස් කරන්නේ කවදාද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) பத்து வருடங்களுக்குமுன் கொழும்பு 2, ராம்சே வீதியில் பெறப்பட்ட காணியை கொழும்பு 2 சேர் ஜேம்ஸ் பீரிஸ் மாவத்தையிலுள்ள மகா வித்தியாலய விஸ்தரிப்பிற்குப் பாவிப்பதென்ற முடிவு மாற்றப் பட்டுள்ளதா? ஆமெனில் எப்பொழுது? ஏன்? (ஆ) C/அல் இக்பால் மகா வித்தியாலயத்திற் கெனவும் கனிட்ட பாடசாலைக்கெனவும் வேறோர் காணியை வாங்குவதற்கான நடவடிக்கைகள் எடுத்துக் கொள்ளப்பட்டுள்ளதா? (இ) ஆமெனில், ஆரம்பிக்கப்பட்ட நடவடிக்கைகள் என்ன? (ஈ) வாங்குவதாக உத்தேசிக்கப்பட்டுள்ள காணி எங்குள்ளது? அதன் விஸ்தீரணமென்ன? (உ) காணியை வாங்கும் நடவடிக்கை எப்பொழுது முடிவடையும்? (ஊ) கொழும்பு 2, ராம்சே வீதியில் பெறப்பட்ட காணியில் கட்டிட நடவடிக்கைகள் எப்பொழுது ஆரம்பிப்பதாக உத்தேசம்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Has the decision to use the land at Ramsay Road, Colombo 2, that was acquired about 10 years ago for extensions to the two maha vidyalayas at Sir James Peiris Mawatha, Colombo 2, been changed, and if so, when and why? (*b*) Has action now been initiated to purchase a separate block of land for the C/Al Iqbal Maha Vidyalaya and the junior school? (*c*) If so, what action has been initiated in this regard? (*d*) Where is the block of land contemplated for purchase situated and what is its extent? (*e*) When will the purchase be finalized? (*f*) When is it intended to start building operations on the land acquired at Ramsay Road, Colombo 2?

ගරු ඊරියගොල්ල

(கௌரவ ஈரியகொல்ல)

(The Hon. Iriyagolle)

(අ) කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ රජයට අයත් කර ගත් ඉඩමේ පාසල් ගොඩනැගිලි තැනීමට ගත් තීරණය වෙනස් කර නැත. (ආ) නැත. (ඉ) පැන නොනඟී. (ඊ) පැන නොනඟී. (උ) පැන නොනඟී. (ඌ) පාසල් වෙනුවෙන් ගොඩනැගිලි තනවනු ලබන්නේ ප්‍රමුඛතා ලේඛනයක් අනුවය. ප්‍රමුඛතා ලේඛනය අනුව මේ පාසැලේ වාරය පැමිණී වහාම එම ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කරනු ලැබේ.

ගම්බද උසාවි: උතුරු, නැගෙනහිර පළාත්වල ද්‍රවිඩ භාෂාව පාවිච්චිය

வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள ஊர் நீதி மன்றங்களில் தமிழ் உபயோகம்

USE OF TAMIL IN RURAL COURTS, NORTHERN AND EASTERN PROVINCES

7. එස්. එම්. රාසමානික්කම් මයා.

(පද්දිරිප්පු—කා. පො. ඉරත්තිනම් මයා. —කිලිනොච්චි—වෙනුවට)

(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு—திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி—சார்பாக)

(Mr. S. M. Rasamanickam—Paddiruppu—on behalf of Mr. K. P. Ratnam—Kilinochchi)

අධිකරණ ඇමතිගේ පාලිර්මේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුළු ලංකාවේම ඇති ගම්බද උසාවි අතුරින් (i) සිංහල භාෂාවෙන් පමණක් (ii) ද්‍රවිඩ භාෂාවෙන් පමණක් (iii) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් විභාග පවත්වා නීන්දු ප්‍රකාශ කරන ගම්බද උසාවිවල නම් එතුමා සඳහන් කරනවාද? (ආ) උතුරු සහ නැගෙණහිර පළාත්වල ගම්බද උසාවිවල කටයුතු ද්‍රවිඩ භාෂාවෙන් කිරීමට අවශ්‍ය පියවර එතුමා හැකි පමණ ඉක්මනින් ගන්නවාද? නො එසේ නම් ඒ මන්ද?

நீதி அமைச்சரின் பாராளுமன்றச் செயலாளரைக் கேட்ட வினா: (அ) இலங்கை முழுவதிலுமுள்ள ஊர் நீதிமன்றங்களில் விசாரணைகள், தீர்ப்புக் கூறல் முதலியவற்றை (i) சிங்களத்தில் மட்டும் நடத்துபவை யாவை? (ii) தமிழில் மட்டும் நடத்துபவை யாவை? (iii) ஆங்கிலத்தில் மட்டும் நடத்துபவை யாவை? (ஆ) வடக்கு, கிழக்கு மாகாணங்களில் உள்ள ஊர் நீதிமன்றங்கள் யாவற்றையும் தமிழில் அலுவல்களை நடத்தச் செய்தற்கு வேண்டிய நடவடிக்கைகளை விரைவில் எடுப்பாரா? அன்றேல், ஏன்?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

asked the Parliamentary Secretary to the Minister of Justice : (*a*) In respect of rural courts in the whole of Ceylon will he state the courts where inquiries are held and findings are delivered in (i) Sinhala only, (ii) Tamil only, (iii) English only ? (*b*) Will he take necessary action to see that rural courts in the Northern and Eastern Provinces function in Tamil ? If not, why ?

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice)

The Answer is a long one, and I am tabling it.

සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේය :

சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :

The Answer tabled is as follows :

(අ) (i) පහත සඳහන් ගම්බද උසාවිවල නඩු විභාග කිරීම් හා ඒවායේ තීන්දු ප්‍රකාශ කිරීම සිංහලෙන් කරණු ලබන අතර, නඩු වාර්තාවද සිංහලෙන් තබනු ලැබේ.

ගම්බද උසාවිය, මිනුවන්ගොඩ.

ගම්බද උසාවිය, ගංගොඩවිල, නුගේගොඩ.

ගම්බද උසාවිය, හෙනරත්ගොඩ, ගම්පහ.

ගම්බද උසාවිය, මතුගම.

ගම්බද උසාවිය, පිංවත්ත, පානදුර.

ගම්බද උසාවිය, වත්තේගම.

ගම්බද උසාවිය, දැල්පිටිය, අටබාගේ.

ගම්බද උසාවිය, නුගවෙල, වැරැල්ලගම.

ගම්බද උසාවිය, පල්දෙනිය, මහවෙල.

ගම්බද උසාවිය, මාතලේ.

ගම්බද උසාවිය, බිලැක්පූල්, නුවර එළිය.

ගම්බද උසාවිය, අම්බලන්ගොඩ.

ගම්බද උසාවිය, බද්දේගම.

ගම්බද උසාවිය, රත්න.

ගම්බද උසාවිය, බන්ඩත්තර, තිහගොඩ.

ගම්බද උසාවිය, මොරවක.

ගම්බද උසාවිය, පිලැස්ස.

ගම්බද උසාවිය, වාරියපොල වයඹ පළාත.

ගම්බද උසාවිය, දණ්ඩගමුව, කුලියාපිටිය.

ගම්බද උසාවිය, ගල්ගමුව.

ගම්බද උසාවිය, මාරවිල.

ගම්බද උසාවිය, මදුරන්කුලිය.

ගම්බද උසාවිය, මිහින්තලේ.

ගම්බද උසාවිය, කැකිරාව.

ගම්බද උසාවිය, කහටගස්දිගිලිය.

ගම්බද උසාවිය, බිබිල.

ගම්බද උසාවිය, බදුල්ල.

ගම්බද උසාවිය, වැලිමඩ.

ගම්බද උසාවිය, පල්ලෙවෙල, පල්ලෙබැද්ද.

ගම්බද උසාවිය, පැල්මඩුල්ල.

ගම්බද උසාවිය, කුරුවිට.

ගම්බද උසාවිය, මාවනැල්ල.

ගම්බද උසාවිය, රුවන්වැල්ල.

(ii) පහත සඳහන් ගම්බද උසාවිවල නඩු විභාග කිරීම් හා ඒවායේ තීන්දු ප්‍රකාශ කිරීම ද්‍රවිඩ භාෂාවෙන් කරනු ලබන අතර, නඩු වාර්තාව ඉංග්‍රීසියෙන් තබනු ලැබේ.

ගම්බද උසාවිය, චාවාකච්චේරි.

ගම්බද උසාවිය, වංකානේ.

ගම්බද උසාවිය, මන්නාරම.

ගම්බද උසාවිය පදිරිප්පු, කලුවන්විකුඩි.

ගම්බද උසාවිය, අක්කරෙසිපත්තු.

ගම්බද උසාවිය, මුලතිව්.

(iii) පහත සඳහන් ගම්බද උසාවියේ නඩු විභාග කිරීම් හා ඒවායේ තීන්දු ප්‍රකාශ කිරීම ඉංග්‍රීසියෙන් කරනු ලබන අතර, නඩු වාර්තාව ඉංග්‍රීසියෙන් තබනු ලැබේ.

ගම්බද උසාවිය, එරාවුර්, වෙන්කලඩි.

(iv) පහත සඳහන් ගම්බද උසාවිවල නඩු විභාග කිරීම් හා ඒවායේ තීන්දු ප්‍රකාශ කිරීම (පාර්ශ්වකරුවන් සිංහල හෝ දෙමළ වීම අනුව), සිංහලෙන් හෝ ද්‍රවිඩ භාෂාවෙන් කරනු ලබන අතර නඩු වාර්තාව ඉංග්‍රීසියෙන් තබනු ලැබේ.

ගම්බද උසාවිය, මල්ලාකම්.

ගම්බද උසාවිය, වවුනියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

ගම්බද උසාවිය, කල්මුනේ.

ගම්බද උසාවිය, නිලාවේලි.

(v) පහත සඳහන් ගම්බද උසාවියේ නඩු විභාග කිරීම් (පාර්ශ්වකරුවන් සිංහල හෝ දෙමළ වීම අනුව), සිංහලෙන් හෝ ද්‍රවිඩ භාෂාවෙන් කරනු ලබන අතර ඒවයේ තීරණයක් ප්‍රකාශ කිරීම හා නඩු වාර්තාව තැබීම ඉංග්‍රීසියෙන් කරනු ලැබේ.

ගම්බද උසාවිය, කොඩ්ඩියාර්පත්තු, මුත්තූර්.

(ආ) උතුර හා නැගෙනහිර පළාත්වල, ද්‍රවිඩ ජාතිකයින් බහුල වශයෙන් සිටින ප්‍රදේශවල පිහිටි ගම්බද උසාවිවල කටයුතු අවුරුදු බොහෝ ගණනක් තිස්සේම ද්‍රවිඩ භාෂාවෙන් කරගෙන යනු ලැබේ.

(*a*) (i) In the following rural courts inquiries are held and the findings are delivered in Sinhala and the record is also maintained in Sinhala :

Rural Court, Minuwangoda.
Rural Court, Gangodawila, Nugegoda.
Rural Court, Henaratgoda, Gampaha.
Rural Court, Matugama.
Rural Court, Pinwatta, Panadura.
Rural Court, Wattegama.
Rural Court, Delpitiya, Atabage.
Rural Court, Nugawela, Werellagama.
Rural Court, Poldeniya, Mahawela.
Rural Court, Matale.
Rural Court, Blackpool, Nuwara Eliya.
Rural Court, Ambalangoda.
Rural Court, Baddegama.
Rural Court, Ranna.
Rural Court, Bandattara, Thihagoda.
Rural Court, Morawaka.
Rural Court, Pilessa.
Rural Court, Wariyapola, N.W.P.
Rural Court, Dandagamuwa, Kuliyapitiya.
Rural Court, Galgamuwa.
Rural Court, Marawila.
Rural Court, Madurankuli.
Rural Court, Mihintale.
Rural Court, Kekirawa.
Rural Court, Kahatagasdigiliya.
Rural Court, Bibile.
Rural Court, Badulla.
Rural Court, Welimada.
Rural Court, Pallewela, Pallebadda.
Rural Court, Pelmadulla.
Rural Court, Kuruwita.
Rural Court, Mawanella.
Rural Court, Ruwanwella.

වාචික පිළිතුරු

(ii) In the following rural courts inquiries are held and the findings are delivered in Tamil but the Record is maintained in English :

Rural Court, Chavakachcheri.
Rural Court, Changanai.
Rural Court, Mannar.
Rural Court, Paddirippu, Kaluwanchikudi.
Rural Court, Akkaraipattu.
Rural Court, Mullaitivu.

(iii) In the following rural court inquiries are held and the findings are delivered in English and the record is maintained in English :

Rural Court, Eravur, Chenkaladi.

(iv) In the following rural courts inquiries are held and the findings are delivered in either Sinhala or Tamil (depending on whether the parties are Sinhala or Tamil) but the record is maintained in English :

Rural Court, Mallakam.
Rural Court, Vavuniya.
Rural Court, Kalmunai.
Rural Court, Nilaveli.

(v) In the following rural court inquiries are held in either Sinhala or Tamil (depending on whether the parties are Sinhala or Tamil) but the findings are delivered and the record is maintained in English :

Rural Court, Koddiyarpattu, Muthur.

(*b*) In the Northern and Eastern Provinces, rural courts in those areas in which the population is predominantly Tamil have been conducting their proceedings in Tamli for the past many years.

එංගලන්තයට යවන ලද විශ්‍රාම වැටුප්

இங்கிலாந்துக்குச் செலுத்தப்பட்ட இளைப்பாறுஞ் சம்பளம்

PENSIONS REMITTED TO ENGLAND

10. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව—එස්. ඩී. බණ්ඩාරනායක මයා.—ගම්පහ—වෙනුවට)

(திரு. பிறிஸ் குணசேக்கர—ஹபரதுவ—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ—சார்பாக)

(Mr. Prins Gunasekera—Habaraduwa—on behalf of Mr. S. D. Bandaranayake—Gampaha)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1948 සිට 1968 අවසානය දක්වා එංගලන්තයට යවනු ලැබූ විශ්‍රාම වැටුප් මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේම්ස් ගුණසේකර මයා.]

ප්‍රමාණයත්, ඒවා ලැබූ අයගේ ගණනත් එතුමා ප්‍රකාශ කරන්නේද? (ආ) මෙරට බ්‍රිතාන්‍යයට යටත්ව තිබියදී මෙහි සේවය කළ විශ්‍රාම වැටුප්ලාභීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ වගකීම රජය සතුද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 1948 ஆம் ஆண்டு தொட்டு 1968 ஆம் ஆண்டு இறுதி வரை எத்தனை பேர்களுக்கு எவ்வளவு பணம் இலேப்பாறுஞ் சம்பளமாக இங்கிலாந்திற்குச் செலுத்தப்பட்டுள்ள என்பதை அவர் இச் சபைக்குக் கூறுவாரா? (ஆ) பிரிட்டிஷ் ஆட்சியின் கீழ் இந்நாடு இருந்த காலத்திலே இங்கு சேவை செய்த இலேப்பாற்று சம்பளக்காரருக்கு பணஞ் செலுத்த இவ்வரசாங்கம் கடமைப்பட்டுள்ளதா?

asked the Minister of Finance: (a) Will he inform this House of the amount of money and the number of people to whom pensions have been remitted to England from 1948 up to the end of 1968? (b) Is it the responsibility of the Government to pay pensioners who were serving here during the time of the British occupation in this country?

විමලසේන මයා.
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

(a) To furnish the figures regarding the amount of money and the number of persons to whom pensions have been remitted to England from 1948 up to end of 1968 will need considerable time. (b) Section 64 of the Ceylon (Constitution) Order in Council, Chapter 379 of the Legislative Enactments of Ceylon, makes it obligatory on the part of the Government of Ceylon to pay pensions to those who served here during the time of the British occupation of this country.

විසර්ජන පනත් කෙටුම්පත, 1969-70

ஒதுக்கீட்டு மசோதா, 1969-70

APPROPRIATION BILL, 1969-70

කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.—[ප්‍රගතිය සැප්තැම්බර් 5]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப் பெற்றது—[தேர்ச்சி, 5, செப்ரெம்பர்].

[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்].

Considered further in Committee.—[Progress: 5th September]

[MR. SPEAKER *in the Chair.*]

80 වන ශීර්ෂය.—සෞඛ්‍ය අමාත්‍යවරයා

1 වන සම්මතය—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 24,61,720.

80 ஆம் தலைப்பு.—சுகாதார அமைச்சர்

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 24,61,720.

HEAD 80.—MINISTER OF HEALTH

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 2,461,720

ඉදිරිපත් කරන ලද සංශෝධනය—[සැප්තැම්බර් 5.]

"වැය සම්මතය රු. 10 කින් අඩු කළ යුතුය."—[වී. බී. ඉලංගරත්න මයා.]

[பிரேரிக்கப்பட்ட திருத்தம்—5 செப்ரெம்பர்]

"வாக்குப்பணத்தில் ரூபா 10 குறைக்கப்படுமாக"—[திரு. இலங்கரத்ன].

Amendment moved—[5th September] "That the Vote be reduced by Rs. 10."—[Mr. T. B. Ilangaratne.]

ප්‍රශ්නය යළින් සභාගිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

Question again proposed.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

I would like to remind hon. Members that we are behind time on this Vote. Let those Members who want to leave on urgent business kindly send in their names. Others

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

will have to take their turn. Please restrict your speeches to 15 to 20 minutes as agreed at the leaders' meeting.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

Mr. Chairman, before we adjourned yesterday I was urging on the Hon. Minister of Health the need to develop the rural health institutions because the attention given to urban areas is not being given to rural areas. There is a tendency for Government to emphasize the need to modernize the urban hospitals with modern facilities and equipment while the rural areas are neglected. No doubt, the provincial hospitals need modernization, but I must tell the Hon. Minister of Health that it is not enough merely to bring the urban hospitals up to modern standards and allow the rural medical institutions to remain in their backward state.

I have impressed on the Health Department the need to build more rural hospitals and provide visiting stations. If it is not possible to provide visiting stations, let there be more mobile dispensaries. I observe a certain slowness on the part of the department to proceed on these lines. For this I blame the Planning Secretariat. Its planning officers are people who, I believe, have no knowledge of the geography of this country. They have never visited backward rural areas and they do not know the backward conditions in which most of our people live. They are unable to assess the real needs of the villagers, and they do not know where medical institutions should be built. I appeal to the Hon. Minister of Health and the Hon. Prime Minister not to put restrictions in the way of building and equipping rural hospitals, central dispensaries, visiting stations. If it is not possible to set up visiting stations, establish mobile dispensaries.

In my constituency there is an urgent need for a rural hospital in the backward area of Mandur—the west coast of Mandur.

In 1935, when the late Mr. de Silva was the Minister of Health, he visited the place and decided to build a maternity home and a rural hospital there. Even tenders were called for the construction of this building, but it was subsequently cancelled. When the former Minister of Health, the Hon. M. D. H. Jayawardena, visited the place he appreciated the importance of building a hospital at Mandur. Subsequently the present Minister of Health too visited the place. I would urge on him to see that a rural hospital is constructed at Mandur during the next financial year without fail.

ප. භා. 10.15

A maternity home is necessary for the central dispensary at Mahiladitivu in the Kokkaddicholai area in my electorate; also a rural hospital and a maternity home for the colonized area of the left bank at Palaiadivadai in my electorate. These are absolutely necessary to provide my electorate with medical facilities.

In the absence of visiting stations, a modern dispensary must be established to serve the colonized area because it would be the best way of serving a number of villages at the same time.

A rural hospital has been opened at Kaluwanchikudy and it is now being looked after by an apothecary. I would request the Hon. Minister to send a medical officer there because that is the only hospital in the entire Paddiruppu electorate.

At the Palukamam dispensary the water pump went out of order about three years ago and it was sent for repairs. For the last three years neither has a new pump been installed nor has the pump that was

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

sent for repairs been returned, so that the apothecary's quarters and the dispensary are without water. During the drought there is no water available for the dispensary. I should ask the Hon. Minister to find out why such delays occur in the Medical Department.

I am very happy that the Hon. Minister is taking an immense interest in the improvement of the Batticaloa Provincial Hospital. The Surgical Block that was not completed by the contractor has now been completed and I believe it is due to be opened very soon. The Administration Block and other blocks too are coming up. I would urge upon the Hon. Minister to develop this provincial hospital into a modern specialized institution where cases requiring specialized attention can be treated while other cases in the outskirts can be attended to in the rural hospital. This is one way of reducing the congestion in the provincial hospital at Batticaloa which should be made available for specialized treatment for the entire province. I believe the hospital committee at Batticaloa has made representations to the Hon. Minister requesting more staff and more equipment, and I hope the Hon. Minister will pay the attention that is necessary to this institution.

Another matter connected with the Batticaloa Provincial Hospital is the provision of sewerage facilities. Such a large hospital with a large number of beds and wards is without sewerage facilities today, and up to now the hospital has been functioning with bucket latrines, which is most unsatisfactory according to modern standards. I believe money has been allocated for the provision of sewerage facilities and I would urge upon the Hon. Minister to see that work starts without further delay.

I was in Jaffna recently and I met a number of my friends there. They wanted me to urge on the Hon. Minister the necessity to install a Cobalt Unit in the Jaffna Hospital without delay. I think the public of Jaffna have been agitating for the installation of a Cobalt Unit there and when the Hon. Minister was last on circuit in the Northern Province the urgency of it was impressed on him by both the medical staff and the public and I hope he will see to it that no delay is caused in the establishment of this unit.

Finally, and before I conclude my comments on these Votes, I want to bring to the notice of the Hon. Minister a matter regarding W. H. O. scholarships for which applications were called recently.

Applications were invited from officers engaged in medical stores management work in the Department of Health for two W.H.O. fellowships in medical stores management. The duration of the fellowship is three months. The board that was appointed to go into the question of the selection of candidates interviewed about six candidates, and it has been brought to my notice that a very serious omission has been made in the non-selection of one of the most qualified candidates who had sent in his application. The candidate concerned is Mr. C. K. Thurairatnam, who is the present Assistant Superintendent, Civil Medical Stores. This gentleman is an assistant medical practitioner apothecary for the last eighteen years, a Licentiate of the Institute of British Surgical Technicians, a pharmacist of Ceylon, and has followed a course of training in Ceylon in Materials (Stores) Management conducted by the Management Development and Productivity Centre of the Industrial Development Board. Further, he has worked in the department from 1951 to 1958 as apothecary in charge of drugs and instruments, and he has been trained in the U. K. in the Administrative Care and Repair of Surgical Equipment (1958-1960). He was sent on a private scholarship awarded by a commercial firm dealing in surgical

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

instruments and he himself paid the passage money for this trip. Perhaps, that trip abroad on a previous occasion for this training is being considered a disqualification in regard to this scholarship.

I believe a man who has rendered such faithful, loyal and efficient service to the department and who is today the Assistant Superintendent, Civil Medical Stores, should be given a chance to qualify himself further in medical stores management. The candidates who have been selected are perhaps eligible, but there is a big gap between this gentleman and the candidates who have been selected.

I hope the Hon. Minister will look into this question carefully and see that no injustice is done to this man whose case merits consideration.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

There are four or five Members among those who have given their names as desiring to speak on these Votes who want to leave early on particular business. As a matter of fact, there are thirty-five Members who desire to speak. However, the amount of time left is only five hours, and the Hon. Minister must be given at least an hour to reply. We have to finish these Votes by 4.30 P.M. Therefore I request hon. Members to kindly co-operate with me, each Member taking about ten minutes, as otherwise it will be impossible for me to give a reasonable number of Members the opportunity to speak.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்தை)
(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අගලවත්තේ රෝහල් දෙකක් ගැන කරුණු කීපයක් ඉදිරිපත් කරන්නටයි මා මේ වේලාව ගන්නට අදහස් කරන්නෙ. පිඹුරේ ආරෝග්‍ය ශාලාව එකක්. ඒ ආරෝග්‍ය ශාලාව ගැන උප ඇමතිනිය දන්නවා. අනෙක ඉත්තෑපානේ ආරෝග්‍යශාලාවයි. පිඹුර ආරෝග්‍යශාලාව ගැන මට මතක් කරන්නට තිබෙන වැදගත්ම කරුණය මේකයි. වෙනදා මෙන් අද පිඹුරේ ආරෝග්‍යශාලාවේ ඩී. එම්. ඕ. කෙනෙකු නැහැ. දැනට එහි සිටින දොස්තර මහත්මයෙක් එම තනතුරේ වැඩ බලනවා. ඔට ඒ මහත්මයා මුණගැසී තිබෙනවා. ඔහු තරුණ කෙනෙක්. ඔහු හොඳ මහත්මයෙක් වුණාට එතැන දැන් තිබෙන තත්ත්වය කුමක් ද? ඒ දොස්තර මහත්මයාට තනියම සිය ලුම වැඩ කරන්නට සිද්ධ වී තිබෙනවා. ඒ දොස්තර මහත්මයාගේ බිරිඳත් දොස්තර කෙනෙක්. ඒ දෙදෙනාටම රෑ දවල් නොබලා වැඩ කරන්නට සිද්ධ වී තිබෙනවා. මේ තත්ත්වය තවදුරටත් පැවතුණොත් මේක අවසාන වන්නේ ඒ දෙදෙනාත් අසනීපවීමෙනුයි. එමනිසා කෙසේ හෝ අද හෙටම එතැනට සුදුසු දොස්තර මහත්මයකු ඩී. එම්. ඕ. වශයෙන් පත් කිරීම අත්‍යවශ්‍යයි. එය ඉෂ්ට කරනවා නම් ඒ දොස්තර මහත්මයාත් සතුටට පත් වන බව මා මතක් කරන්නට සතුටුයි. පිඹුරේ ආරෝග්‍යශාලාවේ අඩුපාඩුකම් ගැන උප ඇමතිනියගෙන් ඇසුවොත් එතුමිය ගරු ඇමතිතුමාට අලුතෙන් ඒවා ගැන දැනුම් දේවිය කියා මා විශ්වාස කරනවා. මේ අඩුපාඩුකම් ඉෂ්ට කිරීමට තිබෙන්නාවූ හදිසි භාවය ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරවීමටයි මා නැගි සිටියේ.

ඊළඟට, ඉත්තෑපානේ ආරෝග්‍යශාලාවේ ඊටත් වඩා නරක තත්ත්වයක් තිබෙනවා. මොන කාරණයක් නිසාද කියා මා දන්නේ නැහැ. දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ආරෝග්‍යශාලාවේ භාරකරුවන් වශයෙන් පත්ව එන්නේ අඵත සමර්ථ වූ යන්තම් තමන්ගේ අර ආරෝග්‍යශාලා පුහුණුව අවසාන කළ උදවියයි. මෑත කාලය බැලුවොත් ඒ එක් කෙනෙකුවත් අවුරුද්දකට වඩා ඉඳලත් නැහැ. මේ තත්ත්වය නිසා වැඩි වශයෙන්ම බර වැටී තිබෙන්නේ එතැන දෙවැනි මහත්මයාගේ කරපිටයි. ඉත්තෑපානේ ආරෝග්‍යශාලාවේ බෙහෙත් ටික තබා ගන්නටවත් හරි තැනක් නැහැ. ඒ කුඩා කාමර මා දුටුවා. ඒක අවුරුදු හැටක් පමණ පරණ ගොඩ නැගිල්ලක. එතැන හරි කාර්යාලයකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

නැහැ. ඇත්තම කියනවා නම් එතැන පාල නය කරන පාලකයින්ටවත් නිසි තැනක් නැහැ. ඔවුන්ට ඉන්නට නිසි ගොඩනැගිල්ලක්වත් නැහැ.

ඒ සියල්ලටම වඩා මට තේරුම් ගන්නට බැරි එතැන ජල පහසුකම් පිළිබඳ ප්‍රශ්නයයි. මා දන්නා හැටියට අවුරුදු එක හමාරක් මුළුල්ලේ ඔය ඉල්ලීම කරනවා. ඉත්තෑපාන රෝහලට ජලය සැපයීමේ කට යුත්ත සම්බන්ධයෙන් කලුතර කාර්යාලයේ අඟල් ගණනක් උස ලිපි ගොනුවක් ඇති. මේ තත්ත්වය ගැන එක පැතැනකින් මා ඇසුවාම, එතැන පයිප්ප ශුද්ධ කිරීමේ අර්ථයක් නැහැ. ටැන්කියත් නරක් වී තිබෙනවා, එමනිසා අළුතෙන්ම මැෂින් එකක් දමන්නට සියළුම කටයුතු ලැස්ති කර තිබෙනවාය කියා ඉංජිනේරු මහත්මයා කියනවා. ටැන්කිය සාදන්නට තිබෙනවාය කියා පයිප්ප ශුද්ධ කරන්නේ නැහැ. පයිප්ප නරක්වී තිබෙනවාය කියා ටැන්කිය සාදන්නේ නැහැ. අවසානයේදී පයිප්පයයි ටැන්කියයි දෙකම සෑදී නැහැ. ආරෝග්‍යශාලාවට ජලය නැහැ. එතැන විදුලියෙන් වැඩ කරන්නාවූ පොම්පයකුත් තිබෙනවා. නමුත් ඒකත් වැඩ කරන්නේ නැහැ. ඒ මදිවාට රෑ දොළහෙන් පසු විදුලි ආලෝකය නැහැ. රෑ දොළහෙන් පසු මැෂින් එක ක්‍රියා කෙරෙව්වොත් ඒක කඩා වැටෙවිය කියා භයක් තිබෙනවා. එපමණක් නොවෙයි. තවත් සේවකයන් කීප දෙනෙකුට අමුතුවෙන් ගෙවන්නටත් සිදුධ වෙනවා. තිබෙන මුදල මදි ඒක කරන්නට. රාත්‍රී දොළහට පසු ලයිට් නැහැ. ඊටපසු භූමි තෙල් ලාම්පු පත්තු කරන්නට ඕනෑ. සමා වෙන්න කියනවාට දැන් ඒ මුළු ප්‍රදේශයටම මේ ආරෝග්‍යශාලාව තිත්ත වී තිබෙනවා. මේ තත්ත්වය සම්බන්ධයෙන් මා එතැන සිටින්නාවූ දොස්තර මහත්වරුන්ට බණින්නට ලැස්ති නැහැ. මේ ස්ථානයේ සිටි තත්ත්වයේ සිටි හැටියට ඒ අයට කරන්නට දෙයක් නැහැ. කිසිම අනුමානයක් නැතිව ඔය ආරෝග්‍යශාලා දෙකටම අළුත් ගොඩනැගිලි අවශ්‍යයි. පිඹුරට වඩා ඉත්තෑපානට අළුත් ගොඩනැගිලි විශේෂයෙන්ම අවශ්‍යයි. ඒ ප්‍රදේශය ඉතා විශාල එකක්. ලෙඩුන් විශාල සංඛ්‍යාවක් එනවා. එතැන ඉඩ නැහැ. ගොඩනැගිලි හැදීමට නම් ඉත්තෑපානේ ඉඩ තියෙනවා. පිඹුරෙත් ඉඩ තියෙන නමුත් ඉත්තෑපානේ තරම් ඉඩ නැහැ. ඒ අයගේ විශේෂ ඉල්ලීම් මෙවැනි ස්ථානයක කාලය ගෙන විස්තර කරන්නට මා අදහස් කරන්නේ නැහැ. අවශ්‍ය නම් පසුව ඒ ගැන සන්දේශයක් එවන්නම්. දොස්තර මහත්වරුන්ගේ ප්‍රශ්නයත්, ඉත්තෑපානේ වතුර ප්‍රශ්නයත් ඉක්මනින්ම විසඳන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලනවා. ඒක සතියකින් කර දෙන්නට පුළුවන්.

පූ. භා. 10.30

අගලවත්තේ ආරෝග්‍යශාලාවල පමණක් නොවෙයි, කළුතර නාගොඩ ආරෝග්‍යශාලාවේත් බෙහෙත් හිඟ වීම නිතර නිතර සිදු වීම ගැන බොහොම කණගාටුවෙන් ප්‍රකාශ කරනවා. ලෙඩේ ටිකක් අමාරු නම් අගලවත්තෙන් හුඟක් දෙනෙක් නාගොඩටත් යනවා. ඒ නිසයි, නාගොඩ ගැනත් සඳහන් කළේ. ඇමති අංශයට අයවැය ලෙඛනයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබුනත්, වියදම් කරන්නට වුවමනා වන විට ඒ මුදල් ඒ තරමටම ලැබෙන්නෙ නැත කියා මගේ විශ්වාසයක් තියෙනවා. ඒක ඒ පිළිවෙළට සිදු වෙනවාය කියා අපට කිව්වොත් ඒ ගැනත් කරන්නට පුළුවන් දෙයක් කරන්න අප සූදානම්. මෙවැනි ගම්බද පළාත්වලට වුවමනා කරන මූලික බෙහෙත් වර්ග නොලැබෙනවා නම් ඒ ජනතාව ඉතා අමාරු තත්ත්වයකට පත් වෙනවා. නාගොඩ. මීගහතැන්න, ඉත්තෑපාන. පිඹුරෙ යන ආරෝග්‍යශාලා සෑම එකකට ඉන්සියුලින් නැතුව ගිය කාලයක් තිබුණු බව මා පෞද්ගලිකව දන්නවා. එක මවක්, උපදුණු කාලයේ සිට දියවැඩියාව තිබුණු ළමයකු මා ළඟට ගෙනැවිත් ඒ ළමයාට ඉන්සියුලින් ටිකක් ලබා දෙන්නය කී අවස්ථාවේදී ඒ ගැන මට දැනගන්නට පුළුවන් වුණා. මෙතැනට ඇවිත් මෙවැනි අඩුපාඩු තියෙනවාය කීමේ තේරුමක් නැහැ. මගේ ඉල්ලීම වෙනින් එකක්. මේ ආරෝග්‍යශාලා තුන හතර හදියාකාර ගෙන යන්නට—විශේෂයෙන් ඉත්තෑපානේ සහ පිඹුරේ ආරෝග්‍යශාලා හදියාකාර ගෙන යන්නට—වුවමනා කරන්නා වූ මූලික ද්‍රව්‍ය සහ නිලධාරීන් කරුණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර සපයන්න. ඒ කටයුත්ත ඉටු කළොත් මේ ඇමති අංශයෙනුත් ආණ්ඩුවෙනුත් ඒ මුළු පළාතටම සේවයක් සිදු වුණු බව ඒ ජනතාව පිළිගන්නවා ඇති. පහරක් ගැසීමක් වශයෙන් නොව ඉල්ලීමක් ඉදිරි පත් කිරීමක් වශයෙනුයි, මා මේ කරුණු සඳහන් කළේ.

ආර්. එස්. පෙරේරා මයා. (කැලණිය)
(திரு. ஆர். எஸ். பெரேரா—களனி)
(Mr. R. S. Perera—Kelaniya)

ගරු සභාපතිතුමනි, දීර්ඝ කාලයක සිට භාණ්ඩාගාර නීතිරීති අනුව ප්‍රතිසංවිධානය කරගෙන එන, ජනාරක්ෂක ප්‍රතිෂ්ඨාධාර සමිතිය නමින් සමිතියක්—ත්‍රිflප්ටි සොසයිටි එකක්—ලාදුරු ආරෝග්‍යශාලාවේ තියෙනවා. එතැන වැඩ කරන සේවකයන්ගේ වැටුපෙන් එක්තරා ගණනක් මාස්පතා පඩි ලැයිස්තුවෙන්ම කපාගෙන එකතු කරනවා. ඒ එකතු වන මුදල්වලින්, ඒ ඒ අවස්ථාවල තැන්පත් මුදල් වශයෙන් තියෙන ගණනට වඩා අඩු ගණනක්, යම්කිසි සේවකයකුට ණය වශයෙන් ගන්නටත් පුළුවන්කම තියෙනවා. ණය කොටස් වශයෙන් මාස්පතා ගෙවිය යුතු අතර, ඉතිරි කරන ප්‍රමාණයත් සමග මුළු ගණන මාස්පතා පඩි ලැයිස්තුවෙන් කපා ගන්නවා. යම්කිසි සේවකයකු විශ්‍රාම ගිය විට, එසේ විශ්‍රාම ගොස් මාසයක් ඇතුළත, ඔහුගේ ණය ප්‍රමාණය අඩු කරගෙන ඉතිරි මුදල ඔහුට ගෙවන්නට ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ මේ විධියට නීත්‍යානුකූලව මුදල් ගෙවාගෙන ආවා. එහෙත් මෑත කාලයේ සිට විශ්‍රාම ගිය අයට ඒ මුදල් ලැබෙන්නේ නැහැ. මා මේ කාරණය ගැන විශේෂයෙන් සඳහන් කරන්නේ ජේ. එම්. සොමිසුන්දර නමැති නිලධාරි මහතාමයාගේ පැමිණිල්ලක් නිසයි. අවුරුදු ගණනාවක් තිස්සේ මුදල් ඉතිරි කර තිබෙන ඔහු රුපියල් 500ක පොඩි ණයකුත් අරගෙන තියෙනවා. ඔහු ඉතිරි කර තිබෙන මුදල රු. 1,840.10 යි. පන්සිය ගණන අඩු කළාම රු. 1,315.10ක් ඔහුට ලැබෙන්නට ඕනෑ. පසුගිය නොවැම්බර් මාසයේදී ඔහු විශ්‍රාම ගියා. මාසයක් තුළදී ලැබියයුතු මුදල් තවම ලැබී නැහැ. මෙම දුප්පත් නිලධාරියා අද මුළු පවුලම රැක ගන්නේ තමන්ට ලැබෙන රුපියල් 93.62 ක විශ්‍රාම වැටුපෙනුයි. පසුගිය කාලසීමාව තුළදී කිසිම මුදලක් නැහැ. ඒ මහතාට ලබා ගන්නට මෙම මුදල් ලබා ගැනීම පිණිස ලියන්නට තිබෙන හැම තැනටම ලියා තිබෙනවා. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාට ලිව්වා. ගරු ඇමතිතුමාට ලිව්වා අනිකුත් නිලධාරීන්ට ලිව්වා. එහෙත් කිසිම සහනයක් ලැබුණේ නැහැ. අවසානයේදී මේ ගැන ක්‍රියා කිරීම පිණිස නීතිවේදියකුට බාර දුන්නා. එනම් වර්තන් තිලකරත්න පෙරකදෝරු මහතාටයි. ඊට අදාළ නිලධාරීන් වෙත ඔහු විසින් කරුණු දැක්වූවායින් පසු ලැබුණු උත්තරයත් සතුටුදායක එකක් නොවෙයි.

දැනට මෙම සමිතියේ රුපියල් 9,000ක් විතර සල්ලි තිබෙනවා. මේ අන්දමට සල්ලි ඉල්ලා සිටින අයගේ සංඛ්‍යාව සිව් දෙනෙකුට වැඩිවන්නේ නැහැ. ඒ උදවියට ගෙවන්නට රුපියල් හාර පන් දහසක් පමණ යාවි. ඇයි අතින් ඒ උදවියට මෙම මුදල් නොගෙවන්නේ? ඒ ගැන විමසා යැවූ විට ලාදුරු මර්ධන ව්‍යාපාරයේ ප්‍රධාන තැන දන්වා එවා තිබෙනවා "මේ සමිතිය නැවත වරක් කඩාකප්පල් වී තිබෙනවාය; එය ප්‍රතිසංවිධානය කළ යුතුය." යනුවෙන්. පැන්ෂන් ගිය නිලධාරීන් එතන තිබෙන සමිතියක් ප්‍රතිසංවිධානය කරන්නේ කෙසේද? මෙම සිද්ධියට දැන් මාස 10 ක් 11ක් පමණ ගත වී තිබෙනවා. රුපියල් 500, 600, 700 යනාදී වශයෙන් ගන්නට සිටින මෙවැනි තව කීප දෙනෙක්ද එතන සිටින බව පෙනෙනවා. ඔවුන්ට ලැබෙන්නට තිබෙන මුදල් නොපමාව ලැබෙන්නට සලස්වන ලෙස මා ඉල්ලා සිටිනවා. එතන යම්කිසි ප්‍රතිසංවිධානයක් කරනවා නම් එය කළ යුත්තේ දැනට සේවයේ යෙදී සිටින අය විසිනුයි. නිලධාරීන් විසින් එහි මුදල් හරියාකාර පරිහරණය කර නොමැති නම් හෝ වෙනත් අයථා ක්‍රියා එතන තිබෙනවා නම් ඒවා ගැන දැනට සේවයේ යෙදී සිටින අය ක්‍රියා කළයුතුයි. පෙන්ෂන් ගිය උදවියට ඒවා කරන්නට බැහැ. දැන් එතන රුපියල් 9,000ක් පමණ තිබෙනවා. කරුණා කර එම මුදලෙන් අර උදවියගේ මුදල් ගෙවන්නට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. දැන් 10 මාසයක් 11 මාසයක් පමණ ගතවී ඇතත් ඒ දුප්පත් නිලධාරියාගේ ඉල්ලීම ගැන ක්‍රියා කිරීමක් නැහැ. ඒ මහතාට ලබා ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ඇස්. පෙරේරා මයා.]

තිබෙන හැඳල ලාදුරු ආරෝග්‍ය ශාලාවේ ධනාරක්ෂක සමිතියේ තැන්පත් මුදල කරුණා කර හැකි පමණ ඉක්මණින් ලබා දෙන ලෙස මා තමුන්නාන්සේට නැවත වරක් මතක් කර සිටිනවා. නිතිපතා පඩි ලැයිස්තුවෙන් කපාගෙන තිබෙන මෙම මුදල් පිළිබඳ ලිය කියවිලි එම නිලධාරීන් ළඟ තිබෙන නිසා මෙහි කිසිම රහසක් නැහැ.

මට තවත් කාරණයක් එම ආරෝග්‍ය ශාලාව ගැනම ඉදිරිපත් කරන්නට තිබෙනවා. කන්‍යා සහෝදරියන් සිටි කාලයේ පටන්ම අපේ රටේ අනිකුත් ආරෝග්‍ය ශාලාවල අනුගමනය කළ එක්තරා වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ ඒ වාට්ටු භාරව වැඩ කරන එක්තරා හෙදියන් පිරිසක් එම වාට්ටුවල සිටින ලෙඩුන්ගේ රෙදි පිළි සහ ඔවුන් පරිහරණය කරන වෙනත් දේ භාරව කටයුතු කරනවා. ඒ හෙදියන්ට එම සේවය උදෙසා යම්කිසි ගාස්තුවක් ගෙවී මේ වැඩ පිළිවෙලක් තිබෙනවා. පසුගිය කාලයේ ඒ අයට ගෙවිවේ රුපියල් 50 යි. කොතරම් මුදලක් දැන් ඒ අයට ගෙවන වාද කියනන්ට මා දන්නේ නැහැ. අංගොඩ මානසික රෝහලේත් ඒ ගෙවීම කරනවා. මහාරෝග්‍යශාලාවේත් ඒ ගෙවීම කරනවා. එහෙත් මේ කියන ආරෝග්‍ය ශාලාවේ ගෙවන්නේ නැහැ. එම වාට්ටුවල තිබෙන ඇතැම් රෙදි පිළි ලෙඩුන් විසින් ඉරා දමනවා; නාස්ති කර දමනවා. මෙම රෝහලේ මානසික ලෙඩුන් තුන් හතර දෙනෙක්ද සිටින නිසා ඔවුන්ද එම දේවල් නාස්ති කරනවා. ඇතැම් උදවිය මෙම රෙදිපිළි ඇදගෙන ගෙදර යනවා. එවැනි කරුණු නිසා සිදුවන නාස්තිවලට වග කියන්නට සිදු වන්නේ එම හෙදියන්ටයි. අවුරුද්ද අවසානයේදී ඒවා ගණන් බලන්නට පැමිණෙන පරීක්ෂකයන් ඉරුණු රෙදි ගණන් ගන්නේ නැහැ; නාස්ති වී ගිය රෙදි ගණන් ගන්නේ නැහැ. මෙම ආරෝග්‍ය ශාලාවේ උදවියට, අනිකුත් තැන්වල අයට මාස්පතා ලැබෙන ගාස්තුව පවා ලැබෙන්නේ නැතුවාට මොකද එවැනි සිද්ධීන්ට මුහුණ දෙන්නට සිදුවීම නිසා අවසානයේදී තම පඩියෙන් රුපියල් දෙතුන් සියය ගෙවන්නට සිදු වෙනවා. එම නිසා ඔවුන්ටත් එම ගෙවීම ලැබෙන්නට සලස්වන හැටියට මා ඉල්ලා සිටිනවා. ඒ උදවියට මාස්පතා ලැබෙන යම්කිසි මුදලක් තිබෙනවා නම් එවැනි අවස්ථාවලදී තම වේතනයෙන් පාඩු නොවිඳ කටයුතු කරන්නට හැකි වෙනවා. මේ ආරෝග්‍ය ශාලාවේ උදවියට පමණක් ඒ ගෙවීම නොලැබෙන්නේ මන්ද යන කාරණය ගැන සොයා බලන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අපේ පළාතේ විශාලතම ජනාකීර්ණ ප්‍රදේශයක් හැටියට කිරිබත්ගොඩ ප්‍රදේශය හඳුන්නා දෙන්නට පුළුවනි. එම ප්‍රදේශයේ පර්යන්ත ආරෝග්‍යශාලාවක්—peripheral unit—තිබෙනවා. එහි සාමාන්‍ය ලෙඩුන් සඳහා වාට්ටුවක්ද මව්වරුන් සඳහා සකස්වුණු ඇඳන් හත අටකින් යුක්ත වාට්ටුවක්ද තිබෙනවා. එම ප්‍රදේශය විශාල තදබදයක් තිබෙන ප්‍රදේශයක් බව අප කල්පනා කළ යුතුයි. මා නිතරම කරන එක්තරා ඉල්ලීමක් මෙම අවස්ථාවෙහිදීද මතක් කරන්නට කැමතියි. මගේ මුළු කොට්ඨාශය තුළම කුඩා දරුවන් සඳහා වෙන්වුණු ආරෝග්‍ය ශාලාවක් නැහැ. එම නිසා කුඩා ළමා වාට්ටුවක්—ළමුන් 8කට 10කට සරිලන සේ සකස් වුණු එකක් වුවත් ඇති—සකස් කර දුන් නොත් හොඳයි. රිජ්වේ ආර්යා ළමා රෝහලට එම පළාත්වලින් එන ළමුන්ගේ සංඛ්‍යාවත් අඩු කර ගන්නට එය මඟක් වෙනවා ඇති. මා ඉදිරිපත් කළ මෙම කරුණු තුන පිළිබඳව—විශේෂයෙන් මුලින් කී කරුණ ගැන සළකා බැලිය යුතුයි.—ඉතා ඕනෑකමින් ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ගරු සභාපතිතුමනි, කඹුරුපිටිය ආසනයේ තිබෙන අඩුපාඩුකම් ස්වල්පයක් ගැන සෞඛ්‍ය ඇමතිතුමා ඉදිරියෙහි කරුණු කියන්නට මා බලාපොරොත්තු වෙනවා. එතුමා විසින්ම විවෘත කරන්නට යෙදුණු මගේ කොට්ඨාශයේ පිහිටි කිරින්ද මාතෘ නිවාසය පිළිබඳව ප්‍රථමයෙන්ම සිහිපත් කළ යුතුයි. එහි වැඩ කරන සේවකයන්ට නිවාස පහසුව ඇත්තේ නැහැ. එහි වැඩ කරන සේවකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සියලු දෙනාටම ඒ මාතෘ නිවාසයේම නවතිනන්ටයි, සිදු වී තිබෙන්නේ. ඒ නිසා ඒ මාතෘ නිවාසයේ සේවය කරන වින්නඹු මාතාවන්ටත්, අනෙක් සේවක යන්ටත් අඩු වශයෙන් නිවාස දෙකක් වත් මේ වර්ෂයේදී තනා දෙන්නැයි මා ඉල්ලා සිටිනවා.

කඹුරුපිටිය ආරෝග්‍යශාලාවට අවුරුදු ගණනාවකින්ම අලුතෙන් ගොඩනැගිලි ලැබී නැහැ. මුළු ප්‍රදේශයටම තිබෙන්නේ මේ ආරෝග්‍යශාලාව පමණයි. පළාත් වාසීන් අවුරුදු ගණනක් තිස්සේම මේ ආරෝග්‍යශාලාව සඳහා තවත් වාට්ටුවක් ඉල්ලා තිබෙනවා. එහෙත් තවම ඒ ඉල්ලීම ඉෂ්ට වී නැහැ. මාතර දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවත් මේ කාරණය අනුමත කර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දන්වා එවා ඇති. කරුණාකර ඉක්මනටම කඹුරුපිටිය ආරෝග්‍යශාලාව සඳහා තවත් වාට්ටුවක් ලබා දෙන්න.

ගම්කාර්ය සභාවලින් පාලනය වන මාතෘ දාරකාභිවෘද්ධි මධ්‍යස්ථානයකට රුපියල් 1,000 ආධාර මුදලක් ලැබෙනවා. කිරි පිටි හා බෙහෙත් ආදිය බෙදා හැරීම සඳහා මේ මුදල කිසිසේත් ප්‍රමාණවත් නැහැ. මව්වරුන් සහ කුඩා දරුවන් මේ මධ්‍යස්ථානවලට එනවා. ඒ අයට වුවමනා කරන විටැමින් පෙති වර්ග සහ කිරි පිටි දීමට මේ ලැබෙන ආධාර මුදල ප්‍රමාණවත් නොවන නිසා එය වැඩි කළ යුතුව තිබෙනවා. මේ ලැබෙන ආධාර මුදලින් ඒ මධ්‍යස්ථාන නියම විධියට මාස දෙකකට වඩා පවත්වාගෙන යන්නට අමාරුයි. ඒ මධ්‍යස්ථාන සඳහා වැඩිපුර මුදලක් වැය කරන්නට ගම්කාර්ය සභාවලටද පුළුවන් කමක් නැහැ. ඒ නිසා ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

වින්නඹු මාතාවන්ගේ සේවා කොට්ඨාශ අලුතෙන් බෙදා වෙන් කිරීමේ කාලය පැමිණ තිබෙනවා. දුෂ්කර ප්‍රදේශවල අති විශාල කොට්ඨාශයක සේවය වින්නඹු මාතාවකට භාර දීමෙන් නියම යුතුකම් කොටස ඉටු කරන්නට ඇයට බැරි වෙනවා. ඇළ දොළවල් පසුකරගෙන, කඳු හෙල් උඩින් ගමන් කරමින් සිය සේවාවන් ඉටු කිරීමටයි, ඒ වින්නඹු මාතාවන්ට සිදු වී තිබෙන්නේ. භාර්යාවට දරු ප්‍රසූතියක ලකුණු පහළ වන විට ස්වාමිපුරුෂයා වින්නඹු මාතාව පදිංචි ස්ථානයට පැමිණ ඇයත් සමඟ ආපසු ඔහුගේ ගෙදරට යන විට කෙරෙන්නට වුවමනා වැඩ කෙරී හමාරයි. ඒ නිසා අලුත් සැලැස්මක් අනුව වින්නඹු මාතා කොට්ඨාශ ඇති කර ඒ වින්නඹු මාතාවන්ගේ සේවය නියම අන්දමින් ලබා දීමට වැඩ පිළිවෙළක් යොදන මෙන් ඉල්ලා සිටිනවා.

මෑතදී අපවත් වී වදාළ කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ ඒ අපවත් වීම ගැන කල්පනා කරන විට මට පෙනී යන්නේ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කටයුතු කිරීම සඳහා කාන්තා වන් පත් කිරීමේ වරදයි. ස්වාමීන් වහන්සේ නමකට බෙහෙතක් විදීමට කාන්තාවකට බල කළ විට ඒ කාන්තාව ඒ ස්වාමීන් වහන්සේගේ නහර අල්ලා "ස්පයිනල් ඉන්ජෙක්ෂන්" එක දෙන්නේ කොහොමද? ඒ නිසා ආරෝග්‍යශාලාවල ප්‍රතිකාර ලබා ගන්නා භික්ෂූන් වහන්සේලාගේ කටයුතු කිරීම සඳහා පිරිමින් යොදවන ලෙස මා ඉල්ලා සිටිනවා.

පෞද්ගලික බෙහෙත් ශාලා දමාගෙන සිටින වෛද්‍යවරුන් ගැනත් වචනයක් කියන්නට ඕනෑ. අද ඒ සමහර වෛද්‍යවරුන් ඩිස්ප්‍රින් පෙති දෙකක් විතර කුඩු කර ඊට පසු ඒ කුඩු පැකට් වශයෙන් සකස් කර පැය හයෙන් හයට නැත්නම් පැය තුනෙන් තුනට ලෙඩාට දෙන ලෙස නියම කරනවා. ශත පහළොවකට, විස්සකට ගන්නට පුළුවන් ඩිස්ප්‍රින් පෙති වෙනුවෙන් අර වෛද්‍යවරයා රුපියල් පහක් විතර අය කරනවා. ඇත්තෙන්ම පෞද්ගලික බෙහෙත් ශාලා පවත්වාගෙන යන සමහර වෛද්‍යවරුන් අද මේ විධියේ ගසා කෑමක යෙදී සිටිනවා. ගසාකන ඇතැම් නිතිඥයින් සිටිනවා වගේ පෞද්ගලික බෙහෙත් ශාලා දමාගෙන ගසාකෑමක් කර ගෙන යන සමහර පෞද්ගලික වෛද්‍යවරුනුත් සිටිනවා. ඒ අය මොන විධියටද මුදල් හම්බ කරන්නේ කියා තමුන්නාන්සේටත් පෙනෙනවා ඇති. ඒ තත්ත්වය නවත්වන්නට ඕනෑ.

මේ රටට බෙහෙත් ගෙන්වීම රජය මගින් කරන්නට ඕනෑ. සතොස වැනි ආයතන මගින් බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

යම්කිසි නියම මිලකට දෙනවා නම් ඒවා නම තමන්ට වුවමනා විධියට මිල කරන්නට වෛද්‍යවරුන් පුළුවන් වන්නේ නැහැ. පෞද්ගලික වෛද්‍යවරුන් පිළිබඳ ඔය ප්‍රශ්නය අපට නිතර නිතර අහන්නට ලැබෙන දෙයක්. තවත් කරුණක් තිබෙනවා. බෙහෙත් 8 වේලත් දෙනවා; 12 වේලත් දෙනවා; 24 වේලත් දෙනවා. 8 වේල රුපියල් 5 නම් ඒ විධියේ බෙහෙත් බෝතල් 3 ක් බොන්නට ඕනෑ. එතකොට රුපියල් 15 යි. ඔය විධියේ ක්‍රම යොදා ගෙන මුදල් හම්බ කරනවා මිස සමහර අය කල්පනා කරන්නේ ලෙඩා ගැන නොවෙයි. ඒ තත්ත්වයට දරදඬු විධියට ගෙන යන නිසා කුමක් හෝ පාලනයක් අවශ්‍ය වෙනවා. අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ රජයේ ආරෝග්‍යශාලා පමණක් නොවෙයි පෞද්ගලික දිස්පැන්සරි ගැනත් එතුමාගේ අවධානය යොමු කරනන්ය කියා ලයි. ඒ නිසා පෞද්ගලික දිස්පැන්සරිවල කෙරෙන කටයුතුත් පාලනය කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

පූ. හා. 10.45

මීට වඩා යමක් කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. කඹුරුපිටිය ආසනයේ තිබෙන අඩුපාඩුකම් සියල්ලක්ම සම්පූර්ණ කර දෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමා මේ අමාත්‍යාංශය බාර ගත්තාට පසුව සෑම දිස්ත්‍රික්කයකටම වාගේ ගොස් තිබෙනවා. එතුමා යන්නේ ආරෝග්‍ය ශාලාවලට දැනුම් දෙන්නේ නැතිවයි. ඒකයි එහි වටිනාකම. දැනුම් දී ගියොත් එතන සුද්ධ කරලා, කානු සෝදලා, අඩුපාඩු හරිගස්සලා, යුනිෆෝම් ඇඳලා, ගේට්ටුව ඇරගෙන සූදානම්ව ඉන්නවා. ඒ නිසා දැනුම් නොදී යෑමෙන් තමයි ගේ ඇස් දෙකින්ම නියම තත්ත්වය බලා ගන්නට ඇමතිතුමාට පුළුවන් වුණා. ඉදිරි අවුරුද්ද තුළ මේ අඩුපාඩු සම්පූර්ණයෙන්ම හදන්නට ගරු ඇමතිතුමාට නොහැකි වුණත් අඩක්වත් හදා දෙනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The "Ceylon Daily News" of 24th August talks about "Chaos at TB Hospital":

"Is the Welisara Chest Hospital—the premier TB institution of this country—heading for a gradual breakdown? The question is posed with serious concern by harried patients and an equally worrried (and depleted) staff in the X-ray Unit."

Will the Hon. Minister please inquire as to what is happening? That is true of a number of other institutions also.

About the shortage of drugs, a number of Members have already spoken. I think this is common to a number of places and the matter should be seriously considered and attended to. Particularly after the FEECs Scheme you have increased the costs placed upon drugs. I am sorry the Minister of Finance is not here. I think as a result of FEECs, the prices of drugs are going up more and more. I have drawn attention to this here more than once. If you go to any dispensary you will observe that from month to month the prices of drugs are going up. I do not know why. The general explanation is that FEECs are operating on drugs; and that is going to make things worse for hospitals also. According to the Minister, various other departments are now being brought within FEECs. The actual Budget is not affected. The people outside, the consumers, will be affected by this effort on the part of the Government to extend FEECs to all other departments.

Then I wish to say one word about the accident service. The accident service, at least in the beginning, worked fairly satisfactorily. I do not know whether I can say the same thing now. But there is one defect that I can see. Children are not admitted to the accident service. The people concerned, the people outside, do not know this. They generally rush children also after an accident to the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

accident service. They are expected to go to the Lady Ridgeway Hospital for Children. By the time they are told to go to this hospital a number of hours might pass.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
What is the age limit ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
I think it is below five years or up to eight or even ten. Anyhow, if there is an accident to a child, there is no reason why they cannot attend to it immediately in the accident service and transfer the child afterwards to the Lady Ridgeway Hospital. Any delay can mean trouble. The delay may even mean the loss of a child's life.

May I also ask the Minister to have an accident service in Colombo South ? Now that you have got fairly good doctors in the Colombo South Hospital, I see no reason why it cannot be extended to Colombo South also.

With regard to the switchboard service in your hospitals, I think there are about 200 lines and the staff is quite inadequate. Quite often you cannot get through anyone of the lines and the staff is also dissatisfied. Will you look into that and also increase the staff in the switchboard service ?

I should like to say a word about the channelled service. I do not know whether the time has not come to review the whole question. My information is that it has practically broken down and that doctors and specialists are going about their private work as before. There are plenty of specialists outside now—people who have retired. I think it is time for us to reconsider the whole matter. The matter may be reviewed. I am not making a pronouncement at the moment, but the Minister might review the whole question.

I do not want to go the whole length into the question of Rev. Vachissara, but what the hon. Member for Panadura (Mr. Leslie Goonewardene) said was true. Today the specialists take the senior anaesthetists out for all their operations in private hospitals and their services are not made available in the General Hospital. I am sorry that the Hon. Minister made a statement in this House on this question. Why should he go out of his way to make a statement in this House before the question could have been genuinely raised ? What happened ? There is a circular issued by the Medical Superintendent himself—not this Medical Superintendent alone but others also—which says that operation lists will have to be surveyed by the senior anaesthetist. He must earmark for each operation the doctor as well as the anaesthetist. There is a list put up for the purpose. That is one of the rules which has never been adhered to. An anaesthetist must examine the patients the day before the operation and enter his observations in the bedhead ticket. Those are conditions laid down by your Medical Superintendent, and you can ascertain that from anybody there if you inquire.

I must say that I am very dissatisfied with your Medical Superintendent. I am sorry you have appointed him Medical Superintendent. He is a first-class surgeon. Why did you put him on to do administrative work ? Take him away from that work and let him do surgical work. I am told that he is a very good surgeon. Specialists must not be wasted on administrative work.

There are lots of questions arising out of the death of Ven. Kotagama Vachissara which require examination. I support the request of the hon. Member for Panadura (Mr. Leslie Goonewardene) and the hon. Leader of the Opposition, namely, that we should have an inquiry if only for the sake of preventing similar incidents of this nature. This came to light because of the death of

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

Ven. Kotagama Vachissara. How many people must be dying like this ?

What is an "anaesthetic misadventure" ? Please tell me whether you go into hospitals for adventures. This is an age where hearts are transplanted. People have lived for 20 months after heart transplants. You are telling me that in Ceylon it is not safe to have a hernia operation ! What kind of reputation will this country get ? Today after a hernia operation a patient can walk out of the hospital in two to three days. That is the position. Today when the world is moving towards transplanting hearts successfully, we cannot get a hernia operation done safely in this country !

This particular anaesthetist had no business to attend to that work. She is incompetent. Please remove her from there before she kills more people. That is what she is doing. She is incompetent to do that type of work. Get her to do some other job. She may be competent to do something else, but not to work as an anaesthetist. She had an elementary duty, if she could not do the job of giving a local anaesthetic, to summon Dr. Richards who was in the next room for the purpose. She cannot do this job. She should have summoned a senior anaesthetist. She cannot be allowed to take a decision on her own on something which she cannot do.

ගරු. සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

They learn by trial and error.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Yes, and they are killing people in the process.—[*Interruption*]. There is no fat in the spinal cord. Any doctor will tell you that there is no fat in the spinal cord. This question of being too fat is nonsense. What kind of excuses are you giving ? I am sorry, I was there, I came to know what happened because I was there. Do you know what your attendants and nurses are saying ? They say :

"මහත්තයො වැඳල කියන්නම්, මෙහාට එන්න එපා ඔපරේෂන් කරන්න. මෙහෙ මිනිස්සු මරනවා තියාගෙන.

That is the reaction of the ordinary person there. That is not a good reputation for a hospital to get.

And what a number of excuses your Medical Superintendent gave me when I was there ! One was that this type of thing happens. What is this ? Can you please explain how the Medical Superintendent happens to be also the head of the trade union ? How can he pull up doctors if he is the head of the trade union ? Your Medical Superintendent is the head of the G.M.O.A., which is a trade union organization looking after the interests of the doctors. How can he pull up members of his own union ? How can he find out the lapses of the doctors if he is the head of the union ? How can he do that ? He must defend them. That is what has happened in this particular case. There is something radically wrong in the whole matter. I hope you will look into it.

There is one thing for which I have been fighting for the last so many years, but I have so far not been able to get any redress for the persons concerned. My good and charming Friend, the Deputy Minister of Health has tried her best. This is about the dhobies there who are doing the work of washing the linen. I asked a question in this House the other day and as a result they have got one cent more on every piece of linen washed. They are expected to work 365 days in the year. If they are not being employed, that is a different matter ; but if they are being employed, do not exploit them.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It was only the other day that they were pulled up by the Medical Superintendent because they did not turn up for work on Poya day. That means they have no off-day, they have no holiday. But when it comes to a question of giving them provident fund facilities, you refuse to grant them that. You have been employing these people for 20 to 30 years. I am not blaming the Hon. Minister. I have been fighting with every Health Minister and trying to get redress for these people, but I have failed because of these bureaucrats.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)
(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

You should have corrected it when you were Finance Minister.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I did not get a chance. You got me out.

I am sorry I have taken more time than was granted to me. But I would like to ask the Hon. Minister to please consider the case of these poor dhobies. There are not many of them. It would not cost you very much. After all they are doing a dirty job, cleaning the linen. If you have the idea of having a central laundry by all means proceed with it but if you are having these dhobies please try to be fair by them.

පී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අද විශේෂයෙන්ම පිටිසරබද සෑම මධ්‍යම බෙහෙත්ශාලාවකම, ආරෝහාශාලා වකම වගේ පුදුම අන්දමේ බෙහෙත් හිඟයක් තිබෙනවා. මොන කාරණයක් නිසා දැයි මා දන්නේ නැහැ. ගබඩා අධිකාරීන් බොහොම කම්මැලියි ඇත පළාත්වලට බෙහෙත් යවන්න. ඒ ප්‍රදේශවලට අවශ්‍ය තරම් බෙහෙත් යවන්නෙ නැහැ. සමහර විට බෙහෙත් ඇණවුම් ඉදිරිපත් වී හය මාසයක්, අවුරුද්දක් තරම ගතවන තුරුත් පිළිතුරක්වත් නොලැබෙන අවස්ථා තිබෙනවා. ඒ නිසා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය බෙහෙත් ගබඩා පිහිටුවීමට මහන්සි ගත් බවත් මා දන්නවා. එයිනුත් තවම තත්ත්වය මඟ හැරී නැහැ. එහෙත් කාලය පසුවීම නිසා රුපියල් ලක්ෂ ගණන් වටිනා බෙහෙත් තොග කොළඹ ගබඩාවෙන් වීසි කර දමන බව අපි දන්නවා. සාමාන්‍ය ගම්බද ජනතාව බෙහෙත් නැතිකම නිසා රෝග සුව කර ගන්නට බැරිව දඟලනවා. මෙහෙ ආණ්ඩුව විශාල මුදලක් වැය කර ගෙන්වූ බෙහෙත් තොග කාලය පැන ගොස් තිබෙන නිසා වළ දමනවා; වීසි කරනවා. එයින් පෙනී යන්නේ බෙහෙත් ගබඩාවේ සංවිධානාත්මක වැඩ පිළිවෙළක් නැති බවයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමා කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගොස් පරීක්ෂණ පවත්වනවා නම් එතුමාට පෙනී යයි, පාවිච්චි කළ යුතු කාලය ඉකුත් වූ රුපියල් ලක්ෂ ගණනක් වටිනා බෙහෙත් කොයි තරම් ප්‍රමාණයක් එහි ගොඩ ගසා තිබෙන වාද කියා. සමහරවිට ඉතාම අවශ්‍ය වටිනා බෙහෙත් වඟී ඒ අතර තිබෙනවා.

පිටිසර ප්‍රදේශවල පවතින බෙහෙත් හිඟය සම්බන්ධයෙන් මා නිදර්ශනයක් පෙන්වා දෙන්නට කැමතියි. හැතැප්ම 8 ක්, 9 ක් පසින් යා යුතු ස්ථානයක් වන තෙරිපැහැ කියන ගමේ පිහිටි බෙහෙත් ශාලාවට මම මේ ළඟදී ගිය අවස්ථාවෙදි මට ගම්වාසීන් පැමිණිල්ලක් කළා, දිස්පැන්සරියේ සිටින ඇපොතිකරි මහත්මයා බෙහෙත් දෙන්නෙ සල්ලිවලටයි කියා. මම උන්නැහේගෙන් ඒ ගැන ඇසුවාම ඔහු මට දුන්න පිළිතුර මේකයි: "දිස්පැන්සරියේ බෙහෙත් නැහැ. කොහෙන් හරි බෙහෙත් ගෙනත් දෙන්නය කියා සමහරුන් මට කියනවා. ඒ වුවමනා අයට මම සෞඛ්‍ය ගලිකව මුදලට බෙහෙත් ගෙනැවිත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

දෙනවා. බෙහෙත් සපයන ලෙස ඉල්ලා දෙපාර්තමේන්තුවට ලියුම් ගණනාවක් යැවී වත් බෙහෙත් ලැබෙන්නෙ නැහැ." සම හරවිට දෙපාර්තමේන්තුවෙන් බෙහෙත් එව්වත් ඒවා රාගල දුම්පිය පොළේ අවුරුදු ගණනක් තිබෙනවා. මෙම බෙහෙත් හිඟය නිසා ගම්බද මහජනතාවට විශාල කරදරයකට මුහුණපාන්නට සිදු වී තිබෙනවා. ඒ ගැන සොයා බලා කටයුතු කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ආයුර්වේද බෙහෙත්ශාලා ප්‍රශ්නය ගැන මා මේ කථා කරන්නේ පස්වෙනි වරටයි. පසුගිය අවුරුදු හතරේම මා ඒ ගැන සඳහන් කර තිබෙනවා. මගේ කොට්ඨාශයේ යටිපළාත ගම්කාර්ය සභාව මගින් පවත්වාගෙන යන ආයුර්වේද බෙහෙත් ශාලාවක් තිබෙනවා. ගම්කාර්ය සභාව මගින් එය ආරම්භ කරන්නට යෙදුණේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආධාර ඇතුවයි. එහෙත් ඒ ආයුර්වේද බෙහෙත් ශාලාවට අවුරුදු 5 ක් තිස්සේ අද වනතුරු ශත යකවත් ආධාරයක් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලැබී නැහැ. ගම්කාර්ය සභාවලට පුළුවන්කමක් නැහැ. මේ බෙහෙත් ශාලාවලට වියදම් කරන්න. සියයට 90 ක් තරම දෙපාර්තමේන්තුවේ ආධාර ලැබෙයි කියන පොරොන්දුව පිටයි, ගම්කාර්ය සභා මගින් ආයුර්වේද බෙහෙත් ශාලා ආරම්භ කරන්නට යෙදුණේ. දැන් ඒවාට ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් සියයට 90 ක තබා කිසිම ආධාරයක් නොලැබෙන නිසා ආයුර්වේද බෙහෙත් ශාලා ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වී තිබෙනවා. අළුත් බෙහෙත්ශාලා පිහිටුවන්නට ක්‍රියා කරන අතරම, ගම්කාර්ය සභා මගින් දැනට පවත්වාගෙන යන ආයුර්වේද බෙහෙත්ශාලාවලටත් වැඩි මුදලක් වෙන් කර ආධාර නොදෙන්නේ ඇයි කියා මා ප්‍රශ්න කරනවා.

ගරු සභාපතිතුමනි, කොළඹ මහාරෝගාශාලාවේ උණත්, වෙනත් ස්ථානවල උණත් හැමෝටම ඒකාකාර සැලකිලි ලැබෙන්නේ නැහැ. පුළුවන් උදවියට එක ආකාරයකටත්, බැරි උදවියට තවත් ආකාරයකටත් සලකන සිරිතක් තිබෙනවා. විශේෂ පුද්ගලයෙකුට කොළඹ ආරෝගාශාලාවේ පළමුවෙනි පන්තියේ කාමරයක් අවශ්‍ය නම් පහසුවෙන් එය ලබා ගත හැකියි. එහෙත් ශල්‍ය කර්මයකට භාජනවුනු සාමාන්‍ය කෙනෙකුට වුණත් ඇඳක් වෙන් කරවා ගන්නට පුළුවන්කමක් නැහැ. ඉල්ලීම් ලැයිස්තුවේ අවුරුදු ගණනක් සිටින්නට ඕනෑ. එහෙත් සමහර විශේෂ පුද්ගලයන්ට දවසකින් දෙකකින් ඇඳක් ලබා ගන්නට පුළුවන්. මා දන්නා එක්තරා පෞද්ගලික ආරෝගාශාලාවක අධ්‍යක්ෂවරයෙකුට දවස් දෙකකින් ඇඳක් ලැබුණා. මේ වගේ අසාධාරණකම් රාශියක් ආරෝග්‍යශාලාවල සිදුවෙනවා. තත්ත්වයක් තිබෙන, ධනය තිබෙන අයට විශේෂ සැලකිලි තිබෙනවා. එහෙත් සමහර සාමාන්‍ය මිනිසුන් පෝළිමේ ඉදලම බෙහෙත් ගන්න බැරුව නිකම් මැරෙණවා. සමහරවිට මහනුවර ආරෝග්‍යශාලාවේ වුණත් තත්ත්වය ඒකයි. මහනුවර ආරෝග්‍යශාලාවෙන් බෙහෙත් ලබා ගන්නට එන උදවියට සමහරවිට පාන්දර 3 සිට පෝළිමේ ඉන්නට සිදු වෙනවා. අක්ෂි වෛද්‍ය විශේෂඥයින් වැනි උදවිය සේවය කරන දිනවල සමහරුන් කලින් දවසේ රාත්‍රියේ 12 ටත් ගොස් පෝළිම්වලට එකතු වෙනවා. එසේ නැත්නම් පසුවදාට බෙහෙත් ලබා ගන්නට බැහැ.

සාමාන්‍ය මිනිහා ඒ තරම් දුක් විඳිනවා. එහෙත් පුළුවන් අය, ධනපති අය, තත්වයක් තිබෙන අය කෙලින්ම පස්සදොරෙන් ගොස් තමන්ගේ වැඩේ කර ගන්නවා. මේවා එන්න එන්නම වැඩි වෙනවා. ඒවාට අපි විරුද්ධ වන්නට ඕනෑ. කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේ ගැන කථා කරද්දී මහාරෝග්‍ය ශාලාවේ වෛද්‍යවරියක් ගැන සඳහන් වුණා. එමෙන්ම ආරෝග්‍ය ශාලාවේ ඇඳක ඇබෑර්තුවක් ඇති වන විට මේවිරන්වරිය කොහොම හෝ තමන්ට ඕනෑ කරන තැනැත්තාට දන්වනවා. ඔහුත් කොහොම හෝ ඒ ඇඳ වෙන් කරවා ගන්නවා. ලැයිස්තුවේ සිටින අය බලා ඉන්න ඕනෑ. සාමාන්‍ය කෙනෙකුට සාධාරණ අඳුමින් සැලකිල්ලක් ලබා ගන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා කරුණාකර සාධාරණත්වයක් ඉටු වන්නට වැඩ පිළිවෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ළක් සකස් කරන්න. අපට වුවමනා කරන්නේ මිනිසුන්ට වුවමනා කරන බෙහෙත් ටික අඩු මුදලකට සාධාරණ විධියකට ලබා දෙන්නටයි. එසේ කළොත් තමයි මිනිහාට සංවර්ධනය කරන්නට පුළුවන්.

ජනගහනය වැඩි වන විට රටේ සංවර්ධන ව්‍යාපාරත් වැඩි කර ඒ පරතරය නැති කරන්න ඕනෑ. එහෙත් අපේ සෞඛ්‍ය ඇමතිතුමා කරන්නේ ජනගහණය අඩු කරන්නට උත්පත්ති පාලනය කිරීමයි. හැබැයි කවදා හෝ මේ රටේ සිංහල ජාතිය පරාධීන වුණොත් එයට වගකියන්නට වේවි. දැන් අපේ කාන්තාවන් දන්නෙත් නැතිව ළමයින් නොලැබෙන්නට ශල්‍ය කර්ම කරනවාලු. නොදන්වාම එසේ කරනවාලු. දැන් හැම තැනින්ම එයට විරෝධය නැඟී එනවා. පළාත් පාලන ආයතනවලින්, රටේ ජාතියේ හා ආගමේ නායකයින්ගෙන් උත්පත්ති පාලනයට විරුද්ධත්වය ප්‍රකාශ වී තිබෙනවා. වෙනත් රටවල වැඩි වැඩියෙන් ළමයින් උපදින විට ඒ දරුවන්ගේ දෙමව්පියන්ට තෑගි දෙනවා; මුදල් දෙනවා. එහෙත් මේ රටේ දරු උපත් සංඛ්‍යාව තව තවත් අඩු කරන්නට මව්වරුන්ට බෙහෙත් පෙති දෙනවා. මේ වැඩ පිළිවෙළ නිසා යම් දවසක මේ රටේ මහ ජාතිය වන සිංහල ජාතිය නැති වී ගියොත් ඊට මේ ඇමතිතුමා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වගකියන්නට ඕනෑ. හැබැයි, වගකියන්නට සිද්ධ වන විට මේ උදවිය කොහේද කියලා හොයන්නටත් බැරි තැනක හිටීවි. සමහර විට ජීවතුන් අතරත් නැතිව යන්නට පුළුවනි. ජීවත්ව ඉන්නවා නම් හොයාගන්නටවත් පුළුවන් වෙයි. එහෙම වුණොත් පරම්පරාවේ ඇති වන අයටත් කරදර වෙයි. ඒ නිසා මම දැන් එක ඉල්ලීමක් කරන්නට කැමතියි. කරුණා කර ජාතිය මරන්නට මහන්සි ගන්න එපා.

මා නියෝජනය කරන වලපනේ කොටි ඝාශයේ අඩුපාඩු ගැන වචනයක් දෙකක් කථා කරන්නට ඕනෑ. තෙරිපැහැ මාතෘ නිවාසයත්, අරුක්වත්ත මධ්‍යම බෙහෙත් ශාලාවත් මේ අතර වැදගත් තැනක් ගන්නවා. අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන අවස්ථාවේ පමණක් මේවා වෙනුවෙන් මුදල් වෙන් කළාය කියා ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. නිකම් බොරුවට, මේවා කරනවාය, මේවා කරන්නට බලාපොරොත්තු වෙනවාය යනාදි වශයෙන් අයවැය ලේඛනයේ සඳහන් කිරීමෙන් වැඩක් නැහැ. තෙරිපැහැ මාතෘ නිවාසය සෑදීමට මුදල් වෙන් කරන්නට පටන් ගත්තේ අද ඊයේ නොවෙයි. 1963 සිට දිගටම, 1969 දක්වාම, තෙරිපැහැ මාතෘ නිවාසයට මුදල් වෙන් කර තිබුණා. ඉදිරි වර්ෂයටත් මුදල් වෙන් කර තිබෙනවා. දිගටම අවුරුදු හතක් තිස්සේ මුදල් වෙන් කළත් තෙරිපැහැ මාතෘ නිවාසය නම් තවම හදලා නැහැ. ඒ විධියේ අයවැය ලේඛනවලින් ඇති වැඩේ මොකක්ද කියි මම අහනවා. ගත වූ කාලය තුළ ශත පහක වැඩක් කළාද? නැහැ. සැලැස්මක් හැදුවාද? නැහැ. ඇස්තමේන්තු සකස් කළාද? නැහැ. ඉතින්, එහෙම නම්, මේ වැඩ පිළිවෙළේ තේරුම මොකක්ද? අයවැය ලේඛනයේ නම් වැය ශීර්ෂයක් හැටියට සඳහන් කර තිබෙනවා.

අරුක්වත්ත මධ්‍යම බෙහෙත් ශාලාව ගැන කියන්නට තිබෙන්නේත් ඔය විකම තමයි. අවුරුදු හයක් තිස්සේම ඔහේ නිකම් තිබෙනවා. මධ්‍යම බෙහෙත් ශාලාව කඩා වැටෙන්න ඔන්න මෙන්න කියලා තියෙනවා. ඒ ගැන කොයි තරම් පැමිණිලි කළත් ප්‍රයෝජනයක් වෙලා නැහැ. කිප දෙනෙක් එකතු වෙලා ඒ ගැන අමාත්‍යාංශයට පෙත්සමක් ඉදිරිපත් කළා. මොකක්ද ලැබුණු ප්‍රතිඵලය? ඒ ගැන සලකා බලනවාය කියලා උත්තරයක් ලැබුණා; එපමණයි. ඊට වැඩි දෙයක් කෙරෙන්නේ නැහැ. ඉතින්, මේවා ගැන නැවත නැවතත් මතක් කර සිටීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් තිබෙනවාද? වැඩක් කරන්නේ නැත්නම් අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේ මොකටද? ලැයිස්තුවලට නම ඇතුළත් කිරීමෙන් පමණක් ජනතාවට සෙතක් ලැබෙනවාද? අවුරුදු හයක් ගත වෙලා තිබියදීත් මේ වැඩේ කරන්නට වුවමනාවක් ඇතැයි පෙනෙන්නේ නැහැ. වැඩක් කරන්නට බලාපොරොත්තු වෙනවා නම් අවුරුදු හයක් තිස්සේ මෙය නිකම් ලැයිස්තුවල පමණක් තිබෙන්නට හරීවිද? කාරවටන්නටද මෙවැනි වැඩ කරන්නේ? මේ දක්වා ශතයක්වත් වියදම් කෙළේ නැහැ. සැලැස්මක් හදන්නේත් නැහැ. සැලැස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. ඇම්. හේරත් මයා.]

මක් හදන්නේත් නැත්නම්, ඇස්ත මේන්තු සකස් කරන්නේත් නැත්නම්, අයවැය ලේඛනවලට ඇතුළත් කිරීමෙන් වැඩක් තිබෙනවාද? අරුක්වත්ත මධ්‍යම බෙහෙත් ශාලාවත්, තෙරිපැහැ මාතෘ නිවාසයත් මේ ප්‍රදේශවලට විශේෂයෙන් අවශ්‍යයි. අයවැය ලේඛනවලට පමණක් ඒවා ඇතුළත් කර තිබෙනවා. මෙවැනි අයවැය ලේඛන ගෙනැවිත් අප ඉදිරියේ තබා උත්සාහ කරන්නේ අප රවටන්න ටද? කල්පනා කරන්න. මෙවැනි වැඩ වලින් අපේ රටේ ජනතාව රවටන්නට පුළුවන්ද?

මගේ කොට්ඨාශයේ සෞඛ්‍ය පහසුකම් වැඩි කර තිබෙනවා නොවෙයි; ඇත්ත වශයෙන්ම මගේ ප්‍රදේශය සම්බන්ධයෙන් නම් මේ අමාත්‍යාංශය කර තිබෙන්නේ සෞඛ්‍ය පහසුකම් අඩු කර දැමීමයි. හරස්බැද්දේ සංචාරක බෙහෙත් ශාලාවක් තිබෙනවා. කලක් තිස්සේ එය වසා දමා තිබෙන්නේ මොන හේතුවක් නිසාදැයි අපට නම් තේරෙන්නේ නැහැ. ඒ ගැන ලියා යැවීමක පිළිතුරක් නැහැ. මන්ත්‍රීවරයකුට උත්තරයක් දෙන්නටවත් මේ ඇමති අංශයට පුළුවන්කමක් නැද්ද? ලියා පදිංචි කරන ලද තැපෑලෙන් යැවූ ලියමන කටවත් උත්තරයක් එවන්නේ නැද්ද, මේ අමාත්‍යාංශය? මහජන මන්ත්‍රීවරයකු යවන ලියමනටවත් උත්තරයක් එවන්නට බැරි නම් බලාපොරොත්තු විය හැක්කේ මොන සේවයක්ද? ලියන්වෙල සංචාරක බෙහෙත් ශාලාවත් වහලා. කලගන්වත්ත මධ්‍යම බෙහෙත් ශාලාවට වෙලා තියෙන්නේ මොකක්ද? අවුරුදු ගණනක් තිස්සේ එතනට ඇපොතිකරි මහත්මයෙක් නැහැ. බෙහෙත් තිබෙන වෙලාවට ඇපොතිකරි කෙනෙක් නැහැ; ඇපොතිකරි කෙනෙක් ඉන්න වෙලාවට බෙහෙත් නැහැ. මෙවැනි තත්ත්වයක් සෞඛ්‍ය සේවය සම්බන්ධයෙන් අපේ ප්‍රදේශවල පවතින්නට ඉඩ හැර මේ අමාත්‍යාංශය නිකම් බලාගෙන ඉන්නේ මොන කාරණයක් නිසාදැයි තේරෙන්නේ නැහැ. කොළඹටත්, ගාල්ලටත්, මහනුවරටත්, එවැනි නගරබද ප්‍රදේශවලටත් පමණක්ද නියම සෞඛ්‍ය පහසුකම් ලබා දිය යුත්තේ? සාමාන්‍ය ජනතාවට සෞඛ්‍ය සේවය අනවශ්‍යයයි මේ ආණ්ඩුව කල්පනා කරනවාද? මෙවැනි තත්ත්වයක් දිගින් දිගටම පවතින්නට ඉඩ දී නිශ්ශබ්ද ව සිටීමෙන් ඇති වන ප්‍රතිඵලය මොකක් දැයි ගරු ඇමතිතුමා දන්නවාද?

රෝගීන්ට, අසරණ ලෙඩුන්ට, පෞද්ගලික වෙදමහතුන් සහ පෞද්ගලික දෙස්තර මහතුන් පස්සේ යන්නට සිද්ධ වෙනවා නොවෙයිද? ඒ අය කොයි තරම් විශාල මුදලක් ශාස්ත්‍ර වශයෙන් අය කරනවා දැයි ගරු ඇමතිතුමා දන්නවාද? සාමාන්‍ය හෙම්බිරිස්සාවකට වුණත් ඒ අය රුපියල් දහයක්, දහහතයි පණහක් අය කරනවා. ඒ තරම් මුදලක් ගෙවා ලෙඩට ප්‍රතිකාර ගන්නට සාමාන්‍ය ගැමියෙකුට වත්කමක් තිබෙනවාද? ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ නම ඉතිහාසගත වේවි, කරුණා කර මේ ටිකවත් කරන්න. දරු උපත් පාලනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කවදා නමුත් මේ රටේ මහ ජාතිය නැසූ අය හැටියට නම් ඉතිහාසගත වීමට ඉඩ තිබෙනවා. ලෙඩෙකුගෙන් අය කළ හැකි වැඩිම මුදල මෙපමණයයි කරුණා කර සීමාවක් ඇති කරන්න. වෙද මහත්වරුන්ටත් එවැනි සීමාවක් ඇති කරන්න. මේ විධියට සල්ලි දීලා බෙහෙත් ගන්න මිනිසුන්ට සල්ලි කොහෙන්ද?

ලැයිස්තුවලට ඇතුළත් කර තිබෙන තවත් වැඩක් තමයි මුංවත්ත බෙහෙත් ශාලාව සැදීම. ඒ සඳහා සැලැස්මකුත් හැදුවා. එහෙත් එය දැන් සම්පූර්ණයෙන්ම අත් හිටුවා දමා තිබෙනවා. මඩුල්ල මාතෘ නිවාසය සඳහාත් සැලැස්මක් සාදා තිබෙනවා. එහෙත් මා කියන්නේ ඒකත් අත් සිටුවා තිබෙන බවයි.

මෙවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නේ කුමක් නිසා දැයි මට නම් තේරුම් ගන්නට අමාරුයි. ගරු ඇමතිතුමා පලිගන්නට හදන්නේ සාමාන්‍ය දුප්පත් ජනයාගෙන් නොවෙයිද? සමහර විට ගරු ඇමතිතුමාත් ආණ්ඩුවත් කල්පනා කරනවා වෙන්නට ඇති, මේවා නිසියාකාර කර දුන්නොත් මේ මන්ත්‍රීවරයා නැවතත් තේරී එන්නට පුළුවනි කියලා. මේවා කළාම මට නැවතත් මන්ත්‍රීකම හම්බ වේවි කියලා හිතනවා වෙන්නට ඇති. මහජනතාවට වැඩ කර දෙනවා නම් මට මන්ත්‍රීකම නොලැබුණත් කමක් නැහැ. නමුත් මිනිසුන් [illegible] මරා දමන්න එපා; මිනිසුන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මරා දැමීමේ ව්‍යාපාර ගෙන යන්න එපා. මහාරෝග්‍ය ශාලාවේදී, ධනපති උදවියට නම් ඕනෑ තරම් සැලකිලි ලැබෙනවා. එහි එස්මි ඩී. සිල්වා කියා මේවිරන් වරියක් ඉන්නවා. ධනපති උදවියට ඕනෑම ප්‍රශ්නයක් එයාට කියා විසඳා ගත හැකියි. සමහර ධනපති උදවිය කියන්නේ, එස්මි ඩී. සිල්වා නොවෙයි. කිස් මී ඩි සිල්වා කියලයි. "ඩාලින්" කියා කථා කරන අය එයිට එහායි. මෙබඳු තත්ත්වයක් ඇති වී තිබීම මහම විහිළුවක්. මේවා මගුල් සක්වලවල් බවට පරිවර්තනය වී තිබෙනවා; බෙහෙත් නැතුව රෝගීන් දහස් ගණන් එහෙන් මෙහෙන් මැරෙනවා.

දැනට හෙදි සේවයක් තිබෙනවා. ආධාර හෙදි සේවය නැතිනම් උපස්ථායක සේවා ක්‍රමය අතර මග නතර කර දැම්මා. නමුත් ආධාර හෙදි සේවා ක්‍රමයක් අවශ්‍යයි. එහෙම නැතිනම් බඳවා ගන්නා කම්කරුවන්ට පුහුණුවක් දීම අවශ්‍යයි. කකුලක් කැඩුණු පුද්ගලයකුට උපස්ථාන කිරීමේදී හෙදියට සහාය කරන්න වෙන්නේ කම්කරුවන්ටයි. නමුත් ඒ කම්කරුවන්ට කිසිම පුහුණුවක් නැහැ. පුහුණුවක් නැතත් ඔවුන් ලවායි හැම වැඩක්ම ගන්න සිදු වී තිබෙන්නෙ. එම නිසා අඩු වශයෙන් මාස තුනක පුහුණුවක්වත් දීමට කටයුතු යොදන්න ඕනෑ. අඩු වශයෙන් බඳවා ගැනීමට පෙර ප්‍රථමාධාර දීමාදිය ගැනවත් පුහුණුවක් දිය යුතුව තිබෙනවා. නමුත් ඒ කිසිම පුහුණුවක් දීමට පියවර ගෙන නැහැ. ඇතැම් අවස්ථාවලදී දෙන්නට කියන රෝගියාට නොවෙයි බෙහෙත් ගෙනැවිත් දෙන්නෙ. පුහුණුවක් නැති ඒ කම්කරු පිරිසට දොස් නගන්න බැහැ. ආධාර හෙදි ක්‍රමය නතර කර දමනවා නම් බඳවා ගනු ලැබූ කම්කරුවන්ට හෝ සෑහෙන පුහුණුවක් දෙන්න තිබුණා.

ඊළඟට වින්නඹු මාතාවන් ගැනත් වචනයක් සඳහන් කරන්න කැමතියි. අපේ ප්‍රදේශවල ආරෝග්‍ය ශාලා නැහැ; දොස්තරවරුන් නැහැ; බෙහෙත් නැහැ; වින්නඹු මාතාවන් නැහැ. වාහන පහසුකම් නැති, සැතපුම් දහය විස්ස පයින් යන්න වන ප්‍රදේශවල ජනතාවට මේ නිසා අප්‍රමාණ දුෂ්කරතාවන්ට මුහුණ දෙන්න වෙනවා. නගර බද ප්‍රදේශවල වාගේ නොවෙයි පිටිසර බද ප්‍රදේශවල වින්නඹු මාතාවන් සොයා ගැනීම අමාරුයි. දුෂ්කර පළාත්වල ජීවත්වීමට අමාරු නිසා බොහෝ විට වෙනත් ප්‍රදේශවලට මාරු වී යාමට වින්නඹු මාතාවන කැමැත්තක් දක්වනවා. එය ස්වභාවික දෙයක්. නමුත් එසේ මාරු වී යාමේදී ඇති වන පුරප්පාඩු ඉක්මනින්ම පුරවා ලීමට පියවර ගැනීම ඉතාමත්ම අවශ්‍යයි. මෙයට පිළියම් වශයෙන් ඒ කාලයේ එක්තරා ක්‍රමයක් ක්‍රියාවේ යෙදුවා. එනම් එම ප්‍රදේශවලින්ම වින්නඹු මාතාවන් සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමයි. නමුත් ඒ ක්‍රමය දැනට ක්‍රියාවේ යොදවනවායයි අපට පෙනී යන්නේ නැහැ. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය. පොළොන්නරුව දිස්ත්‍රික්කය වැනි දුෂ්කර ප්‍රදේශවලට සේවය පිණිස යාමට වැඩි කැමැත්තක් දක්වන්නේ නැති නිසා එම ප්‍රදේශවලින්ම තෝරා ගැනීම වැදගත් බව මතක් කර දෙන්න කැමතියි. ඒ අන්දමට මිස මෙම ප්‍රශ්නය නිසියාකාර ලෙස විසඳන්න ලැබෙන්නේ නැහැ; එවැනි අන්දමකින් මෙම ප්‍රශ්නය විසඳීමට පියවර ගන්නවා මිස උත්පත්ති පාලනය කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ. සමහර අයට නම් උත්පත්ති පාලනය අවශ්‍යයි. ඒ කියන්නෙ, බහු පුරුෂ සේවනය කරන අයටයි එය අවශ්‍ය. මගේ කථාව මෙයින් අවසන් කරනවා.

පූ. භා. 11.15

එම්. ඒ. ඩැනියල් මයා. (හේවාහැට)
(திரு. எம். ஏ. டானியல்—ஹேவாஹெற்ற)
(Mr. M. A. Daniel—Hewaheta)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය ගැන කථා කරන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් අදහස් ස්වල්පයක් ඉදිරිපත් කිරීමට මට අවකාශ සලසා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. බදනක් තිබෙනවා, ආරෝග්‍ය තරමා ලාභ කියන. අපේ වලපනේ මන්ත්‍රීතුමා ඒ වදන ගැන කල්පනා කරන්නේ නැති බවයි පෙනී ගියේ. අප කන කෑම, බොන බීම, ලැබෙන වාතාශ්‍රය ගැන කල්පනා කර බලන විට වලපනේ මන්ත්‍රීතුමා කථා කළේ එහෙම පිටින්ම එම වදන අනික් පැත්තට හරවා ගෙන බව පෙනී යනවා. අප බොහෝ දුරට ප්‍රවේසම් වෙන්න ඕනෑ. අපේ ශරීරය ලෙඩ රෝවලට ගොදුරුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇනියල් මයා.]

නට ඉඩ නොදී ආරක්ෂා කර ගන්න. එසේ නැතුව රෝහල් පුරවන්න උත්සාහ දැරීමෙන් වැඩක් නැහැ. කෙසේ වුණත් අප උත්සාහ දරන්නෙ වෙන් කර ඇති මුදල්වලින් හැකි තරම් දුරට ප්‍රයෝජන ගැනීමටයි [බාධාකිරීමක්] වැඩි වැඩියෙන් මහජනතාවට සේවය කිරීමයි අදහස. ගරු සභාපතිතුමනි, මැලේරියා උවදුර මැඩලීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් විශාල ව්‍යාපාරයක් ගෙන ගියා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මැලේරියා උවදුර මැඩලීමට සැහෙන තරම් දුරට හැකිවී තිබෙනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල ආරෝග්‍ය ශාලාවලට දක්වන සැලකිල්ල ප්‍රමාණවත් නැති බව පෙනී යනවා. ඇත්ත වශයෙන්ම කුඩම්මාගේ සැලකිල්ලයි ලැබෙන්නෙ. එම තත්ත්වය වෙනස් කර ගම්බද ජීවත්වන දුප්පත් ජනතාවට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීමට ක්‍රියා කරනවා නම් හොඳ බව මතක් කරන්න කැමතියි.

වාචිස්සර හිමියන්ගේ අභාවය සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශවයේ නායිකාව කථා කළා. පානදුරේ මන්ත්‍රීතුමා කථා කළා. ඒ වාගේම වලපනේ මන්ත්‍රීතුමාත් සඳහන් කළා. අපත් ඒ ගැන කියනවා. අප කවුරුත් මැරෙනවා. නමුත් පණ උපද්දන්න කාට වත් බැහැ. එය බොහොම අමාරු දෙයක්. දොස්තර මහත්වරුන්ට දොස් කිව්වට හරියන්නෙත් නැහැ. දොස්තර මහත්වරුන් නියම ප්‍රතිකාරය කළේ නැත කියා දොස් කිව්වට හරියන්නේ නැහැ. ඒ නිසා යම්කිසි ප්‍රතිකර්මයක් කර ගැනීමට බලා පොරොත්තු වෙන්නේ අද නම්, දවසකට කලින්වත් ඒ සඳහා යන්න ඕනෑ බව කල්පනා කරන්න ඕනෑ. කොයි මොහොතේ කොයි වේලාවේ ලෙඩක් හැදෙනවාද කියා දන්නෙ නැහැ. එම නිසා ගත යුතු මාර්ගය දවසකට හෝ කලින් ගත යුතුයි. ඒ කාරණාව සම්බන්ධයෙන් මා කතා කරන්න යන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ තිබෙන අඩුපාඩුකම් කිහිපයක් ගැනයි මා කතා කරන්න අදහස් කරන්නෙ.

සෞඛ්‍ය උප ඇමතිනිය මගේ කොට්ඨාශයේ සංචාරය කරන්න ගිය අවස්ථාවේදී මාරස්සන ආරෝග්‍යශාලාවට චිකිත්සාගාරයක් ඕනෑ බව අපි එතුමියට දන්වා සිටියා. එතුමිය අපට එය ඉටු කර දුන්නා. තලවතුඔය ආරෝග්‍යශාලාවට විදුලි බලය සපයා දුන්නා තවත් සුළු සුළු අඩුපාඩුකම් කිහිපයක් අපට තිබෙනවා. ඒ ආරෝග්‍යශාලාවේ පරීක්ෂක මණ්ඩලය අපට දන්වා එවිවා, කොට්ට මෙට්ටවල මදිකමක් තිබෙනවාය කියා. ඒ සම්බන්ධයෙන් අපි දෙපාර්තමේන්තුවට දන්වා යැව්වා. ඒවා ඉක්ම නින්ම ලබා දීමට කටයුතු කරනවා නම් හොඳයි.

ඊළඟට, දෙල්තොට ආරෝග්‍යශාලාවට විදුලි බලය සපයා නැති නිසා රාත්‍රී කාලයේදී හදිසියක් ඇති වුණහොත් ලන්තෑරුමක් අරගෙන යන්නයි සිදු වී තිබෙන්නෙ. ඒ පළාතේ හුඟක් තදින් හුළං තිබෙන නිසා මේ විධියේ ලාම්පු පාවිච්චි කිරීම බොහොම අමාරුයි. ඒ නිසා එම ආරෝග්‍යශාලාවට විදුලි බලය සපයා දෙන්නය කියා අපි දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් කටයුතු කර එම ආරෝග්‍යශාලාවට ඉක්මනින් විදුලි ආලෝකය සපයා දෙන්නය කියා මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගලහ නව රෝහලේ වැඩ ක්‍රමානුකූලව කරගෙන ආ නමුත්, දැන් අවුරුදු දෙකක පමණ කාලයක සිට එහි වැඩ ඇන හිට තිබෙන බවක් පෙනෙනවා. එම නව රෝහලේ දෙවැනි පියවර වශයෙන් සෑදිය යුතු ගොඩනැගිලි තැනීම ඉක්මනින්ම කර දෙන්නය කියා අප ඇමතිතුමාට දන්වා යවා තිබෙනවා. එය ඉටු කර දෙන බවට ඇමතිතුමා පොරොන්දු වී තිබෙනවා. ඒ නිසා ඒ පොරොන්දුවත් ඉක්මනින් ඉටු කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ ප්‍රදේශයේ සිට මහනුවරට හැතැප්ම 30ක පමණ දූර ප්‍රමාණයක් තිබෙනවා. හදිසි අවස්ථාවකදී මහනුවර රෝහලට යාම ඉතා මත් අපහසුයි. මේ නව රෝහලේ වැඩ කටයුතු ඉක්මනින් අවසන් කළහොත් මහනුවර රෝහලේ තිබෙන තදබදය වැළැක්වීමටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවන් වෙනවා. ඒ නිසා නව රෝහලේ වැඩ කටයුතු ඉක්මනින්ම අවසන් කර දෙන්නය කියා මා ඉල්ලනවා.

ගරු ඇමතිතුමා විසින් ගලහ මාතෘ නිවාසයක් විවෘත කළා. එම මාතෘ නිවාසයට දුරකථනයක් ඉල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා. නමුත් තවම ලැබී නැහැ. ඒ නිසා හැකි ඉක්මණින් එය ලබා දෙන ලෙසත් මා ඉල්ලනවා. එවිට හදිසි අවස්ථාවකදී මවු කෙනෙක් මහනුවර රෝහලට යැවීමට වාහනයක් ගෙන්වා ගැනීම ආදී කටයුතුවලට බොහොම ප්‍රයෝජනවත් වෙනවා. ඒ නිසා ගලහ මාතෘ නිවාසයට ඉක්මනින්ම දුරකථනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

අපේ සෞඛ්‍ය උප ඇමතිනිය මගේ කොට්ඨාශයට ඇවිත් ආයුර්වේද බෙහෙත් ශාලාවක් විවෘත කළා. එසේ විවෘත කළත් අද වන තෙක් එයට රජයෙන් ලැබිය යුතු ආධාර මුදල් නොලැබුණ බව සඳහන් කරන්න ඕනෑ. එම මුදල් දිය යුතු බව යෝජනා කළා. රජයේ නිලධාරීන්—දෙපාර්තමේන්තුවේ නිලධාරීන්—ඇවිත් පරීක්ෂා කර බලා ඒ මුදල් දීම් අනුමත කළා. එසේ අනුමත කර තිබුණත් රජයෙන් ලැබිය යුතු ආධාර මුදල් මෙතෙක් ලැබී නැති බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මේ අවුරුද්දේ කාල සීමාව සඳහා අපේ ගම් සභාවෙන් රුපියල් 35,000 ක පමණ මුදලක් මේ සඳහා වියදම් කර තිබෙනවා. ඒ මුදල් සම්පූර්ණයෙන්ම අපට ලබා ගත නොහැකි වුවත් රජයෙන් ලැබිය යුතු ආධාර මුදලවත් ලබා ගැනීමට කටයුතු කර දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ගරු ඇමතිතුමා එන්න කලින් ගලහ ආරෝග්‍යශාලාවට විදුලිය සැපයීම සඳහා පළාත් පාලන ආයතනයෙන් මුදල් ලබා දුන්නා. මේ විදුලි බලය සැපයීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෙන් කර තිබුණ මුදල් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට හරවා තිබුණා. කෙසේ වෙතත් ඒ මුදල් ලබා ගන්නා තෙක් ගම්සභාව ඒ වෙනුවෙන් වියදම්ක් දරා තිබෙනවා. මා හිතන හැටියට විදුලිය ලබා දීම සඳහා රුපියල් 20,000 ක පමණ වියදමක් දරා තිබෙනවා. විශේෂයෙන්ම ගම් සභාවට ඒ මුදල් නිදහස් කර දෙන්නය කියා මා වැඩි දුරටත් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද අපේ පළාත් වල වැඩිපුරම සිටින්නේ ගොවියන් සහ කම්කරුවනුයි. මේ ගොවීන් සහ කම්කරුවන් එදිනෙදා වැඩවල යෙදී සිටින විට අවි වැසි වලට අසු වෙනවා. ඒ නිසා ඒ අය බොහෝ විට ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. මේ ලෙඩ රෝග වැළැක්වීමට වෛද්‍ය ක්‍රම තිබෙන්න ඕනෑ. පළාත් වාසීන්ගේ අදහසක් තිබෙනවා, ඉංග්‍රීසි වෛද්‍ය ක්‍රමය හා සමානවම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක්ද තිබිය යුතුය කියා. ඒ නිසා ආයුර්වේද රෝහලක් හේවාහැට කොට්ඨාශයේ ගොවි ජනතාවට ලබා දෙන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

PUBLIC LIBRARY JAFFNA.

වෛද්‍යාචාර්‍ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)

(டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்—நல்லூர்)

(Dr. E. M. V. Naganathan—Nallur)

I am glad that you have given me an opportunity of speaking on this Vote. I was very much surprised to find that the whole of the medical profession has been badly maligned. I can understand an hon. Member like the Member for Walapone, who is ignorant, making such an allegation, but I am surprised that the hon. Member for Yatiyantota and the hon. Leader of the Opposition too should join in it. In their party meetings they have started a whispering campaign against the Government for the very unfortunate death of a reverend priest, which we too regret. They have tried to show that his death was due to a conspiracy of murder in which the doctors of the General Hospital took part! In this House itself the hon. Member for Gampaha made the accusation that the C.I.A. were behind it. I do not know whether that is true of things in China, but I know that they did a whole lot of such things in Stalin's Russia. However I am certain that such things are not happening and cannot happen here; they may

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය නාගනාතන්]

happen in China. But I am happy to say that the medical profession in Ceylon is far above those things. You cannot dare to make such accusations against the medical profession.

About the death of the very reverend priest, which we all regret, we were told by the hon. Member for Yatiyantota that there was no fat in the spinal cord. The question was not whether there was fat in the spinal cord. To give a spinal injection the priest must stoop in front as far as possible, his lower back borne must be acutely bent so as to separate the vertebrae and then you have to send the needle in the space between the vertebrae. So if he cannot bend down sufficiently and separate the vertebrae, it is impossible to send the needle into the spinal canal. In the case of this particular reverend priest, as he was fairly fat he was unable to bend down. To make him bend down you had to make people push him down violently. Unfortunately, people thought that it was not quite proper to bend a reverend priest down.

General anaesthetic is normally safe. In this case an accusation was made that this priest had not been examined. I must say that he was examined by the chief physician, Dr. Rajasooriya, not on one day but over a priod of time. He had made many tests and he had found that he was perfectly fit for an operation. On the morning of the operation the anaesthetist had examined him in the ward and therefore there was no necessity to examined him on the table.

The reason why a spinal anaesthetic is preferred is that in these operations for Hernia and Hydrocele, usually a general anaesthetic is not considered necessary. But when the spinal anaesthetic was rather difficult because they could not bend him to separate the vertebrae for the needle to go in, they had to think of a general anaesthetic.

I have not met this doctor. I do not know who she is. I have not even seen her. But from reports I have got from men in the medical profession and from the people of Kegalle where she was the sole anaesthetist for two years, I gather that she anesthetized very well not only in minor surgery but also in major surgery. She was perfectly competent. But the hon. Member for Yatiyantota said that she is the most incompetent. It is disgraceful for him to make that accusation.

Again, another Member said—I do not know who he is; I think he is a Communist Member—that private practitioners were profiteering.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The hon. Member for Kamburupitiya.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

I do not know from where he comes. It does not matter from where he comes. He may be from Kamburupitiya or he may speak for Russia. He said the private practitioners in Ceylon are exploiting. He does not know that if a doctor exploits his clients would not go to him the next time and he will lose his practice. Naturally, in private practice a person will always like to go to a good physician or a good surgeon. The allegation that they are exploiting patients is nonsense.

I would like the Members of this House to study this subject and know more about it. For instance, the hon. Member for Walapone said—he cannot say anything better—that family planning was designed to destroy the Sinhala race. He said so without quoting any statistics. I remember, some reverend priest also wrote to the newspapers and gave certain statistics which were absolutely incorrect and absurd, but it was given big headlines and many people quote him as if he were an authority. If he is an ignorant man I can understand, but by quoting incorrect figures he is misleading the people. He maintained that the birth rate of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sinhalese was 42, of the Muslims 122, and of the Tamils 120, and that the Sinhalese are a dying race. That is impossible because the Sinhalese formed only 67 per cent of the population before independence and they are now 71 per cent of the total population. Ceylon's birth rate is one of the highest in the world. Unless the whole population contributed towards that birth rate this high birth rate could not have been attained. This 29 per cent alone (that is the minorities) cannot make Ceylon one of the biggest child producing countries in the world. The 29 per cent comprising others cannot take the rate above the word's average. So people must talk with a little more sense.

One thing that our country must have is birth control. There can be no real national development unless there is birth control. We cannot reach better standards of living if we go on producing more children instead of producing more work and more wealth.

Hon. Members of this House, including the Hon. Minister, want more hospitals and better hospitals, better facilities and more doctors, but where is the money to come from ? Unless we produce more work, not children, and are more sincere and more dedicated to our work, whether we be government servants or clerks or workers or executives, we cannot progress. Certain Members encourage the people not to work, but to strike, and to go slow in work.

The hon. Member for Yatiyantota let out a very pregnant sentence. He said that the Superintendent of the General Hospital was the president of the G.M.O.A.,a trade union chief, and is therefore not competent to be an administrator. I say that one of the purposes of any trade union is to see to the efficiency of their own workers. We want better medical men, we want them to do better work, to organize their work better, to take measures themselves to increase their efficiency.

The same applies to teachers' unions. They must see that the teachers are not only better paid but that they study better, that they study their problems better, and that they do their work better, devoted to their schools and their children. But the teachers' unions which are mainly leftist controlled are there only for the purpose of asking teachers to strike. I am glad to say that this is not so in the medical profession.

The hon. Member for Yatiyantota also made a defamatory statement about the Medical Superintendent. He said he may be a good surgeon, but he is unfit to be the Superintendent of the General Hospital. I can say that he is one of the best superintendents we have had. He is a good surgeon and also a good superintendent. Making absolutely ignorant, statements, foolish statements, brings no credit to a man of his standard. We expect more responsible statements and better culture from our so-called leaders.

The channelled consultation practice is a good system but the place where the consultations have to be conducted in Kynsey Road is dirty and the room is insufficient. The patients who take advantage of the system have to undergo a great deal of inconvenience before they can see the specialist doctor whom they want.

பி. ப. 11.30

There was an accusation made that these channelled doctors go to private hospitals and nursing homes. Of course they do, but they go through the channelled service. Because there is no room in government hospitals and because of the inconvenience they have to suffer there, patients prefer to go to private hospitals and nursing homes, and there doctors are consulted through the channelled service. It is regrettable that certain hon. Members speak without knowing all the facts. They should speak with a sense of responsibility.

A word about out-patients departments. In colombo and in the big towns, the out-patients departments

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය නාගනාතන්]

of government hospitals are very crowded. For instance, these departments in the hospitals in Jaffna and Colombo are terribly crowded. Each doctor has to see a hundred and fifty or more patients of a morning on any day. This is physically impossible to do properly. This state of affairs has arisen, in my view, because of the lack of a sufficient number of properly equipped dispensaries and outpatients departments in the rest of the towns.

For instance, if the municipal dispensaries in Colombo are better run, and better equipped, there will not be such a rush to government hospital dispensaries. The position is the same in regard to Jaffna. We want more dispensaries in the towns. In my own constituency also we are lacking in dispensaries. I want them not for our own sake, not for any election purposes, but to relieve the congestion in the hospital outpatients department which is terrible. So a different kind of planning is necessary, as stated by my hon. Friend, the Member for Paddirippu (Mr. S. Rasamanickam).

Now I would like to say a few words about the ayurvedic hospitals. I must confess, as I always speak the truth, that I have no great confidence in ayurvedic hospitals. But a foundation stone has been laid for an ayurvedic hospital at Kaithody in Jaffna, and it has been there for so many years. I do not know when a building would be built on that foundation stone.

The Siddayurveda form of medical treatment is one that is highly developed among the Tamils and people of our civilization, but as a system is seems to have been completely ignored or not properly looked after. I would ask the Hon. Minister to pay a little more attention to this Siddayurveda form of medicine and also the Unani system of medicine. These two systems of medicine have not been properly looked after and encouraged even in the Ayurvedic Hospital and College, Colombo. So far as this system of medicine is concerned in Jaffna, only a foundation stone has been laid. No further progress has taken place. Another urgent matter is the need for a Cobalt Unit in Jaffna, but I will not dilate on this because it has already been mentioned by the Member for Paddirippu and the Hon. Minister has given a solemn assurance that it would be installed soon at the Cancer Clinic at Jaffna.

Although I can speak for hours on this subject I do not intend to take any more time. I only wanted to meet some of the uneducated and uncultured arguments adduced by certain hon. Members of the Opposition who were defaming the noble medical profession.

දයා ටී. පස්කුවල් මයා. (මාතුගම)
(திரு. தயா ரீ. பஸ்குவல்—மத்துகம)
(Mr. Daya T. Pasqual—Matugama)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අයවැය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී මා නියෝජනය කරන ආසනය වන මාතුගම කොට්ඨාශයේ සෞඛ්‍ය හා වෛද්‍ය අපහසුකම් ගැන කරුණු ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අදහස් කෙළේ දැනට සෞඛ්‍ය ඇමති ධුරය දරන ඇමතිතුමා ඒ කොට්ඨාශයේ නිල ගමනක මෙතෙක් යෙදී නැති නිසයි. එතුමන්ට ආසන්නව සිටින විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යවරයා නම් සෞඛ්‍ය ඇමති ධුරය දරණ කාලයේදී මගේ ආසනයේ නිල ගමනක යෙදී තිබෙනවා. ඒ අවස්ථාවේදී ප්‍රදේශයේ තිබෙන උසස්ම රෝහල වන නැබොඩ රෝහලටත් වෛද්‍ය මධ්‍යස්ථාන කීපයකටත් එතුමා පැමිණියා.

මාතුගම ඡන්ද කොට්ඨාශය විශාල ජන කායක් සිටින ඡන්ද කොට්ඨාශයක් එහෙත් එහි තිබෙන විශාලම රෝහල පිහිටා තිබෙන්නේ කොහේද? ඉංගිරිසින් රජය කරවන කාලයේදී වතුකම්කරුවන් ගේ පහසුව සලකා ගමින් බැහැර කඳු මුදුනකයි ඒ රෝහල පිහිටුවනු ලැබුවේ. එදා හිටපු සෞඛ්‍ය ඇමතිතුමා ගොස් මේ තත්ත්වය අවබෝධකර ගත්තා. එහි විශාල ගොඩනැගිලි තිබෙනවා. බිම් ප්‍රමාණය විශාලෙට තිබෙනවා. එහෙත් වෛද්‍ය නිලධාරීන් ඒ ස්ථානයට යන්න කැමති නැහැ. ඒ වාගේම ජනතාවටත් එහි ළඟා වීම දුෂ්කරයි. ඒ මන්ද, ප්‍රධාන බස් මාර්ගයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවීමයි. ඉඳ හිට දවසකට වරක් දෙකක් ධාවනය වන බස් රථ සේවයක් තිබෙනවා. එහෙත් ඒ එක බස් රථයක් කැඩුණොත් සේවයක් ඇත්තෙම නැහැ. මේ අපහසුකම් නිසා නිලධාරීන් සහ සේවකයන් පමණක් නොව, රෝගීන් පවා ඒ ස්ථානයට යන්නෙ නැහැ. කොතෙක් දුරට එතැනට රෝගීන් නොයනවාද කියන එක හොඳින්ම පෙනී යනවා එහි පිරිසිදු කම නිසා. ඒ මොකද? ලෙඩුන් නැති නිසා පිරිසිදුයි.

ඒ රෝහල එසේ තිබෙන අතර, දස දහසක පමණ ජනතාවක් සිටින මතුගම නගරයේ ඇත්තේ තවමත් ග්‍රාමීය රෝහලක් පමණයි. කලින් සිටි ඇමතිතුමන් ගිය අවස්ථාවේදී මේ තත්ත්වය දැක අවබෝධ කරගෙන ඒ ස්ථානයට වෛද්‍ය නිලධාරියෙක් දෙන බවට පොරොන්දු වුණා. ඒ එක්කම පාලන අංශයක් හා ගොඩනැගිලි ආදියත් වෛද්‍ය නිවාසත් දෙන බව කිව්වා. තවද දෙඩම්ගොඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවේ සිටින්නේ ඇපොතිකරි කෙනෙක් පමණක් නිසා ඒ ස්ථානයටත් වෛද්‍ය නිලධාරීන් සහ නිවාස දෙන බව සඳහන් කළා. මේ පහසුකම් තවමත් සැලසී නැහැ.

රෙමුණගොඩ, නිරන්තිඩිය, වලගෙදර, කටුගහගේන්න, යටදෙල, ආදී සංචාරක දිස්පැන්සරි තිබෙන නමුත්, ඒ කොටසට අයිති රෝහලක් වශයෙන් තිබෙන්නේ පල්ලේගොඩ වතු රෝහල පමණයි. ඒ රෝහල නම් අර නැබොඩ රෝහල වාගේ කඳු මුදුනක නොවෙයි පිහිටා තිබෙන්නෙ. ජනතාවට යෑම් ඊම් පහසුව ඇති තැනක් වූ ගම මැදයි. එම නිසා එම වතු රෝහල රජයට අරගෙන එය රජයේ ආරෝග්‍ය ශාලාවක් කරන්නේ නම් ඒ වතු හිමියන්ටත් ජනතාවටත් පහසු බවට දැන් කලක සිටම උද්ඝෝෂණයක් කරනවා. එය රජයට භාරගෙන රජයෙන් පාලනය කරන්නේ නම් මතුගම ඡන්ද කොට්ඨාශයෙන් තුනෙන් දෙකකට වැඩි ජනතාවකට සෞඛ්‍ය පහසුකම් ලබාගන්නට පුළුවනි. එයින් විශෙෂයෙන් නොදියුණු ප්‍රදේශවල වාසය කරන ජනතාවට විශාල සේවයක් සැලසෙනවා.

එම නිසා එම පල්ලේගොඩ වතු රෝහල රජයට භාරගෙන රජයේ රෝහලක් කරන ලෙස ඉල්ලා සිටින අතර, මතුගම සහ දොඩම්ගොඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලා දෙකට වෛද්‍ය නිලධාරීන් සහ නිවාස සපයා දෙන ලෙස නැවතත් මතක් කරනවා. ඒ වාගේම රෙමුණගොඩ, නිරන්තිඩිය, වලගෙදර, කටුගහගේන්න සහ යටදෙල සංචාරක දිස්පැන්සරි මධ්‍යම දිස්පැන්සරි බවට පත් කරන ලෙස ඉල්ලා සිටින අතර, හොරවල මධ්‍යම දිස්පැන්සරියට අවශ්‍ය සවීර ගොඩනැගිලි සහ වෛද්‍ය නිලධාරි නිවාස ලබා දිය යුතු බවත් විශෙෂයෙන් මතක් කිරීමට කැමතියි.

මතක් කළ යුතු තවත් විශෙෂ කාරණයක් නම් ගම්වාසීන් විසින් වියදම් කර සාදා තිබුණ කොහොලාන සෞඛ්‍ය මධ්‍යස්ථානය හා දිස්පැන්සරි ගොඩනැගිලි ගංවතුරට කැඩී බිඳී ගොස් තිබෙනවා. එය නැවතත් ගම්වාසීන්ගේ මුදල්වලින්ම සාදා ගැනීම පිණිස සැලැස්මක් හා උපදේශ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතත් තවමත් ලැබී නැහැ. එම නිසා එම ගම්වාසීන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට හැකි වන පරිදි එම මධ්‍යස්ථානයේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

මා අවසාන වශයෙන් ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටින්නේ, හැකි පමණ ඉක්මණින් මගේ කොට්ඨාශයේ නිල ගමනක යෙදීමට අවස්ථාවක් ලබාගෙන මා සඳහන් කළ කාරණා ගැන වටහා ගැනීමෙන් මගේ ඒ ඉල්ලීම් ඉෂ්ට කර දෙන ලෙසයි.

ලක්ෂ්මන් ද සිල්වා මයා. (බලපිටිය)
(திரு. லக்ஷ்மன் டி. சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

සභාපතිතුමනි, පළමුකොටම මුළු බලපිටි ඡන්දදායක කොට්ඨාශයේම ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිතුමාට මගේ අවංක ස්තුතිය පිරිනමනවා. 1969 මැයි 13 වැනි දින සෞඛ්‍ය ඇමතිතුමා පැමිණ බලපිටියේ ආරෝග්‍යශාලාවේ "එක්ස්රේ" යන්ත්‍රය විවෘත කළා. අවුරුදු ගණනාවක් තුළ බලපිටියේ ආරෝග්‍යශාලාවට අඩුපාඩුවක්ව පැවැති "එක්ස්රේ" යන්ත්‍රයක් ලැබීම ඇත්ත වශයෙන්ම සන්තෝෂයට කාරණයක්. එම "එක්ස්රේ" යන්ත්‍රය මේ දක්වා ඉතා සොඳින් වැඩ කරනවා. එහෙත් 1969 මැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

13 වැනි දා "ඇත්ත" පත්‍රයේ පළ වුණේ මොකක්ද? බලපිටියේ ආරෝග්‍ය ශාලාවේ විවෘත කරන්න යන "එක්ස්රේ" යන්ත්‍රය, පාවිච්චි කිරීමට බැරි නිසා කිළි නොච්චියේ සිට ආපසු ගෙනා යකඩ ගොඩක් හැටියටයි, එදා "ඇත්ත" පත්‍රය පෙන්නුම් කළේ. "ඇත්ත" පත්‍රයේ බලපිටියේ වාර්තාකරු එදා ආවා නම් ඔහුගේ පපුවත් පරීක්ෂා කර පෙන්වන්නට පුළුවන්කම තිබුණා. පට්ටපල් බොරු ප්‍රසිද්ධ කරමින් මහජනතාව මුළා නොකර, සත්‍ය ප්‍රවෘත්ති පමණක් ඉදිරිපත් කරන හැටියට මා "ඇත්ත" පත්‍රයෙන් ඉල්ලා සිටිනවා.

කාගේවත් පව්වලට බැණුම් අහන්නටත් සෞඛ්‍ය අමාත්‍යාංශයට සිදු වී තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සඳහාත් අළුතින් ගොඩනැගිලි ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම සිදු වන්නේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙනුයි. තම අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි නොවන නිසා, රජයේ වැඩ දෙපාර්තමේන්තුව අනෙක් අමාත්‍යාංශවලට අයත් ගොඩනැගිලි ඉදි කිරීම් හා අළුත්වැඩියා කිරීම් ආදි කටයුතු ඉක්මනින් කිරීමට කිසිම උත්සාහයක් ගන්නේ නැහැ. මෙවැනි කටයුතු සඳහා වෙනම අංශයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නම් ඇති කර තිබෙනවා. රෝහල් ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් ආදි කටයුතු කලට වේලාවට කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේත් වෙනම අංශයක් ඇති කරනවා නම් විශාල සහනයක් සැලසෙන බව කරුණාවෙන් මතක් කරන්නට කැමතියි.

මගේ ආරාධනයක් පරිදි සෞඛ්‍ය ඇමතිතුමා 1969 මැයි 13 වැනි දින මගේ ඡන්ද දායක කොට්ඨාශයට පැමිණි අවස්ථාවේදී ප්‍රදේශයේ ආරෝග්‍යශාලාවල අඩුපාඩුකම් පෙන්වා දීම සඳහා එතුමා එක් කරගෙන ගියා. ඉඳුරුව, කොස්ගොඩ හා උඟරගස්මන්හන්දිය ආරෝග්‍යශාලාවල ගැබිණි වාට්ටුවල හා සාමාන්‍ය වාට්ටුවල හිඟය පෙන්වා දෙමින් ඒවා සම්පූර්ණ කර දෙන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටියා. ඒවා ඉතා ඉක්මණින් ලැබේ යයි මා බලාපොරොත්තු වෙනවා. අපේ ඉල්ලීම පරිදි වල්ඉඟුරු කැටියට නම් දැනටම සංචාරක බෙහෙත් ශාලාවක් ලැබී තිබෙනවා. එසේම හල්ගහවේල්ලටත් මේ මාසය තුළදීම සංචාරක බෙහෙත් ශාලාවක් ලබා දෙනු ඇතැයි මා විශ්වාස කරනවා. මගේ කොට්ඨාශයට බලපාන කරුණු සම්බන්ධයෙන් මේ වැය ශීර්ෂය යටතේ මට කියන්නට තිබෙන්නේ එපමණක් බව ප්‍රකාශ කරන අතර, මේ අවස්ථාව ලබාදීම ගැන සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)

Mr. Chairman, I thank you for the opportunity given to me of speaking on the Votes of the Ministry of Health.

I would first of all like to thank the Hon. Minister for having granted at least some of the requests put forward by me during the last few years.

I must say that in the present Minister we have one who is not at all biassed by political considerations. He is not influenced by the fact that a Member is in the Government or in the Opposition. He is very considerate and very accommodating. I can say the same things about the hon. and fair Lady, the Parliamentary Secretary to the Minister.

The Hon. Minister took up his portfolio when the malaria epidemic was beginning, and I think his first official visit was to the N.C.P. I must say that due to that visit alone we were in a position to arrest the spread of malaria in the N.C.P.

பூ. ப. 11.45

Regarding the needs of my electorate I would like to say a few words in general. In the Anuradhapura electorate we have a provincial hospital which caters not only to the N.C.P. but also to the adjoining districts, Mannar, Puttalam, Vavuniya and Trincomalee.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The Anuradhapura Provincial Hospital has a bed strength of 630 and invariably we have more than 850 indoor cases. Therefore, additional accommodation is very essential. I think the Hon. Minister is aware of this fact but due to financial difficulties he is unable to accede to the request for more accomodation.

However, I would earnestly request the Hon. Minister to see whether additional accommodation cannot be given at least for two wards—the male surgical ward No. 6 and the female maternity ward No. 2. These two wards are terribly congested, and I would earnestly request the Hon. Minister to consider whether at least semi-permanent buildings cannot be put up. In this connexion I like to mention that sometime ago there was a suggestion to build a temporary waiting hall for the maternity section but for some reason or other this proposal was laid by. I would like the Hon. Minister to look into this matter.

The next important matter concerns the visiting staff. We have a provincial hospital with a bed strength of 630 and we are glad we have practically all the branches of specialists. I would earnestly request the Hon. Minister to consider whether it is not feasible to give us an additional physician, an additional surgeon and an additional obstetrician. I am told that for a second physician, surgeon or obstetrician the general requirement of the department is that there must be a bed strength of 100. In Anuradhapura where obstetrics is concerned we have 95 beds, five beds short of the requirement, but if you take into consideration the floor cases, Anuradhapura qualifies for a second obstetrician.

I know that in the Anuradhapura Provincial Hospital the physician, the surgeon and the obstetrician, the three of them, are over-worked, and an additional hand in each of these fields is very essential.

As regards specialists, there is another general matter I wish to bring to the notice of the Hon. Minister. Among the specialists there is a certain amount of heartburning and discontent in regard to the allocation of hospitals. The present practice is that when a doctor specializes in his own branch and comes back to Ceylon, the allocation of a hospital to him is done on the basis of his seniority in the department. According to that practice a young doctor who goes abroad and returns with a specialist's qualifications, will, however efficient and intelligent he may be, have to wait to take his turn, because another doctor, senior, to him in service, who goes abroad and qualifies after him and returns is given preference.

I suppose this practice was adopted to prevent people with means going abroad, qualifying themselves and returning and getting preference in the matter of specialists' posts in hospitals. But according to the conditions prevailing today most of the doctors who go abroad are those who have got scholarships. I would, therefore, like to make this suggestion to the Hon. Minister: in the allocation of hospitals to specialists, take into consideration the number of years service in the department. I would like you to adopt a points system whereby you could give a point for each year of waiting as a specialist. In that way, you will be able to accommodate some of these specialists who are disgruntled at the moment.

Once again I would urge on the Hon. Minister to appoint the second surgeon, a physician and an obstetrician to the Anuradhapura hospital. Compared to Kurunegala, Ratnapura, Jaffna and Badulla, I think Anuradhapura needs consideration.

Again with regard to the Anuradhapura Hospital, I wish to say that the Hon. Minister was kind enough to consider one of my requests to discuss the shortcomings of departmental officers in that hospital. At that time I brought to his notice that the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

high pressure sterilizing plant was not functioning and he gave the necessary instructions to put this in order. My information now is that the work has come to a standstill because, as the hon. Member for Balapitiya said, the P. W. D. is not working fast enough. Financial provision has been made and funds given to the P. W. D. Now, I would request the Hon. Minister to get the P. W. D. to expedite the work and have the high pressure sterilizing plant working as, otherwise, the Anuradhapura Hospital will have to send all its materials, linen and so on to Kurunegala by ambulance for sterilzing, and bring them back.

There is another matter which is about the nursing staff at Anuradhapura. I brought this to the notice of the Medical Superintendent and he appears to be a little helpless. These girls have no suitable room to do a change of clothing or to have a meal. I happened to drop in to see the room provided for them and I should say that the conditions are inhuman. I am sure that if the hon. Junior Minister had seen this she would have taken immediate action.—[*Interruption*]. This is a room 10 feet by 8 feet and there are three beds but there are no chairs. These girls have to sit on the bed and have their meals, and if someone goes to the closet they can see what is happening inside while they are having their meals. I would request the Hon. Minister to see that the girls who come from outside are given a suitable room to change and to have their meals.

There is a long-standing request of mine, namely, that there should be a physiotherapy section at Anuradhapura. This is an agricultural area and those people come with all sorts of aches and pains. A physiotherapy section in the Anuradhapura Hospital is a must.

As regards the nursing staff again, I am wondering what the Government proposes to do regarding the recruitment of nursing staff. During the last two years the recruitment of nursing staff has come to a standstill and no more recruitments are taking place. At this rate, by 1970, the nurses training schools will have to close down and be made use of some other purpose. Most provincial hospitals are handicapped for want of nurses and it is most advisable for the Hon. ister to stretch a point with the Cabinet and get financial provision to recruit some more nurses who are badly needed.

ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)

(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)

(The Hon. E. L. Senanayake—Minister of Health)

We are doing that.

රත්නායක මයා.

(திரு. ரத்னயக்க)

(Mr. Ratnayake)

Regarding the requirements of the rest of my electorate, I want to refer to one matter about the Rajangana Colonization Scheme maternity home. The Hon. Minister opened a dispensary six or seven months ago and it is doing useful work. The maternity home building is complete, but there again the Land Development Department is gong very slow in providing water, and, I think, this is the case also with regard to the quarters for the attendants and labourers. I must say this in fairness to the Medical Department. I have urged this earlier. There is no co-ordination. When the Ministry of Land decides on the location of these dispensaries and maternity homes, it does so without consulting the Health Ministry. It would be advisable if the Ministry of Land locates these units in consultation with the Ministry of Health. Sometimes it locates these units in a place where the Ministry of Health is not aware that a dispensary or a maternity home is coming up for some colony or other. All of a sudden they call upon the Ministry of Health to have them opened, and it is then

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that the Ministry of Health open their eyes to the need for personnel, equipment, medicine, etc. If there is better co-ordination between the two Ministries, I am sure better use could be made of the medical facilities provided in the colonization schemes. I would urge upon the Hon. Minister to have a maternity home opened at Rajangana as early as possible.

Up to 1964, in the N. C. P. we had two mobile dispensaries, two vans called "Maithri" and "Karuna" visiting the area. There was a programme drawn up for them and they visited various centres to cater especially to the backward villages where we just cannot afford to have dispensaries because of the number of patients coming. Since 1964 the services of these mobile vans have been denied to the people. I do not know what has happened, but I am told that these vans are being used as ambulances. I should like the Hon. Minister to consider this matter and see whether he could get these mobile dispensaries functioning again. They had been doing good service in the N. C. P. if they function well the number of patients attending the O. P. D. of the General Hospital in Anuradhapura and even the central dispensaries, is bound to drop.

I have brought to the notice of the Hon. Minister the bare minimum of medical facilities that we require in the Anuradhapura area, and I hope he will be able to grant our requests early.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Does the House agree to go on till 12.15 P.M.? There are several Members who want to speak for five minutes each. I want to give them an opportunity.

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Aye!

ලීලාරත්න විජේසිංහ මයා. (පොළොන්නරුව)
(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)
(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවේදී අප පළාතේ ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලයේදී භයානක අන්දමින් පැතිර ගිය මැලේරියාව මර්දනය කිරීමට ඉතාම ඉක්මණින් කටයුතු යෙදීම ගැන මා ගරු ඇමතිතුමාට ස්තුති කරනවා. එතුමා එසේ ක්‍රියා නොකළා නම් එදා අපේ ප්‍රදේශයේ ජනතාවට ඉතාම අමාරු තත්ත්වයකට පත් වන්නට සිදු වෙනවා. මැලේරියාව මැඩීමට අලුතෙන් බෙහෙත් ලැබෙන නිසා බිය වන්නට එපායයි එදා එතුමා අපට දන්වා සිටියා.

අප බොහෝ කාලයක් තිස්සේ අපේ ප්‍රදේශයට ශල්‍ය වෛද්‍යාගාරයක් ඉල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමා පසුගිය අවුරුද්දේ අගෝස්තු මාසයේදී පොළොන්නරුවට ගිය අවස්ථාවේදී අප මේ ඉල්ලීම ගැන එතුමාගේ අවධානය යොමු කෙරෙව්වා. එතුමා ඊට ඇහුම්කන් දීමක් වශයෙන් දැන් එහි වැඩ ටිකක් දුරට කෙරීගෙන ගොස් තිබෙනවා. අවශ්‍ය බංගලා ආදිය දැන් සාදාගෙන යනවා. අපගේ කාලය තුළදීම මෙම ශල්‍යාගාරය විවෘත කරන්නට ගරු ඇමතිතුමා කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පොළොන්නරුවේ ආරෝග්‍යශාලාවට ලේ බැංකුවක් ලබා දෙන ලෙසද අප ඉල්ලා තිබෙන නමුත් එය නම් තවම ඉෂ්ට වුණේ නැහැ. එය පරක්කු වීම ගැන මා කණගාවු වෙනවා. කුල් පෙට්ටිය සොයා ගන්නට මෙතෙක් නොහැකි වීම නිසා මේ ලේ බැංකුව පිහිටුවීම ප්‍රමාද වන බවයි මට දැන ගන්නට ලැබී තිබෙන්නේ. හදිසි ලෙඩකුට ලේ දීම අවශ්‍ය වුණොත් මාතලේ වැනි දුර බැහැර ආරෝග්‍යශාලාවකට එම රෝගියා යවන්නට සිදු වෙනවා. එම නිසා පොළොන්නරුවේ ආරෝග්‍යශාලාවට ලේ බැංකුවක් ඉතාම අවශ්‍යයි. මේ ඉල්ලීමද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

ඉක්මණින් ඉෂ්ට කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.

පොලොන්නරු දිස්ත්‍රික්කයෙහි ආයුර්වේද බෙහෙත් ශාලාවක් නැති නිසා ඒ පළාතේ ජනතාව ප්‍රයෝජන ගන්නේ අනුරාධපුරයේ ආයුර්වේද බෙහෙත් ශාලාවෙනුයි. මේ තත්ත්වය නිසා පොලොන්නරු දිස්ත්‍රික්කයට ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක් ලබා දීම ඉතාම අවශ්‍ය කාරණයක්. මනම්පිටියේ ග්‍රාමීය රෝහලක් ඇති කිරීම පළාතට විශාල උපකාරයක් වන කරුණක්. මනම්පිටියෙහි තිබෙන්නේ මාතෘ නිවාසයක් පමණයි. එහි ඩිස්පැන්සරියක් තිබෙන නමුත් එතැනින් බෙහෙත් ගැනීමට හැතැප්ම 10 ක් 15 ක් එන්නට බොහෝ දෙනාට සිදු වෙනවා. මාතෘ නිවාසයේ තිබෙන ඩිස්පැන්සරියම ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවක් බවට පත් කොට වාට්ටු දෙක තුනක්වත් එහි ඇති කළොත් ඒ ප්‍රදේශයේ වාසය කරන වැදි ජනතාවටත්, ඒ වාගේම සිංහල, දෙමළ, මුසලිම් ආදී ජනතාවටත් විශාල ශාන්තියක් සැලසෙන බව මා විශේෂයෙන් මතක් කරනවා. රජය ඇතැම් පළාත්වල මාතෘ නිවාස වසාගෙන යනවා යයි වලපනේ මන්ත්‍රීතුමා කිව්වා. අලුතෙන් මාතෘ නිවාස ගණනාවක් ඉදි කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නයි මට සිදු වී තිබෙන්නේ. අවුරුදු හත අටක් තිස්සේම මාතෘ නිවාස සඳහා අය වැය ඇස්තමේන්තුවලිනුත් මුදල් වෙන් කෙරෙනවා. එහෙත් මගේ පළාතේ නම් අලුතෙන් එකම මාතෘ නිවාසයක්වත් විවෘත කර නැහැ. මහ රෝහලේ තිබෙන මාතෘ නිවාසයත් තවත් මාතෘ නිවාස දෙකකුත් ඇතුළු මාතෘ නිවාස තුනයි මගේ පළාතට තිබෙන්නේ. පරාක්‍රම සමුද්‍රය, අරණගම්මන, කාලිංග ඇළ යන ස්ථාන තුනට මාතෘ නිවාස තුනක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

දවල් 12

සෞඛ්‍යය අතින් පොලොන්නරු ප්‍රදේශය පවතින්නේ ඉතාම නොදියුණු තත්ත්වයකයි. පොලොන්නරුවේ මහ රෝහලේ තත්ත්වය හුඟක් දුරටම පිරිහී තිබෙන්නේ එහි විශේෂඥ වෛද්‍යවරුන් නොමැති නිසායි. මේ තත්ත්වය නිසා පොලොන්නරු ප්‍රදේශයේ ලෙඩුන් මහ පොළවේ තමයි තබන්නට වෙන්නේ. සෑහෙන ගණනක් අනතුරට භාජන වෙනවා. විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා රෝගීන් මාතලේ රෝහලට ගෙන යාමේදී ඔවුන්ට මහ මග මැරෙන්න සිදු වෙනවා. පොලොන්නරුව රෝහලෙහි තිබෙන්නේ එකම එක ගිලන් රථයයි. එය කැඩුණු අවස්ථාවකදී කොතරම් හදිසි රෝගියකුට වුවත් විශේෂඥ වෛද්‍යවරයකුගේ උපදෙස් ලබා ගන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ.

පොලොන්නරුවේ ආරෝග්‍යශාලාවේ බඩු භාණ්ඩ ගැනත් මා වචනයක් කිව යුතුයි. එහි රෙදි පිළි හිඟයකුත් පිස් පෝච්චි හිඟයකුත් පවතිනවා. ඒ වාගේම අල්මාරි හිඟයක් ද තිබෙනවා. මේ බඩු භාණ්ඩ හිඟය පොලොන්නරු රෝහලට තදින්ම බලපානවා ලෙඩෙකුට දෙන්නට කොට්ටයක් පවා නැති වන අවස්ථා තිබෙනවා. ඒ වාගේම මදුරුවන්ගෙනුත් මැස්සන්ගෙනුත් රෝගීන්ට හිරිහැර ඇති වෙනවා. වියලි කලාපයේ පායන කාලයට මැස්සන් වැඩියි. වර්ෂා කාලයට මදුරුවන් වැඩියි. වියලි කලාපයේ ආරෝග්‍ය ශාලාවලට මදුරු දැල් ටිකක් සපයනවා නම් බත් වේලක් දෙනවාටත් වැඩි ප්‍රයෝජනයක් අත් වන බව මා මතක් කරනවා. මදුරු දැලක් තිබෙනවා නම් අඩු වශයෙන් සැනසිල්ලේ නිදා ගන්නටවත් පුළුවන් වෙනවා. එම නිසා වියලි කලාපයේ ආරෝග්‍යශාලාවලට මදුරු දැල් සපයන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. පොලොන්නරුව ආරෝග්‍ය ශාලාවේ මෘත ශරීරාගාරය මනුෂ්‍යත්වයට කරන නින්දාවක්. ඒ මෘත ශරීරාගාරය සාදා තිබෙන්නේ 1909 දීයි. ඒ කාලයේ මුළු දිස්ත්‍රික්කයේම ජනගහණය හාර පන්දහසකට වැඩි වූයේ නැහැ. ඒ කාලයේ සාදා තිබෙන මේ ගොඩනැගිල්ලට අද වන තෙක් කිසිම ප්‍රතිසංස්කරණයක් කර නැහැ. ඒ මෘත ශරීරාගාරයේ මිනී දෙකක් පමණයි තැබිය හැක්කේ. එකම ඇඳයි තිබෙන්නෙ. මිනී කපන්නෙත් එතැනමයි. අලුතෙන් මිය යන රෝගීන්ගේ සිරුරු දමන්නෙත් එතැනමයි, හදිසි අනතුරකින් හෝ වෙනයම් හේතුවකින් හෝ මිනී දෙක තුනක් තබන්නට සිදුවුණොත් මහ පොළවේ තමයි තබන්නට වෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වර්ෂා කාලයට මෘත ශරීරාගාරය වතුර ගොඩක්; මඩ වගුරක්. ඒ පැත්තටවත් යන්නට බැහැ. අවසාන වරට සැතපෙන්නේ එතැනයි, එතැනින් තමයි වළට ගෙන යන්නෙ. එමනිසා පොලොන්නරුවේ මහා රෝහ්‍යශාලාවට අලුතෙන්ම මෘත ශරීරාගාරයක් තනා දෙන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
මිනිත්තු පහ අවසානයි.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
මිනිත්තු දහයක් දේවිය කියා මා සිතුවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
මිනිත්තු පහ බැගින් කථා කරන්නට පුළුවන් අයට 12.15 වන තෙක් කථා කරන්නට දෙන බව මා පැහැදිළිවම කිව්වා.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
පොලොන්නරුව ප්‍රදේශයේ වින්නඹු මාතාවන්ගේ ගණනත් බොහොම අඩුයි. ඒ ප්‍රදේශයට වින්නඹු මාතාවන් 15 දෙනෙකු පමණ වුවමනා කරනවා. අඩු වශයෙන් වින්නඹු මාතාවන් තිදෙනෙකුවත් වහාම ලබා දෙන මෙන් මා ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, ඊයේ සැන්දෑවේ හය වන තෙක් මා බලාගෙන සිටියා. නමුත් වචනයක් වත් කථා කරන්නට ලැබුණේ නැහැ. දැනුත් විනාඩි පහයි ලැබුණෙ. මේ කාලය බෙදීම ගැන අපේ සංවිධායකතුමාටත් තමුන්නාන්සේටත් මගේ බලවත් අප්‍රසාදය පළ කරනවා.

මංගල මූණසිංහ මයා. (බුලත්සිංහල)
(திரு. மங்கள முனசிங்க—புளத்சிங்கள)
(Mr. Mangala Moonesinghe—Bulathsinhala)

Mr. Chairman, I will try to keep to the time allotted to me. I have just one or two matters to raise regarding my electorate. I do not know whether the Hon. Minister is aware that we have no hospital at all in the Bulathsinhala electorate. This causes much inconvenience to the people. The nearest hospital is 15-20 miles away. If a person falls ill in the night—particularly a man who works on a chena—he has to walk the whole night, a distance of about 20 miles. If a child falls ill, by the time he gets to the hospital the child would be dead. At every D. C. C. meeting I have been pressing the need for a medical unit or a rural hospital in my electorate. Year in, year out, this has been given top priority, but nothing has happened.

There is a hospital in Matugama, although it does not fall within the Bulathsinhala electorate. It serves some of the people in Bulathsinhala. This is the Kendakaduwa Hospital. It is in a very dilapidated condition. When you enter it you can see that it is completely neglected. The beds have no sheeting; some have mattresses, but they are torn and ripped open, the fibres coming out. Most beds do not have any mattresses at all and the people just sleep on planks. It was a beautiful hospital at one time. It functioned well during the colonial regime, but it has been neglected. I think something could be done to improve the hospital if you spend a little money on it.

I want to make a point about the All-Ceylon Nurses Union. I think the Hon. Minister is aware that there are three unions. The All-Ceylon Nurses Union has the highest membership of 3,000. This union has made representations to me that the department has sanctioned an office for one union only. In St. Peter's Home there is an office for only one union. It is unfortunate that that union does not have such a big membership as the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

union I am speaking of. No other union has an office. I would request the Hon. Minister to please look into this matter. It is utterly undemocratic and unfair that one union should be given all the facilities while the other unions are not looked after. Their grievances are not looked into.

I am informed that whenever this particular union which has an office in the hospital makes a request to the department, it is readily granted—even transfers which may not be quite correct or legal. I would request the Hon. Minister to look into this aspect of it. The aggrieved union has met the hon. Parliamentary Secretary before this at various conferences, and she has agreed to grant certain requests made by them.

They make the point that there is a three-year period of training for nurses, and after the training period they have to wait another three years before they are allowed to marry. I think the hon. Parliamentary Secretary agreed with the union that she would reduce it by one year, making it five years in all, but this has not yet been implemented. I would ask the Hon. Minister to implement it.

The nurses need a rest-room in the General Hospital. There are nurses who come for duty at 7 o'clock in the morning ; they work till 12 noon and then get a break till 12 to 3 P.M. and they go on again till 7 o'clock. Some of the nurses who do not live in, come from places as far away as Horana. The Hon. Minister knows that a nurse is on her feet almost all the time, and she needs some place in the hospital to rest. There is no proper rest room at present. I am told that there is a small rest-room which is absolutely inadequate, it is not capable of holding even three people. The Hon. Minister should look into this matter and see that the nurses are provided with a proper rest-room. They really need one to change their clothes and to relax in between their duty turns.

There is also the question of the eight-hour shift which was discussed with the hon. Parliamentary Secretary. I understand that it was agreed to give this a trial for two weeks, with shifts from 7 in the morning till 4 in the afternoon and again from 12 noon till 7 in the evening. It has been agreed to give this a trial in the Eye Hospital, and I understand that everybody is agreed on that. I would request the Hon. Minister to please implement this proposal which has been discussed with the unions.

There is one matter which I would ask the Hon. Minister to view with sympathy, at least on humanitarian grounds. There is a category of nurses who are called emergency nurses who were taken in during the last war. They are still paid a salary of Rs. 111.50 a month. From time immemorial their salary has not been revised. Apart from that, when the time comes for them to retire they will not be entitled to a pension. They were recruited during the war when there was a shortage of nurses, and they have spent their whole life in the service of the public. I would request the Hon. Minister to really do something about these nurses.

Finally, on the question of occupational therapists, I understand that there is a cadre of 16, but that there are only 8 occupational therapists now in service. I should like the Hon. Minister to look into this question and see that the vacancies are filled. They are an important section of the staff. The Hon. Minister should also look into the question of a risk allowance for them.

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මුතූර් පළමුවන මන්ත්‍රී)

(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

Mr. Chairman, I am thankful to you for giving me time to speak at least for five minutes. First of all, let me offer a bouquet to the Hon. Minister of Health and his charming

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Parliamentary Secretary who are always very helpful and obliging to people who go to them.

Now, Sir, I come from a district which is represented by three Members of Parliament. Our capital is Trincomalee. It has a base hospital. I wish to ask the Hon. Minister to see that the long promised X-ray plant is sent to the Trincomalee Base Hospital as early as possible. There has been agitation over a long period for the installation of this X-ray plant but so far nothing has been done about it. Patients who are expected to take X-rays are sent to the Naval Hospital. There too, very often, we find certain machinery breaking down. I have brought to the notice of the Hon. Minister that at the Naval Hospital there was an X—ray plant but minus a technician. They had a technican but he was transferred to Colombo on promotion, and they were training a young technician and he too got a commission in the navy as an officer ; the people have now been put to a great deal of difficulty. I would request the Hon. Minister to consider this matter very seriously.

In my own electorate, Mutur, there is a cottage hospital which is going to be up-graded very soon. I want this hospital to be provided with all modern amenities, nurses, nurses' quarters, and so on. Mutur has got electricity. A refrigerator for the Mutur Hospital is very necessary because serious patients are compelled to be taken to Trincomalee for specialist treatment. I would also request that an ambulance launch be provided for the use of the public of Mutur.

Then, Sir, in Kinniya there is a peripheral unit hospital which is in charge of two apothecaries. We have clamoured for a medical officer for the last few months because the population of Kinniya is about 25,000. The Hon. Minister was good enough to send a medical officer and at the Hon. Minister's request I found him accommodation. But unfortunately the medical officer has used his influence and got his transfer cancelled. I hope the Hon. Minister will consider our request.

In my own electorate there are a number of dispensaries and there are a number of villages which are not served by midwives ; for example, there is a village called Kiliveddi which has no midwife. Earlier we had a midwife there. There are two midways in the Mutur area and both of them come from the same D. R. O's division. I would request that one of them be shifted to Kiliveddi.

I appeal to the Hon. Minister to provide the dispensaries and hospitals in my electorate with the required drugs and other amenities which are necessary for the benefit of the patients and the public.

Then, with regard to ayurveda in which I am interested, we have a young, efficient, Commissioner of Ayurveda, Mr. Wimal Navagamuwa. He is doing a good job of work. He should be given all the assistance to carry out his plans and the proposals that are being approved by the various boards such as the Ayurveda Medical Council and the College Hospital Board. There are one or two other boards which also take an interest in the development of ayurveda.

Under ayurveda, there are three systems of medicine, namely, ayurveda, siddha and unani. I would humbly appeal to the Hon. Minister to give equal recognition to all three systems of medicine and to see that the ayurveda hospitals and dispensaries are opened wherever possible in all parts of the country along with the hospitals where Western treatment is given. If this is done, it will pave the way to a solution of the unemployment problem too.

Then, on the question of family planning, I have said earlier that I am not personally opposed to it. The unfortunate thing is that owing to unemployment procreation has become a sort of recreation. When

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

people are unemployed they procreate more and more. We must try to find ways to stop this sort of thing by providing employment to people so that they may concentrate on work and the development of the country, economically and otherwise.

Finally, I wish to refer to an open memorandum that has been submitted to the Cabinet by the All Ceylon Nurses' Association requesting the establishment of a practical nursing school as a national need.

I do want the Hon. Minister to kindly consider these matters. Further, I would urge him to help my district and electorate by providing all the medical needs so that the people there may live in good health and amity and as strong men and women in the years to come.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

Order, please! The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව නාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

ජේ. පී. ඔබයසේකර මිය. (මීරිගම)

(திருமதி ஜே. பீ. ஒபயசேக்கர—மீரிகம)

(Mrs. J. P. Obeysekere—Mirigama)

Mr. Chairman, I would like to endorse what the hon. Member for Anuradhapura (Mr. Ratnayake) said about the Hon. Minister of Health. I am only sorry that he was not the Minister of Health from the very inception of this Government. At the same time I would like to endorse what was said about the hon. Parliamentary Secretary to the Minister of Health. I must say that for the last four and a half years a greater share of the work that has been carried out successfully has been entirely due to her efforts, hard work, perseverance, and quick decisions.

Under these Votes it is my desire to raise one or two matters concerning my electorate. I have already seen the Hon. Minister about a visiting dispensary for Botale Ihalagama.

ගරු ඊ. එල්. සේනානායක

(கௌரவ ஈ. எல். சேனநாயக்க)

(The Hon. E. L. Senanayake)

It has been done.

ඔබයසේකර මිය.

(திருமதி ஒபயசேக்கர)

(Mrs. Obeysekere)

If action has been taken in regard to the matter, I do not wish to deal with it further, but I would request the Hon. Minister to kindly direct the Director of Health Services to expedite it because for the last four and a half years I have been asking for it and I think the Hon. Minister himself realizes the necessity for it.

The other matter I want to raise is with regard to the ambulance provided at the Mirigama Hospital, which is more often in the garage than on the road. It is really a wreck. I do hope that the Hon. Minister will provide this hospital with a better ambulance early.

Now I should like to refer to the question of recruitment of nurses. Mention was made of certain problems that the nursing profession has, and I am not going to repeat all that. I think that when recruiting nurses to the nursing school special emphasis must be laid on selecting the correct type of person. We have excellent medical facilities and excellent doctors in every sphere, but I feel that the quality of nursing can be improved. The present position is perhaps due to the fact that some of our girls take to nursing merely as a job and not as a vocation. If nursing is included in the curriculum of our schools as a subject I think we shall

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

be able to get the type of girl who has the aptitude and the desire for nursing work. If we can recruit that type of girl I am sure the nursing profession would be better than what it is today.

I would also like to make a few comments on the Cancer Hospital at Maharagama. When this Government came into power I remember that the then Minister of Health promised to give 250 beds to this hospital, but up to date nothing has been done about it. You will agree that this hospital is not as it should be. Its requirements should be given priority for the reason that cancer patients suffer much and do not live long. I urge that the provision of 250 beds for this hospital be given top priority, for over four and a half years have elapsed since that promise was made. I shall be very grateful if this matter is settled as expeditiously as possible.

The other matter I want to refer to is regarding the Castle Street Maternity Hospital, the premier medical institution for women. Seeing is believing, Mr. Chairman, but of course I would not expect the Hon. Minister to be an inmate of this hospital.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member is behind the times. Changes of sex have taken place, and he may yet enter this hospital.

ඔබයසේකර මිය.
(திருமதி ஒபயசேக்கர)
(Mrs. Obeyesekere)

If one has the privilege of staying a few days in that hospital one would really see the difficulties that the staff and the medical officers have to undergo in performing their duties. The Castle Street Maternity Hospital has a bed strength of 350, but very often they have 400 to 500 patients. I am subject to correction, but from what I gather there are 38 nurses, 25 post-graduate midwife trainees, 25 training as midwives, nine sisters, one matron, one theatre sister, one labour sister and a sister for the premature baby unit. Those members of the staff, the doctors, matron and sisters, do a wonderful job of work there, but they can do with more staff. There is one nurse for a ward and one nurse on night duty for two wards. I think they take it in rotation at the De Soysa Lying-in Home and each ward takes it in rotation too at the Castle Street Hospital. On emergency nights really it is absolutely chaotic there. You have about 25 to 30 deliveries taking place throughout the night. The labour room is so small. I see a new premature baby unit has been built, but what is most urgently needed there is a good labour room.

There are a very few beds and on emergency nights patients deliver on trolleys or on anything else they are lying on ; and in regard to the babies, there are only about three or four cots, and about five infants are put into one cot. This goes on right through the night. There is only one midwife to clean the babies and prepare them and that one midwife does not know that it has dawned because she is working single-handed throughout the night.

In the labour room itself two or three nurses attend to the deliveries. Not only have they got to deliver the babies but they have also got to do the clerical work. Here, while the poor mother is trying to deliver her baby, she is being asked her name, her age, her village and everything else and then when the baby is born those things have to be looked into and all the statistics have to be written. If you can provide extra hands to do the clerical work, I think the nurses can do what they have to do. This is something which I saw for myself and I think it is only if you can see it for yourself that you can understand the difficulties they have to go through during an emergency night.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඔබයේ කර මිය.]

Even in regard to the admission of patients the same procedure goes on. There is one nurse on night duty. She has to do all the clerical work and go through all the formalities for admitting a patient.

Then in the post-natal ward there is definitely much more work than in the pre-natal ward. In the post-natal ward there are sometimes 40 mothers and 40 babies and one nurse, one attendant, one midwife to attend to all the work. Besides that there are gynaecological cases, forceps cases and caesarean cases. All these cases have to receive attention. They have to see to the feeds of the babies. The babies must be kept clean. And there are just three people to do all this work.

I would very specially ask the Minister of Health to discuss this matter with the specialists, the doctors and the staff at the Castle Street Hospital. I think they are the best people who can advise him. In regard to the people in the head office, it is a sad thing but very often our medical men when they get to the head office forget the difficulties they have experienced themselves in the hospitals they once worked in. Sometimes maybe they forget to give you that necessary advice.

Therefore I suggest to you to discuss it with the hospital doctors themselves and the staff and I am sure you can find a solution quite easily if you discuss it with them. And all they need are extra hands on those special days.

I am not going to talk any further, but there is one other point that occurs to me. Talking about congestion and overcrowding, there is another ward I saw in the General Hospital the other day, the Neuro-Surgeon's Ward. There again I was very sad to see two or three infants in one cot and these are infants and children who need special treatment. When the doctors are there the nurses of course are on their very best behaviour. I happened to be there at a time when the doctors were not there and I was sad to see one feeding bottle being stuck in two or three children's months at the same time. The same bottle was being used for a number of children without sterilizing it.

These are little matters which, I think, could be rectified if you take in more staff, more doctors and more nurses and I am sure if the Hon. Minister and the Junior Minister were to discuss these matters at that level, you would be able to get a solution to all these problems.

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා. (මුතූර් දෙවන මන්ත්‍රී)

(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)

(Mr. A. L. Abdul Majeed—Second Mutur)

There is just one matter I should like to raise with the Hon. Minister of Health. Will the Hon. Minister please take the necessary steps to provide a X-ray plant for the Trincomalee Base Hospital? I shall be glad if the Hon. Minister would please look into this matter and do the needful.

වී. අන්නා මලෙයි මයා. (පත්කරන ලද මන්ත්‍රී)

(திரு. வீ. அண்ணாமலை—நியமன அங்கத்தவர்)

(Mr. V. Annamalay—Appointed Member)

Sir, I am very happy that the Hon. Minister of Health knows the living conditions of workers on estates very well. He is very sympathetic towards the cause of the estate workers. I should like to bring to his notice the conditions in which these workers are living in estate lines. There is heavy congestion, and in many cases they live in insanitary conditions. I would request the Hon. Minister to please prod the inspecting medical officers who are now not regularly visiting

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

these estates and who are also not submitting their reports. These medical officers are not looking after the interests of these workers. I do not know the areas covered by them, but I know that annual inspections are seldom conducted on these estates. Qualified medical officers are finding it difficult to get employment in Government Service, and the cadre of the M. O. H. grade could be increased to meet the increasing demand for health services.

I would also ask the Hon. Minister to look into the question of infant mortality on estates, where the rate is very much higher than in the rural areas. There is provision under the Medical Wants Ordinance for medical officers to see to the health conditions of infants, particularly those of the age of one year and less. So the Hon. Minister has the power to direct superintendents to look after infants on estates as directed by the medical officers.

I should also like to request the Hon. Minister to kindly consider the question of free feeding of these children. In the rural areas the Government provides free milk. In regard to estates, there is provision that estates should provide milk to children under one year of age, but the quantity of milk that should be given is not defined.

I hope the Hon. Minister, who is very sympathetic towards the working class, who has seen them at work and who has been with them, will consider their plight and give his attention to improving their health conditions.

I want to say a few words with regard to the accommodation provided for these workers. There are estate lines which are in a very dilapidated condition. The proprietors do not care to spend even a cent on these estate lines. When prices fall, they make that an excuse not to attend to repairs. Of course, we can understand that. There may be difficulties, and we can sympathize with the employers. But when times are good and commodities fetch high prices, even then they do not take note of these needs. So, regular inspections and sudden checks will go a long way towards improving the lot of these workers. I hope that at least the medical officers will make it a point to visit estates regularly—at least once a year—and submit a report to the Director of Health Services on the living conditions of workers so that timely action could be taken to provide them with some relief in view of the great difficulties they are undergoing.

අ. භා. 2.15

ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා. (පැල්මඩුල්ල)
(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු සභාපතිතුමනි, ඊයේ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ මා කථා කළේ නැහැ. ඒ නිසාත් මගේ හිත මිත්‍ර බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමාගේ කාලයත් ගන්නටය කියන නිසාත් අඩු වශයෙන් මිනිත්තු විස්සක්වත් දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

ඔය පැත්තෙන්ම තවත් ගරු මන්ත්‍රීවරුන් හය දෙනෙකු කථා කරන්නට බලා පොරොත්තු වෙනවා. ඒ අයගෙන් කාලය ඉල්ලා ගන්න.

ධර්මදාස මයා.
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)

ගරු සභාපතිතුමනි, අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල වැඩි වී තිබෙන නිසා, ඒ ද්‍රව්‍ය මිළදී ගැනීමට පළුවන් වන ආකාරයට ගම්බද ජනතාවට මුදල් උපයා ගැනීමේ ක්‍රම නැති නිසා, ගම්බද ජනතාව අද මන්ද පෝෂණයෙන් පෙළෙනවා. මන්ද පෝෂණයෙන් පමණක් නොවෙයි, ඒ හේතුකොට ගෙන ගම්බද ජනතාව තවත් නොයෙකුත් රෝගවලින් පෙළෙන බව අප දන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධම්දාස මයා.]

දෙයක්. රෝහල් කරා පැමිණෙන රෝගීන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වැඩි වෙනවා. ඒ වැඩි වන රෝගීන්ගේ සංඛ්‍යාවේ හැටියට ආරෝග්‍යශාලාවලට වුවමනා කරන බෙහෙත් වර්ග නොලැබෙන බව මා පළමුවෙන්ම මතක් කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ සෑම ආරෝග්‍යශාලාවකම වාගේ ඒ තත්ත්වය පවතින බව මා මතක් කරන්නට ඕනෑ. ඒ සමහර රෝහල්වල ඇස්පිරින් වැනි මූලික ඖෂධ වර්ග පවා නිඟයි. රත්නපුර ආරෝග්‍යශාලාවේත් ඒවාගේම කහවත්ත ආරෝග්‍යශාලාවේත් ඔය අඩුපාඩුකම් පවතිනවා.

ඊළඟට රෝහල්වල තදබදය ගැන වචනයක් කියන්නට තිබෙනවා. රත්නපුර රෝහලේ තිබෙන්නේ ඇඳන් 689 යි. නමුත් සෑම දිනකම වාගේ ඒ රෝහලේ ලෙඩුන් 1,200 ක් පමණ සිටිනවා. කහවත්ත රෝහලේ තත්ත්වයත් ඒකයි. මේ රෝහල්වල පමණක් නොවෙයි, දිවයිනේ සෑම ආරෝග්‍යශාලාවකම තත්ත්වය ඒකයි. මේ රෝගීන්ගෙන් සාමාන්‍යයෙන් සියයට 45 ක පමණ පිරිසකට දිවා කාලයේ සිට ගෙන ඉන්නටත් රාත්‍රී කාලයේ ඔය ඇඳන් යට පැදුරු දමා ගෙන නිදා ගැනීමටත් සිද්ධ වී තිබෙනවා. ඒ තත්ත්වය නැති කර ලීමට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයට බලපාන කහවත්ත රෝහලේ ලෙඩුන් එහා මෙහා ගෙන යාමට ට්‍රොලියක්වත් නැති බව මට පසුගිය දිනක දකින්නට ලැබුණා. එවැනි අඩුපාඩුකම් නැති කිරීමට කටයුතු යොදන මෙන් මා ඉල්ලා සිටිනවා.

නිර්වින්දන අංශය ගැනත් කෙටියෙන් වචන ස්වල්පයක් කිවයුතුව තිබෙනවා. රත්නපුර රෝහලේ සිදුවූ යම් සිද්ධියක් ගැන මීට ප්‍රථමයෙනුත් මා කරුණු ඉදිරිපත් කළා. ඊට පසු රත්නපුර රෝහලේම විසි පස් දෙනෙකුට වැඩි ගණනක් මේ නිර්වින්දන වරදවල් උඩ මරුමුවට පත් වූ බව ඒ පළාතේ කවුරුත් දන්නා දෙයක්.

විරුද්ධ පාර්ශ්වයේ නායකතුමියත්, යටයන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) අපේ කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ අභාවය ගැන සඳහන් කළා. අද උදය වරුවේ කථා කළ නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්‍යවරයා නාගනාතන්) කීවා, හරි හැටි කරුණු නොදන්න මන්ත්‍රීවරුන්ගේ මෝඩ කථා ගැන කණගාටු වෙනවාය කියා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් ඒ විධියේ කථාවක් කියා නල්ලූර්හි ගරු මන්ත්‍රීවරයා තමන්ගේ මන්ද බුද්ධික භාවය ප්‍රකාශ කිරීම ගැන අපත් කණගාටු වෙනවා. ඉඩම් සංවර්ධන ඇමතිතුමා මෙතැන කථා කර ගෙන යන විට නැගිට කිව්වා, වෙදකම් කරන්ටත් පුරුදු වන්න ඕනෑය කියා. වග කිවයුතු ඇමතිවරයකු වශයෙන් එතුමා ඒ ප්‍රකාශය කිරීම ගැන මා කණගාටු වෙනවා. වෙදකම සම්බන්ධයෙන් පුරුදු වන්නේ—අත්හදා බලන්නේ—කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ ජීවිතය වැනි වටිනා ජීවිත සමග පොර බදමින්ද කියා මා අහන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, නිර්වින්දන අංශයේ මොකක් හෝ වරදක් තියෙනවා. කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ මරණයට පෙර මේ විධියටම එක්තරා ළදරු මරණයකුත් කොළඹ මහාරෝග්‍යශාලාවේ සිදු වුණා. ඒ දෙමාපියන්ට සිටි එකම දරුවා මරණයට පත් වී තිබෙන බව අප පත්‍ර මාර්ගයෙන් දැක්කා. ඊට පසු මව් කෙනකුගේ මරණයක් සිදු වූ බවත්, ඒ මරණය සම්බන්ධයෙන් උසාවියේ දැනට නඩුවක් තිබෙන බවත් අප පත්‍ර මාර්ගයෙන් දැක්කා. කෙසේ වෙතත්, මේ නිර්වින්දන අංශයේ වැඩ පිළිවෙළ ගැන මහජනයා අතර ලොකු කුතූහලයක් පහළ වී තිබෙනවා. එක්කෝ නිර්වින්දන කරන නිලධාරීන් මැඩියන්, හාවන් කපාලීමට සකස් කරන්නා වාගේ නොසැලකිලිමත්ව මනුෂ්‍ය ශරීරත් කපා සැත්කම් කිරීමට කටයුතු කරනවා. එසේ නැත්නම් නිර්වින්දන බෙහෙත්වල වරදක් තියෙනවා. එසේ නැත්නම් මේකත් අර උත් සත්ති පාලනය වගේ සිංහල ජාතියේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ප්‍රමාණය අඩු කිරීමට ගෙන යන සූක්ෂම වැඩ පිළිවෙළක්ද කියාත් සැක සිතෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් වහාම ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වීම ගැන සැලකිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පැල්මඩුල්ල පාර වල් තුනක් එක් වන ස්ථානයක පිහිටි නගරයක්. ඒ පාරවල් තුනෙන්ම පැමිණෙන රෝගීන්ට බෙහෙත් ගැනීමට පහසු වන විධියට, අප දන්නා කාලයේ පටන්, එහි ඩිස්පෙන්සරියක් තිබුණා. ඊයේ පෙරේදා කිසිවකුගේ දැනීමක් නැතිව ඒ ඩිස්පැන්සරිය හැතැප්මක් පමණ එහාට ගෙන ගොස් තිබෙනවා. මා මේ කාරණය දැනගත් වහාම ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ලියාපදිංචි කළ තැපෑලෙන් ලිපියක් යැව්වා. ඒ ලිපියට මට පිළිතුරක්වත් ලැබුනේ නැහැ. ඒ නිලධාරීන්ට වුවමනා හැටියට එතැන කටයුතු කර තිබෙනවා. එය ගරු ඇමතිතුමාගේ ගෞරවය පිණිස නොවෙයි. ඒ ස්ථානය වෙනස් කරනවා නම් ඒ නිලධාරීන්ට යුතුකමක් තිබුනා, නගර සභාවෙන් අහන්නට; එසේ නැත්නම් පැල්මඩුල්ලේ ගම් සභාවෙන් අහන්නට; එසේත් නැත්නම් පළාතේ මන්ත්‍රීවරයාගෙන් අහන්නට. පැල්මඩුල්ල වර්ධනය වෙමින් පවතින ප්‍රදේශයක් බව ගරු ඇමතිතුමා දන්නවා. දැන් ඒ දුප්පත් මව්වරුන් තම දරුවන් වඩාගෙන හැතැප්මක් පමණ දුර රෝහලට පයින් යන්නට ඕනෑ. බස් සේවය දියුණු නැති නිසා බස් එකෙන් යන්නට බැහැ. කාර් එකකින් යන්නට ඒ දුප්පත් මිනිසුන්ට සල්ලිත් නැහැ. කෙටි දුරක් යන්න කාර් එකක් එන්නෙත් නැහැ. ඒ නිසා ඔවුනට පයින්ම යන්නට සිදු වී තිබෙනවා. මෙය ඒ නිලධාරීන්ගේ පෞද්ගලික වාසිය පිණිස කළ වැඩක් බව පිළිගෙන අවසානයි. ගෙවල් හිමියාට ගේ ලබා දීමට මාගීයක් හරිගස්සා දුන්නා. වෛද්‍යවරයා කලින් සිටි බංගලාවේම ඉන්නවා. එයා මස්සිනාගේ නමින් බෙහෙත් සාප්පුවක් දමා තිබෙනවා. වෛද්‍යවරයා 10 වන තෙක් තුණ්ඩු ලියනවා. බෙහෙත් සාප්පුවට ඇවිත් බෙහෙත් කරනවා. අමාරුවෙන් හෝ අර රෝහලට ගිය ලෙඩුන් වෛද්‍යවරයා එන තෙක් බලාගෙන ඉන්නවා. මේ පිළිබඳව ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කර ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මගේ ආසනය තුළ මැලේරියා මර්දන ව්‍යාපාරය ක්‍රියාත්මක වන අන්දම ඉතා කණගාටුදායකයි. රක්වානේ මැලේරියා මර්දන බෙහෙත් ඉහිනවා. රත්නපුර ආසනයේත් එම බෙහෙත් ගහනවා. එම ආසන දෙකට මැදිව පිහිටි පැල්මඩුල්ල ආසනය තුළ මැලේරියා මර්ධනය පිළිබඳ කටයුතු නිසි සේ ක්‍රියාත්මක නොවන බව කිව යුතුයි. මා සිතනවා හදිසියේ වාගේ පැමිණි සේවා වක් මගින් එක් පැත්තකට බෙහෙත් ගැසුවාය කියා. ඒ හැරෙන්නට ස්ථිර වැඩ පිළිවෙළක් එහි ඇත්තේ නැහැ.

ගරු සභාපතිතුමනි, ලංකාවේ සෑම කෙනෙකුට පාහේ නොමිලයේ ලැබෙන බෙහෙත් වර්ග දෙහෙනකන්ද ප්‍රදේශයට ලැබෙන්නේ නැහැ. දෙහෙනකන්ද ගම බොහොම ඈත ප්‍රදේශයක පිහිටි ගමක්. වත්තක පිහිටි ඩිස්පෙන්සරියකින් තමයි එම ප්‍රදේශයේ ජනතාව බෙහෙත් ලබා ගන්නේ. බෙහෙත් දෙන විට සෑම කෙනෙකුගෙන්ම ශත 75ක මුදලක් එම ඩිස්පෙන්සරිය මගින් අය කරනවා. එහි අසාධාරණයක් නැහැ. එහෙත් එම තත්ත්වය මගහැරවීම සඳහා ඒ වත්තේ පිහිටි ඩිස්පෙන්සරියට විශෙෂ ආධාර මුදලක් ලබා දෙන ලෙස මා මතක් කර සිටිනවා. රටේ අනිකුත් මිනිසුන්ට නොමිලයේ ලබාගත හැකිව තිබෙන මෙම පහසුව දෙහෙනකන්ද ගම්වාසීන්ටත් ලබා ගැනීමට ඉඩ සලස්වන හැටියටයි මා ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙබිඩි ප්‍රතිපත්තියක් තිබෙනවා. ගරු ඇමතිතුමා මෙය නොදන්නා දෙයක් නොවෙයි. එහෙත් අපි මේවා ප්‍රකාශ කළ යුතුයි. රත්නපුර රෝහලේ යෝගේශ්වරම් මහතා වැනි දක්ෂ වෛද්‍යවරුන් සිටියා. ඒ උදවිය අවුරුදු 4ක කාල සීමාවකින් පසු මාරු කර යැව්වා. පළාත් පාලන ආයතන මගිනුත් මහජනයා විසිනුත් එවැනි මාරුකිරීම්වලට විරුද්ධව පෙත්සම් පවා යවන ලද නමුත් ඒ එකක් දෙසවත් නොබලා තමුන්නාන්සේලා එම වෛද්‍යවරුන් රත්නපුර රෝහලෙන් මාරු

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඩම්දෑස මයා.]

කර යැව්වා. මෙම ගරු සභාවේදී ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිය විසිනුත් ඒ වාගේම රත්නපුර රෝහල් කොමිටියට තමුන්නාන්සේ විසිනුත් පොරොන්දුවක් දී තිබෙනවා අද එහි සිටින දොස්තර කිරිඇල්ල මහතා ගැන. ගිය අවුරුද්ද අවසාන වන විට කිරිඇල්ල දොස්තර මහතාගේ අවුරුදු 4 කාලසීමාව ඉවරයි. අවුරුදු 4 කාල සීමාව පිළිබඳ නීතිය කාටත් සාධාරණ නම් ඔහු වෙනුවෙන් දැන් එම නීතිය ක්‍රියාවෙහි යොදවා තිබෙන්නට ඕනෑ. එහෙත් එතුමා තවමත් එතන සිටිනවා. අපට ඒකෙන් ප්‍රශ්නයක් නැහැ. අපි කියන්නේ එතුමා ගෙන යන වැඩ පිළිවෙළ ගැනයි. උන් නැහේට කිරිඇල්ල ආසනය තුළ දේශ පාලන කටයුතු සංවිධානය කරන්නට තිබෙනවා. එසේ හෙයින් තමුන්නාන්සේ ගෙන් එක ඉල්ලීමක් කරන්නට මා කැමතියි. එම දොස්තර මහතා වෙනුවට වෙනත් දෙක්ෂ දොස්තර මහතෙක් එතැනට පත් කරන්න. එතුමාටත් වෙනම නිලයක් හරිගස්සා දෙන්න. "සම්බන්ධතා නිලධාරි" යනුවෙන් ඔහුට වෙනම නිලයක් දෙන්න. එවිට එතුමාට තත්ත්වයක් ලැබෙනවා. පඩියක් ලබාගන්නට ඉඩ ලැබෙනවා. මිනිසුන් සමඟ ආශ්‍රය කරන්නටත් ඉඩකඩ ලැබෙනවා. එතුමාට දේශ පාලනය කරන්නටත් පුළුවන් වෙනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේගේ සැළකිල්ල යොමු කරන ලෙස මා මතක් කර සිටිනවා. [බාධා කිරීමක්] තව කරුණු ටිකක් කියන්නට තිබෙන නමුත් ගරු සභාපතිතුමාට කීකරු වන්නට වුවමනා නිසා මගේ කථාව ඉක්මණින් අවසාන කරනවා. අනික් අයට වඩා සැළකිල්ලෙන් යුක්තව වැඩ කරන නිසා මේ සෞඛ්‍ය ඇමතිතුමාටත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමියටත් අපේ යම්කිසි සැළකිල්ලක් තිබෙනවා. ඒ නිසා මෙම කරුණු පිළිබඳව සැළකිල්ල යොමු කරන ලෙස මා නැවත වරක් ඉල්ලා සිටිනවා. අපි මේවා ගැන නොකීවායැයි තමුන්නාන්සේලාට මගහරින්නට බැහැ. මේවා මේ අන්දමට කියා තැබුවාම. එම නිසායි මේවා මතක් කළේ. මගේ කතාව මෙයින් සමාප්ත කරනවා.

පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)

(திரு. பீ. எம். கே.. தென்னகூன்—மிஹிந்தலை)

(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු සභාපතිතුමනි, මට වනාඩි පහක කාල සීමාවක් වෙන් කර දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ඒ සමගම ගරු සෞඛ්‍ය ඇමතිතුමාටත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමියටත් මගේ ස්තුතිය පිරිනැමියයුතු කරුණක් තිබෙනවා. මේ ගරු ඇමතිතුමා මෙම අමාත්‍යාංශය භාර ගනිද්දී උතුරුමැද පළාත මැලේරියාවට මුහුණ දීලයි තිබුණේ. එම නිසා ඒ පළාතේ පැතිර ගොස් තිබුණු මැලේරියාව මර්ධනය කිරීම පිණිස බලවත් උනන්දුවකින් ක්‍රියා කිරීම ගැන මිහින්තලේ ජනතාව වෙනුවෙන් මා පළමු කොටම මගේ ස්තුතිය එම දෙපොළට මෙහිදී පුද කරනවා.

ගරු සභාපතිතුමනි, මගේ ආරාධනයක් පිට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිය මිහින්තලේ රෝහල බලන්නට ගියා. මිහින්තලේ ආරෝග්‍යශාලාවේ තත්ත්වය එතුමිය එදා සියැසින්ම දැකගත්තා. එම ආරෝග්‍යශාලාවේ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම දිරා ගොස් තිබෙනවා. එම රෝහලේ ඇපොතිකරිවරුන් දෙපොළක් සිටිනවා. එහෙත් වෛද්‍ය නිලධාරියෙක් එහාට නැහැ. රෝහල් භූමිය වටා වැටක් නැහැ. එහි ප්‍රතිකාර ලබන උදවියට බොන්නට වතුර නැහැ. එතැනින් ප්‍රතිකාර ලබන බොහෝ මව්වරුන්ට සැතැප්මක් පමණ එහායින් පිහිටි වැවක් කරා නැම පිණිස යන්නට සිදු වී තිබෙනවා. එම අඩුපාඩුකම් සම්පූර්ණකොට එම රෝහල අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එදා එතුමියගෙන් එම ඉල්ලීම කළ විට එතුමිය කිව්වා ඒ පිළිබඳව වාර්තාවක් සකස්කොට ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන බව. එම නිසා එතුමියගේ එම වාර්තාව කියවා බලා තමුන්නාන්සේගේ කාලයේදීවත් එම ඉල්ලීම් ඉටු කර දෙන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු ගණනාවක් තිස්සේම පසිරි මඩුව මධ්‍යම ඩිස්පෙන්සරිය ගැන මා හඬ නගනවා. පසුගිය ආණ්ඩුව කාලයේදී ඉඩම් අක්කර 5ක් ලබාගෙන ඒ සඳහා සැලැස්ම හා ඇස්තමේන්තු පවා සකස් කර තිබෙනවා. ඒ පිළිබඳ ලිපි ගොණුව නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ මේසය උඩ තිබෙනවා ඇතැයි මා සිතනවා. එම ප්‍රදේශ වාසි ජනතාව ගොවියන් හැටියට දහසක් දුක් කරදර විඳිමින් කටයුතු කරන බව දන්වන්නට සිදු වී තිබෙනවා. පසිරිමඩුව මධ්‍යම ඩිස්පෙන්සරිය තමුන්නාන්සේගේ කාලයේදීවත් සාදා දී දුක් විඳින එම ජනතාවට සහනය සලස්වා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

යකල්ල-කැකිරාව පාරේ මධ්‍යස්ථානය කයි මුරියාකඩවල ප්‍රදේශය තිබෙන්නේ. එම ප්‍රදේශය වටා බොහෝ ගම් පිහිටා තිබෙනවා. එගම්වාසීන්ට බෙහෙත් ලබා ගැනීම සඳහා යන්නට සිදු වී තිබෙන්නේ යකල්ල රෝහලට හෝ කැකිරාව රෝහලටයි. කෘෂිකර්ම සංවර්ධන කටයුතු සඳහා බොහෝ වෙහෙස මහන්සි වන එම ප්‍රදේශයේ ගොවි ජනතාවට තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුව තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන කල්පනා කර බලා මුරියාකඩවලට මධ්‍යම දිස්පැන්සරියක් දෙන්නය කියා මා ඉල්ලනවා. එමෙන්ම වලගම්බාහුව අවටත් ගම් හුඟක් තිබෙනවා. දැන් මරදන්කඩවලින් ගිහිනුයි බෙහෙත් දෙන්නේ. එය මහජනතාවට විශාල කරදරයක්. ඒ නිසා වලගම්බාහුවටත් ශාඛා දිස්පැන්සරියක් දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

මගේ අනික් ඉල්ලීම නම් මෙයයි. අපේ ප්‍රදේශවල ආරෝග්‍යශාලාවකට යන්නට ටිකක් ඈත යන්න ඕනෑ. ඒ නිසා වින්නඹු සේවිකාවන්ගේ සේවය ඉතාම අවශ්‍යයි. තමුන්නාන්සේලා වින්නඹු සේවිකාවන් පත් කර එවිවත් ගමනා ගමන පහසුකම් ආදී පහසුකම් නැති නිසා ඔවුන් පැමිණ ටික දවසකින්ම ස්ථාන මාරු ඉල්ලනවා. ඒ නිසා දෙපාර්තමේන්තුවටත් තරමක කරදරයක් ඇති වී තිබෙනවා. එමෙන්ම ඒ නිසා අපේ ප්‍රදේශවලට වින්නඹු හිඟය තවදුරටත් ඇති වෙනවා. ඒ නිසා මීට පසු වින්නඹු සේවිකාවන් පත් කරන විට එම සේවය විමධ්‍යගත කරන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. ඒ ඒ දිස්ත්‍රික්කවල තිබෙන අඩුපාඩු ගැන පරීක්ෂා කර බලා ඒ ඒ දිස්ත්‍රික්කවල සිටින වෛද්‍ය අධිකාරීන්ගේත් උපදෙස් ලබා ගෙන මේ කටයුත්ත කරන්නට ඕනෑ. ඒ ඒ දිස්ත්‍රික්කවල අඩුපාඩු සම්පූර්ණ කරන්නට ඔවුන්ට බලය දෙනවා නම් ඒ ඒ දිස්ත්‍රික්කවලින්ම උගත් තරුණ අය පුහුණු කර සේවයේ යොදවා ගන්නට පුළුවන්. එසේ කළොත් වින්නඹු සේවිකාවන්ගේ හිඟය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන් වේවි.

මා මීට වඩා කථා කරන්නට යන්නේ නැහැ. මා ඉදිරිපත් කළ මේ කරුණු සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේත් ගරු පාර්ලිමේන්තු ලේකම්වරිය ගේත් අවධානය යොමු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2.30

එම්. සී. අහමඩ් මයා. (කල්මුනෛයි)
(ஜனாப் எம். சீ. அகமது—கல்முனை)
(Mr. M. C. Ahamed—Kalmunai)

I must thank the Hon. Minister of Health for having promised an X'ray plant and an operating theatre for the Kalmunai Hospital soon after the Committee stage of the Budget, but at the same time I must draw his atention to several shortcomings in the hospital. During the by-election, I well remember the hon. Parliamentary Secretary, when she came there, promising to give the necessary equipment for the newly constructed maternity section and also to furnish the administration block. Unfortunately, the promise is still there ; the equipment is not there. I hope the Hon. Minister will look into this. I appeal to him to equip this hospital.

I have brought it to his notice that there is only one lady doctor. He will remember that I have told him several times that areas like Kalmunai, Pottuvil and Nintavur are being catered for by this particular hospital, and that our Muslim ladies,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අහමඩ් මයා.]

when they find that there are more male doctors than lady doctors, go back home. I have always appealed to him to send some more lady doctors, and I think he has promised to see to it.

I should also like to bring to the Hon. Minister's notice that when the hon. Parliamentary Secretary came to Kalmunai during the by-election she laid a foundation stone for a maternity ward for the Sainthamaruthu Dispensary. One and a half years have since passed but nothing has been done and even the foundation stone is missing. I appeal to the Hon. Minister to provide at least some money to construct this maternity ward which is very important because the village is so congested and the people so poor that they are unable to get to Batticaloa. The car hire to Batticaloa is about Rs. 25 to Rs. 30 and I think not more than 20 to 25 per cent of the people can afford to go to Batticaloa for treatment.

There is one other matter which I want to bring to the Hon. Minister's notice, not, however, with the intention of harrassing or embarrassing him. As chairman of the town council I have started constructing a maternity ward at Kalmunaikudy. I am now stuck without funds. I appeal to him to give me some assistance to complete this maternity ward as early as possible.

One last matter. The Kalumunai Hospital is an institution which was started about one hundred years ago. I should like to say that since this Government came into power not one cent has been spent on this hospital. As such, I want the Hon. Minister to look into this matter and give the hospital some form of assistance. The people of the area will be grateful to the Hon. Minister for any assistance rendered.

එච්. ජී. ඒ. කාරියවසම් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிட்டிய)

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු සභාපතිතුමනි, අපේ ඉල්ලීම් ගැන සලකා බලා ක්‍රියා කිරීම ගැන ගරු සෞඛ්‍ය ඇමතිතුමාටත්, එම පාර්ලිමේන්තු ලේකම්තුමියටත් මගේ ස්තුතිය පුද කරන්නට කැමතියි. ඒ අතර කිව යුතු කාරණා කීපයක් තිබෙනවා. දකුණු පළාතට තිබෙන එකම මහ රෝහල වූ ගාල්ලේ ආරෝග්‍යශාලාව පිහිටා තිබෙන ස්ථානයේ හැටියට අවුරුදුපතා රුපියල් ලක්ෂ සංඛ්‍යාත මුදලක් අපතේ යනවා. එහි ශල්‍ය කර්මවලට ගන්නා ආයුධ පවා මළ කඩ කනවා. ඒ නිසා මෙම ආරෝග්‍ය ශාලාව වෙනත් ස්ථානයකට ගෙන යෑමේ යෝජනාව සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්වා ක්‍රියා කරන්නැයි මා ඉල්ලා සිටිනවා.

මුළු ගාලු දිස්ත්‍රික්කයේම තත්ත්වය ගැන කල්පනා කර බලන විට මා නියෝජනය කරන කොට්ඨාශයේ සෞඛ්‍ය තත්ත්වය සතුටුදායක යයි කියන්නට අමාරුයි. ඇල්පිටියේ ආරෝග්‍යශාලාව තවත් දියුණු කළ යුතුයි. එහි මාතෘ වාට්ටුවක් සාදාගෙන යනවා. පාර්ලිමේන්තු ලේකම්වරිය එහි ගොස් කටයුතු පරීක්ෂා කර බැලුවා. ඇමතිවරියක මෙන් ඉතා මත්ම දක්ෂ අන්දමින් එතුමිය නිලධාරීන්ට උපදෙස් දුන්නා. එහෙත් අද වන තුරු ඒ උපදෙස්වලින් සෙතක් ලැබී නැති බව කියන්නට සිදු වී තිබෙනවා. එදා තිබුණු තත්ත්වයට වඩා අමුත්තක් සිදු වී නැහැ. මීට හේතුව ගාල්ලේ සිටින සෞඛ්‍ය අධිකාරිවරයාගේ අකාර්යක්ෂමතා වයි. ඔහු ප්‍රාණවත්ව කටයුතු කරන බවක් පෙනෙන්නේ නැහැ. ඔහු රාජකාරියට භයාදු ගතියක් දක්වනවා. මේ වැඩ නොකෙරෙන්නේ ඒකයි. මේ වැඩ නොකෙරී තිබීම ගැන සොයා බලා සුදුසු විධිවිධාන යොදන මෙන් මා ඉල්ලා සිටිනවා.

මා නියෝජනය කරන ප්‍රදේශයේ ආරෝග්‍යශාලා අඩුයි. පිටිගල ප්‍රදේශයට ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක් දීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඇඳෝනිකරි කෙනකුගේ පාලනය යටතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැනට පිටිගල වාට්ටු දෙකක් තිබෙනවා. සාමාන්‍යයෙන් තුවාලකාරයන් පමණයි, ඒ වාගේ ඉන්නේ. ඒ නිසා ආයුර්වේද ආරෝග්‍යශාලාවක් සඳහා ඒ වාට්ටු දෙක යොදා ගන්නට පුළුවනි.

නියාගම ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් තැනීමට පසුගිය ආණ්ඩුව කාලයේදී අනුමැතිය ලැබී තිබුණා. ඒ සඳහා ඉඩම්ද පවරාගෙන තිබුණා. මේ ආරෝග්‍යශාලාව ඉක්මනින් සෑදීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාව මඟින්ද නැවත නැවතත් කියනු ලැබ ඇතත් පවරා ගන්නා ලද ඉඩම්ද ආපසු දී මේ කට යුත්ත අතපසු කර දමා තිබෙනවා.

පිනිකහනට මාතෘ නිවාසයක් දීමත් අතපසු කර දමා තිබෙනවා. තවද, වෙද මහතුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන් වැරදි තිබෙන බව අපට නොයෙක් විට අසන්නට ලැබෙනවා. ඒ ගැනත් පරීක්ෂා කර බලා සුදුසු පරිදි කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. මීට වඩා යමක් කියන්නට යන්නේ නැහැ. ගාලු රෝහල පිළිබඳව කියන ලද කාරණය සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කරන්නට ඉල්ලන ගමන්ම සාන්තු සේවිකාවන්ගේ නිවාස ගැනත් මතක් කරන්නට සිදු වී තිබෙනවා. මේ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා වසා දමා දැනට අවුරුදු එක හමාරක් පමණ වෙනවා. මේක ඉතාමත්ම සුළු ප්‍රශ්නයක්. ගාල්ලේ එස්. එච්. එස්. මහත්මයාට මේක එක දවසෙන් කරන්නට පුළුවන් වැඩක්. එහෙත් ඔහු අකාර්යක්ෂම නිසාදෝ තවම ඒ නිවාස විවෘත නොකර තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් සොයා බලන මෙන් ඉල්ලා සිටිනවා.

වී. ඒ. අලගකෝන් මයා. (මන්නාරම)
(திரு. வி. ஏ. அழகக்கோன்—மன்னார்)
(Mr. V. A. Alegacone—Mannar)

Mr. Chairman, thank you for the opportunity afforded me to speak a few words on the Votes of the Ministry of Health.

First and foremost, I must thank the Hon. Minister as well as his fair Parliamentary Secretary for all that they have been able to do for the country in general and my electorate specially in the field of health. I do not propose to take long, but I would like to refer to certain matters that have remained unattended for the last few years in my electorate.

In the first place, I have to refer to the proposed administration block for the Mannar Hospital. This was thought of and estimated for three years ago. Even the money was set apart for it. But for three years nothing has been done. In fact, I do not know what is happening in the Ministry of Health. I have interviewed the Minister, the fair Parliamentary Secretary, the Permanent Secretary and the D.H.S., but nothing has been done. The only reply I receive is that it will be attended to soon.

Then, we have got a surgical ward and an operating theatre. An X'ray plant is very necessary. For close upon a year and a half to two years I have been writing to the Ministry asking for a mobile X'ray plant for this hospital. They only say that an X'ray plant will be given, but nothing has been done about it. So, now, although there is an operating theatre and a full-time surgeon, he is asked to do his work without the aid of an X'ray plant.

But I must pay a tribute to the surgeon, Dr. Thiruchelvam, because he has done good work even with the limited facilities at his command. He has operated on about one thousand patients. I say this because I want it to go on record.

I appeal to the Hon. Minister to see that, as soon as the administration block is completed, a mobile X'ray plant is sent to this hospital to help the surgeon in his work. Otherwise, I am afraid, the work of this surgeon will be greatly limited.

I now come to the rural hospital at Pesalai. In fact the Hon. Minister's predecessor, the Hon. M. D. H. Jayawardena, promised the people of the area that he would supply the doctors if they put up a ward. In fact, they collected Rs. 25,000, and now they do

Digitized by Thahanam Foundation
noolaham.org | aavanaham.org

[අලගක්කෝන් මයා.]

not know what to do with the money. I have been asking the Ministry officials what to do with the money, but they say that they must consult the Planning Ministry, and refuse to do anything. I do not know what I am to do in this matter. I would request the Hon. Minister to see that something is done to utilize this Rs. 25,000 in the proper way ; that is, to build a ward. Thereafter the doctors could be sent there.

There is a rural hospital at Uyilankulam which serves an area of about 30 square miles. The former Minister promised to send doctors to man that rural hospital, but for 2½ years nothnig has been done. The people of the area complain to me about this delay because the nearest hospital is 25 miles away. On our own we are unable to find doctors. So, I would appeal to the Hon. Minister to see that urgent staff is supplied to this hospital at Uyilankulam.

I would also like to bring to his notice the fact that there is a central dispensary at Uyilankulam which was constructed by the V. C. long ago after spending about Rs. 25,000, but an apothecary has not been sent there yet, although quarters for an apothecary have also been put up.

When I saw the Hon. Minister on this matter, he promised to send an apothecary but he has not done so. But to another place—I do not want to mention the name because it is a place of pilgrimage—an apothecary has been sent and the central dispensary there opened, although it serves only about 30 or 40 families. This central dispensary at Uyliyakulam which serves about 30 or 40 villages does not have even an apothecary, although the buildings for the dispensary and apothecary quarters were constructed by the V. C. at a cost of Rs. 25,000.

I would request the Hon. Minister to look into this matter and to see that an apothecary is appointed to this central dispensary as early as possible.

Another matter is the lack of quarters for medical officers, apothecaries, attendants, nurses and others who are appointed to medical institutions.

In fact, year after year we are spending large sums of money to establish various hospitals. Why should we not make use of a portion of that money to put up quarters for medical officers, nurses, apothecaries and others so that they can live in comfort ? How can they work unless they live in comfort ? They work almost 12 hours a day and at night they are unable to find a place to lay their tired heads. I hope you will take that into account and provide them with quarters.

In my area there is only one quarter for the use of the D.M.O. The others live here and there without any permanent abode.

I should like to bring to your notice that the village council has been given an ayurvedic dispensary, a doctor is employed there whom you pay Rs. 500 a month as salary, but the council is not given a grant to buy the necessary herbs and medicines. As a result, there will come a time when you will have to close down the dispensary. I have spoken to the Permanent Secretary about it and I hope something will be done to give them a grant and have their expenses reimbursed by the department.

There is no section for eye treatment in Mannar. The eye specialist comes from Mannar Hospital once a month. For the people in Mannar it is difficult to go for treatment either to Colombo or Jaffna. In the circumstances I would request the Hon. Minister to see that an eye-surgeon is appointed to attend to these people who have eye trouble.

අ. භා. 2.45

I should like to mention another fact. Some Members who are not Members of the area are interferring in the affairs of the Member of Parliament for this area. Some

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

people come and tell a lot of things which they do not know and claim that they are protecting the community. I would tell them that the Member of Parliament of the area knows the needs of the people of the area much better than those who come there from outside. I would ask the department to consider the views of the Member of Parliament of the area before anything is done for the area. I came to know that certain things are taking place in the Ministry. That is why I am urging upon you to consider the views of the Member of Parliament before any action is taken affecting his constituency. I thank you very much, Sir, for giving me the opportunity of speaking on this Vote.

ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)
(Mr. T. B. Tennekoon—Dambulla)

සෞඛ්‍ය ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කිව යුතුව ඇති කාරණා කියන්නට කාලවේලාව නොමැති වීම ගැන මා කණගාටුවෙනත් මගේ ඡන්දය ඇති මහනුවර කොට්ඨාශයේ මන්ත්‍රීතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වී සිටීම ගැන නම් මා සතුටු වන බව ප්‍රකාශ කරන්නට කැමතියි.

රජයේ සෞඛ්‍ය සේවයේ යෙදී සිටින සේවකයන් ඔවුන්ගේ දුක්ගැනවිලි ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු අනෙකුත් ඇමතිවරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත් ඉදිරිපත් කර තිබෙනවා. සේවක සංඛ්‍යාව අඩු වීම ආදිය ගැන සවිස්තර කරුණු ඉදිරිපත් කර තිබෙන හෙයින් මා ඒ ගැන වැඩි දුර කියන්නට අදහස් කරන්නේ නැහැ. ඒ සඳහා කාල වේලාව නැහැ. කොළඹ සිටින සෞඛ්‍ය සේවකයන්ගේ සුභසාධක නිලධාරියා වශයෙන් මෙතෙක් කල් කම්කරු නිලධාරියකු පත් කරන්නට යෙදුණා. සෞඛ්‍ය සේවයේ යෙදී සිටින සේවකයන් 35,000 ක් පමණ වූ පිරිසගෙන් 34,000 ක් පමණ බෞද්ධයි. සුභසාධක නිලධාරීන් වශයෙන් ඒ සේවයේ සිටින වැඩි දෙනාගේ අකමැත්ත පිට එක්තරා පුද්ගලයෙකු එහි සේවක සභාවක් කිරීමට මේ දෙපාර්තමේන්තුව ලැහැස්ති වී සිටීම ගැන සේවකයින් විරුද්ධව සිටින බව ඒ සේවකයින් කියා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ පළාතේ විශේෂයෙන්ම බෙහෙත් ලබා ගත යුතු ස්ථාන වන දඟම්පතහ, ලේනදොර, පල්දෙනිය, නාගහපොළ ආදී ස්ථානවලට අලුත් දිස්පැන්සරි ලබා ගැනීමට මහජනයා උනන්දු වක් දක්වන නිසා ඒ සම්බන්ධයෙන් යම් කිසි පියවරක් ගන්නවා නම් මා කැමති වෙනවා.

තවත් කරුණක් කියන්නට ඕනෑ. ආයුර්වේද කොමසාරිස්තුමාගේ කල්පනාව උඩ දැන් ආයුර්වේදය සම්පූර්ණයෙන්ම නැති කරන්නට අදහසක් තිබෙන බව අපට පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට තිබෙනවා. ආයුර්වේද ක්‍රමය අසාර්ථක වැඩ පිළිවෙළක් හැටියට කොමසාරිස්තුමා ප්‍රකාශයක් කර තිබුණාය කියලයි මා හිතන්නේ, අපි මහනුවර නගර සභාව මගින් ආයුර්වේද ක්‍රමය කොතරම් දුරට සාර්ථක අන්දමින් කර තිබෙනවාද, දිනපතා ඒ බෙහෙත් ශාලවලින් කොපමණ ජනකායක් බෙහෙත් ලබා ගන්නවාද කියා ගරු ඇමතිතුමාත් දන්නවා. එතුමාත් ඒ සඳහා බොහොම මහන්සි ගත් කෙනෙක්. මහනුවර නගර සභාව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධව වෙනත් කිසිම නගරයකට නොදෙවෙනි අන්දමින් හා ආණ්ඩුවටත් ආදර්ශයක් ගත හැකි වන අන්දමින් කටයුතු කර තිබෙන නිසා ගරු ඇමතිතුමාට ඒ ගැන අත්දැකීමක් ඇතැයි මා සිතනවා. ඒ නිසා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමටත් තව ඉතිරිව සිටින ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමටත් සියලුම පහසුකම් යෙදවීම අවශ්‍ය බව මා ඉතා ඕනෑකමින් කියනවා.

මේ අමාත්‍යාංශය යටතේ හුඟක් කරුණු ප්‍රකාශ කිරීමට තිබුණත් ගරු සභාපතිතුමාගේ කැමැත්ත අනුව—මා විනාඩි දෙකක්තුනක් පමණයි ඉල්ලා සිටියේ—කාලය කෙටි කළ යුතු නිසා මා සඳහන් කළ ඔය කරුණු ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලමින් මගේ කථාව ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු සභාපතිතුමනි, මහනුවර මන්ත්‍රීවරයා වශයෙන් සිටින, සැහෙන පළපුරුද්දක් ඇති දේශපාලනඥයකු වශයෙන් සලකන, වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමා මේ ධුරය භාර ගැනීම පිළිබඳව මා සතුටු වුණා. මේ රටට නිදහස ලැබුණාට පසු මහනුවර මහාරෝගාශාලාවේ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කළේ මහනුවර මන්ත්‍රීවරයකුව හා සෞඛ්‍ය ඇමතිවරයකුව සිටි ජෝර්ජ් ඊ. ද සිල්වා මහත්මයායි. ඊට පසු, කාලයක් තිස්සේ කිසිම සංවර්ධනයක් සිදු වුණේ නැහැ. කාලයකට පසු බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් පිහිටුවා තිබුණු මහජන එක්සත් පෙරමුණු ආණ්ඩු කාලයේදී එකළ සිටි සෞඛ්‍ය ඇමතිතුමා විසින් තට්ටු 4 ක විශාල ගොඩනැගිල්ලක් මහනුවර ආරෝගාශාලාවේ ඉදි කරන්නට යෙදුණා. තමුන්නාන්සේට සෞඛ්‍ය ඇමතිනිලයේ වැඩ කරන්නට ලැබුණු කාල සීමාව තවම ඉතා සුළු නිසා තමුන්නාන්සේ විසින් මහනුවර ආරෝගාශාලාව සංවර්ධනයට යමක් කර තිබෙනවාදැයි මට කියන්නට බැහැ. එහෙත් මේ ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන ජෝර්ජ් ඊ. ද. සිල්වා මහත්මයා වගේ ඉතිහාස ගත වෙන්නට මහනුවර ආරෙගාශාලාව වැඩි දියුණු කර එහි අඩුපාඩුකම් පුළුවන් තරමකින් වත් මගහරවා ඒ ප්‍රදේශයේ මහජනයාට පහසුකම් සලසා දෙන්න කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. මහනුවර ආරෝගාශාලාව පිහිටා තිබෙන්නේ අපේ ඡන්ද කොට්ඨාශයට යාබද ආසනයේ නිසා අපේ ඡන්දදායකයන්ට එයින් ප්‍රයෝජන ගන්නට පුළුවන් වන නිසායි, මම මේ කාරණය මතක් කළේ. ඒ වගේම තමුන්නාන්සේගේ ඡන්ද කොට්ඨාශයේ ජනතාවට පමණක් නොවෙයි, ඒ අවට ප්‍රදේශවල විශාල ජනතාවටත් මහනුවර ආරෝගාශාලාවෙන් විශාල සේවයක් සැලසෙනවා.

පසුගිය රජය පැවති කාලයේ සිට මමත් මගේ සහෝදර මන්ත්‍රීතුමාත් විසින් කරන ලද බලවත් ඉල්ලීමක් අනුව දැනට මාස කිහිපයකට පෙර මගේ ඡන්ද කොට්ඨාශයේ මාතෘ නිවාසයක් හා ආරෝග්‍ය ශාලාවක් විවෘත කර දීම ගැන ගරු ඇමතිතුමාට මා ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු කිරීම සඳහා මා තවත් කාරණයක් මතක් කරන්නට කැමතියි. අකුරණ ඡන්ද කොට්ඨාශයේ තිත්තපත්ගල කියන ගමේ විලියම් සහෝදර සමාගමේ කොටස්කරුවන් වන සැලකිය යුතු වැදගත් පවුලක් වූ ජයවික්‍රම පවුලේ උදවිය විසින් දැනට අවුරුදු 20 කට පමණ පෙර ඒ මහතුන්ගේම ඉඩම්වල ඒ මහතුන්ගේම පෞද්ගලික ධන වියදමෙන් රුපියල් ලක්ෂ ගණනක් වටිනා අංග සම්පූර්ණ මාතෘ නිවාසයක් හදා රජයට භාර දුන් බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ මහත්වරුන් ඒ මගින් විශාල සේවයක් කළා. ඒ මහත්වරුන්ට එහෙම කරන්නට ශක්තියක් තිබෙනවා. ඒ මහත්වරුන් විසින් කරන ලද සේවයට ඒ ප්‍රදේශයේ ජනතාව සදාණය ගැතියි. දැන් මාස ගණනක සිට ඒ මාතෘ නිවාසයේ විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කෙරෙන්නේ නැහැ. මේ පිළිබඳව ගරු ඇමතිතුමාටත්, සෞඛ්‍ය අධිකාරීවරයාටත් පැමිණිලි ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නියෝජික පිරිසකුත් මේ පිළිබඳව ගරු ඇමතිතුමා හමු වී කරුණු කියා තිබෙනවා. මේ යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම නිසා ඒ මාතෘ නිවාසයට අවශ්‍ය එළියත්, ජලයත් සපයා ගැනීම දුෂ්කරයි. මේ පිළිබඳව මා සොයා බැලුවාම මට පෙනී ගියා, නිලධාරීන් දෙකොටසක් අතර ඇති මතභේදයක් නිසා මේ විදුලිබල යන්ත්‍ර මේ තත්ත්වයේ තිබෙන බව. ඉන්ජිනේරුවනුත්, පරිපාලන නිලධාරිනුත් අතර ඇති මතභේදයක් නිසා මේ යන්ත්‍රය පාවිච්චියට නුසුදුසු යන්ත්‍රයක් බවට රෙකමදාරු කර තිබෙන බවයි, මට දැන ගන්නට ලැබුණේ. ඒ යන්ත්‍රයේ තිබෙන්නෙ සුළු වරදක්. ඒ යන්ත්‍රය ටිකක් ශුද්ධ කර ඒකට අළුත් ගෑස්කට් එකක් දමා සවි කළොත් එය ක්‍රියාත්මක කර වන්නට පුළුවන්ම තිබෙනවා. ඒක හොඳ යන්ත්‍රයක්. වැඩිය පාවිච්චි කළ එකක් නොවෙයි. කරුණාකර මේ කාරණය සටහන් කරගෙන වහාම ඒක අළුත්වැඩියා කර දෙන්නට ක්‍රියා කරන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, රජය මගින් ඉඩම් ලබාගෙන, රජයේ වියදමින් ගොඩනැගිලි තනා, රජයේ වියදමින් උපකරණ සපයා ලක්ෂ ගණනක් වියදම් කළයුතු කටයුත්තක් මේ ත්‍යාගශීලී ජයවික්‍රම සහෝදර වරුන් විසින් තම වියදමින් ඉටු කර දී තිබෙන නිසා ඔවුන්ගේ ගෞරවයට පවා හානිවන ආකාරයට මේ නිලධාරීන් ක්‍රියා කිරීම ගැන මා කනගාටු වෙනවා. මේ යන්ත්‍රය අළුත් වැඩියා කිරීමට කරන්නට තිබෙන්නේ එක දවසක වැඩක් පමණයි. මේ යන්ත්‍රය තද බල ලෙස ක්‍රියා විරහිත වුණොත් විදුලි බලයෙ ලබා ගන්න තවත් මාර්ගයක් තිබෙනවා. මේ මාතෘ නිවාසයට සම්බන්ධ කළ හැකි විදුලි මාර්ගයක් නුග වෙල මධ්‍ය මහා විද්‍යාලයේ තිබෙනවා. මේ යන්ත්‍රය අළුත්වැඩියා කරන තුරු ඒ සථාන යෙන්වත් තාවකාලික ලෙස විදුලි බලය සපයා දෙන්නට වැඩ පිළිවෙලක් යොදන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

යම්කිසි මන්ත්‍රීවරයෙකු යම්කිසි පැමිණිල්ලක්, ඉල්ලීමක් හෝ චෝදනාවක් ඉදිරිපත් කළ විට ඇමතිවරු එය සටහන් කර මන්ත්‍රී මණ්ඩලය තුළ තිබෙන රජයේ නිලධාරීන්ගේ කාමරයේ සිටින මහත්වරුන්ට ඒ තුණ්ඩුව යවන සිරිතක් පසුගිය රජය පැවති කාලයේ තිබුණා. ඒ නිලධාරීන් ඒවා සටහන් කරගෙන වහාම ඒ ගැන පරීක්ෂා කර බලා ඒ විවේචන හෝ දුක් ගැනවිලි ඉදිරිපත් කළ මන්ත්‍රීවරුන්ට ලියා එවනවා. ඒ කාරණය ගැන අපි සොයා බැලුවාය. ඒ වරද හරි ගැස්සුවාය, එය ඉදිරිපත් කිරීම ගැන ස්තුතිය කියා. ඒ කාලයේ තිබුණු ඒ සිරිත දැන් නැතිවීම ගැන මා කනගාටු වෙනවා. මා සඳහන් කළ කාරණය ගැන සොයා බලා, නිසි පියවර ගෙන, ඒ පිළිබඳව යථා කාලයේ මටත් දැනුම් දෙන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමා නොබෝදා විවෘත කළ බොක්කාවල මාතෘ නිවාසයට තාවකාලික විදුලි යන්ත්‍රයක් සවි කරවන මෙන් මා ඉල්ලා සිටිනවා. ගොඩනැගිල්ල තවමත් සාදා නිම වී නැති නිසා ස්ථිර විදුලිබල ක්‍රමයක් නැතත් දැනට තාවකාලික වශයෙන්වත් ලැබුණොත් හොඳ බව මතක් කරන්නට කැමතියි.

මන්නාරම ආරෝග්‍යශාලාවේ ඇති වූ අවාසනාවන්ත සිද්ධියක් ගැන අපට පුවත්පත් මගින් දැනගන්නට ලැබුණා. ස්වභාෂා මාධ්‍යයෙන් පුහුණුව ලබා එහි සේවයට ගිය සිංහල හෙදියන්ට ලොකු කරදරයක් වෙලා තිබෙන බවයි පුවත්පත්වල සඳහන් වී තිබුණේ. ප්‍රදේශයේ වැඩි වශයෙන් භාවිත වන භාෂාව නොදන්න නිසාත් මේ අයට යම් යම් සිත් තැවුල්වලට හේතු වන දේ සිදු වන බව පිළිගන්නට පුළුවනි. එවැනි අපහසුකම් පවා විඳ දරාගෙන කරදර මධ්‍යයේ තම සේවය හැකි තාක් හොඳින් ඉටු කරන මේ හෙදියන්ට එක්තරා පිරිසක් තාඩන පීඩන කර තිබෙනවා. හෙදියන්ගේ නිවාසයටම කඩා පැන හෙදියනට අතවර කිරීමට, තාඩන පීඩන කිරීමට තරම් සිත් දරුණු කරගෙන ඇත්තේ අනෙකෙක් නොව ග්‍රාම සේවකයාම බවයි දැනගන්නට තිබෙන්නේ. ග්‍රාමසේවක මහත්මයා වැනි කෙනකු එසේ හැසිරුණා නම් මේ උදවියට කාගේ පිහිටද? මේ ගැන පරීක්ෂණයක් පවත්වා යුක්තිය ඉෂ්ට කර දෙන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලනවා. ඒ සමගම සිංහල මාධ්‍යයෙන් පුහුණුව ලත් හෙදියන් සිංහල භාෂාව භාවිත නොකරන ප්‍රදේශවලට යවන්නට එපායයි නියෝග කරන මෙන්ද ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. වෙනත් නොයෙක් කරුණු නිසා අසහනයෙන් පෙළෙන පිරිසකට රජයේම නිලධාරියෙක් මෙවැනි දේ කරනවා නම් එය සෙසු උදවියටත් අනුබලයක් වෙනවා නිසැකයි. මෙවැනි දේ ගැන තද බල දඬුවම් පැමිණවිය යුතුයි. නිසි පියවර ගන්නා මෙන් නැවතත් මම ඉල්ලනවා. ගරු සභාපතිතුමාට ස්තුතියි.

අ. භා. 3

පර්සි සමරවීර මයා. (වැලිමඩ)
(திரு. பேஸி சமரவீர—வெலிமடை)
(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් ස්වල්පයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ගරු මන්ත්‍රීවරුන් මේ විවාදයේදී පැවැත්වූ කථාවලට සවන් දුන් මට පෙනී ගියේ එතුමන්ලා ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් පැමිණ සිටින මන්ත්‍රීන් හැටියට ගරු ඇමතිතුමාගේත්, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

ගේත් වැඩ කටයුතු ගැන ඉතාමත් හොඳින් පැහැදී සිටින බවයි. ඒ නිසාම එතුමන්ලා තමන්ගේ ප්‍රසාදය මේ ගරු සභාවේදී පළකළ බවයි මට පෙනී ගියේ. ඇත්ත වශයෙන්ම ගත වූ අවුරුදු පහ තුළ ගරු ඇමතිතුමාත්, එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් තුමියත් මගින් මේ රටේ ජනතාව ගේ සෞඛ්‍ය සම්පත් වැඩි දියුණු කිරීම සඳහා කර තිබෙන වැදගත් සේවය ගැන උඩරට ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මමද මගේ බලවත් ප්‍රසාදය මේ අවස්ථාවේ ඒ දෙපොළටත් ඒ දෙපාර්තමේන්තුවටත් පුදු කරන්නට සතුටුයි.

මේ රටේ ජනතාවගෙන් වැඩි කොටසක් මන්ද පෝෂණයෙන් පෙළෙන නිසා රෝගින්ගේ සංඛ්‍යාව වැඩි වී ඇතැයි පැල් මඩුල්ලේ මන්ත්‍රීතුමා සඳහන් කළා. මන්ද පෝෂණය කෙසේ වුණත් අපේ රටේ ජනතාව කොන්ද පණ නැති ජනතාවක් නොවන බව ඒ මන්ත්‍රීතුමාට මතක් කර දෙන්න කැමතියි. ගරු සභාපතිතුමනි, වලපනේ ගරු මන්ත්‍රීවරයා කථා කළ විලාසය දිහා බැලුවාම උඩරට ප්‍රදේශයේ මන්ත්‍රීවරයකු වශයෙන් මට ඇති වුණේ බලවත් කනගාටුවක්. ඇත්ත වශයෙන්ම එතුමා තමන්ගෙ ආසනය ගැනවත් නියම අවබෝධයක් නැතුවයි කථා කළේ. ජන ගහණය වැඩි වීම ගැන කථා කරන විට උඩරට ආසනවල පමණක් නොවෙයි මෙම තදබදය තිබෙන්නෙ. ඡන්ද දායකයන් විසි පන්දහසක් පමණ ඇති වැලිමඩ ආසනයේ පමණක් හැට තුන් දහක ජන ගහණයක් සිටිනවා. ජනගහණය වැඩි වීම ගැන කථා කරන විට ඇතැම් මන්ත්‍රීවරුන් මොන මොන අදහස් පළ කරනවාද? සෞඛ්‍ය අමාත්‍යාංශය උත්පත්ති පාලන ක්‍රම මගින් සිංහල ජනතාව නැති කර දමන්නට යනවාය කියන ප්‍රචාරයක් ගෙන යනවා. මෙහිදී, වගකිය යුතු මන්ත්‍රීවරුන් වශයෙන් සෑම කෙනෙකුම මේ ප්‍රශ්නය ගැන සලකා බැලිය යුතුයි. සමහර විට මේ තත්ත්වය දිගටම පැවතුණොත් තව අවු රුදු පහළොවක් පමණ ගත වන විට අපේ ජාතික ධනය සම්පූර්ණයෙන්ම වාගේ සෞඛ්‍ය පහසුකම් සැලසීම පිණිස, අධ්‍යාපන පහසුකම් සැලසීම පිණිස, වැය කරන්න සිදු වනවාට කිසිම අනුමාන්‍යයක් නැහැ. මෙබදු භයානක අනාගතයක් පෙනෙන්නට තිබියදී, අප රට දරුවන්ට හරිහැටි කන්න නොදී, නියම විධියට අධ්‍යාපනයක් ලබා නොදී ජනතාව අන්ධකාරයේම තබා ගන්න ඕනෑයයි යම් මන්ත්‍රීවරයකු කිය නවා නම් එය වගකීමෙන් තොරව කරන ප්‍රකාශයක් බව සඳහන් කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, උත්පත්ති පාලනය හොඳයයි මා කියනවා නොවෙයි. නමුත් තමන්ට පුළුවන් ප්‍රමාණය කොපමණද කියා පුද්ගලයකු වටහා ගන්න ඕනෑ. එය ඉක්මවා ගියොත් ඇති වන තත්ත්වය ගැනත් අවබෝධ කර ගන්න ඕනෑ. වැලිමඩ වැනි කුඩා ආසනයකත් හැට තුන් දාහක පමණ ජනගහණයක් සිටිනවා. තව අවුරුදු දහයක් ගත වන විට එය කොප මණ ප්‍රමාණයකින් වැඩි වෙයිද? එම නිසා, ජනතාවට වැරදි හැඟීම් ඇතිවන ආකාර යෙන් හෝ එසේ නැතිනම් ඒ අය තෘප්ති මත් කරන්න හෝ යම් යම් ප්‍රකාශයන් කරනවා නම් එයින් ලොකු අපරාධයක් විය හැකි බව මතක් කර දෙන්න කැමතියි. දැනට වැඩිවී ගෙන යන ජනගහණය අනුව බලන විට එය අපේ ජාතික ආදායමට ඔරොත්තු නොදෙන බව පෙනී යනවා. තව අවුරුදු දහයක් පහළොවක් ගත වන විට ඇති විය හැකි සෞඛ්‍ය ප්‍රශ්න මෙයට වඩා බරපතළ වීමට පුළුවනි. එම නිසා මේ ප්‍රශ්නය ගැන අප සැලකිලිමත් විය යුතුයි.

ගරු සභාපතිතුමනි, දියුණු වූ රටවල තමුන්නාන්සේත් සංචාරය කරන්න ඇති. මොන අන්දමේ දියුණුවක් ලබා තිබුණත්, මොන අන්දමේ ආර්ථික පද නමක් මත සකස් වී තිබුණත් ඒ රටවල ජනතාවට මොන ආකාරයටද සෞඛ්‍ය පහසු කම් සලසා තිබෙන්නේ කියන කාරණය ගැන අප තරමක් දුරට සැලකිලිමත් වීම වැදගත් යයි මා කල්පනා කරනවා. ඒ නිසා අනාගතයේදීවත් මේ සෞඛ්‍ය පහසු කම් සඳහා වියදම් කරන විශාල මුදල් සම්භාරයෙන් කොටසක්වත් මහජනතාව ගෙන් උපයා ගැනීමට යම් ක්‍රමයක් ඇති කළ යුතුයි. එසේ නැතිව උපන් දා සිට සොහොනට යන තෙක් හැම දේම නිකම්ම කර ගැනීමට මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා නම්, කොහි ආකාරයට කිව්වත්, කවදාවත් මේ රට සශ්‍රීක කරන්න පුළුවන් වෙන්නේ නැහැ. මේ රට දියුණු කරන්න

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පුළුවන් වන්නෙ නැහැ, මේ රට ඉදිරියට ගමන් කරවන්න පුළුවන් වන්නෙ නැහැ. ඒ නිසා මේ කරුණු කිහිපය වගකිව යුතු මැති ඇමතිවරුන් හැටියට කවුරුත් මතක තබා ගත යුතුයි.

මට පෙරදී මේ ගරු සභාවේදී කතා කළ මන්ත්‍රීවරුන් සියලු දෙනාම වාගේ ආයුර්වේදය ගැන කතා කළා. මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි, ආයුර්වේද කොමසාරිස්තුමාගේ පාලනය යටතේ ඉතාමත් සාර්ථක අන්දමේ වැඩපිළිවෙලක් ඇතිව කටයුතු කර ගෙන යන බව. නමුත් මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. සමහර ආයුර්වේද වෛද්‍යවරුන් ගැන මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. සමහර ආයුර්වේද වෛද්‍යවරුන් ඉන්නවා. ඔවුන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හරියට කරන්නෙත් නැහැ, බටහිර වෛද්‍ය ක්‍රමය හරියට කරන්නෙත් නැහැ. ඒ අය මේ දෙකමත් කරනවා. නමුත් එකක්වත් හරියට කරන්නේ නැහැ. මා හිතන්නේ නැහැ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයකින් පිට වුණ වෛද්‍යවරයකුට මේ බෙහෙත් පෙති දීම, බටහිර ක්‍රමයට වෙදකම් කිරීම, "ඉන්ජෙක්ෂන්" ආදිය දීම කරන්න පුළුවන්ය කියා. එසේ කිරීම සුදුසුය කියා මා හිතන්නේ නැහැ. බාගෙට ඉගෙනගත් දේවල් කරන්න යාමෙන් ජනතාවට එය තදින්ම, භයානක අන්දමින්ම, බල පාන්න පුළුවනි. ඒ නිසා මේ සංකර වෙදකම මේ උදවියගෙන් ඉවත් කර ආයුර්වේද ක්‍රමයටම වෙදකම් කිරීමට මේ උදවිය යොදවන අයුරින් කටයුතු කරන ලෙස මා සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඒ කරුණ කෙරෙහි සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමතියි.

ගරු සභාපතිතුමනි, අඛුපාඩුකම් කිහිපයක් සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. හැම දෙයක්ගැනම කියන්න වෙලාවක් නැහැ. ඒ කරුණු ඇමතිතුමාට ලියා දුන්නත් සමහර විට ඒවාට පිළියම් යොදුවි. නමුත් මා ගරු ඇමතිතුමාට මතක් කළ යුතු විශෙෂ කරුණක් තිබෙනවා. අපට තිබුණු ලොකුම හිඟරදයක් තමුන්නාන්සේ විසින් කරන ලද යම් වැඩපිළිවෙලක් නිසා අද මගහැරී ගොස් තිබෙනවා. ප්‍රාදේශීය බෙහෙත් ගබඩාවක් ඇති කර දීම නිසයි ඒ කරදරය මග හැරුණේ. මීට කලින් තිබුණ ක්‍රමය ගැන මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. වැලිමඩ දුම්රිය ස්ථානයට බෙහෙත් තොගයක් කොළඹින් එවනවා. දුම්රිය මධ්‍යස්ථානයේ සිට හැතැප්ම බාගයක් පමණ දුරින් තිබෙන වැලිමඩ ආරෝග්‍ය ශාලාවට මේ බෙහෙත් බඩු ගෙන ගොස් දීමේ කොන්ත්‍රාත් එක අරගෙන සිටි පුද්ගලයා ජීවත් වෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේයි. ඔහු වැලිමඩට පැමිණ අර බෙහෙත් තොගය අරගෙන වැලිමඩ ආරෝග්‍යශාලාවට ගෙන ගොස් දෙන්න ඕනෑ. වෙනත් කෙනෙකුට ගොස් ඒ බෙහෙත් ටික ගන්න බැහැ. ඔන්න ඔය වාගේ තත්ත්වයකුයි තිබුණේ. නමුත් තමුන්නාන්සේ ආරම්භ කළ ප්‍රාදේශීය බෙහෙත් ගබඩාව නිසා ඒ තත්ත්වය අද මග හැරී ගොස් තිබෙනවා.

තවත් එක් කාරණයක් කියන්න ඕනෑ. විත්තඹු මාතාවන් සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව අනුගමනය කරන ප්‍රතිපත්තිය ගැන වචනයක් කියන්න ඕනෑ. දෙපාර්තමේන්තුව මගින් විත්තඹු මාතාවන් පත් කරන්නේ ජනගහනය අනුවයි. ජනගහනය 3,000ක් ඉන්නවා නම් ඒ ප්‍රදේශයට විත්තඹු මාතාවක් පත් කිරීම සුදුසුය කියා, විත්තඹු මාතාවක් ඒ ප්‍රදේශයට පත් කරනවා. හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ මේ කාරණාව ගැන මතක් කළා. විත්තඹු මාතාවක් පත් කළ යුත්තේ ඔවුන්ට ඇවිදින්න තිබෙන දුර ප්‍රමාණය අනුවයි. වැලිමඩ, උඟව, බිබිලේ ආදී ආසන්නවල ජනගහනය 3,000 වුණත් සමහර විට හැතැප්ම 10ක්, 15ක්, 20ක් පමණ ඒ අයට ඇවිදින්න සිදු වෙනවා. ඒ නිසා ඒ විත්තඹු මාතාවන් පත් කරන ක්‍රමය වැරදියි. ඔවුන්ට අයිති වන ආසනවල ගමන් පහසුව ගැන සලකා බලා විත්තඹු මාතාවන් පත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනවා නම්, මීට වඩා හොඳ සේවයක් සැලසෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. මීට වඩා යමක් කියන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. ගරු ඇමතිතුමා වැලිමඩ ආරෝග්‍ය ශාලාවට සම්ප්‍රාප්ත වුණා. එහි තිබෙන අඛුපාඩුකම් දකින්න ඇති. ඒවා සකස්

PUBLIC LIBRARY JAFFNA.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. එය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කර දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

ඇස්. බී. යාලෙගම මයා. (රත්තොට)
(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)
(Mr. S. B. Yalegama—Rattota)

ගරු සභාපතිතුමනි, මා වැඩි වේලාවක් කතා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. කාරණා දෙකක් සම්බන්ධයෙන් පමණයි මා කතා කරන්නෙ. මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, රත්තොට රෝහලට මාතෘ වාට්ටුවක් ඇති කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීම ගැන. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම මගින් ඒ සඳහා ආධාර දීමට පොරොන්දු වී තිබෙනවා. ඒ අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාටත් දෙපාර්තමේන්තුවටත් මා ස්තුති වන්ත වෙනවා.

ඒ වාගේම කිව යුතු තවත් විශේෂ කාරණයක් තිබෙනවා. 1958 සිටම මේ ඉල්ලීම කරනවා. මගේ කොට්ඨාශයේ ගම් ප්‍රදේශ 7ක් 8ක්ම ඇතුළත් වන විශාල ජනගහනයක් සිටින—5,000ක් පමණ සිටින—මුවන්දෙනිය කියා ප්‍රදේශයක් තිබෙනවා. මුවන්දෙනියට මධ්‍යම දිස්පැන්සරියක් සහ මාතෘ නිවාසයක් ඉල්ලා සිටින්නේ 1958 සිටයි. ඇත්ත වශයෙන්ම මේ සඳහා ගොඩනැගිලි සෑදීමට උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව එකඟ වී තිබෙනවා. දැනට මාතලේ සෞඛ්‍ය අධිකාරිතුමා බණ්ඩාරපොළ වත්තෙන් අක්කර 4ක් ගැනීමට කටයුතු කර තිබෙන අතර, ඒ ඉඩම තක්සේරු කර ඒ සඳහා රුපියල් 12,500 ක් අවශ්‍යය කියා තිබෙනවා. එම නිසා දැනට තිබෙන එකම අවශ්‍යතාව රුපියල් 12,500 ක් ගෙවා ඒ ඉඩම අත්පත් කර ගැනීමයි. එම මාතෘ නිවාසය සහ මධ්‍යම දිස්පැන්සරියට අවශ්‍ය ගොඩනැගිලි තැනීම සඳහා රුපියල් 2,50,000ක් පමණ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට වැය වෙනවා. එසේ නම් එපමණ මුදලක් වැය කර ඒවා සාදා දීමට පොරොන්දු වී තිබෙන මේ අවස්ථාවේදී, දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව ඇති එකම දේ රුපියල් 12,500 ක් ගෙවා එම ඉඩම අත්පත් කර දීමයි. දැනට මේ සඳහා සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාත් උපාධ්‍යක්ෂතුමාත් කටයුතු කරගෙන යනවා. මා ඉල්ලා සිටිනවා, පුළුවන් තරම් ඉක්මනින් ඒ ඉඩම අත්පත් කිරීමේ කටයුතු කර දෙන්නය කියා. ඒ මොකද? මේ සඳහා අනුමැතිය ලැබුණ හැටියෙම උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව එහි ගොඩනැගිලි තැනීමට බලාපොරොත්තුවෙන් සිටින නිසයි. එම නිසා මා සෞඛ්‍ය ඇමතිතුමාගෙන් තවදුරටත් ඉල්ලා සිටිනවා එම ඉඩම වහාම අත්පත් කරගත හැකි වන පරිදි නියෝගයක් යවන්නය කියා.

අනික් කාරණය රත්තොට ආසන්නයේ උකුවෙල කියා ඉතාම දුෂ්කර ප්‍රදේශයක් තිබෙනවා. ගම් හතළිහකට පමණ මධ්‍යස්ථානයක් වූ මේ ස්ථානයේ දිස්පැන්සරියක් පමණයි තිබෙන්නෙ. එය සාදා තිබෙන්නෙත් තාවකාලිකව ලබාගත් ගොඩනැගිලිවලයි. ඇත්ත වශයෙන් දැන් ස්ථිර ගොඩනැගිලි අවශ්‍යව තිබෙනවා. මා හිතනව ගරු ඇමතිතුමාත් දන්නවා ඇත කියා. ඒ ඒ පැත්තේ ඉන්නවා මෙවැනි වැඩවලට ඉදිරිපත් වන ත්‍යාගශීලී මහත්මයෙක් ජේ. ඒ. ගුණසේන මහතා කියා. එතුමාට අයිති වත්තක් තිබෙනවා, මාරු කොන වත්ත කියා. එහි විශාල බංගලාවක්ද තිබෙනවා. ඒ බංගලාව මේ සඳහා පාවිච්චි කරන්න පුළුවන් වේවියයි මා අදහස් කරනවා. උකුවෙල ප්‍රදේශයට මාතෘ නිවාසයක් සහිත මධ්‍යම බෙහෙත්ශාලාවක් ඉල්ලීම කලක සිටම කරන ඉල්ලීමක්. මට ආරංචියි ඒ සඳහා ගුණසේන මහතාට අයිති බංගලාව දෙන්නට එතුමා කැමැත්ත පළ කර තිබෙනවාය කියා. එම බංගලාවේ මේ සඳහා ඕනෑ තරම් ඉඩකඩ තිබෙන නිසා ගොඩනැගිලි ආදිය තැනීම පිණිස රජයට වියදමක් දරන්න සිදු වන්නෙත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිතුමාගේ විශෙෂ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ මහතාගේ කැමැත්ත අකමැත්ත ගැන මමත් කෙළින්ම විමසා බලන්නම්.

තවද ඔවිලිකන්දේ මාතෘ නිවාසයකට වතුර පොම්පයක් සවි කිරීම සඳහා රුපියල් 8,850 ක් වෙන් කර තිබූ අතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොන්ත්‍රාත්කරුවන් විසින් යන්ත්‍ර යක් සවි කරන ලද නමුත් එය නියමිත වතුර ප්‍රමාණය අදින්න පුළුවන්කමක් නැති කුඩා යන්ත්‍ර යක් නිසා, ඊට පසුව—සෑහෙන කලකට පෙර—එය ඉවත් කරගෙන ගොස් තිබෙනවා. මා පෙන්වා දෙන්නේ ලොකු යන්ත්‍ර යක් සවි කරන්නට නියමිතව තිබෙන තැනකට කොන්ත්‍රාත්කරුවන් විසින් කුඩා යන්ත්‍රයක් සවි කිරීම වැරදි බවයි. කෙසේ වෙතත් ඒ කුඩා යන්ත්‍රයත් ගලවාගෙන ගියාට පසු තවමත් වෙන යන්ත්‍රයක් ගෙනවිත් සවිකර නැහැ. එම නිසා මේ ගැන වහාම සොයා බලා නියමිත වතුර ප්‍රමාණය අදින්න පුළුවන් යන්ත්‍ර යක් ඉක්මනින් සවි කිරීමට සලස්වා එම මාතෘ නිවාසයට ජල පහසුව ලබා දෙන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවද, රත්තොට ආසනයේ අලකොල මඩ කියන ගමටත් වරකාමුර කියන ගමටත් සංචාරක දිස්පැන්සරි දෙකක් අවුරුදු ගණනක් තිස්සේ ඉල්ලන නමුත්, තවමත් ලැබී නැහැ. එම නිසා ඒ කාරණා දෙක ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 3.15

බී. වයි. තුඩාවේ මයා. (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති, මාතර ආරෝග්‍යශාලාව ඡන්ද කොට්ඨාශ 10කට පමණ තිබෙන ප්‍රධාන පංතියේ ආරෝග්‍යශාලාවක් බව. දැනට එම රෝහල සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් සාදාගෙන යනවා. එය සෑදීමට පටන්ගෙන දැන් අවුරුදු 5ක් පමණ ගත වී ඇතත් තවමත් වැඩ අවසන් වී නැහැ. එය සැප්තැම්බර් මාසය පමණ වන විට අවසන් වේවිය කියා ගරු ඇමතිතුමාගේ අදහස තිබෙන බව දැන ගන්න ලැබුණා. එහෙත් ඒ වන විට එය සම්පූර්ණ වන බවක් නම් පෙනෙන්නට නැහැ. එම නිසා යටත් පිරිසෙසින් මේ අවුරුද්ද අවසන් වන්නට කලින්වත් එය සම්පූර්ණ කිරීමට විධිවිධාන යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

අනික් කාරණය මාතර ආරෝග්‍යශාලාවේ ළමා වාට්ටුවක් තිබෙන නමුත්, ළමා රෝග විශේෂඥයෙක් එහි නැහැ. දැනට මාස හත අටක් තිස්සේම විශේෂඥ දෙස්තර කෙනෙක් නැහැ. මෙම ළමා වාට්ටුව ඡන්ද කොට්ඨාශ කීපයකම ළමයින්ගේ වෛද්‍ය කටයුතු කළ යුතු ළමා වාට්ටුවක් නිසා. වෛද්‍ය විශේෂඥයෙක් නැති වීම ඒ වාට්ටුවේ සිටින දරුවන්ට ලොකු කරදරයක් වී තිබෙනවා. ළමා රෝගීන් ගාලු රෝහලට ගෙන යන්නට සිදු වීම නිසා කරදරය තවත් උග්‍ර වෙනවා. එම නිසා මාතර රෝහලට වහාම ළමා රෝග විශේෂඥයෙකු පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අළුත් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා පැමිණියාට පසු මාතර රෝහලේ පිරිසිදු කම හා පාලන කටයුතු බොහෝ දුරට සතුටුදායක වී තිබෙන බව මතක් කරන්නට කැමතියි. එහෙත් අධිකරණ වෛද්‍ය නිලධාරියකු නොමැති නිසා ඒ වැඩ කටයුතු කිරීමත් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා පිටම පැවරී තිබෙන නිසා, රෝහලේ අනෙකුත් කටයුතු සාර්ථක ලෙස කිරීම අපහසු වී තිබෙනවා. එබැවින්, ප්‍රධාන පංතියේ රෝහලක් වන මාතර රෝහලට අධිකරණ වෛද්‍ය නිලධාරියකු පත් කොට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගේ වැඩ කටයුතු පහසුවෙන් කිරීමට සහයෝගය දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

මාතර දිස්ත්‍රික්කයේ ඡන්දදායක කොට්ඨාශ 10 ක පමණ රෝගීන්ට—විශේෂයෙන් ළය රෝගීන්ට—සිදු වී තිබෙනවා, ප්‍රතිකාර ගැනීම සඳහා ගාලු රෝහලට යන්නට. එම නිසා මාතර රෝහලට ළය චිකිත්සාගාරයකුත් අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන්නට කැමතියි.

මාතර නගරයේ බරවා රෝගය මර්ධනය කරන්නට තවමත් බැරි වී තිබෙන බව පෙන්වා දෙන්නටත් සිදු වී තිබෙනවා. බරවා රෝගය මර්ධනය කිරීම සම්බන්ධයෙන් චිකිත්සාගාර කටයුතු වෙනදාට වඩා පුළුල් කොට ඇතත්, මාතර නගරයේ ඇති අපවිත්‍රතාවත්, ක්‍රමවත් කාණු ක්‍රමයක් නොමැති වීමත් නිසා, මාතර නගරය තුළ බරවා රෝගය එන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

එන්නම වැඩි වෙමින් පවතින බව දැනුම් දෙන්නට සිදු වී තිබෙනවා. එහෙත් බරවා රෝගය නගරයට පමණක් සීමා වීම—නගරයෙන් පිටත බරවා රෝගීන් නොමැති වීම—නිසා හොඳින්ම පැහැදිලි වෙනවා, නගරයේ අපවිත්‍රතාව නිසාම බරවා රෝගය මර්ධනය කිරීම අපහසු වී තිබෙන බව. එම නිසා පළාත් පාලන ඇමතිතුමාත් සමග සාකච්ඡා කොට මාතර නගර සභාව මඟින් නගරයේ මතු පිට කාණු තැනීමේ වැඩ පිළිවෙළකට ආධාර කළොත්, දැනට බරවා රෝග මර්ධන ව්‍යාපාරය වෙනුවෙන් වැය කරන මුදල් සම්භාරයක් ඉතිරි කර ගන්නට පුළුවන්කම ලැබෙන බව සෞඛ්‍ය ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. මේ කරුණු කිහිපය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවමින්, මට නියමිත විනාඩි 5 ගත වන්නට පළමු මගේ කථාව අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)

(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)

(Dr. S. A. Wickremasinghe—Akuressa)

සභාපතිතුමනි, ආරෝග්‍යශාලාවල අද පවත්නා බෙහෙත් හිඟය ගැන මන්ත්‍රීවරුන් කිහිප දෙනකුම කරුණු ඉදිරිපත් කළා. ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙනුත් ලොකු දුක්ගැනවිලි ඉදිරිපත් වෙනවා, ආරෝග්‍යශාලාවල බෙහෙත් හිඟය ගැන මෙය ඉතා භයානක ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කම තිබෙද්දීත් නොවිසඳීම ගැනයි, අප චෝදනා කරන්නේ.

උදාහරණයක් වශයෙන් මානසික ආරෝග්‍යශාලා ගෙනහැර දක්වන්නම්. 81 වැනි ශීර්ෂයේ, 4 වැනි සම්මතයෙන් මානසික ආරෝග්‍යශාලාවල ඖෂධ සහ වෙනත් ශල්‍ය වෛද්‍ය අවශ්‍යෝපකරණ වෙනුවෙන් 1966-67 වර්ෂයේදී කර ඇති නියම වියදම රු. 3,42,350 යි. 1967-68 ඇස්තමේන්තුව— ඒ මුදල් වර්ෂයේ සම්පූර්ණ මුදල යොදවා නැහැ— රු. 5,00,000 යි. 1967-68 වර්ෂයට වෙන් කර ඇති මුදලින් රු. 8,600 ක් වියදම් කර තිබෙන බව නම් මා දන්නවා. 1968-69 ඇස්තමේන්තුව රු. 4,00,000 යි. එය කලින් වර්ෂයට වඩා රුපියල් ලක්ෂයකින් අඩු මුදලක්. වියදම් කර තිබෙන ප්‍රමාණය රු. 1,41,000 යි. ලෙඩුන්ගේ සංඛ්‍යාව වැඩි වුවත්, අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය වැඩි වුවත් මේ අවුරුද්දෙත් පස ගිය අවුරුද්දෙත් බෙහෙත් සඳහා වියදම් කර තිබෙන්නේ 1966-67 වියදම් කළ ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණයි. ආරෝග්‍යශාලාවලට වුවමනා තරමට බෙහෙත් ලබා ගන්නට මුදල් නිබියදීත් එය හරිහැටි ඉෂ්ට නොවන බව මෙයින් පෙනෙනවා. මෙය භයානක තත්ත්වයක්. මෙහි දූෂණයකුත් තිබෙනවා. මා එසේ කියන්නේ මෙන්න මේ කරුණු නිසායි. මානසික රෝගීන්ට දෙන මූලික බෙහෙත් ද්‍රව්‍යයක් තිබෙනවා. එම බෙහෙත් පෙත්තක මිල ශතයකටත් අඩුයි. බටහිර ජර්මනියෙන් ඒවා 500 ක් රු. 3.75 කටත් පෝලන්තය වැනි සමාජවාදී රටකින් එම පෙති 1,000 ක් රු. 4.00 කටත් ගන්නට පුළුවනි. සතයක්වත් මිල නොවන එම බෙහෙත් පෙත්තක් විවෘත වෙළඳ පොළේ—කළුකඩයේ නොවෙයි—විකිණෙන්නේ ශත 12 කටයි. ඉස්පිරිතාල වලට මෙම බෙහෙත් නොලැබෙන විට ඒවා විවෘත වෙළඳ පොළෙන් ලබා ගන්නා ලෙස ආණ්ඩුව නියම කරනවා. ඇතැම් විට ලෙඩුන්ටත් මේවා මිළදී ගන්නට සිදු වෙනවා. මෙය ලෙඩුන්ටත් විශාල හිරිහැරයක්. ශතයකටත් අඩුවෙන් මිළ වන බෙහෙත් පෙත්තකට ශත 12 ක් ගෙවන්නට ඔවුන්ට සිදු වෙනවා. "ඇන්ටි බයොටික්ස්" හෙවත් විෂබීජ නාශක බෙහෙත් පෙති ආණ්ඩුව විසින් ලබා ගන්නවා නම් පෙත්තක් ශත 5 කට වැඩි වන්නේ නැහැ. එහෙත් විවෘත වෙළඳ පොළේ එම බෙහෙත් පෙත්තක් ශත 50 ක් 60 ක් පමණ මිළ වෙනවා. ලංකාවේ ආරෝග්‍යශාලාවලට වුවමනා මුළු ප්‍රමාණයම සමාජවාදී රටවලින් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. එහෙත්, සමාජවාදී රටවලින් අඩු මිළට බෙහෙත් ද්‍රව්‍ය ලබාගෙන, බෙහෙත් හදන අධිරාජ්‍යවාදී කොම්පැනි සමග තරඟ කරන්නට මේ ආණ්ඩුව කැමති නැහැ. ආණ්ඩුව තමන්ට පුරුදු ප්‍රතිපත්තියම අනුගමනය කරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිස, විදේශ විනිමය අමාරු තත්ත්වයක තිබියදීත් ලාබෙට බෙහෙත් ද්‍රව්‍ය ලබා ගෙන මහජනයාට යහපතක් සෙතක් සලසන්නට වැඩ පිළිවෙළක් යොදන්නේ නැහැ. මා එල්ල කරන මේ චෝදනාව සත්‍ය යක්ද නැද්දැයි ගරු ඇමතිතුමා මේ ගැන නියම විධියේ පරීක්ෂණයක් පවත්වා සොයා බලන්න. 1967/68 වර්ෂය සඳහා නියම වියදම සඳහන් කරන්නට බැරි ඇයි? 1967/68 වර්ෂයේදී මානසිකාරෝග්‍යශාලා සඳහා ලක්ෂ 5 ක් ඇස්තමේන්තු කර තිබෙනවා. 1968/69 දී ඇස්තමේන්තු කර තිබෙන්නේ ලක්ෂ 4 යි. කලින් අවුරුද්දට වඩා ලක්ෂයක් අඩුයි. චිකිත්සාගාර සංඛ්‍යාව වැඩියි, ලෙඩුන් සංඛ්‍යාව වැඩියි, වුවමනා බෙහෙත් ප්‍රමාණය වැඩියි. එහෙත් තක්සේරු කර තිබෙන මුදල කලින් අවුරුද්දට වඩා ලක්ෂයකින් අඩුයි. අඩු මිළට බෙහෙත් ලබා ගන්නට ක්‍රම තිබෙනවා. එම බෙහෙත්වල තත්ත්වය ගැන නියම විධියේ සහතිකයක් අපට නැතැයි සමහර පණ්ඩිතයන් ඇතැම් විට කියන්නට පුළුවනි. එවැනි සහතිකයක් නැති, ධනපති ලෝකයේ නමක් ලබා ගෙන සිටින බවර්, ෆයිසර් වැනි ප්‍රසිද්ධ කොම්පැනිවලින් එම බෙහෙත් ගත යුතු යයි එම පණ්ඩිතයන් කියයි. නමුත් සමාජවාදී රටවලින් ගෙන්වන බෙහෙත් වර්ග පිළිබඳවත් ඒවාගේම වගකීමක් තිබෙනවා. ඒ රටවල රජයේ සංස්ථා මගින් තමයි මේ බෙහෙත් වර්ග නිෂ්පාදනය කරන්නෙ. එමනිසා බෙහෙත් වර්ග ඒ රටවලින් ගන්නවා නම් ඒ බෙහෙත් වර්ගවල තත්ත්වයත් වටිනාකමත් පිළිබඳව සම්පූර්ණ වගකීම ඒ ඒ රටවල රජය භාර ගන්නා බව මා මතක් කරන්නට සතුටුයි. එම නිසා මේ කාරණය සම්බන්ධව සොයා බලන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) මාතර ආරෝග්‍යශාලාවේ කණගාටුදායක තත්ත්වය සම්බන්ධයෙන් දැන් කරුණු ඉදිරිපත් කළා. මාතර ආරෝග්‍යශාලාවේ සාමාන්‍යයෙන් අභ්‍යන්තර රෝගීන් භාර සිය පනහක් පන්සියයක් පමණ සිටිනවා. බාහිර රෝගීන් හය සියයක් පමණ සිටිනවා. ඒ අනුව සාමාන්‍යයෙන් දිනකට රෝගීන් දහසකට අධික සංඛ්‍යාවක් ප්‍රතිකාර ලබනවා. මේ රෝහලේ අභ්‍යන්තර ලෙඩුන් බලා ගැනීමට වෛද්‍යවරුන් අට දෙනෙකු සිටිනවා. මේ අට දෙනාම විභාගය සමර්ථ වී පුහුණු වන්නට යෙදූ උදවියයි. ඒ උදවියට පුහුණුවක් දීම අත්‍යවශ්‍යයි. නමුත් තත්ත්වය කුමක්ද? ශල්‍යකර්ම සඳහා ඒ ආරෝග්‍යශාලාවේ සිටින්නේ එක විශේෂඥයායි. අභ්‍යන්තර ලෙඩුන් පන්සියයකුත් බාහිර ලෙඩුන් හය සියයකුත් සිටින ආරෝග්‍යශාලාවක එක "සර්ජන්" කෙනෙකු—ශල්‍ය වෛද්‍යවරයකු—පමණයි සිටින්නේ. ඉතින් අර උදවියට ශල්‍යකර්ම පිළිබඳව නියම පුහුණුවක් ලබා ගන්නට අවස්ථාවක් තිබෙනවාද? ඒ හැරත් ලෙඩුන් ගැනත් ලොකු ප්‍රවේශමක් තිබෙන්නට ඕනෑ. පුහුණු වන උදවිය පුහුණු පළපුරුදු වෛද්‍යවරයකු යටතේ තබන්නට ඕනෑ. මේ ආරෝග්‍යශාලාවේ ලෙඩුන් සිය ගණනකට එක ප්‍රධාන වෛද්‍යවරයකුයි සිටින්නේ. ඊළඟට සිටින්නේ මේ පුහුණු වන්නට පත් කළ "ඉන්ටර්න්ස්" ලා පමණයි. මේ තත්ත්වය ඒ අයගේ පුහුණුවටත් බාධාවක්, ඒවාගේම ලෙඩුන්ගේ ජීවිතවලටත් ලොකු තර්ජනයක්. ඒ කාරණය ගැන අවධානය යොමු කරන්නට ඕනෑ. "හවුස් ඔෆිසර්ස්" කියන වෛද්‍යවරුන් වැඩියෙන් පත් කරන්නට ඕනෑ.

අ. භා. 3.30

තවත් කාරණයක් තිබෙනවා. දකුණු කොළඹ ආරෝග්‍යශාලාවට ගියොත් තත්ත්වය සියැසින්ම දැක ගන්නට පුළුවනි. දකුණු කොළඹ ආරෝග්‍යශාලාවේ සිටින අමාරු ලෙඩුන්ගේ—වැසිකිළියට යන්නට පුළුවන්කමක් නැති අමාරු ලෙඩුන්ගේ—නැදෑයින්ට ආරෝග්‍යශාලාවේම නවතින්නට ඉඩ දී තිබෙනවා. මක්නිසාද? පෝච්චි දෙන්නට, ඒවා ගෙන යන්නට කෙනෙකු නැති නිසයි. එක වාට්ටුවකට එක කුලිකරුවකු බැගින් සිටිනවා. ඒ නැනැත්තාට සිය ලුම ලෙඩුන්ගේ කටයුතු කිරීම අමාරුයි. ඒවාගේම ලෙඩුන්ට ඔහු සොයා ගැනීමත් අමාරුයි. මේ තත්ත්වය නිසා ඒ රෝහලේ වෛද්‍යවරුන් ලෙඩුන් ගැන අනුකම්පා කර නීතිය කඩ කර ලෙඩුන්ගේ නැදෑයකුටත් නතර වෙන්නට ඉඩ දී තිබෙනවා. බොහොම ලෙඩුන් සාත්තුවේ දුර්වලකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ මයා.]

ගැන පැමිණිලි කරනවා. මුලින් මේ කටයුතු කරන්නට පිරිමි උපස්ථායකවරුන් පත් කර තිබුණා. නමුත් දැන් හෙදියන් මේ සියලුම වැඩ කටයුතු කරන්නට ඕනෑය කියා අළුත් වැඩ පිළිවෙලක් අනුගමනය කරනවා. ඇත්ත වශයෙන්ම මේක දියුණු ධනපති රටවල තිබෙන ක්‍රමයකුත් නොවෙයි. ලෝකයේ සෑම රටකම වාගේ හෙදියන් කොටස් කීපයක් සිටිනවා. පළමුවන පෙළේ හෙදියන් ඔය ඉන්ජක්ෂන් දීමාදී කටයුතු කරනවා. ඊළඟට තිබෙන කටයුතු කරන්නට දෙවන පෙළේ හෙදියන් සිටිනවා. මේ ආකාරයට ඒ ඒ කටයුතු කරන්නට හෙදියන් කොටස් දෙක තුනක් සිටිනවා. ගැහැණු හෙදියන් ගැහැණුය පිරිමිය කියා භේදයක් නැතිව සියලුම ලෙඩුන්ගේ කටයුතු අනිවාර්යයෙන්ම කළ යුතුය කියන ප්‍රතිපත්තිය තමුන්නාන්සේලා අනුගමනය කරනවා නම් ඒ ගැන මා රණ්ඩු කරන්නේ නැහැ. නමුත් අපේ රටේ තිබෙන තත්ත්වය ගැන විකක් කල්පනා කර බැලිය යුතුයි. මුලින් තිබුණු ක්‍රමයේ යම් වැදගත්කමක් තිබුණු බව අපි පිළිගන්නට ඕනෑ. සමහර ආසියාතික රටවල ඒ ක්‍රමය තිබෙනවා. විශේෂයෙන්ම ලෙඩුන්ට වෙන වෙනම කාමර නැති, ඇඳන් උඩත් ඇඳන් යටත් ලෙඩුන් සිටින තැන්වල දියුණු තත්ත්වයක් තිබෙන ආරෝග්‍යශාලාවල අනුගමනය කරන සිරිත් සහ පැවතුම් ඇති කරන්නට යෑම අන්ධ භක්තික මෝඩ ක්‍රියාවක් බව මා ප්‍රකාශ කරනවා. අපේ රටේ ආරෝග්‍ය ශාලාවල වාට්ටුවල ලෙඩුන් පිරී ඉතිරී සිටිනවා. එක වාට්ටුවකට නියම කර තිබෙන්නේ ලෙඩුන් විස්සයි. නමුත් සියයක් ඉන්නවා. ඒ තත්ත්වය වෙනස් කරන්නට බැහැ. නියම ගණනට වඩා ලෙඩුන් වාට්ටුවලට ඇතුළත් කරන්නට එපාය කියා තමුන්නාන්සේට නියෝගයක් කරන්නට පුළුවන්ද? බැහැ. අද වැඩ කටයුතු සිදු වන ආකාරය අනුව ආරෝග්‍යශාලා ලොකු කරන්න තව අවුරුදු 50 ක් යයි. අකුරැස්සේ ආරෝග්‍යශාලාවේ ටැන්කිය හදා අවසාන වුණේ 1965 දියි. එහෙත් නළවලින් වතුර ලැබුණේ මේ අවුරුද්දේ දියි. ජල නළ ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරවා ගන්න අවුරුදු 5 ක් 6 ක් ගත වී තිබෙනවා. ආරෝග්‍යශාලාවල තදබදය ඇති වන විට ලෙඩුන්ට පුළුවන් තරම් පහසුකම් ඇති කරන්න ක්‍රියා කරන්න ඕනෑ. දකුණු කොළඹ ආරෝග්‍යශාලාවේ දැනට ඉඩ දෙන්නා වාගේ, රෝගීන්ගේ නෑදෑයන්ට ආරෝග්‍යශාලාවේ පදිංචි වීමට අවස්ථාව සලසන්නේ නැතිව, හෙදියන්ගේ ප්‍රශ්නය පිළිබඳව නියම පරීක්ෂණයක් ඇති කර කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ආයුර්වේදය සම්බන්ධයෙන් අද පවතින්නේ මහා ව්‍යාකූල තත්ත්වයක්. ආයුර්වේද බෙහෙත් ශාලා නඩත්තුව සහ පාලනය පිළිබඳ සම්පූර්ණ වගකීම පළාත් පාලන ආයතනවලට භාර ගන්නය කියා තිබෙනවා. නවීන වෛද්‍ය ක්‍රමය පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් වග කියනවා. පළාත් පාලන ආයතනවල ඒ සම්බන්ධව වගකීමක් නැහැ. ලෙඩ්ඩු ඉන්නේ එක වර්ගයයි. මොන ක්‍රමයෙන් හෝ හොඳට වෙදකම් කළේ නැත්නම් ලෙඩුන් මැරෙනවා. සෞඛ්‍ය සේවය සම්බන්ධයෙන් පාලනයක් ඇති කර කටයුතු කිරීමට, පළාත් පාලන ආයතනවලට තිබෙන සුදුසුකම මොකක්ද? අසිනිවාසිකම මොකක්ද? වගකීම මොකක්ද? වුවමනා කරන්නේ මොනවාද, දඬුවම් දෙන්නේ කොහොමද, මුදල් යොදවන්නේ කෙසේද යනාදි කිසිම දෙයක් ගැන දන්නේ නැති සංවිධානයකට ආයුර්වේද වෙදකම පිළිබඳ පාලනය භාර දී තිබෙනවා. පාරක්වත් පාලනය කර ගැනීමට බැරි ගම්සභාවලට ආයුර්වේද වෛද්‍ය සේවය සම්පූර්ණයෙන් භාර දීමෙන් මොනවා බලාපොරොත්තු වන්නද? මේක ගරු ඇමතිතුමාගේ වරදක් නොවෙයි. මේ ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ තමුන්නාන්සේගේ තීරණයක් උඩ නොවන බව මා දන්නවා. ආයුර්වේදයත්, නවීන වෛද්‍ය ක්‍රමයත් දෙකම අද පිළිගෙන තිබෙන නිසා, මේ ක්‍රම දෙකම එකම අමාත්‍යාංශයෙන් පාලනය වන නිසා, මේ වෙනස්කම ගැන කල්පනා කර ඒ වෙනස නැති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ වෙනස නැති කිරීමටය කියා නවීන වෛද්‍ය ක්‍රමයක් පළාත් පාලන ආයතනවල පාලනයට භාර දෙන්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා මා කියන්නේ නැහැ. එහෙම කළොත් වසංගත හැදිලා මිනිස්සු මැරෙයි. මේ වෛද්‍ය ක්‍රම දෙකම වගකීමක් ඇතිව ක්‍රියාත්මක කළ යුතු නිසා මේ සම්බන්ධ මූලික ප්‍රතිපත්තිය ගැන කල්පනා කර ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින්, ගරු සභාපති තුමනි, තමුන්නාන්සේට මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන සවලපය අවසාන කරනවා.

ගරු ඊ. එල්. සේනානායක

(கௌரவ ஈ. எல். சேனநாயக்க)
(The Hon. E. L. Senanayake)

Mr. Chairman, I have now listened to about five hours of very valuable criticism and suggestions made by hon. Members from both sides of the House.

Sir, the Ministry of Health is responsible, as the hon. Member for Welimada (Mr. Percy Samaraweera) said, for the nation's health. The Ministry of Health has been described by many newspaper articles as a "sick giant". Yes. The Ministry of Health is a giant and it is sick because it deals with the sick. Of every type of illness, from birth to death, it is the medical services that are responsible for prevention and cure.

Every Government and every one of my predecessors have done their utmost to improve the health of the nation. As to an individual, health is the greatest wealth of a nation. I do not think any Government or any Minister of Health will grudge whatever they can afford to improve the health conditions of the people of the country.

Presently, for this current year, the National Government has earmarked Rs. 244 million for health services. On top of this there are unexpected calls. Supplementary Estimates were asked for to meet emergencies like the malaria epidemic that reappeared in this Island about 20 months ago. So no Government or no Minister of Health, with the best will in the world, can satisfy all the health needs of the nation. Not only in this country of ours but in any country in the world, the health services can only be contained ; they can never satisfy one hundred per cent, because every day new problems arise, new illnesses are discovered. Old illnesses that are believed to have been wiped out reappear. Therefore, I do not think anyone can say that we can satisfy the health requirements to the fullest extent.

Having listened to all the criticisms, I am afraid I will not be able to answer every one of the hon. Members who spoke, but I shall try to answer the important points not touching on purely parochial matters.

The hon. Member for Kolonnawa (Mr. Ilangaratne) raised the important issue of a middle grade in the nursing service. In 1958 the then Minister of Health abolished the attendants system that prevailed in the hospitals for fifty to sixty years. They allowed the Attendants Service to die. No recruitments were made to this service after 1958.

In 1961 the then Minister of Health introduced a class of nurses called nurse aides who were given a very short training, but in 1963, after the famous case of Miss Witanage, the nurse aide who committed suicide, from the third storey of the secretariat, the Minister of Health abolished the nurse aide system and absorbed the nurse aides then in service, after giving them a training, as full-fledged nurses.

The hon. Member for Kolonnawa raised this matter on a previous occasion and I replied to him. This is a matter to be decided at Cabinet level and I will be presenting my views in the near future.

The other points he raised are matters concerning his electorate.

The hon. Member also spoke about the present condition of the Mental Hospital, Angoda. I shall come to that presently when I deal with that section.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊ. එල්. සේනානායක]

The hon. Leader of the Opposition (Mrs. Sirimavo Bandaranaike) again referred to the unfortunate incident of the death of Revd. Vachisssara. I have already made statement on the Floor of this House on this matter. The Coroner's inquiry has been held and the report of his findings has been published. A full departmental inquiry has also been held. The report of that inquiry has not been submitted to me as yet. When it is submitted to me, being a layman I will not proceed to judge on the merits of the matter, but I will entrust the inquiry notes and the findings to a competent surgeon who will be able to give an unbiassed opinion. I shall not say anything more about that.

The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) stated that the Kalutara District had been given step-motherly treatment in the matter of drugs. I had the time to look into it. The amount allocated to the Kalutara District had been cut by Rs. 50,000. This had been done purely on the estimates of the S.H.S. in charge of the area who went by the figures of last year—the actual amount used. I have, however, asked the Department to look into the matter and to see that the cut is restored if necessary.

Coming to the Health Ministry as a whole, I have got to place before this House some very interesting figures. During the past 4½ years, from 1965 to 1969, this Government has spent Rs. 52,198,937 by way of capital expenditure on improvements, buildings and facilities to medical institutions in the Island. When you compare this with the previous period, you will see that from 1960 to the end of 1964, the then Government spent Rs. 23,319,948. The comparison will show that the National Government in its period of 4½ years has spent more than double the amount that had been spent during the period of the previous regime, and hon. Members of this House will appreciate that when this Government took office the national coffers were not very full. They were more or less at their lowest ebb.

This money has been spent by the National Government on institutions covering every type of requirement and in every province and in every electorate.

I am very grateful to some hon. Members who mentioned that in respect of health services they have not received step-motherly treatment because they happened to be Opposition Members of Parliament. I, my Parliamentary Secretary and the department have not discriminated against any Member of Parliament be he a Government or an Opposition M. P. Politics cannot and should not interfere when it comes to matters of health.

During the past 4½ years, the following works were completed by this Ministry: For the year 1965-66, 15 water supply schemes, 2 sewerage schemes, 4 central dispensaries, 6 administration blocks, 3 kitchens, 7 maternity wards, 24 surgical wards, 2 thitry-six-bed children's wards and 12 other wards and 24 rural hospitals; for the year 1966-67, 22 water supply schemes, 3 sewerage schemes, 2 kitchens, 7 maternity wards, 2 operating theatres, 4 central dispensaries, 1 X-ray block, children's wards, administration block, major staff quarters and three drug stores.

In the year 1967-68, 14 water supply schemes were completed. Two sewerage schemes, 7 central dispensaries, 5 maternity wards, 5 surgical wards, minor employees quarters, kitchens, stores, operating theatres, 1 cobalt unit and 1 V. D. clinic were completed. In 1968-69 we hope to complete 8 water supply schemes, 9 sewerage schemes, 3 children's wards 20 central dispensaries, 18 maternity wards, 6 rural hospitals, 2 operating theatres. 1 X-ray unit. 3 bhikku wards, 3 drug stores, 2 surgical wards, 2 other wards, 5 dental clinics, one eye bank.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

This indeed is a very proud achievement where the development of our health institutions is concerned, and, as I mentioned a little while ago, this money has been utilized to benefit all parts of the Island, all provinces.

During the Second Reading Debate an hon. Member from the North did mention that nothing much has been done for them during the past 4½ years. I am sorry that that Member is not here at the moment, but he later came and told me that he did not mean it, that the reference was to the cobalt unit.

On the question of the cobalt unit, now that there are three Members from the North present, I wish to mention that so far no cobalt unit has been removed to Kandy. My predecessor, during his time, had ordered that two cobalt units be established, one in Jaffna and one in Kandy. That position remains. The second cobalt unit that came was installed at Maharagama, because Maharagama is the one institution that caters to all the cancer patients who come from all parts of the Island.

අ. භා. 3.45

I agree with the hon. and fair Member for Mirigama (Mrs. J. P. Obeyesekere) that the space available at Maharagama is not sufficient. It would be a good thing if we can decentralize this institution. I can quite understand that poor people from the Eastern and Northern Provinces, with all the language difficulties, find it extremely difficult to come down to Maharagama. It was pointed out that many patients who were recommended treatment at Maharagama preferred to remain in Jaffna or in Batticaloa and die, rather than come all the way to Maharagama. Therefore, we will make every effort to have a cobalt unit established in Jaffna as soon as possible.

Another very important addition to the health services during the past 4½ years, from 1965 to date, is the appointment of 600 new medical officers, 2,375 nurses, 1,058 midwives, 140 pharmacists, 53 dental surgeons, 86 dental nurses, 33 radiographists, 20 physiotherapists and 80 public health inspectors. In all, there has been an addition to the cadre of the Health Department of a total of 7,600 during the period 1965 to 1969.

With regard to the blood transfusion service, the first cut imposed on my Votes was on the blood transfusion service. I think only one Member spoke on this subject. I am happy to tell this House that last year, on the 8th of August, on the Esala full-moon day, the Hon. Prime Minister, at my invitation, inaugurated in Kandy a free blood donation scheme. Up to date we have received 22,000 pints of blood free. In other words, out of the 42,000 pints of blood collected during the past 12 months, 22,000 pints have been given as free donations. What is important is not the saving of Rs. 220,000 but the fact that the public responded in a very generous hearted way to the appeal made by our blood transfusion service. This response came from every part of the Island.

I must take this opportunity to thank every one of my Colleagues—hon. Members on both sides of the House—for the great encouragement they have given me in their electorates for this noble cause.

Another important point was raised. That was the question of the free rice meal to patients in the general hospitals. It is true that with the introduction of the cut in the rice ration from two measures to one, the hospitals had to curtail the rice meal unless the patients produced their rice ration books. But this does not apply to long-time patients in the mental hospitals, leper asylums and various institutions of that sort. Those patients are given their rice meal.

I should like to mention here that on the occasion I visited the Anuradhapura Hospital with the hon. Member for Anuradhapura (Mr. Ratnayake) I was told that the patien-

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු ඊ. එල්. සේනානායක]

in this hospital were given rice—not on government account, but on contributions made by the public. Taking this as an example, I made an island-wide appeal for contributions of rice for the sick people, and you will be surprised to know that in response to my appeal the people in every electorate and from all parts of the Island have generously contributed to a fund known as "Rice for the Sick"; so much so, that in the year 1968-69, 16,000 bushels of rice to the value of Rs. 876,000 have been received as free donations. Of course, I can tell you quite boldly that at least in 75 per cent of the hospitals—rural hospitals, maternity homes in far-flung areas—two rice meals are given on these contributions. I am sure that before long I will be able to report to this House that at least the main meal—the lunch—will be a rice meal.

The other point raised by hon. Members was about the shortage of drugs. I would like the hon. Members to know that close upon 700 different types of drugs are imported into this Island, both by the Civil Medical Stores and the private sector.

The hon. Member for Walapane (Mr. T. B. M. Herath) mentioned that millions of rupees are going down the drain as a result of drugs that are thrown away because they are outdated. That is wrong. The Government imports nearly Rs. 20 million worth of drugs for a year. The private sector imports a similar quantity. Of this Rs. 20 million worth of drugs, not even 10 per cent is thrown away at the end of the year. But there are certain drugs that carry only a limited shelf life, like insulin. There are so many vital drugs that carry a shelf life of 1½ to 2 years. What if outdated drugs are administered to the patients? Is it not the duty of the Government to see, even if the Government is going to lose two or three lakhs, that the people of this country are not treated with outdated drugs?

The drug shortage was due to many reasons. As a result of devaluation the amount of drugs that could have been imported on the Vote allowed was reduced by a certain percentage, and also certain drug imports in the private sector. The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) pointed to the shortage of insulin. As soon as this was pointed out to me in the House I made inquiries and found that we had enough insulin in the Civil Medical Stores. But in the private sector there was a shortage of insulin. When I went into this matter I found that certain people who had large quotas for insulin had not imported their current quotas. I had to tell them that unless they airlifted their quotas immediately they would have their import quotas cancelled, and they immediately imported. But there was a certain period when there was a shortage of insulin in the private sector.

Today, the hon. Member for Akuressa referred to the sale of drugs in the open market. Most of our drugs are bought on world tender. We buy from the cheapest possible source. But there are certain countries that do not give us a guarantee about the quality of the drugs. There was an instance where a certain pill was imported from the cheapest source. It was reported to me by medical men that when this pill was administered it came out in the same form as it went in; it was not distintegrated in the stomach.

We can buy from the cheapest source but in the case of drugs and medicine, unlike anything else, the doctors administering them must be sure that the patient will get their effect. Therefore, it is not an easy matter when you say that we must buy the cheapest drug. We buy drugs on world tender.

We have also had a lot of difficulties in regard to shipping. My Colleague, the Minister of Nationalized Services, knows that shipping to Ceylon today is very difficult. Sometimes from the date of placing

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the order to the date of receiving the goods there is an interval of about nine months. Sometimes when the drugs arrive the period of validity is almost over.

The problem of drugs is a difficult one and we have tried our best to meet the demands of the public. Whenever the newspapers or hon. Members of the House brought to our notice that there was a shortage of any drug, we would verify and if the information was found to be correct we have not hesitated to airlift the necessary drugs.

Subsequent to the price control of drugs, certain importers stopped importing certain drugs. In the private sector, each importer is given a quota. Recently I found that certain importers who had quotas had not imported at all. With the help of the Controller of Imports and the Hon. Minister of State I was able to cancel their quotas and re-allocate them to genuine importers of drugs. There were some people who had submitted a list of 15 drugs and we had given them the permits. They imported five drugs which were fast-selling and had a big margin of profit, and did not import the rest, as a result there was a shortage in those drugs which they omitted to import.

During any shortage of drugs, the Civil Medical Stores has offered to the private sector, to the druggists and the private practitioners, any drug they needed. When the shortage of insulin was reported I had newspaper notices published; I instructed the department to go on the radio; and we offered insulin for sale to anyone from the Civil Medical Stores.

Drug shortage is a problem that has been highlighted by many hon. Members. I can assure them that this year's foreign exchange allocation for drugs has been increased and I do not visualize any severe shortage in the near future.

සභාපති

(அக்கிராசனர்)

(The Chairman)

The Sitting is suspended till 4.30 P.M.

රැස්වීම ඊට අනුකූලව නාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி பி.ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 4.30 P.M. *and then resumed.*

ගරු ඊ. එල්. සේනානායක

(கௌரவ ஈ. எல். சேனநாயக்க)

(The Hon. E. L. Senanayake)

Mr. Chairman, the greatest challenge we had to face in the recent past was an epidemic of malaria, malaria that we all thought was almost eradicated. Everyone had good reason to believe that it was eradicated because in 1963 the recorded cases of malaria had come down to 17. But, unfortunately, due to some reason—I do not want to put the blame on any person or body of persons—the normal expenditure on spraying of D. D. T. had been suddenly withdrawn. In 1963-64 the positive cases of malaria came down to 29; in 1964-65, it went up to 392; in 1966 it was 439; in 1967 it rose to 1,314; in 1967-68, the figure went up to 298,914 and in the year 1968-69, it reached a figure of 483,000 positive cases.

I must pay a tribute to the Health Department for the marvellous response they were able to get from the public of the malaria-stricken areas and from Members of Parliament who went out of their way to help us in every way, and I am happy to report that with half a million cases of malaria recorded the number of confirmed deaths in 1967-68 was 25, and in 1968-69 it was only 19. Those of us who remember the malaria epidemic of the early thirties where whole families and entire villages were wiped out must be happy that we have very effective drugs

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊ. එල්. සේනානායක]

for treatment of malaria-afflicted people and that the use of D. D. T. over vast areas have had good results. I must however warn hon. Members that if anyone says that we have got over the problem of malaria it is a sad mistake. We have made this same mistake once and we cannot afford to make it twice over.

I am very grateful to the W. H. O. who came to our rescue in many ways in our campaign against malaria. They gave us an emergency programme, a crash programme. We had to employ 7,000 new people to get through this crash programme by the end of May this year. They have also warned us that for the next ten years Ceylon will have to have a very close watch on the situation if we are to come to the happy position of saying, like some other countries, that we have eradicated malaria. This year my Ministry is spending nearly Rs. 22 million on malaria work alone. This expenditure, although unfortunate, is worthwhile because if we do not stop the spread of malaria all our development works are bound to suffer.

Hon. Members also spoke on the question of filaria. Here, too, I am very happy to report that rural filaria has been almost eradicated. No cases have been detected this year so far. In 1968 there were only two cases of rural filaria detected. But the situation in regard to urban filaria is a little different.

At the start of the campaign the infection rate of urban filaria in 1947 was found to be 7.3 per cent. By spraying mosquito breeding places regularly, in 1968 the infection rate came down to 1.2 per cent, and we expect in 1969 that the infection rate will be below 1 per cent.

However, special surveys in the areas close to Gampaha and Veyangoda have shown that there is a high rate of infection. Urban filaria cannot be controlled for certain reasons, one of which is that drainage in certain areas is very poor. The hon. Member for Matara (Mr. Tudawe) mentioned that surface drainage in his areas was very poor. In regard to Peliyagoda and Kolonnawa, those areas also are still not very satisfactory. But we are working out a scheme whereby the Government will give financial aid to local authorities to improve their drainage conditions, thereby helping us to eradicate filaria.

The question of employment of medical graduates has been a burning one for the last one year. I should like to place the facts before this honourable House. In the year 1968-69 the total number of medical graduates who passed out was 338. Out of this, the number who applied for employment was 328. The number who turned up at the interview was 312. Up to date we have appointed 286, leaving a balance of 26. Out of this 26, many young men have gone into private practice. I have on my circuits, met young doctors who took advantage of the offer we made where on an allowance of Rs. 250 they would work a few hours in the hospitals as part-time doctors and try to establish themselves in private practice. I am very glad to say that many of these young men, when I asked them "Do you want employment ?", answered, "No, we are doing well in private practice."

In the year 1969-70 we shall have a total number of 172 passing out. Out of this, 162 have applied for appointments. We have already offered employment to 145, leaving a balance of only 17, who, I am sure, will be absorbed with certain retirements that may take place during the year.

So the picture that is presented that medical undergraduates are languishing without jobs is not a true one. Unfortunately we could not absorb them as in the past. In the past there was only one medical college, but a few years back a second was opened in Peradeniya,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and the numbers passing out could not be absorbed automatically. Hon. Members know that every Ministry has a budget. We have to work to that budget. We would like to replace every apothecary with a medical officer but we cannot do that as we are working within a given budget. But we have provided employment for the majority of the graduates who have passed out.

The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) raised the question of channelled consultation practice. This matter is also of great public importance. The Cabinet Conclusion of February 1964 was to meet, on a temporary basis, the shortage of facilities in the private sector. The first part relates to private practice allowed to registered and assistant medical practitioners and district medical officers in areas where no private practitioners are available. This financial year the Government has not been able to absorb all the medical interns. Therefore it was decided to offer to those interms who were not selected for government service, part-time employment in areas where district medical officers have priveate practice. As each intern selected for any area is offered part-time employment, the private practice of the D. M. O. is abolished in that area. It is likely that very soon there will be enought medical graduates who are not absorbed by Government to serve the private patients in these areas. The position is being watched and private practice will be withdrawn from all D. M. O's and registered and assistant medical practitioners when private practitioners settle down in those areas and there are enough general practitioners in the private sector.

Channelled consultation practice was allowed to specialists on a doctor-to-doctor basis so long as there was a shortage of specialists in the private sector. In Colombo there is a large number of specialists who have retired from government service and are available to the private sector. However, the position in the provinces is not similar. The number of specialists who have settled down in the provinces after retirement is small. The position will be watched closely, and action will be taken to abolish channelled consultation practice in specified areas when an adequate number of specialists is available in these areas to serve the private sector. The position is being actively reviewed from time to time, and the abolition of channelled consultation practice will be spread over a few years according to the availability of specialists in the private sector.

Take the case of Kandy. In Kandy now we have only one specialist who has retired and he happens to be a gynaecologist. We have no other specialists who have retired.

So to abolish channelled consultation practice throughout the Island will not be a safe measure. After all we are dealing with life and death. Unlike in Colombo, where we have specialists of all types in the provinces we cannot say the same thing. But it is the considered opinion of everyone that channelled consultation practice must be abolished.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந் துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

Will the Hon. Minister please spend a little money to white-wash the building at Kynsey Road ? It has not ben white-washed since you took over.

ගරු ඊ. එල්. සේනානායක
(கௌரவ ஈ. எல். சேனநாயக்க)
(The Hon. E. L. Senanayake)

The hon. Member will realize that our people do not act with a sense of responsibility in regard to our institutions. If you white-wash it today, you can imagine its state in two weeks' time. Anyway, I shall look into the matter.

Under the Ministry of Health also comes the Department of Ayurveda. I was very sad to see in a newspaper

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊ. එල්. සේනානායක]

western doctor that this Government is spending unnecessarily on the useless institution of ayurveda. I should like to tell that doctor that, as much as we are proud of our language, our history, our religion and our culture, we are also proud of our national system of medicine which has existed in this country for well over 2,300 years. When did the allopathic system of medicine come into this country? This system of medicine came into this country just over a hundred years ago. But our race has lived in Sri Lanka for nearly 2,500 years. We had our own system of medicine. We still have our own system of medicine. And I am proud to say that every one of my predecessors, starting from the late Mr. S. W. R. D. Bandaranaike when he was Minister of Health in the United National Party Government, has given encouragement to the development of ayurveda. Looking through the files I find that every one of my predecessors has always given a helping hand towards developing and fostering ayurveda in this country.

I should like to say that an Ayurveda Commission has been appointed and research laboratories have been set up. I am happy to say that in the financial year 1968-69 the National Government has spent Rs. 5,898,570 on the maintenance of four ayurveda hospitals and 221 ayurveda dispensaries. You will be surprised to hear that the number of outdoor patients who received ayurvedic treatment is 3,340,838. If we did not have these ayurveda dispensaries and hospitals, our western dispensaries and hospitals woud have had to take in these patients, too, totalling nearly 3½ million. And the popularity of the ayurveda hospitals can be gauged from their relative positions in Anuradhapura. In Anuradhapura the ayurveda hospital and the western hospital are in premises adjoining each other. On every visit I paid I found in regard to out-patients that attendance at the ayurveda hospital was definitely greater than at the western hospital. Also, the cost to this country on a patient who is treated at an ayurvedic hospital or dispensary is only Re. 1.76, while western treatment costs Rs. 6.42. Every action is being taken to develop ayurveda.

අ. භා. 4.45

Many hon. Members referred to ayurvedic dispensaries that are being run by local authorities. I think we are giving assistance by way of grants to nearly 224 ayurvedic dispensaries maintained and run by local bodies. We are also spending Rs. 2,263,000 on an ayurvedic hospital at Kurunegala, and Rs. 1,155,000 for an ayurvedic hospital at Beliatta. We are giving assistance to 131 village councils, 46 town and urban councils, 8 municipal councils and also to the Anuradhapura Preservation Board—in all, to 186 local authorities. By way of grant we are giving Rs. 2,385,000 to 219 dispensaries.

One thing I want hon. Members to remember is that once a local authority opens a dispensary it must run it for a period of one year to become entitled to a grant. That is the only condition that is laid down.

I think I have covered most of the points raised. Although I have prepared notes on various subjects, some of them were not even touched on by hon. Members. So I am not going to waste the time of this House on this occasion by referring to them. I would like to thank every one of my colleagues who during this period I have been Minister of Health, have been of great assistance to me. Their requests have been very reasonable. I also want to thank my Deputy Minister for the very effcient support she has given me. Being new to the job, I would have found it very difficult if not for the fact that she took over the entire building programme in my Ministry. Thanks to her efforts I have had the privilage of opening many institutions that were not complete when I took over the Ministry.

Digitized by Aanaham Foundation
noolaham.org | aavanaham.org

I also take this opportunity to thank the officials of my department. They have always tried to guide me and give me advice. I also thank you, Mr. Chairman, and hon. Members for having listened to me.

"80 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 24,61,720 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

80 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"80 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 24,61,720 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

80 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 2,461,720 for Head 80, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 80, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 5,73,812

வாக்குப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 5,73,812.

Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 573,812

"80 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 5,73,812 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

80 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"80 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 5,73,812 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

80 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 573,812 for Head 80, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 80, Vote 2, ordered to stand part of the Schedule.

81 වන ශීර්ෂය.—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

81 ஆம் தலைப்பு.—சௌக்கியத் திணைக்களம்

HEAD 81.—DEPARTMENT OF HEALTH

வாக்குப்பணம் இல. 4—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 21,10,13,757.

4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 21,10,13,757

Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 211,013,757

"81 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 21,10,13,757 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

81 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"81 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 21,10,13,757 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

81 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 211,013,757 for Head 81, Vote No. 4, be inserted in the Schedule", put, and agreed to.

Head 81, Vote 4, ordered to stand part of the Schedule.

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 90,00,000

வாக்குப்பணம் இல. 5—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 90,00,000

Vote No. 5.—Services provided by the Department—Capital Expenditure Rs. 9,000,000

"81 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 90,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

81 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"81 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 90,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

81 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 9,000,000 for Head 81, Vote No. 5, be inserted in the Schedule", put, and agreed to.

Head 81, Vote 5, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

82 වන ශීර්ෂය.—ආයුර්වේද දෙපාර්තමේන්තුව

82 ஆம் தலைப்பு.—ஆயுள்வேத திணைக்களம்

HEAD 82.—DEPARTMENT OF AYURVEDA

4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 69,62,834

வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தில் அளிக்கப் படும் சேவைகள் மீண்டுவருஞ் செலவு, ரூபா 69,62,834

Vote No. 4.—Services provided by the Department—Recurrent .Expenditure, Rs. 6,962,834

"82 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 69,62,834 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

82 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"82 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 69,62,834 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

82 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 6,962,834 for Head 82, Vote No. 4, be inserted in the Schedule", put, and agreed to.

Head 82, Vote 4, ordered to stand part of the Schedule.

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 4,30,500

வாக்குப்பணம் இல. 5—திணைக்களத்தால் அளிக் கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 4,30,500

Vote No. 5.—Services provided by the Department—Capital .Expenditure, Rs. 430,500

"82 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 4,30,500 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

82 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"82 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 4,30,500 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

82 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப்பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 430,500 for Head 82, Vote No. 5, be inserted in the Schedule", put, and agreed to.

Head 82, Vote 5, ordered to stand part of the Schedule.

85 වන ශීර්ෂය.—ජනසතු සේවා අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 10,89,544

85 ஆம் தலைப்பு.—தேசியமய சேவைகள் அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும் ரூபா 10,89,544

HEAD 85.—MINISTER OF NATIONALIZED SERVICES

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 1,089,544

ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)

(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலப்பிட்டிய)

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු සභාපතිතුමනි, "සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතුය" යන යෝජනාව මා ඉදිරිපත් කරනවා.

ජනසතු සේවා අමාත්‍යාංශය ගැන කල්පනා කර ගෙන යන විට විශේෂයෙන්ම කිය යුතු කරුණක් තිබෙනවා. පසුගිය අවුරුදු $4\frac{1}{2}$ ඇතුළත මෙම අමාත්‍යාංශය විවේචනයට ලක් වුණා පමණක් නොවෙයි, එහි හොරමැරකම් ඇති වුණා කියනවා පමණක් ද නොවෙයි; ඇත්ත වශයෙන්ම මේ අමාත්‍යාංශය මගින් කළ යම් යම් ක්‍රියා සම්බන්ධව රාජකීය කොමිසමක් පත් කිරීමට තරම් කරුණු සිදු වී තිබෙනවා. මා එසේ කීමෙන් අදහස් කළේ ගරු ඇමතිතුමා මේ කරුණු ගැන නොබැලුවාය කියන එක නොවෙයි.

ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටු වූ අවස්ථාවේ එයින් විශාල සෙවක් බලාපොරොත්තු වුණා; විශාල ධනයක් ලැබෙයි කියා බලාපොරොත්තු වුණා. මේ මණ්ඩලය මගින් විශාල ධනයක් ඉපැයීමට හැකි වන අන්දමට එය පරිවර්තනය කිරීම සඳහා යම් යම් නීති රීති ගෙනැවිත් අවුරුදු 10 ක් පමණ ගත වී තිබෙනවා. දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ දේශපාලන න්‍යාය ප්‍රතිපත්තිවලට අනුව ජනසතු සේවාවන් ආරම්භ කළා. මා එක කරුණක් ගරු ඇමතිතුමා ගෙන් අහන්නට කැමතියි. බණ්ඩාරනායක අගමැතිතුමා ජනසතු සේවා කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේ පටන් ගත්තේ නැත්නම් මේ අමාත්‍යාංශයවත් නැහැ. එහෙත් මේ අවුරුදු $4\frac{1}{2}$ තුළ තමුන්නාන්සේලා ජනසතු කළ එකම ව්‍යාපාරයක්වත් තිබෙනවාද? කලින් තිබුණු ප්‍රතිපත්තියක් උඩ වරායවල් දෙකක් ජනසතු කළා. එපමණයි කළේ. ඊට වඩා යමක් ජනසතු කරන්නට ඇමතිතුමා බලාපොරොත්තු වුණේ නැහැ; කළේත් නැහැ. ත්‍රිකුණාමල වරාය නම් ජනසතු කළා. එයත් කලින් පනත යටතේ තිබුණු එකක්. ක්‍රීඩාව නම් ක්‍රීඩකයෙක් හැටියට එතුමාට බාර දුන්නා. එහෙත් ජනසතුවයි ක්‍රීඩාවයි එකට ඇදා දීම අහසට පොළොව වගෙයි. ඒ දෙක එකිනෙකට හුගක් වෙනස්. ඒ නිසා මේ අවුරුදු $4\frac{1}{2}$ එතුමාගේ කටයුතු ක්‍රීඩාවට බරව තිබුණා මිස ජනසතුවට බර වුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයෙන් පාඩු වන්නේ ඇයි? 1964 වන විට ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සෑහෙන දුරට ලාභ ගෙන දෙන අන්දමින් වැඩ කටයුතු කෙරී තිබුණා. 1964 වර්ෂයේ සුද්ධ ලාභය රුපියල් ලක්ෂ 130ක් වුණා, මට මතක ඇති අන්දමට. 1965 වර්ෂයේ පාඩුයි. 1966 වර්ෂයේත් පාඩුයි. 1967 වර්ෂයේත් පාඩුයි. 1968 වර්ෂයේත් පාඩුයි. 1969 මොනවා වේද කියා මා දන්නේ නැහැ. හැබැයි බජට් එක හදන විට නම් ලාභයට හදනවා. තමුන්නාන්සේලා ලාභයට දෙන බජට්ටුව වරින් වර පාඩු වීමට හේතුව ගැන තමුන්නාන්සේලා සොයා බැලුවාද? තමුන්නාන්සේලා කියාවි මෙපමණ ගණනකට රක්ෂාව දී තිබෙනවා, ඉන්ටරින් එළවන්ස් එක වැඩි කළා, ඒ අනුව විශාල මුදලක් වියදම් කරන්නට සිදු වුණා, රුපියලේ අගය අඩු කිරීම නිසා පාඩු සිදු වුණා කියා. ඔය වගේ පිළිතුරුවලින් ඇඟ බේරාගන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා ඇති. එහෙත් එය හරි නැහැ. ගරු ඇමතිතුමා කල්පනා කරන්නට ඕනෑ ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටෙව්වේ ලාභයක් ගෙන දෙන ආයතනයක් හැටියටද, එහෙම නැත්නම් සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය වගේ සේවාවක් ගෙන දෙන ආයතනයක් හැටියටද කියා. එය පැහැදිලි කර ගන්නට ඕනෑ. මේ ආණ්ඩුව බලයට පැමිණි හැටියේම කල්පනා කළේ ලංකා ගමනාගමන මණ්ඩලය ගෙනයා යුත්තේ ලාභයක් ලබා ගන්නා ආයතනයක් හැටියට නොවෙයි තමන්ගේ මිත්‍රයින්ට රක්ෂා දීමේ ආයතනයක් හැටියටයි කියා. ඒකයි පාඩු සිදු වී තිබෙන්නෙ. ලංගමයේ ගාස්තු මණ්ඩලය කල්පනා කරනවා නම්, එහි ආරක්ෂාව සඳහා ගාස්තු වැඩි කළහොත් එය පවත්වා ගෙන යන්නට පුළුවන්ය කියා, එය වැරදි මතකයක් බව කියන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවෙ හිදී ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව කියවන්නට යන්නේ නැහැ. ලංගමය පිළිබඳ audit queries කියක් තිබෙනවාදැයි තමුන්නාන්සේ දන්නවාද? මෙම මණ්ඩලය කොතෙක් දුරට ඔඩිටර් ජනරාල්වරයා විසින් විවේචනය කර තිබෙනවාද කිව්වොත් උන්හිටි ගමන්ම කලින් තිබුණු බස් ප්‍රමාණයෙන් බස් සිය ගණනක් පමණ කොහේදෝ අන්තර්ධාන වී තිබෙන බව පෙන්වා දී තිබෙනවා. ඒක මහ පුදුම තත්ත්වයක්. බස් රථ අන්තර්ධාන වන අන්දමේ තත්ත්වයකට ලංගම පිරිහී තිබෙනවා නම් ඇත්තවශයෙන්ම ඇමතිතුමා ඒකට වග කියන්නට ඕනෑ. ඇමතිතුමා ඊට හේතුව වශයෙන් මණ්ඩලයේ ඇති නොයෙකුත් අඩුපාඩු පෙන්වාවි. සමහරු හරියට මේවා කළේ නැතැයි කියා ඇඟ බේරා ගන්නට හදාවි. එහෙත් බස්වලට මොකද වුණේ යන ප්‍රශ්නයට තමුන්නාන්සේ වග කිව යුතුයි. ඔඩිටර් ජනරාල්තුමාගේ වාර්තාවෙන් සඳහන් කර තිබෙනවා, බස්වල නාස්තිය ගැන; නුවුවමනා අමතර කොටස් ගෙන්වීමේ නාස්තිය ගැන; මේන්ටෙනන්ස්වලට යන වියදම් පිළිබඳ නාස්තිය ගැන, මෙම තත්ත්වයට එක් හේතුවක් තිබෙනවා. කණගාටුවෙන් වුවත් මෙම අවස්ථාවෙහිදී සඳහන් කරන්නට සිදු වී තිබෙනවා, මෙම මණ්ඩලයට පත් වී එය භාරව වැඩ කළ සමහර උදවිය විශාල වශයෙන් මුදල් හම්බ කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කළා හැරෙන්නට ජනසතු සේවාව කෙරෙහි ආදරයකින් කටයුතු කර නැති බව. මේ ආණ්ඩුවේ කාල සීමාව තුළදී 20,000 ක් පමණ දෙනා ලංගමයට ඇතුළත් කර ගත්තා.

PUBLIC LIBRARY GAMPAHA
Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

එහෙනම් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳුවේ නැති බව කියන්නේ ඇයි?

ජයකොඩි මයා.

(திரு. ஜயக்கொடி)

(Mr. Jayakody)

එසේ රක්ෂාව සපයා දුන් අය බස් රථ කැඩුණු අවස්ථාවලදී ඒවා අළුත්වැඩියා කිරීම වැනි වැඩවලට නොයෙදෙව්වේ ඇයි? අද ලංගමයේ බස් රථ අළුත් වැඩියා කරන්නට භාර දී තිබෙන්නේ කොලවිස් සමාගම රෝලන්ඩ්ස් සමාගම වැනි ආයතනවලටයි. ඒ උදවියට එම කටයුතු සඳහා සල්ලි ගෙවනවා. වේරහැර අළුත් වැඩපොළට කොතරම් සේවක සංඛ්‍යාවක් ගත්තාදැයි අප දන්නවා. එහෙත් බස් අළුත්වැඩියාව සඳහා ඔය කියන සමාගම් දෙකට කොතරම් මුදලක් ගෙවා තිබෙනවාද? සේවකයන් ඕනෑතරම් ගැනීම ගැන අපි සන්තෝෂයි. හැබැයි වැඩ කරන්නට පුළුවන්කම තිබෙන නියම සේවකයන් ගතයුතුයි. තවත් නාස්තියක් සිදු වී ඇති වැඩ පිළිවෙළක් තිබෙනවා. පොයින්ට් කොන්ට්‍රෝලර්ස් — point controllers—නමින් ඊයේ පෙරේදා කට්ටියක් පත් කළා. ඒ අයගේ රක්ෂාව බස් රථ බලාපොරොත්තුවෙන් සිටින මිනිසුන් පෝලිමට සිටුවීමයි. ඒකටයි සුගතදාස ක්‍රමයය කියන්නේ. සුගතදාස ක්‍රමයය කියන්නේ මගින් පෝලිමට හිටුවීමේ ක්‍රමයක් සකස් කිරීමටයි. පොයින්ට් කොන්ට්‍රෝලර්ස්—point controllers—යන නමින් එම කට්ටිය හඳුන්වනවා. හැම බස් නැවතුම් පොළක් ගානේම එම තරුණයන් සිටිනවා. "කරුණාකර මේකට නගින්න; කරුණාකර මේකට නගින්න" යනුවෙන් කියමින් ඒ උදවිය කල් ගෙවනවා. මෙයින් සිදුවන ප්‍රයෝජනය කුමක්දැයි මට නම් තේරෙන්නේ නැහැ. ඇයි මෙවැනි පිරිසක් පත් කළේ? ඔවුන්ට වැටුප් වශයෙන් කොතරම් මුදලක් ගෙවනවද? මෙම ආයතනය ලාබ දෙන වෙළඳ ආයතනයක් හැටියට ගෙන යන්නට බලාපොරොත්තු නොවී සේවාවක් හැටියට පවත්වා ගෙන යන්නට ඕනෑ. රක්ෂා සපයා දීමේ අභිලාෂයෙන් කරනවා නම් මේ ක්‍රමය වැඩි කලක් පවත්වා ගෙන යන්නට ලැබේයයි මා සිතන්නේ නැහැ.

පසුගිය අවුරුදු 10 කාලසීමාව තුළදී ලක්ෂ 2,831 ක් ලංගමයට භාණ්ඩාගාරයෙන් දී තිබෙනවා. ඒ මුදලින් ශතයක්වත් ආපසු ගෙවා නැහැ. 1964 න් පසුව ගෙවන්නට පුළුවන්කමක් තිබුණා. එහෙත් ඒ ගත් මුදල්වලින් ශතයක්වත් ආපසු ගෙවා නැහැ. ලංගමය ලාභ ගෙන දෙන ආයතනයක් බවට පත් කරනවාද, එසේ නැත්නම් රක්ෂා දෙන ආයතනයක් බවට පත් කරනවාදැයි මුලින්ම විසඳන්නට ඕනෑ.

අ. භා. 5

ලංගමයට බඳවාගෙන සිටින සේවකයන් දෙස බලමු. ඇත්තෙන්ම නුසුදුසු පුද්ගලයන් යම් යම් තනතුරුවලට පත් කර තිබෙනවා. ලංගමයෙන් පාඩු වන්නට ප්‍රධාන හේතුව ඒකයි. ජ්‍යෙෂ්ඨ විභාගයවත් සමත් නොකළ පුද්ගලයන් ලිපිකරුවන් හැටියට බඳවාගෙන තිබෙනවා. ලිපිකරුවකු වන්නට අඩු ගාණේ ජ්‍යෙෂ්ඨ විභාගයවත් සමත් වී තිබිය යුතුය යන්න දන්නා හැම තැනම පිළිගෙන තිබෙන ප්‍රතිපත්තියක්. අකුරු හරි හැටි ලියන්නට පුළුවන්, ගණිත විෂයයෙන් සමත් වූ කෙනකුටයි, ලිපිකරුවකු විය හැක්කේ. එහෙත් ජ්‍යෙෂ්ඨ විභාගය නොසමත් සමහර මන්ත්‍රීවරුන්ගේ නෑදෑයන් අනුරාධපුරයේ ලංගම කාර්යාලයට පත් කර ඇති බව මා දන්නවා. ඉතින් පාඩු නොවී මොකද? සමහර පුද්ගලයන් හිටි හැටියේ උසස් තනතුරුවලට පත් කර යවා තිබෙනවා. හර්මන් ජෝසප් නමින් 8 වැනි ශ්‍රේණියේ හෝ 9 වැනි ශ්‍රේණියේ හෝ සිටි ලිපිකරුවකු හිටි හැටියේ 5 වන ශ්‍රේණියේ විධායක තනතුරකට පත් කර යවා තිබෙනවා. විධායක තනතුරක වැඩ කරන්නට බැරි පුද්ගලයකු විධායක තනතුරකට පත් කරනවා. රියැදුරන් පත් කර ගැනීම සම්බන්ධයෙන් පවා අනුගමනය කරන්නේ අසතුටුදායක වැඩ පිළිවෙළක්. රියැදුරන් බඳවා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගන්නා විට යම්කිසි මට්ටමක් තිබෙන්නට ඕනෑ. පළපුරුද්ද, දැන උගත්කම, ශාරීරික තත්ත්වය ගැන නියම විධියට පරීක්ෂා කර බලන්නට ඕනෑ. තට්ටු දෙකේ බස් රථවලට යට වී පාසල් යන දරුවන් විශාල සංඛ්‍යාවක් මරු මුවට පත් වන හේතුව සොයාබැලුවාද? මේ තට්ටු දෙකේ බස් රථයක් ධාවනය කරවන රියැදුරු අඩු වශයෙන් අඩි 5 අඟල් 7ක් උස වන්නට ඕනෑ. එහෙත් අඩි 5 අඟල් 3ක් උස අයටත් තට්ටු දෙකේ බස් රථවල රියැදුරුකම් දී තිබෙනවා. අර අඟල් 4 වෙනස නිසා රියැදුරාට අඩි 14ක දුර ප්‍රමාණයක් පෙනෙන්නේ නැහැ. ඒ අඩි 14 තුළ ළමයකු යන විට පෙනෙන්නේ නැහැ. ඒ නිසයි, ළමා මරණ ඔය විධියට ඇතිවන්නේ.

පරිපාලන අංශය නම් පවතින්නේ ඉතා මත්ම අසතුටුදායක තත්ත්වයකයි. කොයි තරම් මහන්සි ගත්තත් පරිපාලන අංශය ක්‍රමවත් තත්ත්වයකට ගන්නට බැහැ. ඒක ශුද්ධ කරන්නට බොහොම අමාරුයි. එක "බෝඩ්" එකක් ගියාට පසු තවත් "බෝඩ්" එකක් එනවා. මාස හයක් කල් දෙන්නැයි කියනවා. නැත්නම් මාස තුනක් කල් දෙන්නැයි කියනවා. අලුතෙන් පත් වන "බෝඩ්" එකේ ඒ බැගෑපත් ඉල්ලීමට කන් දෙන්නට මහජනයා ලැස්තියි. එහෙත් අවසානයේදී ඇතිවන ප්‍රතිඵලය කුමක්ද? ඔතැනට දේශපාලනය රිංගනවා. නිලධාරි මට්ටමේ සිටින උදවියට තමන්ගේ රාජකාරි පමණක් කරන්නට ඉඩ දෙනවා නම් දැනට පවතින අභාග්‍ය සම්පන්න තත්ත්වය ලංගමයෙහි ඇතිවන්නේ නැහැ.

මීගමුවේ ලංගම ඩිපෝව ගැන මම කියන්නම්. ඒ ගැන සඳහන් කරන්නේ උදාහරණයක් වශයෙනුයි. ඇත්තෙන්ම එතැන පරිපාලන කටයුතු කෙරෙන හැටි දැක්කොත් පුදුම හිතේවි. ප්‍රාදේශීය කළමනාකරු තවත් පිරිසක් සමග සුරාපානය කර මින් සිටිනවා ලංගමයේ උසස් නිලධාරියකුගේ අතටම අසු වුණා. ඔහුගේ කාර්යාලය ඇතුළේ අරක්කු තිබුණා. ඉතින් මේ විධියට කටයුතු කරන කෙනකුට නියම පරිපාලනයක් ගෙන යන්නට පුළුවන්ද? අරක්කු තිබී අසුවුණායින් පසුව ඔහු මාරු කර හැරියා. අවසානයේදී මේ ස්ථානයට අළුත් කෙනෙකු පත් වුණා. ඔහුටත් පරිපාලනය ඉගැන්වීම සඳහා එතැන සිටි ඩ්‍රයිවර් කෙනෙකු ලැහැස්ති වුණා. දේශපාලනඥයකුගේ මුවාවෙන් මේ ඩ්‍රයිවර් එතැන පරිපාලනය පිළිබඳ නායකත්වය ගන්නට ගියා. ගරු ඇමතිතුමා මේ ගැන දන්නවා. ගරු සභාපතිතුමා ඊටත් වඩා හොඳට දන්නවා. ඒ ඩ්‍රයිවර් පුදුම සහගත මිනිහෙක්. ඒ මනුෂ්‍යයාගේ පඩිය හැම මාසයකම වගේ රු. 1,300 ; 1,400 ; 1,000යි. කරුණු සොයා බැලුවාම පසුගිය හය මාසය තුළම ඔහු අතිකාල වැඩ කර තිබෙන බව පෙනී ගියා. එපමණක් නොවෙයි, සෑම දවසකම ඔහු දිනකට පැය 23 ක් වගේ වැඩ කර තිබෙනවා. මේක වංචාවක් නොවෙයිද? මේක හොරකමක් නොවෙයිද? හය මාසයක් තුළ හැමදාම පැය 23 බැගින් වැඩ කරන්නට පුළුවන් මිනිහෙකු සිටිනවාද? ඒ ප්‍රදේශයේ වෘත්තීය සමිති මගින් මේ කාරණය ගරු ඇමතිතුමාට දැනුම් දී තිබෙනවා. ඒ පුද්ගලයා තමයි, මීගමු ඩිපෝව පාලනය කරන්නේ. රොස්ටර් එක හදන්නෙත් ඒ පුද්ගලයායි. කෙනෙකුට රුට් එකක් මාරු කර ගන්න වුවමනා නම් රු. 25 ක් ඔහු අතට දුන්නාම ඔහු වුවමනා විධියට රොස්ටර් එක වෙනස් කර රුට් එක හදා දෙනවා. පසුගිය මාසයෙන් ඔය කියන ඩ්‍රයිවර්ට රු. 1,300 කට පඩිය හදා තිබුණා. මේක නාස්තියක් නොවෙයිද? මේක වංචාවක් නොවෙයිද? මේක බොරුවක් නොවෙයිද? වැඩිපුර සෙනග රක්ෂාවලට බඳවා ගත්ත එක නොවෙයි පාඩුව; මේ වගේ වංචා සිදුවීමයි.

ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය පිරිසිදු කිරීමට නම් ගරු ඇමතිවරයා විසින් ගත යුතු පියවර දෙකක් තිබෙනවා. එක්කෝ එතුමා ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලන කටයුතුවලින් සම්පූර්ණයෙන්ම ඈත් වෙන්නට ඕනෑ. එසේ නැත්නම් ගරු ඇමතිතුමා මේ මහා ලේකම් ගොඩ නැගිල්ලේ පිහිටි කායර්ීාලයෙන් ඉවත් වෙලා ලංකා ගමනාගමන මණ්ඩලයේ කායර්ීාලය ඇතුළට රිංගන්න ඕනෑ. ඔය දෙකෙන් එකක් කරන්නට ඕනෑ. ඔය දෙකෙන් එකක් නොකර කවදාවත් ලංගමය ශුද්ධ කරන්නට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

බස්වලට වඩා බස් ස්ටෑන්ඩ් හැදීම මේ රජයේ ප්‍රතිපත්තියක්දැයි මා දන්නෙ නැහැ. රුපියල් ලක්ෂයක් විතර වියදම් කර දැන් වරකාපොළ විශාල බස් ස්ටෑන්ඩ් එකක් සාදා තිබෙනවා. ඒ මුදලින් තව බස් ටිකක් ගෙනත් දැම්මා නම් වැඩිපුර බස් ස්ටෑන්ඩ් වුවමනා කරන්නෙ නැහැ. ඇති තරම් බස් යොදනවා නම් මිනිසුන් බස් ස්ටෑන්ඩ්වල රස්තියාදු වෙන්නෙ නැහැ. බස් ස්ටෑන්ඩ් හදන්නෙ මොන හේතුවක් නිසාද? මගීන් රස්තියාදු වන නිසයි. "මෙතැන හුඟක් සෙනඟ එකතු වන තැනක්. කරුණාකර මෙතැන බස් ස්ටෑන්ඩ් එකක් හදන්නය" යයි මන්ත්‍රීවරයකු කිව්වාම බස් ස්ටෑන්ඩ් එකක් හදනවා. තවත් තැනක තවත් එකක් හදන්න යයි කිව්වාම එතැනත් එකක් හදනවා. ඒ විධියට බස් ස්ටෑන්ඩ් හදන්නට සිදු වී තිබෙන්නේ බස් මදිකම නිසයි. මගීන්ට ගමනාගමනය මිස බස් ස්ටෑන්ඩ් වුවමනා නැහැ. ඒ නිසා බස් ස්ටෑන්ඩ් සෑදීමට කරන වියදම අසාධාරණ වියදමක්. ඒ මුදල්වලින් වැඩිපුර බස් යොදවන්න.

ලංකා ගමනාගමන මණ්ඩලයට අවුරුද්දකට රුපියල් කෝටි 3 ක් පමණ වටිනා බස්තොගයක් වුවමනා බව ලංගමය දැන් මාස ගණනකට පෙර අළුත් බස් මිළදී ගැනීම සඳහා රජයෙන් මුදල් ඉල්ලා සිටි අවස්ථාවේදී ප්‍රකාශ වී තිබුණා. මේ අවුරුද්ද සඳහා බස් රථ කොයිතරම් ප්‍රමාණයක් සපයා දුන්නාද කියා මා අහනවා. ඊයෙ-පෙරේදා තමුන්නාන්සේලා ලොරි චැසි ආදිය ගෙන්වීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. තමුන්නාන්සේලා එක්තරා ප්‍රතිපත්තියක් අනුගමනය කළා නම් ලංකාවට සැහෙන තරම් බස් සංඛ්‍යාවක් ඒ මාර්ගයෙන් ගෙන්වා ගන්නට පුළුවන්කම තිබුණු බව මා කියනවා. අද බස් රථ 4,200 ක් පමණ ලංකාවේ පාරවල ධාවනය වෙනවා. මේ රටට බස් 5,000 ක් තරම අවශ්‍ය බව වාර්තාවලින් අපට දැන ගන්නට තිබෙනවා. බස් නොගෙන්වන නිසා පාඩු සිදු වන්නේ මගියා සහ ලංකා ගමනාගමන මණ්ඩලය යන මේ දෙපක්ෂයටමයි.

"කොමෝඩිටි ඒඩ්" ක්‍රමය යටතේ ලොරි නම් මේ රටට ගෙන්වනවා ඒ වෙනුවට බස් නොගෙන්වන්නේ මන්දැයි මම අහනවා. ලොරි ගෙන්වීම නතර කර ඒ වෙනුවට බස් ගෙන්වන්නට කාලය දැන් පැමිණ තිබෙන බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. දැන් ලංකාවට ඕනෑ තරම් ලොරි තිබෙනවාය කියනවා. එහෙම නම්, බස් ගෙන්වන්නෙ නැත්තෙ ඇයි? මේ අවුරුද්දේ බස් 500 ක් ගෙන්වන්නට යනවාය කියනවා. මම ඒ සම්බන්ධයෙන් එකක් කියන්නම්. බස් ගෙන්වන කොම්පැනිවල විදේශ විනිමය වංචාවක් තිබෙන බවදැයි කරුණා කර සෝදිසි කර බලන්න. ගරු ඇමතිතුමා ලේලන්ඩ්ස් සහ වෙනත් සමාගම්වලින් බස් ගෙන්වීමට බලාපොරොත්තු වෙනවා විය හැකියි. ද්‍රව්‍යාධාර ක්‍රමය යටතේ බස් ගෙන්වීම යම් විධියකින් පෞද්ගලික අංශයට භාර දුන්නොත් —ඒජන්සිවලට දුන්නොත්—නිවිස් ප්‍රින්ට්වලට සිදු වූ දෙයම සිදු වන්නට ඉඩ තිබෙන බව කල්පනා කරන්නට ඕනෑ. මේ උදවිය කියක් හරි යටින් ගහනවා. බස් පන්සියයක්ය කිව්වාම එය සුළු ගණනක් නොවෙයි. තමුන්නාන්සේලා මේවා ලෝක වෙළෙඳපොළෙන් ගෙන්වනවාද? වර්ල්ඩ් වයිඩ් ටෙන්ඩර්ස් කැඳවනවාද? මේවා ගෙන්වන්නට බලාපොරොත්තු වන්නේ ද්‍රව්‍යාධාර ක්‍රමයටදැයි කරුණා කර කියන්න.

අපට මේ සම්බන්ධයෙන් ආරංචියක් ලැබී තිබෙනවා. එහෙත් එය ආරංචි මාත්‍රයක් පමණයි. එකෑවරම බස් 500ක් ගෙන්වීම සඳහා කොමෝඩිටි ඒඩ් ක්‍රමය යටතේ වෙන් කරනවාය කිව්වාම ව්‍යාපාරිකයන් ටිකක් කලබල වෙලා කටයුතු කරනවා. එවැනි තත්ත්වයක් යටතේ සමහර විට විදේශ විනිමය වංචාවක් සිදු වන්නට ඉඩ තිබෙනවා. නිවිස් ප්‍රින්ට්වලට මොකද වුණේ? ඔය ක්‍රමයට මේ රටට නිවිස් ප්‍රින්ට් ගෙන්නුවා. කොයි තරම් මුදලක් අපතේ ගියාද, නාස්ති වුණාද යන්න ගරු ඇමතිතුමා දන්නවා. දැන් ඒ පිළිවෙළ, ක්‍රමය, සැලැස්ම අහු වෙලා තියෙනවා. රජය කෙලින්ම මේ ගනුදෙනුවලට එන්නේ නැති බව ඒ උදවිය දන්නවා. මේවා ඒජන්සිස් මාර්ගයෙන් ගෙන්වන්නට යන බව දන්නවා. ඒ නිසා විශේෂ ඉල්ලීමක් කරන්නට මම කැමතියි. බස් රථ ගෙන්වන විට මණ්ඩලයට පමණක් ඒ කාර්යය කරන්නට ඉඩ දෙන්න එපා. බස් රථ ගෙන්වීම සඳහා විශේෂ කමිටුවක් පත් කරන්න. එය හොඳ වැඩ පිළිවෙළක් හැටියට මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්නට පුළුවනි. භාණ්ඩාගාරයේ ලේකම්තුමාත් ඒ කමිටුවට පත් කරන්න. ලංකා ගමනාගමන මණ්ඩලයෙනුත් පත් කරන්න. ස්ථිර ලේකම්තුමා පත් කරන්න. විදේශ ණය ක්‍රමයක් යටතේ මේවා ගෙන් වන නිසා ක්‍රම සම්පාදක මණ්ඩලයත් මෙයට සම්බන්ධ කර ගන්නට පුළුවනි. ඔය ක්‍රමයට ඒ කමිටුව සකස් කර ගන්න. නැත්නම් පසුව ඒ ගැන අමුතුවෙන් කල්පනා කරන්නට සිදු විය හැකියි. බස් පමණක් නොව, අමතර කොටස් ආදි වෙනත් දේත් ගෙන්වන හැම අවස්ථාවකදීම කැත ව්‍යාපාර ගෙන යන්නට ඉඩ තිබෙන බව කිය යුතුයි.

තවත් ගරු මන්ත්‍රීන් කථා කරන්නට බලාපොරොත්තුවෙන් සිටින නිසා මගේ කථාව සඳහා තවත් වැඩිපුර කාලයක් ගත කරන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. එහෙත් මගේ කථාව අවසන් කරන්නට පෙර එක් වැදගත් ඉල්ලීමක් පමණක් ඉදිරිපත් කරන්නට කැමතියි. බණ්ඩාරනායක අගමැතිතුමා අභාවප්‍රාප්ත වී, මේ මාසයේ 26 වැනිදා වන විට අවුරුදු දහයක් සම්පූර්ණ වෙනවා. ලංකා ගමනාගමන මණ්ඩලයටත් වයස අවුරුදු දහයක් වෙලා තිබෙනවා. කුමන දේශපාලන පක්ෂයකට අයත් උදවිය වුවත් අපේ ජනසතු සේවා වන් අතර ප්‍රථම ජනසතු සේවාව හැටියට සැලකෙන ලංකා ගමනාගමන මණ්ඩලය ගැනත්, එය ඇති කළ බණ්ඩාරනායක මැතිතුමාටත් ලැදියාවක් දක්වනවා. ඒ උදවිය සැප්තැම්බර් මාසයේ 26 වැනිදා වැදගත් දිනයක් හැටියට සලකනවා. ඒ දිනය උත්සව දිනයක් හැටියට ඒ උදවිය සලකනවා. ලංකා ගමනාගමන මණ්ඩලය තුළ, සැප්තැම්බර් මාසයේ 25 සහ 26 යන දින දෙකේම පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වන්නට අපි අවසර ඉල්ලුවා. එහෙත් ඊට අවසර දීලා නැහැ. ඒ ලියුම් මා ළඟ තිබෙනවා. ඒ හැම දෙයක්ම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට මම කැමතියි. බණක් කියන්නැයි දන්වා තිබෙනවා. ඇයි පිරිත් දේශනාවක් කරන්නට ඉඩ දෙන්න බැරි? මෙය කිසිම දේශපාලන පක්ෂයකට අයිති නැහැ. බණ කියන්නට පුළුවන් නම්, පිරිත් ටිකක් වැඩිපුර කිව්වාම මොකද වෙන්නෙ? කරුණා කර මේ ගැන කල්පනා කරන්න. ඒ සඳහා ඉදිරිපත් වන නිලධාරීන්ට ඒ කාර්යයන්ත කිරීමට මට ගරු ඇමතිතුමා කරුණා කර විශේෂ අවසරයක් දෙනු ඇතැයි මා විශ්වාස කරනවා. අපි සම්පූර්ණයෙන්ම වග කියනවා. එම ස්ථානය පාවිච්චි කරන විට කිසිම අලාභ හානියක් නොවන විධියට කටයුතු කරන්න අපේ වෘත්තීය සමිති වගකියන බව ප්‍රකාශ කරමින් මගේ වචන සවලාපය අවසන් කරනවා.

අ. භා. 5.15

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன— மினுவாங்கொட)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ගරු සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ පළමුවෙන්ම ලංකා ගමනා ගමන මණ්ඩලය ගැන වචන ස්වල්පයක් කථා කරන්න මා අදහස් කරනවා. මෙයට පෙර අවස්ථාවලදී අපට ලංගමය ගැන කථා කරන්න සිදු වුණේ මණ්ඩලය මගින් එයට අවුරුදු තුන හතරකට උඩදී නිකුත් කරන ලද වාර්තාවලින් දැන ගන්න ලැබුණු කරුණු අනුවයි. 1968-69 අයවැය විවාදය පැවති අවස්ථාවේදී අපට ලැබී තිබුණෙ 1964 වර්ෂීය වෙනුවෙන් නිකුත් කරන ලද වාර්තාවයි. කෙසේ හෝ වේවා අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළාට පසුව වාර්තා දෙකක් ලැබී තිබෙනවා. එම වාර්තාවලින් තමයි, ජනසතු සේවයේ දියුණුවක් ඇති වී තිබෙනවාද නැද්ද යන කාරණය සම්බන්ධයෙන් ස්ථිර නිගමනයකට අපට එළඹෙන්න පුළුවන් වන්නෙ. 1967 සහ 1968 යන වර්ෂවලදී කොයි තරම් දියුණුවක් ලබා තිබෙනවාද කියන කාරණා ගැන ලැබෙන ආරංචිවලින් මිස නියම අන්දමට තොරතුරු ලබා ගන්න අපට පුළුවන්කමක් නැහැ. ගරු සභාපතිතුමනි, දක්ෂ පුද්ගලයන් කිප දෙනෙකුම අලුතෙන් පත් කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටීම ගැන මා සතුටු වුණා. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩ කටයුතුවලට ඇඟිලි ගසන්නේ නැතුව ඒ අයගේ උපදෙස් අනුව, විශේෂඥයන්ගේ උපදෙස් අනුව, නොයෙක් නොයෙක් විද්‍යා අනුව ලංගමය පවත්වා ගෙනයන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ලෙස. මා විශේෂයෙන් මෙම ඉල්ලීම කළේ ඇමතිවරයකු වශයෙන් මා ලැබූ අත්දැකීම් උඩයි. අවුරුදු තුන හමාරක පමණ කාල යක් මෙම අංශයේ වගකිව යුතු ඇමති වරයා වශයෙන් මා ක්‍රියා කළා.

1961 අප්‍රේල් 8 වනදා වැඩ බලන ඇමති වරයා වශයෙන් වැඩ භාර ගනිද්දී මට පෙනී ගියා 1958, 1959 සහ 1960 යන වර්ෂ වලදී ලංගමයෙන් විශාල පාඩු විඳින්න සිදු වී ඇති බව. එය ඇමතිතුමාගේ වරද නිසා නොවෙයි, ජනසතු කිරීමේදී ලැබුණු බස් රථ ඉතාමත්ම අබලන් තත්ත්වයක තිබුණු නිසයි. ඇමතිවරයා වශයෙන් මා වැඩ භාර ගැනීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා, විඳින්න සිදු වන මෙම පාඩු මගහරවා ගැනීමේ මාර්ග ගැන සාකච්ඡා කළා. අප ඒ අවස්ථාවේදී තීරණය කර ගත්තා, ප්‍රාදේශීය වශයෙන් වැඩ කටයුතු ගෙන යන්න. ඒ අතරම මාස තුනෙන් තුනට, සැතපුමක් සඳහා දරන්න වන විය දම, සැතපුමක් සඳහා ලැබෙන ආදායම් පිළි බඳ විස්තර සපයන ලෙස මා නියම කළා. මේ අන්දමට කටයුතු කරගෙන යාම නිසා අවුරුදු තුනක් ගත වන විට පාඩුව සම් පූර්ණයෙන්ම නැති කර විශාල ලාභයක් ලබාගැනීමට හැකි වුණු බව සන්තෝෂ යෙන් සඳහන් කරනවා. ඇත්ත වශයෙන් ම එදා සේවක පිරිසකගෙන් ලැබුණු සහ යෝගය නිසයි එබඳු තත්ත්වයකට ගෙන ඒමට හැකි වුණේ. ගරු සභාපතිතුමනි, මා ඇමතිවරයා වශයෙන් පත්ව දැනට ඇමතිවරයා සිටින ආසනයේ ම වාඩිවී සිටි යදී, එවකට විරුද්ධ පාර්ශ්වයේ සිටි මන්ත්‍රීවරුන් ලංගමයේ කටයුතු විවේච නය කරමින් මට චෝදනා නැගුවා. නමුත් මා කළේ එබඳු චෝදනාවක් එල්ල කළ විට, අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා මොන කරුණක් නිසා චෝදනා කරන්නේදැයි විමසා බලා එවැනි චෝදනාවක් එල්ල නොවන විධියට ක්‍රියා කිරීමයි.

1962 වර්ෂයේ වාර්තාව ගෙන බැලුවොත් තමුන්නාන්සේලාට පෙනී යාවි, ජොයින්ට් කවුන්සිල් ක්‍රමය ඇති කර, ප්‍රාදේශීය ශාඛා ඇති කර, ඒ ඒ ඩිපෝවලට කළමනාකාර වරුන් පත් කර ගනිමින්, හැම අංශයක ගේම සහයෝගය ලබා ගෙන කටයුතු කර ගෙන ගිය ආකාරය ගැන. ඒ සමගම ගරු සභාපතිතුමනි, ලංගමයේ වැඩ කටයුතු ගැන කල්පනා කර බලා එක්තරා නියමයක් කරන්න මට සිදු වුණා. එවකට බස් අටදහසක් තිබුණ ලංඩන් ට්‍රාන්ස්පෝර්ට් බෝඩ් එකේ සිටි සේවක සංඛ්‍යාව—කම්කරුවාගේ සිට අන්තිම උසස් නිල ධාරියා දක්වා සේවයේ යෙදී සිටින අයගේ සංඛ්‍යාව—56 දහසක් පමණයි. එක බස් එකකට සේවකයන් අට දෙනෙක් විය යුතුය කියායි මා නියම කළේ. ලංකාව වගේ රටක අපි අලුතෙන් පටන් ගත් ව්‍යාපාරයක් නිසා එක බස් එකක සේවක යන් අට දෙනෙකුට වඩා යොදවන්නම බැහැ. වැඩිම ගණන අට දෙනයි. බස් 2,000ක් දුවනවා නම් සේවකයන් 24,000 ක් විය යුතුයි. එක බස් එකකට අට දෙනයි. බස් 4,000 ක් තිබුණත් දුවන්නේ 3,000 නම්, සේවකයන් සිටිය යුත්තේ 24,000 යි. ඔය විධියට අපි වැඩ කළ නිසයි, ලාභ ගන්න පුළුවන් වුණේ කියා මා ආඩම්බරයෙන් කියන්න කැමතියි. ගරු සභාපතිතුමනි, අපි ඒ විධි යට වැඩ කරගෙන ගියත්, ඒ සම්බන්ධ යෙන් දැන් කටයුතු කරගෙන යනා ආකා රය වෙනස් බව අපට පෙනී යනවා.

අපි මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගෙන් ප්‍රශ්නයක් ඇසූ විට උප ඇමතිතුමා විසින් පිළිතුරක් දුන්නා. දැනට කොයි තරම් බස් දුවනවාද? කොයි තරම් සේවක යන් පිරිසක් සිටිනවාද? යන ප්‍රශ්න ඇසූ විට අපට ලැබුණ පිළිතුර මෙයයි: බස් 4,700 ක් තිබෙන බවත් එයින් බස් 3,700 ක් වැඩ කරන බවත්, සේවකයන් 39,800 ක් සිටින බවත් අපට දැනගන්න ලැබුණා. මා ඔය කිව්වේ අපට ලැබුණ පිළිතුර අනුවයි. සේවකයන් 44,000 ක් 50,000 ක් පමණ ඉන්න බවටත් අපට ආරංචි ලැබී තිබෙනවා. නමුත් අපට ඒ ගැන මොකුත් කියන්න බැහැ. වාර්තා වලින් තමයි අපි හැම දෙයක්ම දැන ගන්නෙ. 1966 වාර්තාවෙන් අපට දැන ගන්න පුළුවනි. කොයි තරම් සේවකයන් පිරිසක් සිටිනවාද, කොයි තරම් වියදමක් දරන්න සිදු වී තිබෙනවාද, කොයි තරම් ලාබ ලබා තිබෙනවාද කියා. මට මතක හැටි යට 1964 දී—මා ළඟ ඒ වාර්තාව දැන් නැහැ—ලක්ෂ 130 ක පමණ ලාභයක් ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා ඇමතිතුමාගෙන් එක් කරුණක් අසන්න කැමතියි. එතුමා එයට පිළිතුරු දේවිය කියා මා බලාපොරොත්තු වෙනවා. 1965 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය ඇතුළත් කර මේ වාර්තා ඉදිරිපත් කරන්නේ ඇයිද කියන ප්‍රශ්නය මා අසන්න කැමතියි. ඒ කාල සීමාව ඇතුළතදී ලාභ වශයෙන් තිබුණේ රු. 2,42,748.11 ක මුදලකුයි. මට තේරුමක් නැහැ, මේ 1965 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය පමණක් මෙයට ඇතුළත් කළේ ඇයිද කියා. මුලින් මාස 3 ක් අත්හැරියෙ ඇයි? 1964 සැප්තැම්බර් 30 වෙනිදා සිට 1965 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා කාලය ඇතුළත් කළේ නැත්තෙ ඇයිද කියන ප්‍රශ්නයට මා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මාස 3 ක් අත්හැරියේ ඇයිද කියා මා අසන්න කැමතියි. 1966 අවුරුද්දේ වාර්තාවෙන් මට පෙනී යනවා, රු. 28,19,672 ක ලාභයක් ලබා තිබෙන බව. ඒ විධියට මෙම වාර්තාවලින් පෙන්නුම් කරනවා. 1967, 1968, 1969 යන වර්ෂවල කොයි අන්දමට සිදු වී තිබෙනවාද කියන එක අපි දන්නේ නැහැ.

රුපියලේ අගය අඩු කිරීම නිසා සේවකයන්ගේ පඩි වැඩි කරන්නට සිදු වුණාද අපි දන්නේ නැහැ. ඊළඟට විවිහිස ක්‍රමය උඩ බඩු ගෙන්වන්න සිදු වුණාද, ඒ සඳහා කොයි තරම් මුදලක් වියදම් කරන්නට සිදු වුණාද යන කාරණා ගැනත් අපට තේරුමක් නැහැ. ඒ සම්බන්ධ අපට වාතීා ලැබී නැහැ. ඒ නිසා අපට ලැබෙන ආරංචි උඩයි කතා කරන්නට සිදු වන්නෙ. ඒ සම්බන්ධයෙනුත් ඇමතිතුමාගේ කතාවේදී පිළිතුරු දේවිය කියා අපි බලාපොරොත්තු වෙනවා. මන්ද? අපට පෙනී ගියා අප කට යුතු කරගෙන ගිය ආකාරයට ක්‍රමානුකූලව බස් ව්‍යාපාරය දියුණු කරගෙන යාමට, ලාභ ලැබීමට, පුළුවන්කම තිබුණත්, දැන් ඒ ක්‍රමය වෙනස් වී තිබෙන නිසා, මන්ත්‍රීවරුන්ගේ වුවමනාවල් පරිදි යම් යම් පාරවලට බස් දැමීමෙන් ලැබෙන ආදායම සමහර විට එන්න එන්නම අඩු විය හැකි බව. 1965-66 වාර්තාවෙන් හොඳටම පැහැදිලි කාරණයක් තිබෙනවා:

——'While the number of passengers carried increased by 100 per cent. between 1958 and 1966, the increase in the number of vehicles operated daily has been not more than 50 per cent."

1958 ට වඩා දෙගුණයක් වැඩියි.

"The number of passengers carried by the Board during the year was 1,025 million. This is more than double the number carried in 1958,"....——

එයින් පෙනෙනවා ජනගහනය වැඩි වෙන විට බස් සේවය වැඩි කරන්න ඕනෑ බව. ඒ නිසා තමයි, අද වැන් සේවය බස් සේවයට වඩා දියුණුය කියා සමහර පත්‍රවල පවා දැන්වීම් පළ කරන්නෙ.

ගරු සභාපතිතුමනි, ඔය වැන් සේවය ගැනත් වචන දෙක තුනක් කියන්න ඕනෑ. වැන් සේවය දියුණු වන්නේ බස් මදිකම නිසා බව කවුරුත් පිළිගන්නා කාරණයක්. මට හොඳට මතකයි, ඒ කාලයේ මාතර සිට තිස්සමහාරාමයට යන විට අපට දකින්න පුළුවන් වුණා, බස් සේවයට වඩා වැන් සේවය දියුණු වී තිබෙන බවක්. බස් වැඩියෙන් දැම්මත් වැන්වල යාමට සමහර අය කැමැත්තක් දැක්වූවා. එයට හේතුව බඩුත් පටවාගෙන වැන් එකක ගිය විට ගෙවල් ළඟින්ම බහින්න පුළුවන් වීමයි. ඒ නිසා මා නීතියක් දැමුවා, එක වැන් එකක 7 දෙනෙකුට වඩා පටවන්න බැරිය කියා. දැනුත් ඒ නීතිය තිබෙනවා, නමුත් ක්‍රියාවේ යෙදවෙන්නේ නැහැ. කොහොම වුණත් අපට පෙනී යනවා බස් වැඩි කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු බව. බස් වැඩි කරන්නත් ඕනෑ. ලාභ ලබා ගන්නත් ඕනෑ. ලාභ කරන්න බැරි, අර දිවුලපිටිය 'ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කිව්වා වාගේ, කම්කරුවන් ඕනෑවට වඩා අරන් තිබෙන නිසයි. ඒකෙත් ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ.

තවත් කාරණයක් නම් මා ජනසතු ඇමති ධුරය දරණ කාලයේදී හොඳම ප්‍රශ්නයක් මතු වුණ අවස්ථාවක් තිබෙනවා. එවකට කොන්දොස්තර කෙනකුගේ බර රාත්තල් 100 ක් විය යුතුව තිබුණා. අනික සෑම දේකින්ම සුදුසුකම් තිබුණත් බර රාත්තල් 99ක් වීම හේතු කොට ගෙන එක් අයෙකුව භාරගත්තෙ නැහැ. ඒ මොකද? යම්කිසි රෙගුලාසියක් අනුව ක්‍රියා කිරීම නිසා. එවකට දෙහිවල ගල්කිස්ස මන්ත්‍රීවරයාව සිටි අගලවත්ත ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය කොල්වින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා) ප්‍රශ්නයක් ඇසුව මොන කාරණයක් නිසාද සියලුම සුදුසුකම් තිබී ඒ තැනැත්තා ගත්තෙ නැත්තෙ කියා. නොගන්න හේතුව වුණේ අර රෙගුලාසිය අනුව තිබිය යුතු සුදුසුකම අඩු වීම නිසයි. එයින්ම තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති ඒ රෙගුලාසිය අනුව ගත්තා මිසක් අපේ පැත්තේය අනික් පැත්තේය කියා වෙනසක් කෙරුණෙ නැති බව. එහෙත් දැන් බදවාගැනීමේ ලොකු වෙනසක් තිබෙනවා. මට පුදුම වන්නට සිදු වූ එක කාරණාවක් සිද්ධ වුණා. තමුන්නාන්සේ දන්නවා කටාන ආසනය තිබෙන්නේ මගේ ආසනයට යාබදව බව. ඉතාම හොඳ රියැදුරෙක් කටාන ආසනයේ මන්ත්‍රීතුමා ලවා රක්ෂාව ලබාගැනීමට වැඩ කරගෙන ගියා. අන්තිමට ඒ තැනැත්තා තේරුණත්, ඔහු කටාන ආසනයේ කෙනෙක් නොව මිනුවන්ගොඩ ආසනයේ කෙනෙක් බව දැනගෙන බදවාගත්තෙ නැහැ. ඇත්ත වශයෙන්ම එය සඳහන් කරන්න ටත් ලැජ්ජයි. සියලුම සුදුසුකම් තිබියදීත් මිනුවන්ගොඩ ආසනයේ කෙනෙක් කියා —ඔහු බොරගොඩවත්තෙ කෙනෙක්— රක්ෂාව නොදීම ගැන ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා.

ඊළඟ කාරණය නම් රියැදුරන්ට සැහෙණ පුහුණුවක් ලබාදිය යුතුය යන්නයි. අඩුම ගණනේ මාස තුනක පුහුණුවක්වත් දෙන්න ඕනෑ. ඒ කාලේ එහෙම ක්‍රමයක් තිබුණා. දැන් මේ රජය යටතේ කොහොමද කියා මා දන්නෙ නැහැ. රියැදුරන්ට හොඳ පුහුණුවක් පළමුවෙන්ම ලබා දිය යුතු බව මම තරයේම කියා සිටිනවා.

මා මෙහිදී ගරු ඇමතිතුමාට වැරදි කියනවා නොවෙයි. අප පටන්ගත් ජනසතු ව්‍යාපාරය කඩාකප්පල් නොවන අන්දමට පවත්වාගෙන යා යුතු නිසයි මා මේ කාරණා සඳහන් කරන්නේ. මට මතකයි අපේ පළාත් පාලන ඇමතිතුමා බස් ගැන කර ඇති කථාවක්. නිව්ටඹුවේ ගරාජයක් විවෘත කරන අවස්ථාවේදී එතුමා කියා තිබෙනවා, අපට ඕනෑ කරන්නේ මහජනතාව එකතු වී මහජනතාවගේ මුදල්වලින් කළ යුතු සේවයක්ය කියා. එයින් අදහස් කර තිබෙන්නේ ජනසතු සේවය සම්පූර්ණයෙන්ම අහොසි කොට කොටස් විකිණීමෙන් එය කරන්න ඕනෑය කියන එකයි. මේ දෙකේ ලොකු වෙනසක් තිබෙනවා. ජනසතු සේවය සම්පූර්ණයෙන්ම නැති කරන ස්වභාවයක් තිබෙන බව ඇමතිතුමාගේ ඒ කථාවෙන්ම ඔප්පු වෙනවා. තමුන්නාන්සේලා ජනසතු සේවයට විරුද්ධ බව එයින් ඔප්පු වෙනවා.

විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

නැහැ, නැහැ.

ද සොයිසා සිරිවර්ධන මයා.

(திரு. டி. சொய்ஸா சிறிவர்தன)

(Mr. de Zoysa Siriwardena)

සමහර විට ඇමතිතුමා සිතනවා වෙන්න පුළුවන් කොටස් විකිණීමෙන් කරගෙන යාම ජනසතු සේවයට වඩා හොඳයි කියා. ඒකම තමයි දැන් සියයට 51කේ ක්‍රමයට කොටස් විකිණීමෙන් රාජ්‍ය ඇමතිතුමාත් කරගෙන යන්නෙ. සළුසල ආදී ආයතන වල කොටස් විකුණා තිබෙන්නා වාගේ මේ ව්‍යාපාරය මහජනයාත් ආණ්ඩුවත් සමග කිරීමට යාම ඇමතිතුමාගේ අදහස වෙන්න පුළුවන්.

ගරු ප්‍රේමදාස

(கௌரவ பிரேமதாச)

(The Hon. Premadasa)

මා කී දේ තේරුම් අරන් නැහැ.

ද සොයිසා සිරිවර්ධන මයා.

(திரு. டி. சொய்ஸா சிறிவர்தன)

(Mr. de Zoysa Siriwardena)

එතුමා ප්‍රසිද්ධ රැස්වීමකදී මෙසේ කියා තිබෙන්නෙ. මට හොඳට සිංහල තේරෙනවා. එතුමා නැතැයි කියනවා නම්—

ගරු ප්‍රේමදාස

(கௌரவ பிரேமதாச)

(The Hon. Premadasa)

සභාපතිතුමනි, සිංහල තේරෙන්න පුළුවන්. නමුත් අදහස තේරුම් අරන් නැහැ. කිව්වේ, අපේ ප්‍රතිපත්තිය රජය සතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීම නොව, ජනසතු කිරීම බවයි. එතුමා ඒක අනික් පැත්තට හරවාගෙන තිබෙනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ජනසතු කිරීමය කියා තමුන්නාන්සේලා කරගෙන යන්නේ කොටස් විකුණා වැඩ කිරීමයි. ඒ කෙසේ වුණත් දිවංගත බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රතිපත්තිය වූයේ ජනසතු සේවය මහජනතාවට සේවයක් සිදුවන අන්දමට සකස් කිරීමයි. තමුන්නාන්සේලා එය කඩාකප්පල් කරන්නට සූදානම් වන්න එපාය කියා මා බැගෑපත්ව ඉල්ලනවා.

දැනට පත් කර සිටින අධ්‍යක්ෂ මණ්ඩලය ගැන මම වැරදි කියන්නෙ නැහැ. ඒ මොකද? ඒ උදවියට අවබෝධයක් තිබෙන නිසයි. දැන් සුගතදාස ක්‍රමය කියා පොයින්ට් කොන්රෝල් ක්‍රමයක් ඇති කර තිබෙනවා. ඇමතිතුමාට කාගෙන් ඒ අදහස ලැබුණාද කියා මා දන්නෙ නැහැ. සාමාන්‍යයෙන් ඇමති කෙනකු වුණාම ඒ ඒ අංශ කෙරෙහි ඇති කාරණා ගැන යම් යම් කොමිටි පත් කර විශේෂඥ උපදෙස් ලබාගන්නවා. එසේ විශේෂඥ උපදෙස් ලබාගෙන වැඩ කළොත් තමයි නියම ප්‍රයෝජනවත් සේවයක් කිරීමට හැකි වන්නේ කියා මා තරයේම ප්‍රකාශ කරන්න කැමතියි.

මට දීර්ඝ වශයෙන් කථා කරන්නට අවස්ථාව නොලැබීම ගැන කනගාටුයි. කථා කිරීමට තවත් 38 දෙනෙක් ඉන්නවාය කියා මට දැනගන්න ලැබුණා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

කවුද කීවේ, 38 දෙනෙක්ය කියා? කථා කරන්න 46 දෙනෙක් ඉන්නවා.

අ. භා. 5.30

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

එහෙම නම් ඊට පසුවත් නම් දී තිබෙනවා.

මේ අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරයෙක් වශයෙන් වර්තමාන ඇමතිතුමාට මා චෝදනා කරනවා නොවෙයි. ලංගම අධ්‍යක්ෂ මණ්ඩලයට නියම විධියට වැඩ කටයුතු කරගෙන යන්නට ඉඩ හරින්න. මට පිළිතුරක් වශයෙන් ඇමතිතුමා කියා තිබෙනවා, අස් කළ කෙනකු 7 වැනි වගන්තිය යටතේ නැවත ගන්න යයි මා ඇමති කාලයේදී නියෝග කර තිබෙනවාය කියා. සුදුසුකම් ඇති අය මිස අසුවල් පුද්ගලයා ගත යුතු යයි මා නියෝග කර නැති බව එයින්ම ඔප්පු වෙනවා. මට පසුව එම අමාත්‍යාංශය භාරව සිටි අනිල් මුණසිංහ මහත්මයා එය ඊටත් වඩා පිරිසිදු අන්දමින් කළා.

ජෝර්ජ් කොතලාවල මයා. (බණ්ඩාරගම)
(திரு. ஜோஜ் கொத்தலாவல—பண்டாரகம)
(Mr. George Kotelawala—Bandaragama)

ඒ මහත්මයා මැතිවරණ කටයුතුවලට ලංගම බස් යොදා ගත්තේ නැද්ද?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

එය වෙනම දෙයක්. සුදුසුකම් ඇති අය අතුරින් ලොතරැයි ක්‍රමයට නිස්සන්නෝරා ගැනීමේ ඇති වරදක් නැහැ. දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද?

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)
(கௌரவ வி. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)
(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

සුදුසුකම් ඇති අය පමණක් තනතුරුවලට පත් කරන්නය කියා නොවැ. මන්ත්‍රීතුමා කියන්නේ?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඔව්. සුදුස්සන් තෝරා ගැනීමේදී ඒවාට අනිසි අන්දමින් ඇඟිලි ගැසීමෙන් වළක්වා ඇති ඕනෑ. මැති ඇමතිවරුන්ගේ ලිපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

අනුව පත්වීම් දීම වැරදියි. ලංගමයේ දැන් 39,000 ක් පමණ සේවකයන් සිටිනවා.

ලක්ෂ්මන් ද සිල්වා මයා.
(திரு. லக்ஷ்மன் டி. சில்வா)
(Mr. Lakshman de Silva)

තමුන්නාන්සේලාගේ කාලයේදී මීට අන්තයි.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඒ කාලයේ සභාපති වශයෙන් සිටි ආර්. ටී. ද සිල්වා මහත්මයා තමුන්නාන්සේගේ කිට්ටුවරයෙක් නොවැ. ඇයි, ඒ කාලයේදී ඒ වැරදි පෙන්වා නොදුන්නේ? [බාධා කිරීම්]

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Order please!

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

දුෂිත අන්දමට මගේ කාලයේදී පත්වීම් දුන්නා යයි ඔප්පු කළොත් මා තමුන්නාන්සේ කියන ඕනෑම දේකට වාල් වෙනවා. මා කවදාවත් වැරදි විධියට ඒ කටයුතුවලට ඇඟිලි ගැසුවේ නැහැ. "අපට එක්කෙනෙක්වත් දමා ගන්නට බැරි වී තිබෙනවා" යයි ඒ කාලයේදී අපේ පක්ෂයම මන්ත්‍රීවරුන් මට කොතෙකුත් මැසිවිලි කීවා. එහෙත් දැන් ලංගමයේ පත්වීම් දෙන්නේ කොහොමද? මැති ඇමතිවරුන්ගේ ලියුම් අනුවයි, දැන් පත්වීම් ලැබෙන්නේ. ලංගමයේ දක්ෂ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. කරුණාකර ඒ අයට අනවශ්‍ය ඇඟිලි ගැසීම්වලින් තොරව කටයුතු කරගෙන යන්නට ඉඩ දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

සුගතදාස අරඹවල මයා. (අක්මීමන)
(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)
(Mr. Sugathadasa Arambewala—Akmeemana)

සභාපතිතුමනි, ඉතා දක්ෂ මන්ත්‍රීවරුන් දෙපළකගේ කථාවලට පසු මේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මටත් අවස්ථාව ලබාදීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ලංගමයේ අඩුපාඩු පෙන්වා දෙමින් කථා කළ දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කීවා, හතවත් සමත් නැති අය පවා ලිපිකාර කට යුතුවල යොදවා සිටිනවාය කියා. එසේම අඩි 5 අඟල් 3 ක් උස නැති අය පවා බස් රියැදුරන් වශයෙන් සේවය කරන බවත් එතුමා කීවා. පෞද්ගලික බස් ජනසතු කොට ලංකා ගමනාගමන මණ්ඩලය ඇති කළ අවස්ථාවේදී, එවකට පෞද්ගලික බස් සමාගම්වල සේවය කරමින් සිටි සෑම දෙනාම පාහේ ලංගමයට බඳවා ගත් බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට සිදු වී තිබෙනවා. ඉස්සර පෞද්ගලික බස් සමාගම් තිබුණු කාලයේ සේවකයන් බඳවා ගැනීමේදී ඔවුන්ගේ සුදුසුකම් හෝ උස මහත හෝ ඒ තරම් සැලකිල්ලකට ගෙන නැහැ. පෞද්ගලික බස් සමාගම් පැවැති කාලයේ එවැනි තත්ත්වයක් යටතේ සේවයට බැඳුණු සියලුම සේවකයන් ලංගමයට බඳවා ගන්නට සිදු වුණු නිසා, හතවත් සමත් නොවුණු අය ලංගමයේ ලිපිකාර තනතුරුවලත්, අඩි 5 අඟල් 3 ක්වත් උස නැති අය රියැදුරු තනතුරුවලත් සිටිනවා දකින්නට ලැබීම පුදුමයක් නොවෙයි. ඒ මිස, මේ රජය බලයට පත් වුණාට පසුව ඇමතිතුමාට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ කියා සුදුසුකම් නැති එකම කෙනකුවත් ලංගමයේ යම්කිසි තනතුරකට පත් කරවා ගන්නට බැරි වූ බව මතක් කරන්න කැමැතියි. අඩි 5.3 ක් උස නැති බස් රියැදුරන් ඒ කාලයේදී ඇතුළත් කර ගන්නා ලද අය අතර නැති බව මා හොඳින් දන්නවා. ඒ වාගේම, ජී. සී. ඊ. විභාගයේදී වැඩ හයකින් සම්මාන කීපයක් ඇතිව සමත් නොවුණු අය ලිපිකරුවන් වශයෙන් අලුතෙන් බඳවාගෙන නැති බවද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කිව යුතුයි. සුදුසුකම් නැති කෙනෙකු බඳවාගෙන තිබේ නම් එයද හොඳ දෙයක්යයි මා කියන්නේ නැහැ.

ගරු ඇමතිතුමා ලංගමයේ කටයුතුවලට ඇඟිලි ගසනොත් හරියට ඇඟිලි ගැසිය යුතු බවත්; එසේ නැත්නම්, ඇඟිලි නොගසාම නිකම් සිටිය යුතු බවත් දිවුල පිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් ජයකොඩි මයා.) පෙන්වා දුන්නා. මට මේ අවස්ථාවේදී එක්තරා පැරණි සිද්ධියක් මතක් වෙනවා. මුනිදාස කුමාරතුංග මහතා මේ රටේ සිටි හොඳ පණ්ඩිතයෙක්. නිදහස් අධ්‍යාපනයේ පියා හැටියට සැලකෙන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාත් එවැනි හොඳ පණ්ඩිතයෙක්. කන්නන්ගර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු එක්තරා ගුරු රැස්වීමකදී, ගුරුවරුන්ගේ වැඩ අවුල් වී තිබෙන්නේ ඇඟිලිගැසීම් වැඩි නිසා යයි චෝදනාවක් එල්ල කළ කුමාරණතුංග මහතා ඊට උදාහරණයක් වශයෙන් මෙබඳු කතන්දරයක් කිව්වා. "එක්තරා ගමරාළ කෙනෙකුගෙ කොරටුවෙහි හොඳ ලබු ගෙඩියක් හැදුණා. එය ලොකු වේගන එන විට ගමරාල හැමදාම ගිහින් ඇඟිලි ගසා බලනවා. ගම මහගෙත් ගිහින් ඇඟිලිගසා බලනවා. ඔවුන්ගේ දූ පුතුනුත් හැමදාම කොරටුවට ගිහින් ලබු ගෙඩියෙ ඇඟිලි ගසා බලනවා. අන්තිමේදී ගමරාල බලන විට, ඇඟිලිගැසීම නිසාම ලබු ගෙඩිය කුණු වී ගිහින්."

ගමරාල කෙනෙකු ගැන කතාවක් කියන්න මටත් හිතුණායි කියමින් නැඟී සිටි කන්නන්ගර මහතාත් මේ විධියේ කතන්දරයක් කිව්වා. "ගමරාළ කෙනෙකුගේ කොරටුවෙහි ලබු ගෙඩියක් හැදුණා. එය හැදුණාට පස්සේ ගමරාළවත් ගම මහගෙවත් ළමයින්වත් කවදාවත් ඒකෙ ඇඟිලි ගැසුවේ නැහැ. අන්තිමේ බලන විට ලබු ගෙඩිය හොරු කඩාගෙන ගිහින්." ඇඟිලිගැසීම අවශ්‍යයි. ඒත් වැඩි පුර ඇඟිලි ගැසීම හොඳ නෑ. ඇඟිලිගැසීමේ කිසියම් ප්‍රමාණයක් තිබිය යුතුයි.

ලංගමයට සේවකයන් බඳවා ගැනීමේදී අක්‍රමිකතාවන් සිදු වී තිබෙනවාය යන්න මෙම ගරු සභාවෙහි පමණක් නොව අද සෑම තැනකම ප්‍රකාශ කරනු ලැබෙයි. පසුගිය ආණ්ඩු කාලයේදී සතොස ආයතනයට සේවකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඇති වුණු අක්‍රමිකතාවන් ගැන මෙම සභා ගර්භය තුළදී ප්‍රශ්න මතු වන විට එදා ඒ ඉංගිය භාරව සිටි ඇමති, අද කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්වේ කුමක්ද? "අප සේවකයන් බඳවා ගන්න විට විශේෂ සුදුසුකම වශයෙන් සලකා බලන්නේ එම සේවකයන් අපේ පක්ෂයට, අපේ ආණ්ඩුවට හිතවත්ද යන්න පමණයි." විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරුන් දැන් මේ විධියට ක්‍රියා කරන්නේ එදා කී දේවල් මතක නැතිවදැයි මා දන්නේ නැහැ.

අප අපේ ඇමතිවරුන්ට දෙස් කිව යුතු කරුණක් තිබෙනවා. පසුගිය ආණ්ඩු කාලයේදී මෙන්ම මේ කාලයේදීත් අපටත් හොඳ හොඳ කෙරුම් කරන්නට පුළුවන් වේයයි, මේ සභාවට එන්නට පෙර අප හිතුවා. එහෙත් එවැනි අවස්ථා අපට ලැබුණේ නැහැ. අපේ ගරු ඇමතිවරුන් හැමදෙනම යම් යම් අංශවලට සේවකයන් බඳවා ගන්නේ, එතුමන්ලාගේ ප්‍රතිපත්ති අනුව, නියම සුදුසුකම් ඇති අය කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙනුයි.

පසුගිය කාලයේ තිබුණාට වඩා සෑම අතින්ම උසස් තත්ත්වයකට දැන් බස් සේවය පැමිණ තිබෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුයි. එදාට වඩා අද අලුත් බස් මාර්ග කොපමණ වැඩි වී තිබෙනවාද, ඒ වාගේම බස්වලින් ගමනා ගමනය කරන්නන්ගේ සංඛ්‍යාව කොපමණ වැඩි වී තිබෙනවාද, යන කරුණු ගැන අපට චෝදනා කරන අය මොහොතකට කල්පනා කළාද? මේ රටේ ජනගහනය අවුරුද්දකට ලක්ෂ 3 ටත් 4 ටත් අතර ගණන් වැඩි වෙනවා. ඒ අනුව බස් මගින්ගේ සංඛ්‍යාවත් වැඩි විය යුතුයි. බස් මගින්ගේ ගණන වැඩි වන විට, ධාවන මාර්ග ගණන වැඩි වන විට, බස් ප්‍රමාණය වැඩි වන විට සේවකයන් වැඩි පුර බඳවා ගැනීමත් අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි.

ගරු ඇමතිතුමාගෙන් අප කරන ඉල්ලීම මෙයයි. බස් සේවය මහජන හැටියට මිස ලාභ උපදවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]

සේවයක් හැටියට නොසලකා ගමනාගමන පහසුව ජනතාවගේ ඕනෑඑපාකම් අනුව සැලැස්විය යුතුයි. ලාභ ගැන තැකීමක් නැතිව බස් සේවාව දියුණු කරන්නට ඕනෑ. බස් රථ ප්‍රමාණය වැඩි කරන්නට ඕනෑ. ඒ වාගේම බස් ධාවන මාර්ග වැඩි කරන්නට ඕනෑ. බස් රථ හිඟය නිසා අළුත් ධාවන මාර්ගවලට බස් රථ දැමීම දැනට නවතා තිබෙනවා. නමුත් කෙසේ හෝ බස් රථ සංඛ්‍යාව වැඩි කර මහජන ඉල්ලීම් සපුරාලන්නට කටයුතු කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අප අළුත් යෝජනා රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. ඉතාම ඉක්මණින් ඒ අළුත් ධාවන මාර්ගවල බස් රථ යෙදවීමට ක්‍රියා මාර්ගයක් ගන්න මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

කැඩුණු බස් රථ විශාල සංඛ්‍යාවක් අද ගරාජවල තිබෙන බව අප දන්නවා. ඒවා පැත්තකට නොදමා අළුත්වැඩියා කර පාවිච්චියට ගත යුතුව තිබෙනවා. කැඩෙන බස් රථ වහාම අළුත්වැඩියා කිරීමට දැනට සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවනවා නම්, අලුතෙන් ඒ අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවාගෙන ඒ බස් රථ වහාම අළුත්වැඩියා කර ධාවනය කරවීමට කටයුතු යොදන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, දුම්රියක ප්‍රමාදයක් වුණාට මගීන් දුම්රියේ රියදුරාටවත් ගාඩ් තැනටවත් බැණ වදින්නේ නැහැ. දුම්රියේ යන සංඛ්‍යාව වැඩියි. නමුත් බස් රථය කුඩා වාහනයක්. එහි යන මගීන් ගණන අඩුයි. බස් රියක් ප්‍රමාද වුනොත් නැත් නම් කැඩුනොත්, ඒ සෑම අවස්ථාවකදීම මගීන් බස් රියේ රියැදුරාටත් කොන්දොස්තර තැනවත් බැණ වැදීම සිරිතක් නමුත් මා එකක් කියන්නට සතුටුයි. පසුගිය අවුරුදු කීපය තුළදී ධාවනය වන බස් රථ සංඛ්‍යාව වැඩි කර තිබෙනවා. ඒ වාගේම කලින් තිබුණාට වඩා හොඳ තත්ත්වයක දැන් බස් සේවාව තිබෙන බව මා ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම ගාල්ල-කොළඹ වැනි දීර්ඝ ධාවන මාර්ගවල බස් සේවාව දියුණු කර තිබෙනවා. ගාල්ලෙන් පිටත් වන සීඝ්‍රගාමී බස් රියකට ගොඩ වුණාම දැන් නියමිත වේලාවට කොළඹට එන්නට පුළුවනි. ඉතාම කලාතුරකින් බස් රියක් දෙකක් නරක් වන බව ඇත්තයි. දහස් ගණනක් බස් රථ ධාවනය කරන විට කලාතුරකින් එවැනි සිද්ධියක් ඇති වීම පුදුමයක් නොවෙයි.

ගරු ඇමතිතුමාට නොයෙක් ඇනුම් බැණුම් ලැබෙන බව අප දන්නවා. ප්‍රවෘත්ති පත්‍රවලිනුත් එතුමා දෝෂාරෝපනවලට ලක් වෙනවා. නමුත් මේ අවස්ථාවේදී සිහි පත් කළ යුතු කාරණයක් තිබෙනවා. ගල් වදින්නේ ගෙඩි තිබෙන ගහටයි. ගෙඩි වැඩි යෙන් තිබෙන ගහට ගල් වදිනවා වැඩියි. එක ගෙඩියක්වත් නැති ගහකට කවදාවත් ගලක් වදින්නේ නැහැ. ඒ වාගේ ප්‍රයෝජනවත් සේවාවක් නොකර සිටින ඇමතිවරයෙකුට කවදාවත් ගලක් වදින්නේ නැති බව මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමා යටතේ දිනෙන් දින බස් සේවාව දියුණු තත්ත්වයකට පත් වන බව මා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට සතුටුයි. අඩුපාඩුකම් නැත්තේ නැහැ. නමුත් ඒවා මගහැරවීමට අප කටයුතු කරනවා.

අලුත් මණ්ඩලය ඉතා කාර්යක්ෂම බව මා කියන්නට සතුටුයි. එහි සභාපතිතුමා උදේ හතහමාරට කාර්යාලයට ආවාම රාත්‍රී අටහමාර වන තෙක් සිටින බව මා කියන්නට සතුටුයි. ඒ වාගේම සාමාන්‍යාධිකාරීතුමාත් උදේ හතහමාරට පැමිණ රාත්‍රී අටහමාරට වාගේ පිට වී යනවා අපේ කොට්ඨාශවල යම් යම් අඩුපාඩුකම් ගැන කරුණු ඉදිරිපත් කරන්නට යන විට සාමාන්‍යයෙන් උදේ හතහමාරත් අටත් අතර වේලාව තුළ කාර්යාලවලට යෑමේ සිරිතක් මා තුළ තිබෙනවා. ඒ වේලාවට ගියාම විස්තර සහිතව කරුණු පැහැදිලි කර දෙන්නට පුළුවන්කම ලැබෙනවා. එම නිසා මේ නිලධාරීන් කාර්යාලයට පැමිණෙන වේලාවත් පිට වී යන වේලාවත් මා දන්නවා.

ගරු සභාපතිතුමනි, මා මීට වඩා නමුත් නාන්සේගේ කාලය ගන්නට අදහස් කරන්නේ නැහැ. කොයි තරම් ඇනුම් බැණුම්වලට ලක් වුණත් ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ තිබෙන ජනසතු ව්‍යාපාර දිනෙන් දින දියුණුවට පත්වන බව මා කැවතත් ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)

ගරු සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් කථාකරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මෙතෙක් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපොලයි කථා කළේ. අනිත් අය මොනවා කියාවිද කියා මා දන්නේ නැහැ. විරුද්ධ පක්ෂයෙන් කථා කළ දෙදෙනාගෙන් එක් ගරු මන්ත්‍රීවරයකු කළ කථාව ගැන නම් වචනයක් නොකියාම බැහැ. දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ (ජයකොඩි මයා.) කථාවෙන් පෙනී ගියේ අප ඡන්දයෙන් දිනා ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ හරියට එතුමා කියන කියන විධියට වැඩ කරන්නටය කියා එතුමා සිතාගෙන සිටින බවයි. භාණ්ඩාගාරයෙනුයි අරෙහෙනුයි මෙහෙනුයි එක එක්කෙනා දමා කොමිසමක් පත කරන්නටය කියා එතුමා කිව්වා. අපේ වැරදි තිබෙනවා නම් පෙන්වා දෙන්න. ඒවා පිළිගෙන හදා ගන්නම්. නමුත් අපට ආණ්ඩු කරන ක්‍රමය කියා දෙන්නට ඉදිරිපත් වන්නට එපාය කියා මා දිවුලපිටියේ **ගරු මන්ත්‍රීතුමාට කියනවා.**

හිටපු ඇමතිවරයකු වන මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) සුපුරුදු පිළිවෙළට කාටවත් අවනම්බුවක් නොවන ලීලාවෙන් වැදගත් කථාවක් කළා. එහෙත් ඒ මන්ත්‍රීතුමා සත්‍ය නොවන කරුණු කීපයක් ප්‍රකාශ කළ නිසා පිළිතුරු වශයෙන් යමක් කියන්න ඕනෑ. කොළොන්නාවේ මන්ත්‍රීතුමාත් (ඉලංගරත්න මයා.) අනිකුත් මන්ත්‍රීවරුනුත් එවකට කී වචන අමතක වෙලාද අපට චෝදනා කරන්නේ කියා මා අහන්නට කැමතියි. තමුන්නාන්සේලා වැරැද්දක් කළ නිසා අපත් වැරැද්දක් කිරීම හරි නැති බව අප පිළිගන්නවා. එහෙත් හිටපු ඇමති අනිල් මුණසිංහ මහතාගේ කාලයේදී ජනසතු සේවය කළ හැටි අප හොඳාකාර දන්නවා. කොළොන්නාවේ මන්ත්‍රීතුමා ඒ කාලයේ කිව්වේ මොකක්ද? රැකියාවන් දෙන විට අප සෝදිසි කර බලන්නේ කරුණ තුනයි—රජයට පක්ෂපාතද, අපට හිතවත්ද, අපේ පක්ෂය වෙනුවෙන් මාත් අද තමුන්නාන්සේලාගේ කාලයේදී බදවා ගන්නා ලද දහස් ගණන් සෙනග අපට විරුද්ධව, ආණ්ඩුව කඩාකප්පල් කරන්නට ගෙන යන ව්‍යාපාර මැඩපවත්වාගෙන කටයුතු කරන්නට සිදුවී තිබෙන බව මා මතක් කරන්නට ඕනෑ. එවැනි කරදර මධ්‍යයෙහි අපේ ඇමතිවරුන් සහ ඒ ඇමතිවරුන්ට සහයෝගය දෙන නිලධාරීන් කරන වැඩ ගැන අප ප්‍රශංසා කරන්නට ඕනෑ. ලංකා ගමනාගමන මණ්ඩලය ගැන මාත් තරමක් දන්නවා. ඉඳ හිට වැරදි කරන නිලධාරීන් සුවලප දෙනෙක් ඇති, එහෙත් අවස්ථාව පැමිණි විට, වන්දනා කාලයක්, උත්සව කාලයක් පැමිණි විට—වැඩිපුර බස් රථ යොදාගෙන, උදේ රෑ දවල් නොබලා—ඕවර්ටයිම් මුදල් ගන්නවාද නැද්ද මා දන්නෙ නැහැ—බොහොම මහන්සි වී වැඩ කරන නිලධාරීන් සිටින බව මා හොඳින් දන්නවා. අපේ ඇමතිතුමා අසනීපයෙන් සිටිද්දීත් දිනකට පැය 17 ක්, 18 ක් වැඩ කරන බව මා ආඩම්බරයෙන් මතක් කරන්නට ඕනෑ. මේ වැද ගත් සභාවේදී කීප විටක්ම එතුමාට චෝදනා එල්ල කර තිබෙනවා. පාසල් යන කාලයේ පටන්ම එතුමා ගැන හොඳින් දන්න කෙනකු හැටියට මා නිර්භයව කියන්නට කැමතියි, දැනුවත්ව නම් එතුමා කවදාවත් වරදක් කරන්නෙත් නැති බව; කරන්නට ඉඩ දෙන්නෙත් නැති බව.

තමුන්නාන්සේලා ජනසතු ව්‍යාපාර ඇති කළ බව අපි පිළිගන්නවා. අප ඒ ජනසතු ව්‍යාපාර දිගටම පවත්වාගෙන යනවා. මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) කී විධියට අප ඒ ජනසතු ව්‍යාපාර නැවත කිසිම දිනක ඒ පරණ මුදලාලිලාට හෝ ව්‍යාපාරි කයන්ට නොදෙන බව ගරු අගමැතිතුමා කීප වරක්ම ප්‍රකාශ කර තිබෙනවා. අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් කොතලාවල මයා.]

නාන්සේලාට කියන්නට කැමතියි. අප නැවත ඒවා කිසිම දිනක පරණ අයිතිකාර යන්ට නොදෙන බව. තමුන්නාන්සේලා අපට මොනවා කීවත් අප ඇවිත් තියෙන්නේ රට හදන්නයි. රට හදන්න නම්, මහ ජනයාට සේවයක් කරන්න නම් මහ ජන යාගේ දුක නැති කරන්න නම්, මේ රට සශ්‍රීක රටක් කරන්නට නම් අප කව්රුත් උනන්දුවෙන් වැඩ කරන්න ඕනෑ. තමුන් නාන්සේලා කරපු දේවල් අප කඩන්නත්, අප කරන දේවල් තමුනාන්නාසේලා කඩන්නත් කාලය ගත කළොත් කවදාවත් වැඩක් කරන්නට ලැබෙන්නෙ නැහැ.

ජනසතු සේවාවල යම් යම් වැරදි තිබෙනට පුළුවන්. විශාල වශයෙන් වැඩ කරන විට සෑම දෙයක් ගැනම, පස්සෙන් ගිහින් සොයා බලන්නට බැරි බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. තමුන්නාන්සේලා විසින් ඉදිරිපත් කරන ලද අඩුපාඩු ගැන ගරු ඇමතිතුමා කල්පනා කර නිලධාරීන් සමග සාකච්ඡා කර ඒවා හදන්නට කටයුතු කරනවා ඇති. අපත් අපේ ප්‍රදේශවල අඩුපාඩු එතුමාට ඉදිරිපත් කළ විට එතුමා ඒ ගැනත් සැලකිල්ලෙන් කට යුතු කරනවාට කිසිම සැකයක් නැහැ. ඒ අඩුපාඩු හැදීමට තමුන්නාන්සේලාගේ සහයෝගයත් එතුමාට දෙන ලෙස මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. මෙම බොරු චෝදනා වලට බිය නොවී, මෙම විරුද්ධකාරයින්ගේ කථාවලට බිය නොවී, තම රටට කරන සේවය එඩිතරව කරන්නට එතුමාට ශක්තිය ලැබේවායි පතමින් මගේ කථාව අවසාන කරනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

ගරු සභාපතිතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයෙහි දුර්වලතා පිළිබඳව විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද චෝදනා අමතක කොට ජනසතු සේවා ඇමතිතුමා සුදනෙකු කිරීමේ අදහසින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කථා පැවැත්වීම පුදුමයට කාරණයක් නොවන බව මා මුලින්ම සඳහන් කළ යුතුයි. ඒ කෙසේ වෙතත්, ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ඇති දුර්වලතාවන් පිළිබඳව මහජනතාව සාක්ෂි දරනවා ඇති. බස්වලින් ගමනාගමනය කරන මහජනතාව කොතරම් අසහනයකට පත් වී සිටිනවාද යන්න අප දන්නවා. රැකීරක්ෂාවලට සහ නඩු හබවලට යන එන මගින් නිසි වේලාවට එම කටයුතු සඳහා යන්නට නොහැකි වීම නිසා නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දී සිටිනවා. ගම්බද ප්‍රදේශවල තිබෙන පරිසරය ගැන දන්න අපට ඒ පිළිබඳ කරුණු මහත් රාශියක් ඉදිරිපත් කරන්නට හැකියි. ඒ එකක් එකක් පාසා සඳහන් කරන්නට මෙය අවස්ථාවක් නොවන බව මා දන්නා හෙයින් මෙම අවස්ථාවෙහිදී දීර්ඝ ලෙස කතා කරන්නට කල්පනා කරන්නේ නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය බලයෙහි පැවති කාලයේදී ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුව කාර්යශීලී ලෙස ලංකා ගමනාගමන මණ්ඩලයෙහි වැඩ කටයුතු කරගෙන ගිය නිසා එමගින් විශාල ආදායමක් ලැබිය හැකි තත්ත්වයක් උදා වී තිබුණු බව වාර්තාවලින් පෙනෙනවා. එදා ලංකා ගමනාගමන මණ්ඩලයට සේවකයන් බඳවා ගැනීමේදී එක්තරා ප්‍රතිපත්තියක් අනුගමනය කළා. යම් යම් තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීමට වුවමනා වූ විට චක්‍ර ලේඛන මගින් ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. එම ඉල්ලුම් පත්‍ර මගින් සුදුසුකම් ඇති අය තෝරා ඔවුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්තුවා. එසේ කොට අවශ්‍ය ප්‍රමාණයට වඩා සුදුසුකම් ඇති අය සිටියා නම් ඒ අය ඉදිරිපිටදීම නිලධාරීන් විසින් ලොතරැයි ක්‍රමයක් මගින් ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය අය තෝරා ගැනීමේ ක්‍රමයක් එදා ක්‍රියාවට යෙදුණා. ඒ ක්‍රමය අසාධාරණ ක්‍රමයකැයි ප්‍රකාශ කරන්නට තමුන්නාන්සේලාට පුළුවන් කමක් තිබෙනවාදැයි මා ප්‍රශ්න කරන්නට කැමතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව අවසාන කාල පරිච්ඡේදය ගත කරන කාලයේදී, ඒ කියන්නේ සභාග රජය කාලයේදී, මෙම ඇමති ධුරය පැවරී තිබුණේ එවකට සිටි අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා වන අනිල් මුණසිංහ මහතාටයි. අපක්ෂපාතිව නිලධාරීන් සහ සේවකයන් පත් කර ගැනීම පිණිස එතුමා ක්‍රමවත් සැලැස්මක් ඇති කළා. එම සැලැස්ම කොතරම් සාර්ථක වුණාද කියතොත්, ඒ ඒ ඡන්ද කොට්ඨාස අනුව සේවකයන් අවශ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංඛ්‍යාව තෝරා ගැනීමේදී ඉදිරිපත් වූ පිරිස වැඩි නම් එය ක්‍රියාවට යෙදුවේ ලොත රැයි ක්‍රමයකට බව මේ ගරු සභාවත් රටත් එම සේවකයනුත් දන්නවා. [බාධා කිරීමක්] අපි එය කළේ දේශපාලනයෙන් තොරවයි. මෙම රජය බලයට පත් වුණා යින් පසුව පවා තවත් කොටසක් එසේ බඳවා ගන්නට සිදු වුණු නමුත් ටික කල කදී එම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා දේශපාලන බලපෑම් අනුව, හිතවත්කම් අනුව, ඥාති සම්බන්ධකම් අනුව, යනාදී ක්‍රියා මාර්ග වලින් විශාල සංඛ්‍යාවකට රැකීරක්ෂා සපයා දී තිබෙන බව අපට පෙනෙනවා. දේශපාලන හිතවත්කම් අනුව සේවක යන් ලංගමයට බඳවා ගත්තත් ඒ සේවක යන් ඒ දේශපාලන පක්ෂයට ගැතිකම් දක්වන්නේ නැති බවට අපට අත්දැකීම් තිබෙනවා. ඉලංගරත්න මැතිතුමා වෙළෙඳ ඇමතිවරයා වශයෙන් සිටිද්දී දේශපාලන හිතවත්කම් අනුව නොව සාධාරණ අන්දමට සතොසට සේවකයන් පිරිසක් බඳවා ගත්තා. ස්වකීය දේශපාලන පක්ෂයට ලැදි අයත්, ඒ වගේම ප්‍රතිවිරුද්ධ දේශ පාලන පක්ෂයේ අයත් ඒ සේවකයන් අතර සිටියා. 1965 දී පවත්වන ලද මහා මැතිවරණයේදී ඒ ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂයට අයත් සමහර උදවියගේ ඡන්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක යන්ට ලැබුණු අතර ඒ පක්ෂයටම හිත වත්ව සිටි සමහරුන් ඒ අපේක්ෂක යන්ට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. ඉතින් වර්තමාන ජනසතු සේවා ඇමති තුමා විසි දාහක් හෝ තිස් දහක් ලංගමයට බඳවා ගත්තත් ඊළඟ මහා මැතිවරණයේදී ඒ අයගෙන් සියයට 90 ක් ශ්‍රී ලංකා නිද හස් පක්ෂයේ අපේක්ෂකයන්ට ඡන්දය පාවිච්චි කරන බවට මට නම් සැකයක් නැහැ.

සේවක දුක්ගැනවිලිවලට මේ ඇමති අංශයෙන් කිසිම සහනයක් ලැබී නැහැ. ඒ වාගේම බස් රථවල අඩුපාඩු රාශියක් තිබෙනවා. බස් රථවල ඇති ඇණවලට ඒ වායේ ගමන් කරන මගින්ගේ ඇඳුම් පවා ඉරෙනවා. කැරපොත්තන්, සිකනල්ලුන් බස් රථවලට රිංගාගෙන සිටිනවා. එ පමණක් නොව සමහර බස් රථවලට නයින් පවා රිංගාගෙන සිටි අවස්ථා කිහිපයක් බව පුවත්පත්වල පළ වූ වාර්තා අනුව අපට පෙනී ගියා. බස් රථ කොතරම් අපිරි සිදු තත්ත්වයක පවතිනවාද කියනොත්, ඒවා ඇතුළට යන විට ගඳ ගහනවා. අද ලංගම බස් සේවය පවතින්නේ මේ තරම් අභාග්‍ය සම්පන්න තත්ත්වයකයි.

ජනසතු සේවා ඇමතිතුමාගේ දක්ෂතා ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කීප දෙනෙකුම කථා කළා. කොළඹ නගර සභා වට අයත් ව තිබුණු ට්‍රොලි බස් හැට හැත්තෑව නියම විධියට පාලනය කර ගන්නට ශක්තියක් නොතිබුණු පුද්ගල යකුට ලංගම බස් රථ භාර පන්දාහක් පාලනය කරන්නට පුළුවන්දැයි මා අහනවා.

ඊළඟට වරාය ගැන මතක් කරන්නට කැමතියි. අද වරායේ පවතින අසතුටුදායක තත්ත්වය නිසා බඩු ආනයනය කරන හා අපනයනය කරන වෙළඳුන් කරදර රාශිය කට මුහුණ පා සිටිනවා. "ජාතික" යයි කියා ගන්නා මේ රජය බලයට පත් වුණා යින් පසුව වරායේ දූෂණ බහුල වී තිබෙ නවා. මේ රටට ගෙන්වන සමහර බඩු, තොග පිටින්ම නැති වෙනවා. හොණ්ඩර හතර පහේ බැරල්, ඒවාගේම හොණ්ඩර තුන හතරේ පෙට්ටි පවා නැති වෙනවා. එක් අවස්ථාවකදී මා ගෙන්වූ බඩු හොණ් ඩර හතක් අටක්ම නැති වුණා. පසුගිය ජනවාරි මාසයේ මා රසායනික ද්‍රව්‍ය හොණ් ඩර හතහමාරක් ගෙන්වූවත් ඒ මුළු ප්‍රමාණයම හොරුන් ගත්තා. ඒ බැරල් සියල්ලම නැති වුණා. මේ රජය බලයට පත් වන්නට පෙර නම් මා පිටරටින් බඩු ගෙන් වූයේ නැහැ. කර්මාන්ත අමා ත්‍යාංශයේ අනුමැතිය ලැබුණ නිසා මට ඒ විධියට වැඩ කරන්නට පුළුවන් වුණා. ඒ ගැන ගරු කර්මාන්ත ඇමතිතුමාට ස්තුති වන්ත වෙනවා. 1965 ට පෙර නම් වරායේ මේ තරමට හොරකම් නොසිදු වූ බව වෙළෙඳ ව්‍යාපාරිකයන්ගෙන් මට දැන ගන්නට ලැබුණා. මේ ඔක්කොම සිදු වන්නේ මේ ඇමතිතුමා පත් වුණාට පසු වයි. නැති වූ බඩුවල අලාභය රක්ෂණ ආයතනයෙන් ඉල්ලුවත් ඒ අලාභ නියම විධියට ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. අලාභ ලබා ගන්නටත් මාස 8 ක් 10 ක් පමණ ගත වෙනවා. ගරු සභාපතිතුමනි,

PUBLIC LIBRARY JAFFNA.
Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. විදේශ විනිමය යොදා බඩු ගෙන්වීමේදි ඒ බඩු නැති වුණොත් රක්ෂණ සංස්ථාව මගින් අලාභය ගෙවන්නේ මේ රටේ මුදල් වලිනුයි. තමන්ට බඩුත් නැහැ; විදේශ විනිමයත් නැහැ. බඩු ටික හොරු අරගෙන විකුණා ගත්තාම සිදු වන්නෙ එයයි. හිත වතුන්ය කියා පත් කර සිටින අය ඒවා ගසා කනවා. දැන් උද්ගත වී තිබෙන්නේ ඔන්න ඔය විධියේ තත්ත්වයක්. ඒ ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. ඇමතිතුමාගේ හොඳ නම නරක් කරන්නට ඇමතිතුමා විසින්ම පත් කළ අයයි මේ බඩු හොරකම් කරන්නේ කියන එකයි මගේ හැඟීම.

අ. භා. 6.

අකුරණ ඡන්ද කොට්ඨාශයේ බස් ගමනාගමනය පිළිබඳව නම් ඉතාම නරක ආකාරයටයි විවේචනය කරන්නට සිදු වී තිබෙන්නේ. සමහර මාර්ගවල බස් ගමනාගමනය සතිය දෙක නතර වී තිබෙනවා. එයට හේතුව ඇසුවාම කියනවා, "අහවල් මන්ත්‍රීතුමා කරදර කර අහවල් පළාතට බස් එක ගත්තා; ආණ්ඩුව කියන එක කරන්න ඕනෑනේ; නැත්නම් අපව හම් බලන්නෙවට මාරු කරාවි; බස් එකක් ලැබුණාම දෙන්නම්" කියා. ගරු සභාපතිතුමනි, මම දවසක් මේ නිලධාරියෙකුට කිව්ව, කරුණාකර මට ඒ කාරණය ලියල දෙන්න කියා. "ලියල දුන්නොත් මගෙ රක්ෂාව සම්පූර්ණයෙන්ම ඉවරයි; ඒක නම් කරන්නට බැහැ" කිව්වා. මේ ලංගම ජනසතු ව්‍යාපාරය දැනට කෙරීගෙන යන්නෙ ඔය ආකාරයටයි. හිතවතුන් වශයෙන් හෝ දේශපාලන වශයෙන් හෝ ගරු ඇමතිතුමා ලංගමයට සේවකයන් පත් කර ගත්තාට අප කාගේවත් විරුද්ධත්වයක් නැහැ. යම්කිසි පිරිසකගේ හෝ රක්ෂා ප්‍රශ්නය විසඳෙන නිසා අපි ඊට විරුද්ධ නැහැ. එහෙත් ගරු ඇමතිතුමා විසින් දේශ පාලන වශයෙන් පත් කර ගත් කිසියම් පිරිසක් වෙනොත් ඔවුන්ගෙන් සියයට 90 ක් තරම ඊළඟ මහා මැතිවරණයේදී ඡන්දය දෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බව ගරු ඇමතිතුමා විසින් දැනගත යුතු බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ධර්මදාස බණ්ඩා මයා.
(திரு. தர்மதாஸ பண்டா)
(Mr. Dharmadasa Banda)

සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කරන්ට මට අවස්ථාවක් ලබා දීම ගැන තමුන්නාන්සේට මා ස්තුති වන්ත වෙනවා. විශේෂයෙන් අකුරණ පළමුවෙනි ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු අපට එක්තරා සැකයක් ඇති වෙනවා. ඊයෙ පෙරේදා උන්නැහේ බඩු වගයක් ගෙන්නුවලු. අපි ඇහුවා, බඩු මොනවද කියා. එහෙත් කිව්වෙ නැහැ. ඒ බඩු හත අට වරායෙදි නැති වුණු බවත් කිව්වා. එ පමණක් නොවෙයි. එතුමා ලංගමය ගැන කියාගෙන යන අවස්ථාවේදී මෙහෙමත් කිව්වා. මේ ආණ්ඩුව සහ ඇමතිවරයා ලංගමයට සේවකයන් පත්කරගෙන පත් කරගෙන යනවාය, නමුත් ලබන මැතිවරණයේදී ඔවුන්ගේ ඡන්දය ලැබෙන්නේ විරුද්ධ පාර්ශ්වයටය කිව්වා. ඒ නිසා ඒ ගැනත් අපට සැකයක් පහළ වෙනවා. ලංගම සේවය නරකය කියන මේ මන්ත්‍රීවරුන්ම කියනවා, ඔවුන් ඡන්දය දෙන්නෙ විරුද්ධ පාර්ශ්වයටය කියා. බස් ධාවනය කරවන නිලධාරීන්ගේත්, ඒවා පාලනය කරන අයගේත්, ඒවා අළුත්වැඩියා කරන අයගේත් වැඩ ගැන දෙස් කියමින්ම ඔවුන් නැවත වරක් විරුද්ධ පාර්ශ්වයට ඡන්දය දෙන්නට ලැහැස්තියයි කියනවා. මට තිබෙන සැකය නම් මේ මහත්වරුම මේවා කරනවාද කියන එකයි.

දැන් මාස තුන හතරකට පෙර මේ රටේ බස් ගමනාගමනය ඉතාම නරකයි කියා ලොකු ආන්දෝලනයක් තිබුණා. ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමා කෝටි එකත් දමා ගෙන බස් ස්ටෑන්ඩ් සෑම එකකටම වගේ යමින් බස් ධාවනය පිළිබඳව සොයා බැලීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. විරුද්ධ පාර්ශ්වය රට ආණ්ඩු කළ අවුරුදු ගණනාව තුළ එකම ඇමතිවරයකුවත් ඒ අන්දමට වැඩ කළේ නැහැ. ප්‍රවෘත්ති පත්‍ර ප්‍රමුඛ මේ රටේ සෑම කෙනෙකුම ඒ ඇමතිතුමාට පහර ගහන්නට පටන් ගත් ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමාම ඒ ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සොයා බලා ප්‍රතිකර්ම යෙදුවා. ඇත්ත වශ යෙන්ම ඒ ප්‍රවෘත්ති පත්‍රවල පළවූ තාලය ටම, මහජනයා කිව්ව තාලයටම දුර්වලකම් තිබුණෙ නැහැ. දුර්වලකම් නොතිබුණා යයි අපි කියන්නෙ නැහැ. ඒ තිබුණු දුර්වලකම් නැති කිරීමට ගරු ඇමතිතුමාම පියවර ගත් බව රටේ ජනතාව දන්නා නිසා ජනතාව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇමතිතුමා අසනීපයෙන් සිටියදීත් ඒ කළ මහඟු කාර්යට මුළු ජාතියම ණයගැති යයි මා කියනවා.

බස් දහස් ගණනක් තබාගෙන රටපුරා ධාවනය කරවන්නට යාමේදී නොයෙක් ප්‍රමාද දෝෂයන් ඇති වෙන්නට පුළුවන්. අකුරණ පළමුවෙනි ගරු මන්ත්‍රීතුමා වැනි උදවිය කියනවා, නඩු සඳහා උසාවිවලට යන උදවියට එහෙම බස් ප්‍රමාද වුණාම කරදර සිදු වෙනවාය කියා. බස් එක ප්‍රමාද වුණාය, බස් එක කැඩුණාය කියා කිසිවෙකුට උසාවියකින් දඩ ගැසූ බවක් මා නම් දන්නෙ නැහැ. යම්කිසි බස් එකක දුන්නක් කැඩුණත්, නැත්නම් සමහර අවස්ථාවලදී සමහරුන්ට වෙන්න වගේ ටයර් එකක හුළං ගියත් දෙස් කියන්නෙ ඇමතිතුමාටයි. සමහරවිට මන්ත්‍රීවරුන්ට අයත් විශාල 4 ශ්‍රී පෝජෝ කාර්වල ටයර් වලත් හුළං ගිය අවස්ථා තිබෙනවා. හුළං ගොස් ඡන්දය දෙන්නට බැරිවෙලා ආණ්ඩු පෙරළුණු අවස්ථාත් තිබුණා. රට පුරා ධාවනය වන බස් රථ තුන් හාර දහකින් එකක දෙකක ටයර්වල හුළං ගියාම බණින්නේ ඇමතිතුමාටයි; රජයටයි. මේක ඉතා අසාධාරණයි. ඇමතිතුමාට කොළඹ නගර සභාවේ ට්‍රොලි බස් ටිකවත් හරිහැටි ධාවනය කරවන්නට බැරි වුණාය, ඒ තරම් අදක්ෂ පාලකයකු වන මේ ඇමතිතුමා ලංගමයේ බස් ධාවනය කරවන්නෙ කොහොමද කියා අකුරණ පළමුවෙනි ගරු මන්ත්‍රීතුමා ඇහුවා. දැන් මේ ඇමතිතුමා අවුරුදු $4\frac{1}{2}$ක් බස් ධාවනය කරවා නැද්ද කියා මා අහනවා. මේ අවුරුදු $4\frac{1}{2}$ තුළ තමුන්නාන්සේලාගේ කාලයේදී දුන්නාට වඩා ගම්බද පළාත්වලට බස් සේවා දෙමින් එතුමා විශාල සේවයක් කර නැද්ද කියාත් මා අහනවා. සමහරවිට බස් සේවා යෙදවිය යුතු තවත් මාර්ග ඇති.

උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ දැනටමත් අපේ ප්‍රදේශවල අලුතින් පාරවල් සකස් කරගෙන යනවා. ඒ පාරවල් හදා අවසන් වුණාම අපට තව තවත් බස් රථ වුවමනා කරනවා. මෙතෙක් කල් අලුත් පාරවලට අවශ්‍ය බස් සපයා දී අපේ ජනතාවගේ ගමනා ගමන අවශ්‍යතාවන් සපුරා දුන්නා වාගේ ඉදිරියට අලුත් බස් සපයා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. අලුතින් වැඩි දියුණු කරනු ලබන පාරවලට තව තවත් අලුත් බස් සේවාවන් ඇති කරන්නට ඕනෑ බව මතක් කරන්නට කැමතියි. ඉදිරියටත් හැකි තරමින් බස් රථ දී අපේ ගමනාගමන සේවය වඩාත් පුළුල් කරන්නට ගරු ඇමතිතුමාට පුළුවන් වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

ට්‍රොලි බස් රථ සේවය සම්බන්ධයෙන් අකරුණාවන්ත අන්දමට අදහස් ප්‍රකාශ කරන්නට යෙදුණා. ඒ බස් රථ ධාවනය කරවන්නට බැරි නිසා කොළඹ පාරවලින් ඉවත් කරන්නට යෙදුණු බවක් ප්‍රකාශ කළා. දුවන්නට බැරි වෙලා ට්‍රොලි බස් නැවැත්තුවා නොවෙයි. ඒ ඉදිරිපත් කරන්නට යෙදුණේ වැරදි හැඟීමක් බව සඳහන් කරන්නට කැමතියි. ඒ විධියේ දේවල්ම කියමින් බස් සේවයක් කඩා කප්පල් කරන්නට උත්සාහ කළ නමුත් ඒ විධියට කරන්නට බැරි වුණා. ඒ නිසා අකුරණ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා කළ කථාව ගැන මගේ කණගාටුව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමතියි.

මීට අවුරුදු පහකට, දහයකට නැත්නම් පහළොවකට පමණ පෙර මේ රටේ රුපියල් පන්දහක පමණ වටිනාකමක් ඇති සුළු වෙළඳ හලක් පවා හරියාකාර පාලනය කරගෙන යන්නට පුළුවන් කමක් නොතිබුණු ඇතැම් අය අද බොහොම හොඳ දක්ෂ වෙළෙඳ ව්‍යාපාරික යන් බවට පත් වී සිටින හැටි අපට දකින්නට ලැබෙනවා. එහෙත් අවුරුදු පහකට, දහයකට නැත්නම් පහළොවකට පසු දැන් ඊට වඩා බොහොම හුඟක් වටිනාකම තිබෙන—සමහර විට ලක්ෂ ගණන් වටිනාකම තිබෙන—වෙළෙඳ ආයතනවල අධ්‍යක්ෂවරුන් හැටියට ඒ උදවිය කටයුතු කරනවා. එය අපට පැහැදිලි ලෙස පෙනී

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

ගොස් තිබෙන දෙයක් බව මතක් කරන්නට කැමතියි. මේ කාරණය විශේෂයෙන්ම අකුරණ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා ගැන වුවත් සඳහන් කරන්නට අපට පුළුවන් කම තිබෙනවා. එතුමා දැන් දක්ෂම පාලකයකු වෙලා සිටින බව අපට පෙනෙනවා. ආයතන එකක නොව කිහිපය කම අධ්‍යක්ෂ හැටියට එතුමා ක්‍රියා කරන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. එහි ඇති වැරැද්දක් නැහැ. ඒ කාරණය මතක් කරන්නට වුවමනාත් නැහැ. මුලදී කිසිම දෙයක් නොදත් උදව්ය වුවත් කලක් ගත වන විට අති දක්ෂ පුද්ගල යන් හැටියට ප්‍රසිද්ධියක් ලබන්නට බැරි කමක් නැහැ. මා එය සඳහන් කෙළේ එක් වැදගත් තර්කයක් සනාථ කරන්නටයි. එදා සිටි තත්ත්වයෙන්ම අදත් කෙනකු මනින්නට බැහැ. ඒකයි මට කියන්නට වුවමනා කළ වැදගත් කාරණය. අපේ ගරු ඇමතිතුමා අවුරුදු හතරහමාරක් මුළුල්ලේ මේ රටේ බස්රථ සේවය පාලනය කළා. ඒ කාලය තුළ එතුමා රටට විශාල සේවයක් කර තිබෙනවා. කාටවත් එය නැතැයි කියන්නට පුළුවන් කමක් නැහැ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ සිටින සේවකයන්ගේ ඡන්දවලින් සියේට 90ක් ලබා ගන්නට විරුද්ධ පාර්ශ්වයට පුළුවන් වෙතැයි අකුරණ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එවැනි ප්‍රකාශයක් කිරීම ගැන මා කනගාටු වෙනවා. නියම තත්ත්වය දැනගෙන නොවෙයි එතුමා ඒ ප්‍රකාශය කෙළේ. මේ සම්බන්ධයෙන් මට එකක් කියන්නට පුළුවනි. එතුමන්ලා බලයේ සිටි කාලයේ ලංගමයේ හිටපු සේවකයන් සහ ඊට පසු ලංගමයට ඇතුළු වූ සේවකයන් යන සියල්ලන්ම එකතු කර බැලුවත් සියේට අනූවක් තබා ඉතිරි හරියවත් එතුමන්ලාට ලබා ගන්නට බැරි වන බවට මා තුළ නම් කිසිම සැකයක් නැහැ. අනෙක් පැත්ත බලාපොරොත්තු වෙනවා නම් සමහර විට පසුව තැවෙන්නට නො සිදු වෙනවා ඇති. අඩු වශයෙන් පසුගිය චිතාවේ ලැබුණු ඡන්ද සංඛ්‍යාවෙන් සියේට පණහක්වත් එතුමන්ලාට ලබා ගන්නට පුළුවන් වෙතොත් ඒකත් එතුමන්ලාගේ සැනසිල්ලට හේතුවක් වන්නට පුළුවනි. එහෙත් ඒ ප්‍රමාණයවත් ලබා ගන්නට පුළුවනැයි සිතනවා නම් එය දවල් සිහිනයකැයි මට කියන්නට පුළුවනි. මෙවැනි සිහින මවාගෙන ඉන්නවා නම් කරුණා කර දැන්වත් නියම තත්ත්වය තේරුම් ගෙන නව පිටුවක් පෙරළා කටයුතු කරගෙන යන්නැයි මම කියනවා. කරුණා කර මේ විධියට ඇති කර ගත් සිතිවිලි අනුව ක්‍රියා කරමින් සේවකයන් උසිගන්නවා ලංකා ගමනාගමන මණ්ඩලයේ වැඩ කටයුතු කඩාකප්පල් නොකරන්නැයි මම මතක් කරන්නට කැමතියි.

මේ වැය ශීර්ෂය යටතේ කථා කරන විට ගරු ඇමතිතුමාගෙන් පසුගිය අවුරුදු හතරහමාර තුළ අපට විශාල සේවයක් සිදු වී තිබෙන බව කියන්නට මට පුළුවනි. 1960 සිට 1964 දක්වා ගත වූ කාලය තුළ මගේ ප්‍රදේශයෙ නම් එක අලුත් බස් සේවකයක්වත් ආරම්භ කෙළේ නැති බව මට කියන්නට පුළුවනි. එහෙත් වර්තමාන ගරු ඇමතිතුමාගේ පාලනය යටතේ ගත වූ අවුරුදු හතරහමාර තුළ නම් අපට අලුතින් බස් සේවා තුනක්ම ආරම්භ කර දී තිබෙනවා. ඒ ගැන බිබිලේ ජනතාව වෙනුවෙන් ගරු ඇමතිතුමාටත් ලංකා ගමනාගමන මණ්ඩලයටත් මම ස්තුති වන්න වෙනවා. තවත් සේවයක් සඳහා ඉල්ලීමක් කර තිබෙනවා. ඒකත් දැන් අනුමත කර තිබෙනවා. ඒ නිසා, ජනතාව වෙනුවෙන් හැකි තාක් ඉක්මනින් ඒ සේවයත් ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. අලුතින් බස් ලැබුණාම අලුත් පාරවලට අලුත් බස් ලබා දෙන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමාගේ අලුත් ප්‍රතිපත්තියක් මත අවශ්‍ය තැන්වල අලුතින් බස් ඩිපෝ ඇති කරන්නට කටයුතු කිරීම ගැන මගේ සතුට ප්‍රකාශ කරන්නට කැමතියි. බදුල්ලේ සිට මඩකලපුව දක්වා අම්පාර අතරතුර එකම බස් ඩිපෝවක්වත් නැහැ. ගරු ඇමතිතුමාට ඒ ගැන දැනුම් දීමෙන් පසු එතුමා ක්‍රියා කර තිබීම අපේ සතුටට කරුණක් බව කියන්නට කැමතියි. එතුමා ඉඩම් අත්පත් කරගෙන බිබිලේ ආසන්නය තුළ නුවන් බස් ඩිපෝවක් ඇති කරන්නට අනුමැතිය දී තිබෙනවා. ඒ ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බිබිලේ ජනතාව ස්තුතිවන්ත වෙනවා. ඇතැම් අය ගරු ඇමතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් නොමඟ යවන්න උත්සාහ කළ නමුත් එතුමා නොමඟ යවන්නට බැහැ. අලුතින් බස් ඩිපෝවක් අනවශ්‍ය යයි ඒ උදවිය කියා සිටියා. කුඹුරුවලට හානි වෙනවාය; මහජනයාට හානි වෙන වාය; තෙල් ආදිය කුඹුරුවලට යෑමෙන් පාඩු වෙනවාය යනාදි වශයෙන් කියන්නට යෙදුණු නමුත් ඒවා සම්පූර්ණයෙන්ම බොරු බව ගරු ඇමතිතුමා පිළිගත්තා. සමහර වෙළෙන්දන් එකතු වී තමන්ගේ ලාභය තමන්ටම තබා ගන්නට ඕනෑ නිසා මෙ වැනි අසත්‍ය දේ කියමින්, අපට බස් ඩිපෝවක් එපා යනාදි වශයෙන් කිව්වා. ඒ කොයි හැටි වෙතත් විරුද්ධත්වය පළ කිරීමේ එවැනි කතා ගරු ඇමතිතුමා නම් පිළිගන්නේ නැහැ. අපට එය අවශ්‍යයයි. ඒ නිසා ළඟදීම ඒ ඩිපෝවේ වැඩ කටයුතු ආරම්භ කරන්නැයි මා ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

අපේ ප්‍රදේශවල ගමනාගමන පහසුකම් ඇති කිරීමට ගරු ඇමතිතුමා ගත් පියවර සාර්ථක වීම අපේ ප්‍රීතියට කරුණක් බව කියන්නට කැමතියි. අපි එතුමාට ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. 1965 වන විට අපේ ප්‍රදේශයට—බදුල්ලට—තිබුණේ බස් 51 ක් පමණයි. කොළඹ, මාතර, ගාල්ල, මඩකලපුව, මහනුවර ආදි තැන්වලට යන ගත වූ අවුරුදු හතරහමාර තුළ බදුල්ලේ තිබුණේ බස් 51 ක් පමණයි. එහෙත් දැන් ඒ ගණන 91 දක්වා වැඩි කර තිබෙනවා. ගත වූ අවුරුදු හතරමාර තුළ බදුල්ලේ බස් රථ සංඛ්‍යාව 40කින් වැඩි කර තිබෙනවා. ප්‍රදේශයේ මහජනයාගේ ගමනාගමන පහසුකම් සලසා දීම ගැන අපි බදුල්ලේ ඩිපෝවට ස්තුතිවන්ත වෙනවා. තවත් අඩුපාඩුකම් නැතිවා නොවෙයි. ඒවාත් හැකි අන්දමින් සාර්ථක කර දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. 1965 දී තිබුණු බස් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි කර අවුරුදු පහකට පසු දැන් ඒ ගණන දෙගුණයක් කරන්නැයි ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. අවශ්‍ය බස් සංඛ්‍යාව ලබා දෙන්නට ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටිනවා.

අකුරණ පළමුවන මන්ත්‍රීතුමා (හේම චන්ද්‍ර සිරිසේන මයා.) කීවා, ලංගම බස් රථවල නයි, පොලොං ආදී සතුනුත් ඉන්නවාය කියා. ඔය විධියට යන විට පුදුම සත්තුත් සිටිවි. නමුත් අවුරුද්දකට කී වතාවක් ලංගම බස් රථවල ගමන් කරලාද එතුමා එබඳු ප්‍රකාශයන් කරන්නෙ? 4 ශ්‍රී, 5 ශ්‍රී සුඛෝපභෝගී මෝටර් රථවල ගමන් කරමින් මෙබඳු ප්‍රකාශයන් කිරීම ගැන මා කනගාටු වෙනවා. මොනරාගල ගරු මන්ත්‍රීවරයා හෝ සොරනාතොට ගරු මන්ත්‍රීවරයා හෝ වැලිමඩ ගරු මන්ත්‍රීවරයා හෝ ඒ අන්දමට කීවා නම් අපට එතරම් කනගාටුවක් නැහැ.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

මම බස්වල කොන්දොස්තර වැඩේ කරලා තිබෙනවා, ඩ්‍රයිවර් වැඩේ කරලා තිබෙනවා. මට හොඳට පළපුරුදුකම් තිබෙනවා. ගරු ඇමතිතුමා බස් එකක ඩ්‍රයිවර් වැඩේ නැතිනම් කොන්දොස්තර වැඩේ කරලා පළපුරුද්දක් තිබෙනවාද? කවදාද මේ මන්ත්‍රීතුමා කොන්දොස්තර වැඩක් කර තිබෙන්නෙ?

ධර්මදාස බණ්ඩා මයා.
(திரு. தர்மதாஸ பண்டா)
(Mr. Dharmadasa Banda)

මන්ත්‍රීතුමාගේ එම ප්‍රකාශයන් ගැන මා පුදුමයට පත් වෙන්නෙ නැහැ. ලංගමය පවත්වා ගෙන යන්න, ඇමතිතුමාට කොන්දොස්තර වැඩේ ගැන පළපුරුදුකම් ලබන්න ඕනෑද? අකුරණ පළමුවන මන්ත්‍රීතුමා කියන දේ ඇත්ත නම් එතුමාට බස් කොන්දොස්තර වැඩේවත් හරියට කර ගෙන යන්න නොහැකිව, ඩ්‍රයිවර් වැඩේවත් හරියට කරගෙන යන්න නොහැකිව, වෙළඳ ව්‍යාපාරවත් හරියාකාර ගෙන යන්නට නොහැකිව සිටි යුගයක් තිබුණු බව එතුමා පිළිගන්නවා. නමුත් අවුරුදු පහළොවකට පස්සෙ අද එතුමා සිටින තත්ත්වය ගැන මා සතුටු වෙනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

එදා බස් කොන්දොස්තර වශයෙන් ගෙවිවේ රුපියල් හතලිස් පහයි. කොන්දොස්තර කෙනෙකුට අද රුපියල් දෙසිය තුන්සියයක් පමණ ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධර්මදාස බණ්ඩා මයා.
(திரு. தர்மதாஸ பண்டா)
(Mr. Dharmadasa Banda)

ට්‍රොලි බස් ටික ගෙන යන්නවත් බැරුව සිටි ඇමතිතුමා ලංගමය පවත්වාගෙන යන්නේ කොහොමදැයි ඒ මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. එදා බස් කොන්දොස්තර කමින්, රියැදුරු කමින් දොට්ට බහින්න වුණත්, වෙළඳ ව්‍යාපාර පවත්වා ගෙන යාමට නොහැකිව අසාර්ථක තත්ත්ව්‍යය කට වැටී හිටියත්, අද එතුමා ඉතා සාර්ථක අන්දමින් වෙළඳ ව්‍යාපාර පවත්වා ගෙන යනවා. නමුත් එතුමා එතරම් ඉක්මනට සාර්ථක භාවයට පත් කර ගත්තේ, ඉක් මනින් පොහොසතෙක් වුණේ කොහොම දැයි කියන්න මා දන්නේ නැහැ. එදා එතුමාට බැරි වුණු දේ අද පුළුවන් වී තිබෙනවා; පිටරටින් බඩු ගෙන්වා ගෙන කටයුතු කරන ලොකු ව්‍යාපාරයක් පවත්වා ගෙන යනවා. වරායෙන් ද්‍රව්‍ය හොණ්ඩර ගණන් නැති වී තිබියදී පවා රුපියල් දහ යක දෙයක් නැති වුණු තරම්වත් ගණන් ගන්නේ නැතුව සිටින්න පුළුවන් පුද්ගල යකුගේ තත්ත්වයට අද පත් වී තිබෙ නවා. අද ඒ තරමට වෙනස් වුණු, දක්ෂ පුද්ගලයකු වී තිබෙනවා. අද විශාල වශ යෙන් පිටරටින් බඩු ගෙන්වන—

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

පිටරටින් බඩු ගෙන්වන ඇමතිවරුන් නැද්ද? [බාධාකිරීමක්]

ධර්මදාස බණ්ඩා මයා.
(திரு. தர்மதாஸ பண்டா)
(Mr. Dharmadasa Banda)

ඇමතිතුමාගෙත් දුර්වලකම් මුල් කාල යේදී තිබෙන්න ඇති. නමුත් පසුගිය අවුරුදු හතර හමාර තුළදී එතුමා ඉතාමත් දක්ෂ අන්දමින් කටයුතු කරගෙන ගොස් තිබෙනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

කෝටි පතියන් වුණු මැති ඇමතිවරුන් ඔය පැත්තේ නැද්ද? ඊයෙ පෙරේදා කෝටිපතියන් වුණු අයත් ඉන්නවා.

අ. භා. 6.15

ධර්මදාස බණ්ඩා මයා.
(திரு. தர்மதாஸ பண්டා)
(Mr. Dharmadasa Banda)

නොයෙක් ආකාරයෙන් කෝටිපතියන් වෙන්න පුළුවනි. නමුත් පාර්ලිමේන්තු කාල සීමාව තුළදීම කෝටිපතියන් වෙන්න පුළුවන්කමක් තිබුණා නම්, අපි බලමු කොයි පැත්තේද වැඩියෙන් සිටින්නේ කියන කාරණය. මා ඒ ගැන වැඩිපුර කථා කරන්න යන්නෙ නැහැ. [බාධාකිරීමක්] අකුරණ පළමුවන මන්ත්‍රීතුමාගේ බඩු වරා යේදී නැති වුණු බවක් ගැන සඳහන් වුණා. ඒ කෙසේ වුණත් මුලදී කොළඹින් හොණ්ඩර භාගයක හෝ හොණ්ඩරයක ද්‍රව්‍ය ගෙන්වා ගත් පුද්ගලයා අවුරුදු ගණ නාවකට පසුව පිටරටින් ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට තරම් දක්ෂ පුද්ගලයකු බවට පරිවර්තනය වීම ගැන, දක්ෂ පුද්ගලයකු වීම ගැන, එබඳු සිංහලයකු සිටීම ගැන අප සන්තෝෂ වෙනවා.

වරාය ගැන නොයෙක් අන්දමට විවේ චනය කළා. අප දන්නවා ඒ දවස්වල වරා යෙන් පිට නිතරම නැව් හතලිහක් පණ හක් නවතා තැබීමට සිදු වන බව. නමුත් ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර වරායේ බඩු බෑම පමාවක් නැතුව කර ගෙන යාමට පියවර ගැනීම ගැන මා එතු මාට ස්තුතිවන්ත වෙනවා. දැන් එබඳු ප්‍රමාදයක් ඇත්තේ නැහැ. නැව් ප්‍රමාද වීමක් සිදු වන්නේත් නැහැ. ඒ කාලයේ කොයි තරම් අයහපත් තත්ත්වයකින් වරායේ වැඩ කටයුතු ගෙන ගියාද කියනවා නම් මෙරටට අවශ්‍ය ද්‍රව්‍ය ගෙන ඒමට නැව් සමාගම් ප්‍රතික්ෂේප කළ අවස්ථාද තිබුණා. ඒ මන්ද? මේ වරායට නැව් ආ විට නියම වේලාවට බඩු බෑම් පැටවීම් ආදිය නො කෙරෙන නිසාත්, වරායෙන් පිට නැව් පෝලිම් ගසා තිබීමට සිදු වූ නිසාත්, නොයෙක් රටවල් හා නොයෙක් සමාගම් මේ රටට බඩු ගෙන ඒම ප්‍රතික්ෂේප කළා. නමුත් අද එවැනි තත්ත්වයක් නැහැ. කිසිම නැව් සමාගමක් අද මේ රටට බඩු ගෙන ඒම ප්‍රතික්ෂේප කරන්නෙ නැහැ. කිසිම නැව් සමාගමක් අද වැනි දවසක මේ රටට බඩු ගෙන ඒම ප්‍රතික්ෂේප කර තිබේ නාවද කියා තමුන්නාන්සේලා සොයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලන්න. ඇයි? අද මේ රටට බඩු නැවක් ආ විට වහාම ඒ බඩු ටික වරායේ තැන් පත් කර මේ රටෙන් ගෙන යන බඩු ආපසු නැව්වලට පටවා ගෙන ඉක්මනින්ම ආපසු යන්න පුළුවනි. අපේ වරායේ ඒ තරම් සතුටුදායක තත්ත්වයක් අද තිබෙනවා.

සමහර විට අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඡන්දය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් යම් යම් අය විසින් කරන ලද කඩාකප්පල්කාරී වැඩ නිසා සුළු සුළු වැරදි දේවල් සිදු වෙන්න පුළුවනි. සමහර විට සමහර බඩු නැති වෙනවා වෙන්න පුළුවනි. දහස් ගණනක් වැඩ කරන වරාය වැනි තැනක, දවසකට ලක්ෂ ගණනක් වටිනා බඩු එහා මෙහා වෙන තැනක, සුළු සුළු වැරදි සිදු වෙන්න පුළුවනි. අපි නැහැයි කියන්නෙ නැහැ.

එදා වරායෙන් පිට නැව් විශාල සංඛ්‍යාවක් පෝලිම් ගසා තිබුණා. පත්‍රවල පවා ඡායාරූප පළ වුණා. එදා අදක්ෂ අන්දමට ගෙන ගිය පාලනයක් නිසා එවැනි තත්ත්වයක් ඇති වී තිබුණා. නමුත් එදාට වඩා හොඳින් දක්ෂ අන්දමට මේ ඇමතිතුමා කටයුතු කරන නිසා, මේ ඇමතිතුමාගේ හොඳ පාලනය නිසා, අද වරායෙන් පිට නැව් ගොඩගැසී නැහැ. කිසිම නැව් සමාගමක් මේ රටට බඩු ගෙන ඒම ප්‍රතික්ෂේප කරන්නෙත් නැහැ. මේ රටට ගෙන එන ලද බඩු ඉක්මණින් බැමත්, ඒ වගේම මේ රටින් යවන බඩු ඉක්මනින් පැටවීමත් නිසා, නැව්වලට වැඩි කාලයක් වරායේ රැඳී සිටින්න ලැබෙන්නෙ නැහැ. අද මේ වගේ තත්ත්වයක් ඇති කළේ ගරු ඇමතිතුමාගේ දක්ෂකම නිසයි. ඒ නිසා මා හිතනවා තමුන්නාන්සේලා හැමදාම ගහන මළ බේරය තව දුරටත් ගැසීමෙන් කිසිම වැඩක් වෙන්නේ නැත කියා. අරක නැති වෙනවාය, මේක නැති වෙනවාය කියනවා. නමුත් නැති වුණ බඩුව මොකක්ද කියා කවදාවත් කියන්නෙ නැහැ. හැමදාම එකම ආකාරයට එකම සින්දුවක් කියනවා. මේ විධියට විවේචනය කරනවාට වඩා හොඳයි ඇත්ත ඇති සැටියට රටට පෙන්වීම කියා මා කල්පනා කරනවා. කවුරුන් මේ රට ආණ්ඩු කළත් අපට කමක් නැහැ. ඉතාමත් ඉක්මනින් මේ රටට බඩු ගොඩබැමට සහ බඩු පැටවීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට ක්‍රමයක් ඇති කර ගැනීමෙන් මුළු රටටම සේවයක් සැලසෙනවා. එය අපේ කාගෙත් යුතුකමක් විය යුතුයි.

අකුරණ මන්ත්‍රීතුමා පමණක් නොවෙයි, සෑම වෙළෙන්දෙක්ම කැමතියි, නැව් වරායට පැමිණි විගසම ඒව ගොඩ බාගෙන ගොස් වෙළඳාම් පොළවල්වලට ගෙන යන්න. මේ රටේ හැම වෙළෙන්දෙක්ම උත්සාහ කරන්නේ හැකි ඉක්මනින් බඩු ටික ගොඩ බාගෙන යාමටයි. ඒ වගේම හැකි ඉක්මනින්ම බඩු පැටවීම කරන්නත් ඒ අය කැමතියි. තමන්ගේ අලෙවිය ඉක්මනින් කර ගැනීමට හැම වෙළෙන්දෙක්ම කැමැත්තක් දක්වනවා. සමහර විට කෑම වර්ග ගෙන එන නැව් තිබෙන්න පුළුවනි. සමහර විට ලූනු වැනි නරක් වන දේවල් ගෙන එන්න පුළුවනි. ඒවා හැකි ඉක්මනින්ම ගොඩබා මහජනතාව අතට පත් කරන්න ඕනෑ. එවැනි දේවල් සම්බන්ධයෙන් අද කොයි තරම් හොඳ තත්ත්වයක් ඇති වී තිබෙනවාද කියා ටිකක් කල්පනා කර බලන්න. දැන් කොයි තරමක් වරායේ බඩු කුණු වෙනවාද කියා ටිකක් සොයා බලන්න. කරුණා කර සංඛ්‍යා ලේඛන ගෙනැවිත් බලන්න. 1965ට පෙර තත්ත්වයත් ඊට පසු තත්ත්වයත් හොඳට සසඳා බලන්න. දැන් වරාය ගඳ ගහන්නෙත් නැහැ. බඩු කුණු වෙන්නෙ නැති නිසා. ඒ නිසා අපේ ජනසතු සේවා ඇමතිතුමා මේ තරම් දක්ෂ ලෙස මේ කටයුත්ත කිරීම ගැන එතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ වගේම ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉතාමත් ඉක්මනින් තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබෙනවා. මා හිතන හැටියට මේ වර්ෂයේදීම ඒ ස්ථානයෙන් තෙල් ලබා ගන්න පුළුවන් වේවි. එපමණක් නොව, එදාට වඩා ඉතාමත් හොඳ සේවයක් ඇති කරන්න ගරු ඇමතිතුමාට පුළුවන්වී තිබෙනවා. කිසිම අගයක් හිඟයක් නැතිව පෙට්‍රල් ටිකක් ලබා ගන්න පුළුවනි. තමුන්නාන්සේලාගේ කාලයේදී පෙට්‍රල් බෙදා දෙන මධ්‍යස්ථාන කිහිපයක් වසා දමන්න යෙදුණා. සමහර දේවල් කලවම් කර—භූමිතෙල් ආදිය කලවම් කර—පෙට්‍රල් දෙනවාය කියා පෙට්‍රල් බෙදා හැරීම මධ්‍යස්ථාන කිහිපයක් වසා දැමුවා.

[ධර්මදාස බණ්ඩා මයා.]

ඒ වාට නඩු තිබුණා. තවමත් ඒ වා විසඳා අවසාන නැහැ. නමුත් මේ කාලය ඇතුළත අපේ ඇමතිතුමා එවැනි දේවල් සම්පූර්ණයෙන්ම මර්දනය කර තිබෙනවා. අද තමුන්නාන්සේලාගේ 4ශ්‍රී, 5ශ්‍රී, වාහන වලට විශ්වාසයක් ඇතුව පෙට්රල් ටිකක් දමා ගන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ වගේම සංස්ථාවට විශාල ලාභයක් ලබා දීමට ගරු ඇමතිතුමාට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ විධියට කටයුතු කළ ජනසතු සේවා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අවසාන වශයෙන් මා නැවත වරක් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. බිබිලේ ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටින අලුත් බස් මාර්ග දෙක ඉක්මනින්ම ලබා දෙන්න. බිබිලෙ-පිටිකුඹුරු සහ යල්කුඹුර-මැදගම සේවයන් දෙක ඉක්මනින්ම ආරම්භ කර අලුත් බස් රථ දෙකක්ද ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ වවන දෙක තුනක් කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, විශේෂයෙන් බණ්ඩාරගම මන්ත්‍රීතුමා (ජෝර්ජ් කොතලාවල මයා.) කියා සිටියා. ජනසතු සේවය ආරක්ෂා කරනවාය කියා. ඒ ගැන අසන්නත් අපි බොහොම සතුටුයි. ජනසතු ව්‍යාපාරවලට විරුද්ධකම් දැක්වූ උදවිය අද ජනසතු සේවය ආරක්ෂා කරනවාය කියා මේ ගරු සභාවේදී කියනවා අසන්න ලැබීම ඇත්ත වශයෙන්ම ප්‍රීතියට කාරණයක්.

ගරු සභාපතිතුමනි, මේ රටේ ජනසතු සේවය ආරම්භ කළේ 1956 න් පසුවයි. බස්, වරාය, රට ඇතුළත තෙල් බෙදා හැරීම ආදිය ජනසතු කළා. එම නිසා පසුගිය ආණ්ඩුවත් ඊට කලින් තිබුණ ආණ්ඩුවත් ජනසතු සේවයේ ප්‍රගතිය හැටියට සලකන්න පුළුවන්. තමුන්නාන්සේලා ඒ ව්‍යාපාර පවත්වාගෙන යනවා මිසක් අමුතුවෙන් එකම පෞද්ගලික ව්‍යාපාරයක්වත් ජනසතු ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට ක්‍රියා කර තිබෙනවාද කියා මම ප්‍රශ්න කරනවා. ජනසතු ව්‍යාපාරයට ඔතරම් ආදරයක් දක්වනවා නම්, ජනසතු සේවයක් ලාභ ඇතුව කරන්න පුළුවන්ය කියා විශ්වාසයක් තිබෙනවා නම්, ජනසතු සේවා මගින් රට සංවර්ධනය කරන්නට පුළුවන්ය කියා විශ්වාසයක් තිබෙනවා නම්, රටේ ජනතාවගේ වුවමනාවන් ඉෂ්ට කරන්නට පුළුවන්ය කියා විශ්වාස කරනවා නම්, ඒ ජනසතු ව්‍යාපාර ආරම්භ කිරීම ඉදිරියටත් කරගෙන යන්නෙ නැත්තේ ඇයි කියා අපි ප්‍රශ්න කරනවා. ඇත්ත වශයෙන් ම කියනවා නම් තමුන්නාන්සේලා ජනසතු ව්‍යාපාරයට විරුද්ධයි. තමුන්නාන්සේලා සෑම අවස්ථාවකදීම එවැනි ව්‍යාපාරවලට විරුද්ධවයි ක්‍රියා කර තිබෙන්නෙ, ඒ ව්‍යාපාර ආරක්ෂා කරනවාය කියා අද තමුන්නාන්සේලා පොරොන්දු දුන්නත්, ඇත්ත වශයෙන්ම ඒ ව්‍යාපාර ආරම්භ කරන සෑම අවස්ථාවකදීම හරස් කැපීම් තමයි තමුන්නාන්සේලා කර තිබෙන්නෙ. එසේ නොකලාය කියා තමුන්නාන්සේලාට කියන්න බැහැ.

ඒ කෙසේ වුණත් අපි සන්තෝෂ වෙනවා, මේ ආණ්ඩුව ඒ ජනසතු ව්‍යාපාර ආරක්ෂා කර, දියුණු කර, ඉදිරියට ගෙන යන්නට පොරොන්දු වීම ගැන. තමුන්නාන්සේලා බලයේ සිටියත් වෙන කවුරු බලයේ සිටියත් ඒ ජනසතු ව්‍යාපාර ආරක්ෂා කරගෙන ඉදිරියට ගෙන යන්නට අපේ සම්පූර්ණ සහයෝගය දෙන්නට අපි සෑම අවස්ථාවකම ලැහැස්ති බව මා ප්‍රකාශ කරන්න සතුටුයි.

සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ බස් සේවය සම්බන්ධයෙන් වවන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා. මාතර නගරයේ බස් ව්‍යාපාරය ගැන සඳහන් කරන විට ගාල්ල ඇරුණාම තිබෙන ඒ ප්‍රදේශයේ විශාලම බස් නැවතුම්පොල මාතර බස් නැවතුම්පොළයි. ඒ පරණ බස් නැවතුම්පොළ වෙනුවට, මඟීන්ට ආවරණයක් නැති බස් නැවතුම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොළ වෙනුවට, මගින්ට විශ්‍රාම ශාලාවක් නැති බස් නැවතුම්පොළ වෙනුවට එහි අලුත් බස් නැවතුම්පොළක් ඉදි කිරීමට ලංකා ගමනාගමන මණ්ඩලය මූලික කට යුතු සූදානම් කර තිබෙන බව මම දන්නවා. ඒ ගැන ඇමතිතුමාට ස්තුති කරන අතර මා ඉල්ලා සිටිනවා, ඒ වැඩපිළිවෙළ ඉක්මනින්ම , ක්‍රියාත්මක කරන්නය කියා. ඒ මක්නිසාද? වර්ෂා දිනයකදී මාතර බස් නැවතුම්පොළ දකින්න ලැබුණොත් තමුන්නාන්සේට අවබෝධ වේවි මගින් මොන තරම් අමාරුකම්වලට මුහුණ පාන වාද කියා.

ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

හදන්න එපාය කියනවාද? අපි හදන්න ලැහැස්තියි.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

බොහොම හොඳයි. තමුන්නාන්සේ ඒක හදන්න. [බාධාකිරීම්] සභාපතිතුමනි, බසුත් අවශ්‍යයි. ඒ වාගේම බස් නැවතුම් පොළත් අවශ්‍යයි. දැන් බස් එකකට නගින්න යන්න සිදු වී තිබෙන්නේ මඩ වගුරකයි. වැසි දිනයකදී පිරිසිදු ඇඳුමක් ඇඳගෙන ගොස් එහිදී බස්රියකට නගින්න බැහැ. සෙරෙප්පු කුට්ටමක් දාගෙන යන්න බැහැ. ඇඳුම්වල මඩ ඉහෙනවා; ඇඟේ මඩ ඉහෙනවා. එය අද ඉතාම නරක තත්ත්වයට පත් වී තිබෙනවා. කීප වතාවකදීම මේ ගැන ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේදීත් කරුණු ඉදිරිපත් කළා.

ගරු සුගතදාස

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

ඒක නොවෙන්නම් වැඩ ආරම්භ කර තිබෙන්නෙ.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ආරම්භ කෙළේ නැහැ. නියම විධියට ඒ වැඩේ කිරීමට ආරම්භ කර නැහැ. එහෙන් මෙහෙන් ඩිංගක් බොරුවට කර තිබෙනවා. ඒත් වැසි දිනයකදී එය සම්පූර්ණයෙන්ම මඩ වගුරක්. එම නිසා එම බස් නැවතුම් පොළ අංගසම්පූර්ණ බස් නැවතුම්පොළක් කරන්න. මහජනයාට මෙසේ හිරිහැර කර දරදඬු මුහුණපාන්නට ඉඩ දෙන්න එපා. අලුත් බස් නැවතුම්පොළ හදන තුරු අඩු ගණනේ එම භූමියේ වතුර රැඳීම වළක්වා මහජනයාට එහි ගමන් කරන්නට පුළුවන් තත්ත්වයට ගෙනෙන්නටය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ප්‍රමාණවත් ආවරණ නොමැති නිසා, වර්ෂා දින වලදී බස්වලට නගින්නට යන මගින්ට තෙමෙන්නට සිදු වෙනවා. එහි තිබෙන්නේ අඩි තුන හතරක් දිග ආවරණ පමණයි. ඒවා අවශ්‍ය තරමට දිග නැහැ. වර්ෂා දින වලදී මාතර බස් නැවතුම්පොළට එන මගින්ට හිස් ලූ ලූ අත දුවන්නට සිදු වීම කොතරම් කණගාටුදායකද? එම නිසා නව බස් නැවතුම් පොළ සාදා නිම වන තුරු පහත සඳහන් කාරණා දෙකටත් ඉෂ්ට කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. පළමුවෙන්ම, වර්ෂා දිනවල බස් නැවතුම් පොළේ වතුර රැඳීම වැළැක්වීමට කටයුතු කරන්න. ඊළඟට, තාවකාලික ආවරණ සපයා, වර්ෂා දිනවල නොතෙමී බස්වලට නගින්නට ඉඩකඩ සලසා දෙන්න.

මාතර ඩිපෝවේ පාසල් සේවය සාර්ථකව ක්‍රියාත්මක වන්නේ නැහැ. සෑහෙන තරම් බස් නොමැති වීමයි, ඊට හේතුව. දැනට තිබෙන මාර්ගවලම බස් ධාවනය කිරීම සඳහා වුවත් අඩු ගණනේ තවත් බස් 15ක් වත් මාතර ඩිපෝවට අවශ්‍යව තිබූ බව මට දැනගන්නට ලැබී තිබෙනවා. එහෙත් ලැබී තිබෙන්නේ බස් 5ක් පමණයි. ඉතිරි බස් 10 මේ මස අවසන් වන්නට පළමු මාතර ඩිපෝවට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
10 ක් ඇද්ද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
10 ක් ලැබුණොත් යම්තම් පිරිමහ ගන්න පුළුවනි.

වංක සේවකයන්ට කිසිම සමාවක් නොදෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා. මහ ජන මුදල් එළිමහනේම වංචා කොට අසු වී අස් කළ සමහර සේවකයන් යළිත් පස්සා දොරෙන් ලංගමයට රිංගා ගන්න බවට අපට අරාංචි ලැබී තිබෙනවා. දේශ පාලන ලැදියාවන් හා පෞද්ගලික හිත වත් කම් උඩ යම් යම් පුද්ගලයන් සමග ඇවිත්, යළිත් ලංගම සේවයට ඇතුළත් වන්නට ඔවුන්ට පුළුවන්කම ලැබීම කෙත රම් කණගාටුදායකද? එවැනි වංචනික සේවකයන් ලංගමය තුළ රඳවාගන්නවා නම් ඒ ජනසතු ව්‍යාපාරය නියම අන්දමින් ගෙන යන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා එවැන්නන් මොහොතක්වත් තබා නොගෙන අස් කළ යුතු අතර, යළිත් පස්සා දොරෙන් එන්නට ඔවුන්ට ඉඩ නොතැබිය යුතු බවත් මා අවධාරණයෙන් කියා සිටිනවා. යම් යම් දේශපාලන පක්ෂවලට ලැදිව කටයුතු කළාය, වෘත්තීය සමිති කටයුතුවල යෙදුණාය යන චෝදනා වලට ලක් වුණු සේවකයන් හෝ අත් වැරදීම් වුණු සේවකයන් ගැන නොවෙයි, මා කියන්නෙ. පසුව කී ගණයේ සේවක යන්ට නම් අනුකම්පාව දක්වන්නට ඕනෑ.

මාතර නගරයේ ක්‍රීඩාංගණයක් සෑදීම සඳහා මේ අමාත්‍යාංශය මගින් රු. 50,000 ක මුදලක් මාතර නගර සභාවට දී තිබෙනවා. ඒ ගැන මා ස්තුතිවන්ත වෙනවා. මාතර ක්‍රීඩා සමාජය "රුහුණු සෑණ කෙළිය" නමින් සැළකෙළියක් පවත්වා ඒ සඳහා රු. 51,000 ක් උපයාගෙන තිබෙනවා. මේ ක්‍රීඩාංගණයට මුල් ගල් තැබීමේ උත්සවයට ජනසතු සේවා ඇමති තුමාත් සහභාගි වුණා වගේ මතකයි. එහෙත් තවමත් එහි වැඩ කටයුතු පටන් ගෙන නැහැ. මාතර නගර සභාවේ මුදල් වංචාවත් සිදු වන නිසා, තමන් එකතු කළ රු. 51,000 නගර සභාවට දෙන්නට අර ක්‍රීඩා සමාජය කැමති නැහැ. මේ තත්ත්වය යටතේ යළෝක්ත ක්‍රීඩාංගණය සඳහා වැය කරන්නට තිබෙන රු. 1,01,000 ක මුදලක් නිකම්ම තිබෙනවා. එම නිසා අමාත්‍යාංශයෙන් දුන් මුදල් පාවිච්චි කර වහාම ක්‍රීඩාංගණය සෑදීමේ කටයුතු අරඹන්නැයි මාතර නගර සභාවට නියෝග කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
එවැනි නියෝගයක් කරන්න අපට බලයක් නැහැ.

අ. භා. 6.30

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
වෙන් කර ඇති රු. 50,000 ප්‍රයෝජන යට ගන්නේ නැත්නම් එය ආපසු ලබා ගන්නවා යයි කියන්න. රු. 50,000 බැංකුවේ තැන්පත් කොට තිබීමේ ඇති ඵලය මොකක්ද? මාතර නගරයට ක්‍රීඩාංගණ යක් අත්‍යවශ්‍යයි. එම නිසා ක්‍රීඩාංගණය සෑදීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසන්න ඕනෑ.

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)
රු. 50,000 පාවිච්චි කර ක්‍රීඩාංගණය හදන්න කියන්නම්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
නගර සභාව එම ක්‍රීඩාංගණය හදන්නට සූදානම් වන්නේ මාතර උයන්වත්තේයි. මේ ක්‍රීඩාංගණය සෑදීමට යෝජනා කර තිබෙන ස්ථානය ගැන මා නම් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. දකුණේ ඉතාම අලංකාර පිටිතනිය තිබෙන්නේ මාතර නගරයේයි. එය මාතර නගරයේ පෙණහල්ල වැනි ස්ථානයක්. ශීඝ්‍රාකාරයෙන් ගොඩනැගිලි ඉදි වේගත එන මාතර නගර යේ වේසෙන මහජනතාවට හුස්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට තිබෙන්නේ මේ උයන්වත්ත පිටිටනියයි. එම නිසා මෙම ක්‍රීඩාංගණය ඒ පිටිටනියෙන් ඉවත් කොට වෙනත් ස්ථානයකට ගෙන යා යුතුයි. මාතර නගරය ආසන්නයේ වෙනත් බිම් තිබෙනවා. එයින් භූමියක් තෝරාගෙන ක්‍රීඩාංගණය ඉදි කොට ක්‍රීඩා ලෝල තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුශලතාව දියුණු කර ගැනීමටත් ක්‍රීඩා පුහුණු වීමටත් ගරු ඇමතිතුමා අවස්ථාව සලසා දෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

තවත් එක් කරුණක් ඉදිරිපත් කොට මගේ කතාව අවසන් කිරීමට මා අදහස් කරනවා. ලංකාවේ මුහුදුබඩ සෑම ප්‍රදේශයකම වාගේ අද ඉතා ශීඝ්‍රයෙන් මුහුදුකෑම සිදු වන බව තමුන්නාන්සේ දන්නවා. මගේ ඡන්දදායක කොට්ඨාශයේ වැල්ල මඩම නමැති ප්‍රදේශය ඉතාම භයානක විධියට මුහුදුකෑමට ගොදුරු වී තිබෙන නිසා එහි වෙරළ අයිනේ තිබෙන ගෙවල් ඉතාමත් අන්තරාදායක තත්ත්වයකට මුහුණ පා තිබෙනවා. එම නිසා, මුහුදුකෑම වළක්වා මුහුද අයිනේ ජීවත් වන දුප්පත් ජනතාවගේ ගෙවල් හා දේපළ ආරක්ෂා කිරීමට වහාම වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය අවුරුදු ගණනක් ඇතුළතදී —කාලය නියම වශයෙන්ම මට කියන්නට බැහැ—ලංකා භූමියෙන් වර්ග සැතැප්ම 25 ක් පමණ මුහුදට සේදී ගොස් තිබෙන බව සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක සඳහන් වී තිබෙනු මා දැක්කා. තව තවත් මේ විධියට රට සේදී යන්නට ඉඩ දුන්නොත් අපේ රට තව තවත් පුංචි වෙනවා. රට ලොකු කර ගත යුතුව තිබෙන අවස්ථාවක පුංචි වන්නට ඉඩ හැරීම ඉතාම භයානකයි. මුහුදු බොරළු හා හුණුගල් ගැනීම සඳහා මුහුදු වෙරළ විශාල යන්ත්‍රසූත්‍ර යොදා හාරනු ලබන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. වෙරළෙහි විශාල වලවල් හැරීම නිසා රට තව තවත් ඉතා ශීඝ්‍රයෙන් මුහුදට සේදී යනවා. මෙය භයානක අපරාධයක්. මෙය නතර කිරීමට නීතියෙන් ඉඩක් නැතැයි මට දැනගන්නට ලැබුණා. වෙරළ හැරීම සම්බන්ධව නඩුවක් උසාවියට ඉදිරිපත් කළ අවස්ථාවක උසාවිය එම නඩුව බාර ගන්නට බැරියයි කී බව, දිසාපති තුමා සමග මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේදී මට දැනගන්නට ලැබුණා.

ඩී. ඊ. තිලකරත්න මයා. (රත්ගම)
(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)
(Mr. D. E. Tillekeratne—Ratgama)
දැන් නීති සකස් කර තිබෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ක්‍රියාත්මක වෙනවාද?

ඩී. ඊ. තිලකරත්න මයා.
(திரு. டி. ஈ. திலகரத்ன)
(Mr. D. E. Tillekeratne)
ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තවම සූදානම් වෙනවා. ඉතාමත්ම ඉක්මනින් එම නීති ක්‍රියාත්මක කොට රට ආරක්ෂා කිරීමට කටයුතු සලස්වන ලෙස මා ඉල්ලා සිටිනවා. අපේ රටට තිබෙන්නේ සතරැස් හැතැප්ම 25,000 ක භූමියක් පමණයි. හුණුගල් ටිකක්, බොරළු ටිකක් නිසා මේ කුඩා රට විනාශ කරන්නට ඉඩ දෙන්න එපා. මෙම විනාශය නැවැත්වීමට වහාම නීති සකස් කොට ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමින් මගේ කතාව අවසන් කරනවා.

විමලා කන්නන්ගර මිය.
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)
ජනසතු සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කතා කිරීමට මට අවසර දීම ගැන ගරු සභාපතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. ජාතික රජය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී මාර්ගය ඔස්සේ ගමන් කරමින් දුප්පත් මහජනතාවගේ යහපත උදෙසා අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, ආදියද නොමිලයේ සපයමින් රටේ ශුභසිද්ධියට කටයුතු කරගෙන යන නමුත්, විරුද්ධ පාර්ශ්වය අපගේ බස් සේවයෙන් අලාභ යයි කියමින් රට පුරා විශාල උද්ඝෝෂණ යක් ගෙන යනවා. එංගලන්තය වැනි ඉතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මයා.]

දියුණු රටෙහි ඇති "ලන්ඩන් ට්‍රාන්ස්පෝට් සර්විස්" නම් බස් සේවය පවත්වාගෙන යන්නේ ලාභ ඇතිවදැයි මා විරුද්ධ පාර්ශ්වයෙන් ප්‍රශ්න කරනවා හැදට යාමට තරම් විද්‍යා අංශයෙන් දියුණුව සිටින අමෙරිකාව "නිව්යෝක් ට්‍රාන්ස්පෝට් සර්විස්" එක පවත්වාගෙන යන්නේ ලාභ ඇතිවද? ඒ රටවල් දෙකේම කටයුතු කරන්නේ ලාභයක් නොතකා දුප්පත් මහජනතාවගේ සැප පහසුවට බස් සේවය දියුණු කරන්නටයි. දුප්පත් මහජනතාවට කලට වේලාවට තම තමන් රාජකාරී කරන කාර්යාලවලට යන්නට, ආරෝග්‍යශාලාවලට යන්නට, පාසැල් දරුවන්ට කලට වේලාවට තම තමන්ගේ පාසැල්වලට යන්නට තිබෙන එකම වාහනය බස් රියයි. එසේ නම් වාසියක් බලාගෙන නොව දුප්පත් මහජනතාවගේ ශුභ සිද්ධිය තකා බස් රථ සේවය දියුණු කළයුතු බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. මහජනතාවට පුළුවන් තරම් සැප පහසු ඇතිව ජීවිතත් ආරක්ෂා කර ගෙන කලට වේලාවට ගමන් කළහැකි බස් රථ සේවයක් ඇති කිරීම දියුණු නොදියුණු සෑම රටකම ආණ්ඩුවේ එකම පරමාර්ථය විය යුතුයි. ඒ අනුව අපේ ආණ්ඩුව කටයුතු කරගෙන යනවා. අපේ ඡන්ද ප්‍රතිඥාවකුත් ඉෂ්ට කරමින් මේ සේවය පුළුවන් තරම් හොඳින් පවත්වාගෙන යන බව තමුන්නාන්සේලා දන්නවා. ලාභයක් ගැන සිතට ගන්නේ නැතිව අපේ රටේ බස් සේවය තව තවත් දියුණු කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආදායම් ලබා ගන්නට ගරු මුදල් ඇමතිතුමාට වෙනත් මාර්ග සොයා ගන්නට කියන්න. ලාභය පැත්තකට දමා මේ බස්රථ සේවය දුප්පත් මහජනතාවගේ සැපපහසුව තකා තව තවත් දියුණු කිරීමට පියවර ගන්න. අද තිබෙන තදබදය නැති කිරීමට කටයුතු කරන්න.

නොබෝදා පාර්ලිමේන්තුව වැඩ කටයුතු අවසාන වී මා කොළඹ සිට යන විට මගින්ගෙන් පිරී ඉතිරී තිබුණු බස් රියක් දුටුවා. සාඩින් ටින් එකක මාළු පුරවන්නාක් මෙන් ඒ බස් රියේ මගීන් පුරවා තිබුණා. මගින් වවුලන් වාගේ එල්ලී ගමන් කළා. ඒ දර්ශනය දුටුවාම මුළු ලොකු දුකක් ඇති වුණා. බැරි වෙලාවත් ලොකු ගැස්සීමක් එහෙම ඇති වුණා නම් මගින් කිහිප දෙනෙකුගේ ජීවිත විනාශ වන්නට ඉඩ තිබුණා. කොළඹ-මහනුවර පාරට පුළුවන් තරම් බස් රථ දැමිය යුතුයි. එවැනි අනෙක් ප්‍රධාන මාර්ගවලටත් පුළුවන් තරම් බස් රථ දැමිය යුතුයි. ලාභය පැත්තකට දමන්න. විරුද්ධකාරයින් කියන හැටියට කරන්නට නොවෙයි අප ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ. අප ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ දුප්පත් මහජනතාවගේ යහපතට වැඩ කිරීමටයි. ඒ කාරණය සිතට ගන්නා මෙන් මා මතක් කරනවා. අපේ යුතුකම හරියාකාරව ඉෂ්ට කළොත් මහජනතාව මහජනතාවගේ යුතුකමත් හරියාකාරව ඉෂ්ට කරන බව මා ගරු ඇමතිතුමාටත් රජයටත් මතක් කරන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, අපේ ආණ්ඩුව බලයට පත් වූවාට පසු නොයෙකුත් නව ක්‍රම ආරම්භ කළා. අධ්‍යාපන ක්‍රමයේ ලොකු වෙනසක් ඇති කළා. දැන් කණිෂ්ඨ ජ්‍යෙෂ්ඨ විද්‍යාලවලට, මහා විද්‍යාලවලට, මහා විද්‍යාලවල විද්‍යා පන්තිවලට යන්නට පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන්ට ඉඩ ප්‍රස්ථාව සලසා දී තිබෙනවා. ඒ පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන්ට කලට වේලාවට පාසැල්වලට යන්නට ගමනාගමන පහසුකම් සැලැස්විය යුතුව තිබෙනවා. වේලාවට පාසැලට යා ගන්නට බැරි වුණොත් දඬුවම් ලැබෙනවා. ඉතින් දඬුවමකින් දවස පටන් ගත්තාම ඒ දරුවාට හරියාකාරව මුළු දවසේම ඉගෙනීම කරන්නට බැහැ. පාසැල් බස් නැතිකම නිසා ඉතාම නරක තත්ත්වයක් ඇති වී තිබෙනවා. පාසැල් ශිෂ්‍යයනුත් වෙනත් රැකීරක්ෂාවලට යන මහජනතාවත් සියල්ලෝම එකම බස් රථයකට පිංගන්නට උත්සාහ කරනවා. දෙගොල්ලන්ගේ අවුල නිසා අපට පෙත්සම් පිට පෙත්සම් ලැබෙනවා. මහජනතාව පෙත්සම් එවනවා. ගුරු දෙගුරු සමිති පෙත්සම් එවනවා. පාඨශාලා ශිෂ්‍යශිෂ්‍යාවන් පෙත්සම් එවනවා. මේ සියළු දෙනාම කියන්නේ බස් සේවා කාල සටහන් වෙනස් කරන්නය යන්නයි. නමුත් ඒක හරියට හිසේ ඇම්මට කොට්ටය මාරු කරනවා වාගේ වැඩක්. කාල සටහන් වෙනස් කළාට මේ තත්ත්වය මග හැරෙන්නේ නැහැ. කළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුව තිබෙන පිළියම ඒක නොවෙයි. කොළඹ-මහනුවර පාරේ ධාවනය වන බස් වලින් කොඩිබෑවල වසම, ගලිගොමුව වසම ආදී ප්‍රදේශවල ළමයින්ටත් ගමන් කරන්නට වී තිබෙනවා. ඒවාගේම අවිස්සාවේල්ල-කොටියාකුඹුර පාරේ ධාවනය වන බස් වලින් කෑගල්ලට එන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අද තිබෙන තත්ත්වය යටතේ මගීනුත් පාසැල් ශිෂ්‍යයනුත් දෙගොල්ලම අතරමං වෙනවා.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් මේ ලෙඩේට බෙහෙතක් කියන්නම්. පිළි ගන්නවා නම් පිළිගන්න. බැරි නම් පැතත්කට දමන්න උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවෙනුත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙනුත් ඒවාගේම ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙනුත් විශාල මුදල් වැය කර තනා තිබෙන මේ පාරවල්වලට අපට "ඒ" වර්ගයේ ලොකු බස්රථ වුවමනා නැහැ. ඒවාගේම "බී" වර්ගයේ බස් රථත් වුවමනා නැහැ. අපට ටොන් හතරේ "ඊ" වර්ගයේ බස් රථ දෙන්න. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත් මා කියන දෙය ඒකඡන්දයෙන් පිළිගන්නවා ඇති. අපේ කුඩා ගම්වලට ටොන් හතරේ බස් රථ ටිකක් සපයනවා නම් මේ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවනි. එසේ කළොත් ගරු ඇමතිතුමා මහජන ප්‍රශංසාවට ලක් වෙනවා පමණක් නොවෙයි පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන්ටත් විශාල ප්‍රයෝජනයක් අත් වන බව මා මතක් කරන්නට සතුටුයි.

ගරු ඇමතිතුමනි, මා බොහොම වෙහෙස මහන්සි වී තමුන්නාන්සේට ලියුමක් ලිව්වා. මට දුන්නේ ආසන කීපයකින් කෑලි කඩා හැදූ අළුත් ආසනයක්, යටියන්තොට ආසනයෙනුත්, කෑගල්ල ආසනයෙනුත්, දැදිගම ආසනයෙනුත් කෑල්ල කෑල්ල කඩාගෙන ගලිගමුවය කියා අළුත් ආසනයක් හදා මට දුන්නා. මා හතර අවුරුදු හය මාසයක් තිස්සේ බොහොම මහන්සි වෙලා, කිරිදෙනිය සිට බුලත්කොහුපිටිය දක්වා පාරය කියා ආසනය දිගටම යන්නට පුළුවන් පාරක් හදා ගත්තා. මේ පාරට බස් රථයක් ඉල්ලුවා. බුලත් කොහුපිටියේ සිට කොටියා කුඹුරටයි. ඒ බස් එක ඉල්ලුවේ. රුවන්වැල්ල, යටියන්තොට, වලාවෙල, බුලත්කොහුපිටිය, කෑගල්ල යන මාර්ගයෙන් යනවට වඩා කෙටියෙන් හැතැප්ම 12 කින් මේ පාරෙන් යන්න පුළුවන්. බස් සේවය දික් කරන්නෙත් නැත, අළුත් බස් දමන්නෙත් නැත කියා අප තීරණයක් ගෙන තිබෙනවායයි තමුන්නාන්සේ මට ලිපියක් එවා තිබුණා. ඒක තාවකාලික තීරණයක්ලු. එය තාවකාලික එකක් වීම ගැන අප සතුටුවෙනවා. මැති වරණය පැමිණෙන්න පෙර කෙසේ නමුත් මගේ ඉල්ලීම ඉටු කර දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේ අපේ ගලිගමුව ආසනයට බස් දෙක තුනක් එව්වා. කෑගල්ල රෝහලට යන්න රෝහල් සේවය කියා බස් සේවයක් ඇති කළා. එසින් දුප්පත් ලෙඩුන්ට විශාල සේවයක් සිදු වුණා. එසේම තමුන්නාන්සේ මට දුන් ලියුම ඉල්ලා අස් කරගෙන මේ පාරටත් "ඊ" වර්ගයේ කුඩා බස් රථයක් සපයන ලෙස මා ඉල්ලා සිටිනවා.

කොළඹ සිට නුවරට යන තෙක් තදබදයක් තිබෙන එකම නගරය මොකක්ද කියා කාගෙන් ඇහුවත් කෑගල්ලය කියයි. කෑගල්ලට අද බස් නැවතුම් පොළක් නැහැ. නගර සභාව ඉඩම දෙන්න බැරිය කියනවාය කියා දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවට එන ප්‍රධාන ධාවන කළමනාකාර සේරම් මහත්මයා කියනවා. එහෙත් ඇමතිවරයකු හැටියට තමුන්නාන්සේට පුළුවන්කම තියෙන්න ඕනෑ, පළාත් පාලන ආයතනයට බය වන්නේ නැතිව, කෑගල්ලේ නගර සභාවේ සභාපතිවරයාට යට වෙන්නෙ නැතිව, අවශ්‍ය නීතිරීති ඇති කර කෑගල්ල ප්‍රදේශයේ ලක්ෂ ගණන් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ඒ කට යුක්ත කිරීමට. තමුන්නාන්සේ එසේ කළොත් තමුන්නාන්සේගේ නම කෑගල්ල ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙනවාට කිසිම සැකයක් නැත.

බස්වල සේවය කරන අපේ සේවක පක්ෂය ගැනත් අවසාන වශයෙන් වචනයක් කියන්නට ඕනෑ. ඒ සේවක පිරිසට අපේ සහයෝගය ලැබෙනවාද නැද්ද යන්න ගැන සමහරුන්ට සැකයක් තියෙනවා. ඒ සඳහා අවස්ථාවක් ලැබෙන්නට ඕනෑ. ඉංග්‍රීසියෙන් කියනවා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හිමලා කන්නන්ගර මිය.]

"A friend in need is a friend indeed" කියා. පසුගිය වර්ෂයේදී කෑගල්ල ඩිපෝවේදී බස් කම්කරු වැඩ වර්ජනයක් ඇති වුණා. බස් රියැදුරුවරුනුත්, කොන්දොස්තර මහත්වරුනුත්, අනික් සේවකයනුත් එයට සහභාගි වුණා. පොලිසියත්, බස් රියැදුරකුත් අතර ඇති වූ ඝට්ඨනයක් නිසයි, ඒ වැඩ වර්ජනය ඇති වුණේ විරුඬ පාර්ශ්වයේ ආසනයක් වූ කෑගල්ලේ මන්ත්‍රීතුමා (කළුගල්ල මයා.) යෝධයකු වීගේ ඉදිරිපත් වේලා වැඩ වර්ජනය කර පල්ලා, අපි ඒ ගැන බලාගන්නම් කිව්වා. තවත් අයත් එහෙම උල්පන්දම් දුන්නා. ඒ අනුව මේ උදවියත් වැඩ වර්ජනය කළා. එයින් අපට බස් සේවය නැති වී ගියා. මේ ආරංචිය ලැබෙන විට මා ඇමති කාර්යාලයේ වැඩ කරමින් සිටියා. ආරංචිය ලැබුණු වහාම මා වැඩ වර්ජනය කර සිටි නිලධාරීන් ළඟට ගිහින් රිස්වීමක් පවත්වා තමුන්නාන්සේලාගේ දුක් ගැනවිල්ලට සිදු වී තිබෙන්නේ කුමක්ද කියා ඇහුවා. කම්කරු නායකයන්ගේ නම් කීපයක් සඳහන් කර ඔවුන් කිව්වා, අප මේ කම්කරු නායකයන්ට ටෙලිෆෝම් ගැහුවාය, එනවාය කියා ටෙලිෆෝම් එවා තිබෙනවාය, නවමත් ආවේ නැත, අපට වැඩ වර්ජනය කරන්න කිව්වාය, දැන් අපව දාලා පැනලා ගිහින්ය කියා. කණගාටු වන්න එපා, තමුන්නාන්සේලාට මගෙන් ලැබිය යුතු උදව්ව කුමක්ද කියන්නයැයි මා කීවා. අපට අයුක්තිය කළ තැනැත්තා මෙහෙන් මාරු කරවන්නය කියා ඔවුන් ඉල්ලා සිටියා. මා එය එකහෙලාම ඉටු කරනවාය කියා කම්කරු මහතුන්ගේ පැත්ත ගෙන අගමැතිතුමාට ඒ කාරණය ඉදිරිපත් කළ සැණෙකින් වැඩ වර්ජනය නතර වුණා.

අ. භා. 6.45

සේවක පිරිසට අයුක්තියක් සිදු වූ විට අපේ සහයෝගය සියයට සියයක් දෙන බවත්, අප ඒ මහතුන් සමඟ බවත් ප්‍රකාශ කරන්නට සතුටුයි. ඒ මහතුන් අපට දෙන සහයෝගය ගැනත් අප ස්තුතිවන්ත වෙනවා. අපේ ඇමතිතුමාටත්, උප ඇමතිතුමාටත් ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමාත්, කළමනාකාරතුමාත් ඇතුළු උසස් නිලධාරී මහතුන්ගෙන් සිදු වන සේවය අගය කරමින් ඒ මහතුන්වත් අප ස්තුති කරනවා. අනාගතයේදී, දේශපාලන පක්ෂ භේද පැත්තකට දමා සෑම දෙනකුටම රක්ෂාවට, ආරෝග්‍යශාලාවට, වෙනත් වුවමනාවලට යාමට පහසුවන අන්දමේ හොඳ ගමනාගමන සේවයක් ඇති කරන්නට කාගේත් සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

அக்கிராசனவர்களே, தேசியமயச் சேவைகள் அமைச்சர் ஒரு வில்லங்கமான சேவையை மிகக் கஷ்டத்தோடும் துணிவோடும் ஓரளவு திருப்தியாக நடாத்துகிறார் என்று நாம் கூறலாம். இலங்கைப் போக்குவரத்துச் சபையின் பஸ் சேவையை நடாத்துவது ஒரு சாதாரணமான விடயமன்று. ஆயிரக்கணக்கான மக்களை நாள்தோறும் ஏற்றிச்சென்று, அவர்களுக்கு வசதியான போக்குவரத்து வசதிகளை அமைத்துக் கொடுப்பதில் அமைச்சர் மிகவும் சிரத்தை யெடுத்து வருகிறார். அதற்குப் பல காரணங்கள் உண்டு. அவருடைய உத்தியோகத்தர்களில் பலர் மிகவும் சிறந்தவர்களாகவும், மிகவும் அனுபவம் வாய்ந்தவர்களாகவும், தங்களுடைய கடமையைத் திறமையாகச் செய்யக் கூடியவர்களாகவும் இருப்பது அதற்கு ஒரு முக்கிய காரணமாக இருக்கிறது. இலங்கைப் போக்குவரத்துச் சபையின் தலைவர் அறிவும் ஆற்றலும் படைத்தவர் மாத்திரமன்றி, அவர் இந்த பஸ் சேவையின் நுணுக்கங்களையும் நன்கு அறிந்தவரென்றும் கூறலாம். அது போன்று இந்தச் சபையின் பொதுமுகாமையாளரும் மிகவும் அனுபவமும் அறிவும் வாய்ந்தவரென்று கூறலாம். அதைப்போலவே தலைமைக் காரியாலயத்திலுள்ள பல உயர்தர உத்தியோகத்தர்களும் தங்களுடைய கடமைகளைச் சிந்தனையோடும், கவனத்தோடும் செய்து வருகிறார்கள். ஆனால் இதே நிலை மாவட்டங்களிலோ அல்லது மாகாணங்களிலோ உள்ள கிளை ஸ்தாபனங்களில் இல்லை என்பதை நான் கூறுவது மிக அவசியமானதாகும்.

மாவட்டங்களிலுள்ள இ. போ. ச. கிளை ஸ்தாபனங்களில் இருக்கும் உத்தியோகத்தர்கள், தலைமைக் காரியாலயத்திலிருக்கின்ற உத்தியோகத்தர்களைப் போன்று பொறுப்பும், கவனமும், சேவையின் நலனைக் கருதி உழைக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கும் தன்மையுமில்லாதவர்களாக, இருக்கிறார் கள். ஆகவே அமைச்சரவர்களும், சபைத் தலைவரவர்களும், பொது முகாமையாளரும் தங்களுடைய கண்காணிப்பையும் கவனத்தை யும் மாட்டங்கள் மீது செலுத்தவேண்டு மென்று நான் மிகவும் பணிவுடன் கேட்டுக் கொள்ளுகிறேன்.

நம் மக்களுடைய போக்குவரத்தை, பிரயா ணத்தை, எடுத்துப் பார்த்தால் மக்கள் ஐந்து வருடங்களுக்கு முன்பு பிரயாணம் செய்த தைப் பார்க்கிலும் இன்று அதிகமான அளவில் பிரயாணம் செய்கிறார்கள். போக்குவரத்துச் சேவைகளான பஸ்சேவை, புகையிரதச் சேவை ஆதியன இன்று போக்குவரத்துச் செய்கின்ற மக்களை துரிதமாகவும் கவனமாக வும் ஆரோக்கிய வசதியுடனும் கொண்டு செல் லக்கூடியனவாக அல்லது அதற்குத் தேவை யான போதிய சாதனங்களை உடையனவாக இல்லாதிருப்பதை நாம் காண்கிறோம். புகை யிரதத்தில் பிரயாணம் செய்தால், புகையிரதப் பெட்டிகளெல்லாம் பிரயாணிகளால் நிரம்பி யிருப்பதையும் மக்கள் மிக நெருக்கத்தோடு பிரயாணம் செய்வதையும் காண்கிறோம். பஸ் சேவையைப் பார்த்தால், அநேக மக்கள் பிர யாணஞ் செய்கின்ற காரணத்தால் பஸ்களுக் குள் மக்கள் மிக நெருக்கமாக இருந்து பிர யாணம் செய்வதைக் காண்கிறோம். இந்த நிலை யைச் சீர்ப்படுத்துவதற்கு கௌரவ அமைச் சர் இதுவரை என்ன நடவடிக்கையை எடுத் தார் என்பதை ஆராய்ந்து பார்க்கும்பொழுது மக்கள் பிரயாணம் கூடியிருக்கும் அளவுக்கு பஸ்வண்டிகளின் தொகை கூடவில்லை என்பது புலனாகும். இதற்குப் பல காரணங்களை அவர் கள் கூறக்கூடும். வெளிநாட்டுச் செலாவணி இல்லாத காரணத்தினால் புதிய பஸ் வண்டி களை வாங்குவதில் தாமதமேற்பட்டிருக்கிறது என்று கூறலாம். ஆனால் பொதுவாக போக்கு வரத்துச் சேவையைப் பார்த்தால் பிரயாணி களின் தொகைக்கு ஏற்ற அளவுக்கு பஸ்வண்டி கள் இல்லை என்பதை நாம் மிகவும் இலகு வாகக் காணக்கூடியதாக இருக்கிறது. இந்த நிலையை மாற்றியமைப்பதுதான் கௌரவ அமைச்சரின் முக்கிய கடமையாக இருக்க வேண்டும் என்பதை குறிப்பிட விரும்புகி றேன்.

சென்ற பல ஆண்டுகளில் இலங்கைக்கு வர வழைத்த பஸ்வண்டிகளை எடுத்துப் பார்த்தால் அவற்றில் புதிய பஸ் வண்டிகளின் தொகை மிகவும் குறைவாக இருப்பதை அவதானிக்க லாம். இங்கிலாந்திலே உபயோகிக்கப்பட்டு பிர யோசனமற்றவை எனக் கழிக்கப்பட்ட பஸ் வண்டிகளைத்தான் இங்கே வரவழைத்து மீண் டும் புதுப்பித்து ஓட விடுகிறோம். அந்த பஸ் வண்டிகள் தக்க கவனமும், போதிய பாவனை யும் இல்லாத காரணத்தினாலும் அவற்றி னுடைய பழுதுகளை உடனுக்குடன் பார்த்துத் திருத்தாத காரணத்தினாலும் அவை ஓடும் பொழுது வழியில் நிற்பதும், அவற்றினுடைய இயந்திரங்கள் பழுதடைவதும், மிகவும் விரை வில் பிரயோசனமற்றுப் போவதுமான நிலை மையைக் காண்கிறோம். இதனாலேதான் இன்று பொது மக்களுக்கும் இலங்கைப் போக்கு வரத்துச் சபைக்குமிடையில் தகராறுகள் ஏற் படுகின்றன. பொது மக்கள் உல்லாசமாக, சௌகரியமாக பிரயாணம் செய்யக்கூடிய பஸ் வண்டிகள் காலத்துக்குக் காலம் பழுதடைந்து பிரயாணத்தில் தாமதமேற்படுவதை தவிர்க் கும் நிலை இல்லாமலிருக்கும் காரணத்தி னாலேயே பொது மக்கள் இலங்கைப் போக்கு வரத்துச் சபையை அடிக்கடி கண்டிக்கிறார் கள். இந்த நிலையைச் சீர்திருத்த வேண்டியது கௌரவ அமைச்சருடைய முதற் கடமை யாகும்.

நல்லதோர் பஸ் சேவையை நடத்துவதற்கு நல்ல பஸ்களும் நல்ல சாரதிகளும் இருந்தால் மாத்திரம் போதாது. பஸ்கள் ஓடுவதற்கு நல்ல பாதைகளும் வேண்டும். நல்ல பாதை கள் இல்லாத பகுதிகளிலே நல்ல பஸ் சேவையை நடாத்துவது அசாத்தியமாகும். புதிய பஸ்களைக் கூட பழுதான ரோட்டுக்க ளிலே ஓட விட்டால் அவை மிக விரைவில் பழுதடையும் என்று கூறத் தேவையில்லை. நாட்டிலுள்ள பாதைகள் திருத்தமின்றி இருக்கும் காரணத்தினாலும் நல்ல பஸ் சேவையை நடத்த முடியாமலிருக்கிறது. கௌரவ தேசிய மய சேவைகள் அமைச்சர் எவ்வளவு நடவடிக்கை எடுத்தாலும் பொது மராமத்து அமைச்சரவர்களுடைய இலாகா பாதைகளை நல்ல முறையில் வைத்திருக்கா விட்டால் நல்ல சேவையை நடாத்துவது அசாத்தியம். நல்ல பஸ் சேவையை நடத்து வதற்கு மராமத்து இலாகாவின் பங்கும் அதிகமாக வேண்டப்படுகிறது என்று கூறி வைக்க விரும்புகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavahanam.org

[රාජමානික්කම් මයා.]

கிராமப் பகுதிகளிலிருந்து வரும் என்னைப் போன்ற பிரதிநிதிகளுடைய நிலைமையை நான் கௌரவ அமைச்சருக்கு விளக்கிக் கூற விரும்புகிறேன். இன்று காலை நான் பேசும் பொழுது ஒரு விஷயத்தைக் கௌரவ சுகாதார அமைச்சருடைய கவனத்துக்கு கொண்டு வந்தேன். நகரங்கள் அணுயுக ரொக்கட் வேகத்தில் முன்னேறிக் கொண்டு போகும் நேரத்தில் கிராமங்கள் மாட்டு வண்டி வேகத்தில் முன்னேறிக் கொண்டிருக்கும் நிலையை நான் எடுத்துக் கூறினேன். நகரங்களும் நகரங்களுக்கு அண்மையிலுள்ள இடங்களும் எவ்வாறு முன்னேற்றம் அடைந்திருக்கின்றனவோ, அவற்றில் அரசாங்கம் எவ்வாறு கவனம் செலுத்துகின்றதோ அவ்வாறே கிராமங்களின் முன்னேற்றத்திலும் அரசாங்கம் கவனம் செலுத்த வேண்டும். கிராம மக்கள் பண்டைக்காலத்தில் தங்கள் கிராமங்களை விட்டு வெளியேறுதிருந்த நிலைமை போய் இன்று தங்கள் கருமங்களைச் செய்ய அனேகமாக நகரங்களை நோக்கி வரவேண்டிய காலமாக இருக்கின்றது. ஆகவே, இன்று பஸ் சேவை மூலம் கிராமப்புறங்களை இணைக்க வேண்டும். அப்படி இணைக்காவிட்டால் கிராமிய மக்கள் முன்னேற்றத்தின் ஒரு பகுதியை அனுபவிக்க முடியாது மிகவும் கஷ்டப்பட்டுக்கொண்டிருப்பார்கள்.

அனேகமாக, காடுகளை வெட்டி, நிலங்களைத் திறந்து குடியேற்றக் கிராமங்களை நாடு முழுவதும் ஏற்படுத்தியிருக்கும் அரசாங்கம் அந்தப் பகுதிகளில் குடியேற்றப்பட்ட ஆயிரக்கணக்கான மக்களுக்கு இன்னும் பிரயாண வசதிகள் அளிக்கவில்லையென்றால் எவ்வாறு அவர்கள் தங்கள் வாழ்க்கையை நடாத்த முடியும், எவ்வாறு விவசாயத்தைச் செய்ய முடியும், எவ்வாறு பொருளாதாரத் துறையில் முன்னேற முடியும் என்று கேட்க விரும்புகிறேன். குறிப்பாக, கல்லோயாப் பிரதேசத்தை எடுத்துப் பார்க்கும் பொழுது, இடதுகரை வாய்க்கால் பிரதேசமாயிருந்தாலென்ன, வலதுகரை வாய்க்கால் பிரதேசமாயிருந்தாலென்ன. அந்தப் பகுதிகளில் நல்ல பாதைகளை அமைத்து, போக்குவரத்து வசதியை ஏற்படுத்தாத காரணத்தினால் இன்று மக்கள் கஷ்டப்படுகிறார்கள். எனது தொகுதியைப் போன்ற பல பின்னடைந்த கிராமங்களைக் கொண்ட தொகுதிகள் இந்நாட்டிலே இருக்கின்றன. அரசாங்கமும் அமைச்சரும் இலங்கைப் போக்குவரத்து சபையும் முதலா வதாகக் கவனம் செலுத்த வேண்டியது, கிராமப் புறங்களில் பஸ் சேவையைத் திறந்து வைப்பதில்தான் என்பதை நான் வலியுறுத்த வேண்டும். எனக்கு முன் பேசிய பிரதிநிதிகள் கிராமப் புறங்களுக்கு பஸ் சேவையை ஏற்படுத்துவது பற்றிப் பேசினார்கள். பெரிய பஸ்கள் நல்ல 'ரோட்டு'க்களில் ஓடிக்கொண்டிருந்தால் சிறிய பஸ்களை—Hardy Vehicles போன்ற சிறிய பஸ்களை—கிராமப் புறப் பாதைகளில் ஓடக்கூடிய வழியை ஏற்படுத்த வேண்டும். அவ்விதம் செய்யாவிட்டால் போக்குவரத்துச் சேவையின் வசதியை நீங்கள் கிராமிய மக்களுக்கு, விவசாயத்தில் ஈடுபட்டிருக்கும் மக்களுக்கு கொடுத்ததாக இருக்காது என்பதை உணர வேண்டும். ஆகவே, கிராமப் புறங்களில் பஸ் சேவையை ஏற்படுத்த, சிறிய பஸ்களை வாங்கி அவைகளை கிராமிய மக்கள் பாவிக்கக்கூடியதாகச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

ஏ. ஹ. 7

அடுத்ததாக, பஸ் ஊழியர்களைப் பற்றி ஒரு சில வார்த்தைகள் நான் கூறவேண்டும். பஸ் ஊழியர்களில் அனேகமாக தங்கள் சேவையைத் திறன்படச் செய்யக்கூடிய ஒரு பகுதியினர் இருக்கிறார்கள். அனேகமானோர் பொறுப்புத் தன்மையில்லாத வகையில் சேவைகளைச் செய்வதையும் நாம் காணக்கூடியதாக இருக்கின்றது. பஸ் சாரதிகள் கண்டக்டர்கள் முக்கியமாகப் பிரயாணிகளோடு மிகவும் அந்நியோன்யமான முறையில் நடந்துகொள்ளக்கூடிய முறை அதிகமாக இல்லையென்பதைப் பல பிரயாணிகள் கவனித்து வருகிறார்கள். இதற்குப் பல காரணங்கள் இருக்கலாம். பஸ் சாரதிகள் அளவுக்கு மேலான நேரத்துக்கு வேலைசெய்யவேண்டிய நிலை இலங்கைப் போக்குவரத்துச் சபையில் இருக்கும் காரணத்தால் களைப்பாலோ, அல்லது மேலதிகமாக வேலை செய்ய முடியாமையாலோ அவர்கள் அனேக பிழைகளை விடும் நிலையிலிருக்கிறார்கள். ஆகவே, எட்டு மணித்தியால வேலை செய்யக்கூடிய ஊழியர்களை நியமித்து, அல்லது அதற்குக் குறைய வேலை செய்யக்கூடிய ஊழியர்களை நியமித்து இரண்டு "Shift" ஆக வேலை செய்யக்கூடியதாக—

ගරු සුගතදාස
(கௌரவ சுகததாச)
(The Hon. Sugathadasa)

இரண்டு முறை வேலைசெய்யக் கூடியதாக—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

இரண்டு "முறை"களுக்கும் போதிய ஊழியர்களை இலங்கைப் போக்குவரத்துச் சபை நியமிக்க கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்கவேண்டும். அப்படி இரண்டு முறைவேலை செய்வதற்கு வெவ்வேறு ஆட்களை நியமிக்க முடியுமானால் ஓரளவு வேலையில்லாத் திண்டாட்டத்தையும் குறைக்க முடியும். கூடுதலாக பஸ் சாரதிகளையும் கொண்டக்டர்களையும் நியமிக்க கூடிய ஒரு நிலை ஏற்படும். இப்பொழுதுள்ள ஊழியர்களுக்கு மேலதிக நேரச்சம்பளம் கொடுக்கும் நிலையும் ஏற்படாது. படித்துவிட்டு வேலையில்லாமல் இருப்பவர்களுக்கு இதனால் வேலைகொடுக்கக்கூடிய ஒரு நிலையும் வரும். அடுத்த நிதி வருடத்திலிருந்து எங்களுடைய கிராமப் பகுதிகளுக்குப் புதிய பஸ் சேவைகளை ஆரம்பித்து வைக்கவேண்டுமென்று நான் அமைச்சரவர்களைக் கேட்டுக் கொள்ளுகிறேன். இலங்கைப் போக்குவரத்துச் சபையிடமிருந்தும் கௌரவ அமைச்சர் அவர்களிடமிருந்தும் அடுத்த நிதி வருடத்தில் நல்லதிறமையான பஸ்சேவையை மக்களும் நாமும் எதிர்பார்க்கிறோமென்று கூறி எனது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

අ. භා. 7.03

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. ඉවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

Whereupon Mr. Speaker *left the Chair, and* Mr. Deputy Speaker [Mr. M. Sivasithamparam] *took the chair.*

රාජා වෙල්ගම මයා. (மொனராகலை)
(திரு. ராஜா வெலேகம—மொனராகலை)
(Mr. Raja Welegama—Moneragala)

ගරු සභාපතිතුමනි, ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන පළමුකොටම තමුන්නාන්සේට මගේ ස්තුතිය පුද කරනවා. පැය එකහමාරක් පමණ වේලා මෙම අමාත්‍යාංශය පිළිබඳව කෙරුණු සැහෙන විවේචන රාශියකට අප කන් දී සිටියා. ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ලංකා ගමනාගමන මණ්ඩලය ඉතාම සාධාරණ ලෙස පවත්වාගෙන යන, පක්ෂපාතිත්වයෙන් තොර, ආයතනයක් හැටියට හඳුන්වා දෙන්නට උත්සාහ කිරීම ගැන මා ඉතා කනගාටු වෙනවා. මෙම රජයේ අමාත්‍යාංශ දෙස බලන විට දේශපාලන වාසිය තකා පක්ෂග්‍රාහීව ක්‍රියා කරන අමාත්‍යාංශ අතුරින් ප්‍රමුඛස්ථානය ගන්නේ ජනසතු සේවා අමාත්‍යාංශය බවයි මට නිර්භයව කියන්නට තිබෙන්නේ. මේ රටේ පවත්වාගෙන යන බස් සේවාව පිළිබඳව ඉතා කනගාටු දායක තොරතුරු අපට දැනගන්නට ලැබී තිබෙනවා. පසුගිය කාලසීමාවේදී ලංකාවේ බස් ව්‍යාපාරය තරම් විවේචනයට භාජනවුණු තවත් ජනසතු සේවා අංශයක් නිබුණේ නැති බව කියන්නට පුළුවනි. ඒ නිසා ම වියහැකියි, හොඳ සීපෝව තේරීමේ තරඟය වැනි දේ ඇතිකොට මහජනතාවගේ සිත් සතුටු කිරීමේ යම් යම් උපක්‍රම පවා කරන්නට ලංගමයට සිදු වූයේ. එහෙත් කළේ ලොකු ප්‍රෝඩාවක්. එවැනි නොයෙකුත් උපක්‍රම යොදා යටකී ආන්දෝලනයෙන් මිදීම පිණිස කටයුතු කළ බව අප දන්නවා.

සුගතදාස ක්‍රමය කියා එකක් ඇති කළා. ඒ හේතුකොට ගෙන ලංකාවේ බස් සේවාව තිබුණාටත් වඩා අන්ත තත්ත්වයට වැටුණු බව කිව යුතුයි. එහෙත් අපේ කනගාටුව නම් එතුමන්ලා ලංකා ගමනාගමන මණ්ඩලයේ අඩුපාඩු තිබෙන බව පිළිගන්නට ලැස්ති නැති එකයි. මේ රටේ බස් රථ 3,000 ක් පමණ ධාවනය කෙරෙනවාලු. සේවකයන් 54,000 ක් පමණ සිටිනවාලු. ඒ අනුව එක බස් රථයක් සඳහා සේවකයන් 18ක් පමණ සිටින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

බව පෙනෙනවා. මා සිතන හැටියට බස් සේවාවෙන් මෙතරම් පාඩු සිදු වන්නට ප්‍රධාන හේතුව තමයි එය. මට පෙනෙන හැටියට එක බස් රථයක සේවය සඳහා 18 ක් සිටිනවා නම් ඒ 18 දෙනා යොදවා එම බස් රථය තල්ලු කරගෙන යන්නට වුවත් පුළුවනි. එවිට ඩීසල්, පෙට්‍රල් යනාදිය පාවිච්චි කරන්නට වුවමනා වන්නේත් නැහැ. ඒ අනුව මහජනතාව ලවා තල්ලු කරවාගෙන යන බස් සේවයක් වශයෙන් මෙම බස් සේවය ක්‍රියාත්මක කරන්නට පුළුවනි. මේක මහ විහිළුවක්. මෙසේ සේවකයන් ගණන වැඩි වී තිබෙන්නේ ඇයි? තමන්ගේ පක්ෂයට ගැතිකම් කළ අයට පස්සා දොරෙන් රැකිරක්ෂා දීමේ ප්‍රතිපත්තිය නිසායි. බස් සේවකයන් පත් කිරීම පිළිබඳව කෙරෙන දූෂණකම් කීපයක් ගැන අපේ අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) කරුණු ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ඒ කරුණු ගැන මා සියයට සියයක්ම එකඟ වෙනවා. 1965න් පෙර ප්‍රතිපත්තියක් වශයෙන් සෑම මන්ත්‍රී කොට්ඨාශය කින්ම යම් ප්‍රමාණයක් සේවකයන් බඳවා ගන්නට කටයුතු යොදා තිබුණා. මා සිතන හැටියට සෑම මන්ත්‍රී කොට්ඨාශය කින්ම එක හා සමාන සේවක සංඛ්‍යාවක් තමයි එදා ඒ අනුව බඳවා ගත්තේ. ඒ ක්‍රමයත් ක්‍රියාවේ යෙදුවේ ලොතරැයි ක්‍රමයකට අනුවයි. එහෙත් පසුගිය අවුරුදු හතර හමාර තුළ විරුද්ධ පාර්ශ්වයේ ආසනයකට පස් දෙනා බැගින්වත් වැටෙන්නට හැකි වන පරිදි මෙම සේවකයන් බඳවාගෙන තිබෙනවා. යැයි මා සිතන්නේ නැහැ. යම් හෙයකින් අරගෙන තිබෙනවා නම් එසේ කර ඇත්තේ පරාජිත අපේක්ෂකයන්ගේ ලියුම් උඩයි. නැතිනම් අල්ලපු ආසනයේ සිටින එම පක්ෂයට අයත් මන්ත්‍රීවරයකු ගෙන් හෝ ලබා ගත් ලියමනක් උඩයි. ඒ හැරෙන්නට සාධාරණ ක්‍රමයක් උඩ නොවෙයි එම සේවකයන් බඳවා ගැනීම කෙරී තිබෙන්නේ. මා එය නිර්භයවම ප්‍රකාශ කරනවා.

මීට ප්‍රථම කථා කළ බිබිලේ ගරු මන්ත්‍රීතුමා (ධර්මදාස බණ්ඩා මයා.) කිව්වා බිබිලේ ලංගම ඩිපෝවක් ආරම්භ කරන්නට යන බව. මොණරාගල දිස්ත්‍රික්කයට ලංගම ඩිපෝවක තිබෙන අවශ්‍යතාවය ගැන කියන්නේ අද ඊයේ පටන් නොවෙයි. බස් සේවාව ජනසතු සේවාවක් වශයෙන් පවත්වා ගෙන යන්නට පටන් ගත් කාලයේ ඉඳලායි. සාධාරණත්වය අනුව හෝ සේවාව අනුව හෝ කල්පනා කරනවා නම් ලංගම ඩිපෝවක් පිහිටුවිය යුත්තේ මොණරාගලයි. ලංකාවේ ප්‍රධාන මාර්ග කීපයක් සම්බන්ධ වන මධ්‍යස්ථානයක් හැටියට මොණරාගල නගරය නම් කරන්නට පුළුවනි. මාතර-අම්පාරේ බස් මොණරාගල පසුකර යන බව අප දන්නවා. ඒ වාගේම පොතුවිල් පැත්තෙන් එන බස්, අම්පාරේ පැත්තෙන් එන බස්, බදුල්ල සහ බණ්ඩාරවෙල පැත්තෙන් එන බස් යනාදී බස් සේවාවන් ගණනාවක්ම මොණරාගල පසුකර යන බව අප දන්නවා. මේ අනුව ප්‍රධාන මාර්ග කීපයකම මධ්‍යස්ථානයක් හැටියට මොණරාගල සලකන්නට පුළුවනි. එසේම සති අන්තවල දී අතිරේක වශයෙන් ධාවනය කරනු ලබන විශේෂ සිඝ්‍රගාමී බස් සේවාවන් පිළිබඳව සලකා බලන විටත් මට කියන්නට තිබෙන්නේ ලංකාවේ නොයෙකුත් පළාත්වලින් පැමිණෙන බස් විශාල සංඛ්‍යාවක් එක් එක් ප්‍රදේශවලට බෙදී යන මධ්‍යස්ථානයක් හැටියට මොණරාගල සැලකිය හැකි බවයි. මධ්‍යස්ථානය වශයෙන් සැලකිය යුත්තේ මොණරාගල හෙයින් එහි මේ බස් ඩිපෝව පිහිටුවිය යුතුයි. එහෙත් එය බිබිලේ කොට්ඨාශයේ පිහිටුවන්නට යනවා. මා ඒ ගැන සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මා විරුද්ධ වන්නේ එය මගේ කොට්ඨාශයේ නොපිහිටුවා බිබිලේ කොට්ඨාශයේ පිහිටුවීම ගැන යයි හිතන්නට එපා. ලංගම ප්‍රධාන කාර්යාලය බිබිලේ පිහිටෙව්වත් මට කමක් නැහැ. ජනසතු සේවා අමාත්‍යාංශයේ කාර්යාලය එහාට ගෙන ගියත් මට කමක් නෑ. ඇමතිතුමා ඒ කොට්ඨාශයේ පදිංචි වුණත් මට කමක් නැහැ. එහෙත් එකක් කිව යුතුයි. මහජනයාගේ මුදල් වියදම් කර කිසියම් පොදු කටයුත්තක් කරන විට එය සාධාරණ අන්දමට කළ යුතුයි. ලංගම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යක්ෂ මණ්ඩලයේ, ලංගම සාමාන්‍යාධිකාරී ඇතුළු ලොක්කන්ගේ දැවැදිවලට ලැබුණු බූදලය යොදා නොවෙයි, මේ කටයුතු කරන්නේ. ඒ නිසා සාධාරණ අන්දමට කටයුතු කළ යුතු බවට මා ලංගම ලොක්කන්ටත් ගරු ඇමතිතුමාටත් අවවාදයක් කරන්නට කැමතියි.

ඊළඟට බස් ගාල් ඇති කිරීම ගැනත් මතක් කරන්නට ඕනෑ. මා නියෝජනය කරන කොට්ඨාශයේ යම් යම් ස්ථානවල බස් ගාල් ඇති කළ යුතු බවට කාලයක් තිස්සේ ඉල්ලීම් ඉදිරිපත් කළා. එහෙත් තවම ඒ ඉල්ලීම්වල ප්‍රතිඵල ලැබී නැහැ. වැල්ලවාය, තණමල්විල, මොණරාගල යන ස්ථානවල බස් ගාල් ඇති කළ යුතු බවට පළාත් පාලන ආයතනවල මූලිකයන්, නියෝජිතයන් ඇතුළු උදවිය ඉල්ලා තිබෙනවා. එහෙත් මේ පිළිබඳව ඇති මතභේද නිසා මේ දක්වා ඒ බස් ගාල් පිහිටුවා නියම ආකාරයට මහජන සේවය සලසා නැහැ. විශේෂයෙන්ම ශීඝ්‍රගාමී බස් රථ සම්බන්ධයෙන් මේ බස් ගාල් අවශ්‍ය වෙනවා. එක නගරයක බස් නැවතුම් පොළවල් කීපයක් ඇති අතර එක ශීඝ්‍ර ගාමී බස් රියක් එක තැනක නවත්වන අතර තවත් ශීඝ්‍රගාමී බස් රියක් තවත් තැනක නවත්වනවා. මගීන් ඒ ගැන දන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට බස් රථවල නැග ගන්නට බැරි වෙනවා. මේ ප්‍රශ්නය විසඳිය හැක්කේ බස් ගාල් ඇති කිරීමෙනුයි. එක එක අයගේ ඇඟිලි ගැසීම් නිසා සාධාරණ සතුටුදායක ක්‍රමයක් ඇති කරන්නට ඉඩ ලැබෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මුදලාලිලා බස් නැවතුම් පොළවල් ඔවුන්ගේ කඩවල් ළඟට ගෙන යන්නට හදනවා. වෙළෙඳාම් වැඩි කර ගැනීම සඳහා ඒ උදවිය ඒ විධියට ක්‍රියා කරනවා. ගම්කාර්ය සභාපතිවරුන් සහ එම නියෝජිතයන් සාධාරණ ස්ථාන පෙන්නා දුන්නත්, සාධාරණ ක්‍රමයක් ඇති කරන්නැයි ඉල්ලා සිටියත් මොන ප්‍රෝඩාව හෝ යොදා ඒ සාධාරණය ඉෂ්ට වීම වළක්වන්නට සමහරුන් ක්‍රියා කරනවා. දේශපාලන වශයෙන් ඇඟිලි ගසනවා. පෙත්සම් එවනවා, මොකක් හෝ ප්‍රෝඩාවක් කරනවා. මේ තත්ත්වය නිසයි, මා නියෝජනය කරන කොට්ඨාශයේ නියම විධියේ බස් ගාල් කරන ස්ථානයක් ඇති කරන්නට අපහසු වී තිබෙන්නේ. මෙය, මුළු ලංකාව පුරාම බලපාන පොදු ප්‍රශ්නයක් හැටියටත් සලකන්නට පුළුවනි. විශේෂයෙන්ම තණමල්විල සහ වැල්ලවායේ මේ ප්‍රශ්නය තිබෙනවා.

බස් සේවා දියුණු කර තිබෙන බවත්, බස් සේවා වැඩි කර තිබෙන බවත් මට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. එහෙත් මා නියෝජනය කරන කොට්ඨාශයේ නම් 1964 න් පසුව එකම අලුත් බස් රථ සේවයක්වත් ඇති කර නැහැ. ලංකාවේ විශාලම මන්ත්‍රී කොට්ඨාශය මා නියෝජනය කරන කොට්ඨාශයයි. ඒ වාගේම එය ගමන් පහසුකම් නැති ප්‍රදේශයක්. අලුතෙන් පාරවල් සකස් කරගෙන යන ප්‍රදේශයක්. එහෙත් 1964 න් පසුව ඒ ප්‍රදේශයෙහි එකද අලුත් බස් රථ සේවයක් ඇති කර නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ අප මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාව මගින්ද, පළාත් පාලන ආයතන මගින්ද අලුත් බස් රථ සේවාවල අවශ්‍යතාව ගැන කියනු ලැබ ඇති අතර, මා මෙම ගරු සභාවේදීත් නොයෙක් අවස්ථාවල ඒ ගැන සඳහන් කර තිබෙනවා. මේ සම්බන්ධ උද්ඝෝෂණය වැඩි වන විට ලංගම නිලධාරීන් ඒ ප්‍රදේශයට ගොස් කරන්නේ පාරවල් හොඳ නැති බව කීමයි. මම නිදර්ශනයක් වශයෙන් ඔක්කම්පිටිය බස් සේවය ගැන කියන්නම්. දැන් ඒ ප්‍රදේශය ශීඝ්‍රයෙන් දියුණුව කරා ගමන් කරනවා. 1961, 1962 යන වර්ෂවල සිට ඒ ප්‍රදේශයේ මැණික් ඉල්ලම් පැදුණු නිසා විශාල ජනකායක් ඒ ප්‍රදේශයට යන්නට පටන් ගත්තා. අද, දිනපතා විශාල ජනකායක් ඒ ප්‍රදේශයේ ගමන් කරනවා. එහෙත් බස් රථ සේවයක් නැති නිසා පෞද්ගලික රථවාහනවලින් ගමන් කරන්නට ඒ ජනතාවට සිදු වී තිබෙනවා. ආරෝග්‍ය ශාලාවකට පැමිණීම සඳහා ඔක්කම්පිටියේ ජනතාවට සිදු වී තිබෙනවා මොණරාගලට හෝ බුත්තලට යන්නට. හැතැප්ම 12 ක් යන්න ඕනෑ. කුලී කාර්එකකට රුපියල් 25 ක් ගන්නවා. බස් රථයක් ධාවනය වෙනවා නම් සත ගණනායි වියදම් වන්නේ. ඒ නිසා මේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

කාරණය සම්බන්ධව විශේෂ උනන්දුවක් දක්වා කටයුතු කරගෙන ගිය අවස්ථාවේදී ලංගම නිලධාරීන් කීවා බස් සේවයක් ඇති කරන්නට පාර හොඳ නැහැ කියා.

වෙලගෙදර මයා.
(திரு. வெலகெதர)
(Mr. Welagedera)

දැන් පාර හදලාද?

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

ඔව්. පාර හදා අවුරුදු 2 ක් පමණ වෙනවා. උඩරට ගැම් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා හා දිසාපතිතුමා හමු වී, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ගිය අවස්ථාවේ එතුමාටත් කාරණය ඉදිරිපත් කර, විශේෂ උනන්දුවක් අර ගෙන පාර සකස් කළා. දැන් ලංගම කියනවා බස් නැහැ, බස් ආවාම දෙන්නම් කියා. බස් ලබා ගැනීමට පොරොත්තු ලේඛනයේ අවුරුදු ගණනක් හිටියා. අපට බස් ලැබෙන්නේ නැහැ. එහෙත් පසුගිය දිනවල හපුතලේට තරඟ කිරීමට බලාපොරොත්තුවෙන් සිටින රජයේ වැඩ ඇමතිතුමාගේ ඉල්ලීම පිට සතියක් ඇතුළත තේ වත්තකට යන්නට බස් රථයක් ලැබී තිබෙනවා. ඒකට අපි විරුද්ධ නැහැ. එහෙත් කාටත් සාධාරණය ඉටු වන්නට ඕනෑ. ඒ බස් රථය එළවන ඩ්‍රයිවර් මහත්වරු කියනවා බස් රථය එළවන්නේ බොහොම අමාරුවෙන් කියා. පාරේ ඇළි තිබෙනවාලු. බසයක් එළවන්න බොහොම අමාරුලු. [බාධාකිරීමක්] කොස්ලන්ද සිට පූනාගලට යන පාර. ඒ පාරේ කුලී කාර් එකක්වත් යන්නේ නැහැ, පාර නරකයි කියා. එහෙත් රජයේ වැඩ ඇමතිතුමාගේ වුවමනාව නිසා දේශපාලන වාසිය තකා බස් රථයක් ධාවනය කරනවා. තමුන්නාන්සේලා බොහොම ලොකුවට කථා කරනවා සාධාරණය සහ යුක්තිය ගැන. එහෙත් අපි යමක් කිව්වොත් එය හරියට බිරි අලින්ට වීණා ගායනා කරනවා වගෙයි.

ගරු සභාපතිතුමනි, දැනට ධාවනය කරන බස් සේවා ගැනත් කියන්නට ඕනෑ. අම්පාරේ සිට කොළඹට බස් සේවා වක් තිබෙනවා. දැන් බස්වල යන එකත් ඉතාම භයානකයි. පසුගිය කාලයේ දෝවේ මාරක අනතුරක් ඇති වුණා. ඒවා සිදු වන්නේ මොන හේතූන් නිසාද කියා පෙන්වා දෙන්නයි මා අදහස් කරන්නේ. අම්පාරේ සිට කොළඹට බස් එක එන්නට පැය 12 ක් පමණ ගත වෙනවා. ඊට පසුව පැය බාගයක්වත් විවේකයක් නැතිව ඩ්‍රයිවර් මාරු කර බස් රථය ආපසු අම්පාරේට පිටත් කරනවා. යකඩ තබා මොනවා වුණත් ගෙවෙන්නේ නැද්ද? අඩුපාඩු ඇති වන්නේ නැද්ද? ඔන්න ඔය විධියට කිසිම ක්‍රමානුකූලත්වයක් නැතිව අපරීක්ෂාකාරීව කටයුතු කරන නිසයි අනතුරු සිදු වන්නේ. කොළඹ බදුල්ල අතර සේවය වුණත් එහෙමයි. මේ කාරණය සම්බන්ධව පාර්ලිමේන්තු ලේකම්තුමා සමග කථා කළ අවස්ථාවේ එතුමා කාගෙන්දෝ ඇසුවාම ඔහු ඔය තත්ත්වය පිළිගත්තේ නැහැ. එහෙත් එවැනි තත්ත්වයක් නැද්ද කියා පරීක්ෂා කර බලන්නය කියා මා කියනවා. දෝවේ බස් අනතුර සම්බන්ධව වන්දි වශයෙන් ලක්ෂ 5 ක් දෙනවාය 10 ක් දෙනවාය කියා ලොකු ප්‍රචාරයක් තිබුණා. මගේ කොට්ඨාශයේ සිටිනවා ඒ අනතුරට භාජන වී කකුලක් කැඩුණු මුස්ලිම් කෙනෙක්. වන්දි සම්බන්ධව ලියුම් කීපයක්ම එව්වා. අද වන තුරුත් සතයක් වත් ලැබුණේ නැහැ. එසේ ප්‍රමාද වන්නේ ඇයි කියා මා ප්‍රශ්න කරනවා. ගෙවා තිබෙනවා නම් ඒ කාටද කියා දැනගන්නට කැමතියි.

මීට වඩා කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මට මේ අවස්ථාව දීම ගැන තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන
(අම්බලංගොඩ)
(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)
(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු සභාපතිතුමනි, මට කථා කරන්නට සිදු වී තිබෙන්නේ ඉතා කණගාටුවෙනුයි. ගරු ඇමතිතුමෙකුට බස් එකක් දී තිබෙනවා යයි මොණරාගල ගරු මන්ත්‍රීතුමා කී නිසා මගේ කණගාටුව තවත් වැඩි වෙනවා. මගේ කොට්ඨාශයට මා ඉල්ලුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකම බස් සේවාවක් පමණයි. එම පාර හැදුවේ උඩරට ගැමි කොමිසමෙන්වත් රජයෙන්වත් නොවෙයි. ඒ පළාත් වාසී මහ ජනතාව ඉතා උනන්දුවෙන් හා ඕනෑ කමින් තමන්ගේ ඉඩම්වලින් අඩි දෙක දෙක නොමිලේ දී ශ්‍රමදානයෙනුයි පාර පළල් කළේ. මා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට කන්නලව් කර බෝක්කු ටික සාදවා ගෙන තාර දම්මවා ගත්තේ ඕවර්සියර් වැඩෙත් කරලයි. ඉංජිනේරු මහත්වරුන් හමු වී අවශ්‍ය කරන පර්මිට් එකත් අරගෙන ලංගම සභාපතිතුමාට කන්නලව් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බස් එකක් දෙන්නට එතුමා බොහොම අමාරුවෙන් පොරොන්දු වුණා. අවුරුදු 3 ක් තිස්සේ මහන්සි ගන්නවා. සමහරවිට කියනවා, ඇමතිතුමන්ලා හතර පස් දෙනෙකුටත් දෙන්නට බැරි වුණා කියා. ඊට වඩා හාත්පසින්ම වෙනස් මගේ ප්‍රශ්නය. මේ වෙනස හොඳට මතක තබාගන්න. මම කථා කරන්නෙ බොහොම කනගාටුවෙන්. කේන්තියෙන්. මට මේ මන්ත්‍රිකම වුව මනා නැහැ. රජයක් වැඩ කරන්නෙ මෙහෙමද? බිබිලේ ගරු මන්ත්‍රීතුමාගේ (ධර්මදාස බණ්ඩා මයා.) කථාවෙන් කිය වුණා, එතුමාට බස් මාගී දෙකක් ලබා දුන්නාය, තවත් දෙකක් එතුමා බලා පොරොත්තු වෙනවාය කියා. මා කෑ නොගසන නිසාද මට මෙහෙම කරන්නේ, කියා මා අහනවා. මගේ දුප්පත් ජනතාව පාර වෙනුවෙන් ඔවුන්ගේ ඉඩම්වලින් අඩි දෙක බැගින් දුන්නා. ඒ වගේම ඒ පාර සකස් කිරීමට ශ්‍රමදාන කටයුතුවල යෙදුණා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මගින් එක පාරක බෝක්කු 27 කුත් අනික් පාරේ බෝක්කු 10 කුත් දමා දුන්නා. ඕවර්සියර්වරුන් හා ඉන්ජිනේරුවන් හමු වෙන්නට ගිහින් අවශ්‍ය බල පත්‍ර ආදිය මා ඔවුන්ට ලබා දුන්නා. ලංගම සභාපතිතුමාත් රජයේ නිලධාරීන්ගේ කාමරයේ සිටිනවා. එතුමාට කරුණු ඉදිරිපත් කළාසින් පසු මෙන්න මේ විධියේ ලිපියක් මට ලැබී තිබෙනවා. මා කියන්නෙ ඒ ලිපියේ අන්තිම කොටස විතරයි. මෙන්න ඒ කොටස:

"While I appreciate your anxiety to inaugurate this new service as early as possible, I have to ask you to please bear with me a little longer until I can provide a but for it. While I cannot promise that I can get a bus ready before 10th May, I shall certainly try my very best to do so. Failing this I assure you I will definitely give you a bus for this service before end of June."

ඒ ලියුමෙන් කියන්නේ 1969 ජූනි මාසයයි; 1970 ජූනි මාසය නොවෙයි. ලංගම සභාපතිතුමා ලිව්ව මේ ලියමන වාර්තා ගත වෙන්න ඕනෑ. මා එතුමාට දොස් කියනවා නොවෙයි. එතුමා මේ බස් සේවය ලබා දෙන්නට බොහොම මහන්සි ගත්තා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

බස් නැත්නම් මොකද කරන්නෙ?

වෛද්‍යාචාර්ය සද්ධාසේන
(வைத்திய கலாநிதி சத்தாசேன)
(Dr. Saddhasena)

ලංගම සේවය ගැන පත්‍රවලින් උද්ඝෝෂණයක් ඇති වුණු අවස්ථාවේදී සිදු වුණේ මොකක්ද? ක්‍රම සම්පාදක කෙහෙල්මල් අමාත්‍යාංශය වගේ අපේ ඇමති මණ්ඩලයත් හදිසි තීරණ ගන්නවා. හරියාකාර කරුණු සොයා බලා, මේක සිදු වුණේ කොහොමද, මේ මිනිසුන්ගේ මුහුණ බලන්නේ කොහොමද, කියා කල්පනා කරන්නෙ නැහැ. දුප්පතා වෙනුවෙන් පෙනී සිටින; දුප්පතා මුළා කරන්නට සිදු වුණු මහජන අපේක්ෂකයකු වශයෙන් මේ ලියමන ඒ උදවියට මා පෙන්වා බස් රථ දෙකක් අත්හදා බැලීමේ ගමන්—"ට්‍රයල් රන්ස්"—දෙකක් අරන් ගියා. එදා මිනිසුන් ප්‍රීතියෙන් රබන් එහෙමත් ගැහුවා, පොඩි ළමයි "අන්න බස් එක එනවා" කියමින් උඩ පැන්නා. දුප්පත් ජනපද වාසීන්, ගොවීන්, හා කම්කරුවන් දැන් අවුරුදු ගණනාවක් තිස්සේ හැතැප්ම ගණනක් දාඩිය මුගුරු දාගෙන පයින් මයි ගමන් කරමින් සිටින්නේ. වෙල් වැඩ කරල ඔවුන්ට නගරයට පයින් එන්න කොයිතරම් කාලයත් ගත වෙනවාද?

බස් සේවා පවත්වාගෙන යන්නේ මෙහෙමද කියා මා අහනවා. ඇතැම් ඇමතිවරුන්ගේ කොට්ඨාශවල පටු පාරවල් වලටත් දමන්නට බස් තිබුණු බව අපට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්‍ය සද්ධාසේන]

දැනගන්නට ලැබුණා. පසුගිය මැතිවරණ කාලයේදී හිටපු මන්ත්‍රීතුමා කරන්දෙනිය ප්‍රදේශයේ කුරුඳුවතු උඩින් පවා බස් යෙදවූ බව මා දන්නවා. අපක්ෂපාත සේවයක් ඉටු වෙනවා යයි කියන්න බැහැ. අපේ ලංගම සභාපතිතුමාට මම දෙස් කියනවා නොවෙයි. උන්නැහේ ඊට පසු ලියා එවා තිබෙනවා, කැබිනට් තීරණයක් නිසා මේක කරන්නට බැරි බව. ඊයෙ ගරු ඇමතිතුමා කිව්වා, මේක කොහොම හරි දෙන්ට මහන්සි ගන්නම් කියා. මහන්සි ගන්නෙ කවදද? අපි මැරුණාසින් පස්සෙද කියා මා අහනවා. බස් වලින් ගමන් කරන්නට මේ දුප්පත් ජනතාවට අයිතියක් නැද්ද? බස් සේවය කැබිනට් එකේ බූදලයක් ද කියා මා අහනවා. එහෙම නැත්නම් අපක්ෂපාතව ක්‍රියා කරනවාද?

බස් රථ හිඟයක් තිබෙනවා නම් මම එය වැළැක්වීම සඳහා එක්තරා යෝජනාවක් ඉදිරිපත් කරන්නට සතුටුයි. අද ලංගමයත් දුම්රිය සේවාවත් දෙකම ජනසතු සේවා වශයෙනුයි පවත්වාගෙන යන්නේ. මේ දෙක අතර තරඟයක් ඇති කිරීම අනවශ්‍යයි. දැන් ඩීසල් එන්ජින් ගෙනැවිත් තිබෙන නිසා ඒවා යොදවා මුහුදුබඩ ප්‍රදේශයේ දුම්රිය ධාවනය කරවන්නට පුළුවන් ප්‍රදේශවල ශීඝ්‍රගාමී දුම්රිය සේවයක් යොදවන අතර, යම් යම් මධ්‍යස්ථානවලින් බස් ධාවනය කරවන්නේ නම් ගම්බද දුප්පත් ජනතාවට විශාල සේවයක් සිදු වෙනවා පමණක් නොවෙයි, මේ ආයතන දෙකේ පාඩුවත් මගහරවා ගන්නට පුළුවන් වෙනවා ඇති. අද දුම්රිය දෙපාර්තමේන්තුවෙනුත්, ලංකා ගමනාගමන මණ්ඩලයෙනුත් විශාල ලෙස පාඩු සිදු වෙනවා. ඒ වගේම බස් ගෙන්වන්නට සල්ලි නැහැ කියනවා. එහෙම නම් අපි ශීඝ්‍රගාමී දුම්රිය සේවා යොදවමු. මාතර සිට කොළඹට ශීඝ්‍රගාමී දුම්රිය සේවා යොදවමු. ඒ ගමනේදී අම්බලන්ගොඩ වගේ ස්ථාන 4 ක විතර නවත්වන්නට කටයුතු යොදම. මහජනයාට ඉක්මනින් ගමන් යන්නට ඕනෑ. ඒ වගේම දුප්පත් ගම්බද ජනතාවටත් නගරවලට එන්නට ඕනෑ. දුප්පතා ගැන කෑ ගහන, දුප්පතාට කරනවාය කියන මේ ආණ්ඩුව දුප්පතාට කරන්නේ මෙහෙමද කියා මා කනගාටුවෙන් අහනවා.

මම මේ විධියට කථා කරන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ඉන්න ගමන් වෙන්න පුළුවනි. ඔව්, මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවනි. ඒ වුණත්, ඒ ගැනත් දැන් නම් මම කනගාටු වෙනවා. මෙහෙමද වැඩ කරන්නේ කියලා කල්පනා කරන නොයෙක් අවස්ථාවල මට එහෙම හිතෙනවා. මගේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන්නට තිබුණු නොයෙක් දේවල් තවමත් කෙරී නැහැ. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ බොහොම දුර බැහැර ප්‍රදේශයකරන කරවිදෙණිය-මහ ඒදණ්ඩ පාරටත්, කොටගල-මහඒදණ්ඩ-අටකෝට්ටේ-පාරටත් බස් නැහැ. බස් නැතිව ඒ උදවිය දවස් ගණන් ඇවිදින්න ඕනෑ. ඇයි, ඔවුන්ට ඇත්තේම නැද්ද බස් සේවාවක් ලබා ගැනීමේ අයිතියක්? කිරිල්ලගහවෙල-තෙල්වත්ත පාරත්, මිටියාගොඩ-අම්පේගම පාරත් බොහොම මහන්සි වෙලා විශාල පිරිසක් එකතු වෙලා වැඩ කර, දැන් තාරත් දමා අවසානයි. අර කවුදෝ හඳ පායන කල් බලාගෙන ඉන්නවා කිව්වා වාගේ දැන් ඒ ප්‍රදේශයේ මිනිසුන් බස් එන කල් බලාගෙන ඉන්නවා. ඇත්තෙන්ම මිනිසුන් හඳටත් ගියා. ඒ වුණාට තමන් ඉන්න ගමට යන්න බස් රථයක්වත් නැතිවයි අපේ ප්‍රදේශයේ ඇතැම් අය ඉන්නේ. ඒ උදවියට බස් සේවයක් දෙන්නට මම පොරොන්දු වුණා. අම්බලන්ගොඩ සද්ධාසේනට ආණ්ඩුවෙන් බස් එකක්වත් ඉල්ලා ගන්නට බැරි වුණා, කියලයි ඒ අය දැන් මා ගැන කථා කරන විට කියන්නේ. මොකද, පන්දම් ඇල්ලීම නිසා දැයි මම අහනවා. මම පන්දම් අල්ලන්නේ නැහැ. මම මහජන ඡන්දයෙනුයි මෙහාට ආවේ. මම මෙහාට ආවේ නිකම් ඔහෙ වාඩි වෙලා ඉඳලා, කියන කියන දේට අත උස්සන්න නොවෙයි. මගේ දුප්පත් ජනතාවට සේවයක් කරන්නටමයි මම ඇවිත් ඉන්නේ. ඒක කරන්න බැරි වෙනකොට මොනවද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිතෙන්නේ නැත්තේ? මොන අපරාධ යක්ද මේක? ඇත්තෙන්ම මෙය අපරාධ යක් හැටියටයි මම නම් විස්තර කරන්නේ. වහාම බස් එවන්නැයි මම ඉල්ලනවා. බස් එකක් නැත්නම් ගෙදර තියෙන බස් එකක්වත් ගෙනැවිත් දෙන්නැයි කියනවා. මෙහෙමයි අපට සලකන්නේ.

ලබන මහා මැතිවරණයේදී ලංගම සේවකයන්ගෙන් සියේට අනූවක ඡන්ද තමන්ගේ පැත්තට ලැබෙනු ඇතැයි බලා පොරොත්තු වන බවක් අකුරණ පළමු වැනි ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) ප්‍රකාශ කළා. එතුමා එවැනි කථාවක් කිරීම ගැන මම පුදුම වන්නේ නැහැ. මක්නිසාද, ලංගමයේ ඉන්න හුඟ දෙනෙක්ම එතුමන්ලාගේ අයයි. ඒ අය තමයි දැන් ලංගමයේ කඩාකප්පල්කාරී වැඩ කරගෙන යන්නේ. ඒ නිසා ඇතැම්විට ඔය කඩාකප්පල්කාරී පුද්ගලයන් ලවා අපේ ගමනාගමන සේවය අඩපණ කරනවා වෙන්නටත් පුළුවනි. විරුඬ පාර්ශ්වයේ තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ පිරිස ලවා ලංකා ගමනාගමන මණ්ඩලයේ කඩාකප්පල්කාරී කටයුතු කරවන බවක් ඒ කථාවෙන් අපට පැහැදිලි වෙනවා. එසේ නොවෙයි නම් කිසිම බියක් නැතිව ඒ විධියේ කථාවක්—ලංගම සේවකයන්ගේ ඡන්දවලින් සියේට 90ක්ම තමන්ට ලැබේ යයි බලාපොරොත්තු වන බවක්—කියන්නේ නැහැ.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

ඇයි මේ ආණ්ඩුව පත් කළ උදවියත් එතන ඉන්නවා. ඇයි ඒක දන්නෙ නැද්ද? අපේ කාලයේ ඇති කළ සංසථාවක් නිසා අපේ කාලයේ බඳවා ගත් උදවියත්, මෙතෙක් කල් මේ ආණ්ඩුව යටතේ තිබුණු නිසා මේ කාලය තුළ බඳවා ගත් උදවියත් එතන ඉන්නවා. තමන්ගේ රක්ෂාවල් ආරක්ෂා කර ගන්නට ඕනෑ නිසයි ඒ උදවිය අපට බලය දෙන්නට කැමැත්තක් දක්වන්නේ. අපේ රටේ තිබෙන පාර්ලිමේන්තු පාලනක්‍රමය යටතේ තමන් කැමති පක්ෂයකට ඡන්දය දෙන්නට පුළුවනි. ඡන්දය පාවිච්චි කිරීමේ ක්‍රමයත් ඒකයි. අපි පළිගන්නේ නැහැ.

වෛද්‍යාචාර්ය සද්ධාසේන
(வைத்திய கலாநிதி சத்தாசேன)
(Dr. Saddhasena)

ඡන්දය පාවිච්චි කරන වෙලාවට ඒ උදවිය ඡන්දය පාවිච්චි කරාවි. එහෙත් මට එකක් කියන්නට පුළුවනි. ලංගම සේවකයන්ට මේ ආණ්ඩුව තරම් හොඳට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සැලකුවේ නැහැ.

තවත් එකක් කියන්න තියෙනවා. ඒක කිව්වොත් තරහ වෙන්න ඉඩ තියෙනවා. තරහ වුණාට කමක් නැහැ. සේවකයන් පත් කිරීම ගැනයි මට කියන්න තියෙන්නෙ. මගේ කොට්ඨාශයෙනුත් මට වුවමනා කළ උදවියට රක්ෂාවල් ලබා දීමට පුළුවන් වීම ගැන මම ගරු ඇමතිතුමාට කෘතඥ වෙනවා. වෙන ඇමතිවරුන් නොකළ දෙයක් එතුමා මට කළ නිසයි මා එතුමාට කෘතඥ වන්නේ. එහෙත් එතුමාගේ වැඩ සාධාරණ විධියට කෙරෙනවායයි මට කියන්නට බැහැ. මගේ කොට්ඨාශයට අයිති උදවියගෙන් කොන්දොස්තර තන තුරු සඳහා ඉල්ලූ අයත් පොරොත්තු ලේඛනයේ සිටිනවා, හුඟ දෙනෙක්. එහෙත් පස්සා දොරෙන් මිනිසුන් අරන් තියෙනවා, අර උදවිය එහෙමම ඉන්දැද්දී. නැතැයි කියනවා නම් මට ඔප්පු කරන්නට පුළුවනි. මම ඔප්පු කරන්න ලෑස්තියි. මේ පැත්තේ හිටියාය කියලා මට ඇත්ත නොකියා බැහැ.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Dr. Saddhasena)

අම්බලන්ගොඩ මන්ත්‍රීතුමාට ජය වේවා.

වෛද්‍යාචාර්ය සද්ධාසේන
(வைத்திய கலாநிதி சத்தாசேன)
(Dr. Saddhasena)

මට ජය වෙන්න දෙයක් ඔහේ නැහැ; ඇත්තේම නැහැ. මට නම් දැන් ජයත් එපා වෙලයි තියෙන්නේ. මට, ඇත්තම කියනවා නම්, ජය තියා මේ මන්ත්‍රීකමවත් එපා වෙලයි තියෙන්නේ. මේ විධියට නම් වැඩ කෙරෙන්නෙ, ඕවා මොනවටද? ධනය, ශ්‍රමය, කාලය යනාදී හැම වටිනා දෙයක්ම කැප කරගෙනයි ඇවිත් වැඩ කරන්නේ. එහෙත් වැඩක් කරවා ගන්න බැරි නම් මේ මන්ත්‍රීකම මොකටද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

මීට වඩා කල් ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ, කනගාටුවෙනුයි මම කථා කරන්නේ. මම ඇත්ත කථා කළා. තරහ වෙන්න එපා. තරහ වුණත් කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලා අගමැති තුමාටවත් කියලා මේ වැඩ ටික කරලා දෙන්න මට. මේවා කරලා නුදුන්නොත් මට ගමට යන්නත් බැරි වෙයි. මගේ ප්‍රදේශයේ දුප්පත් ජනතාව පුල පුලා සිටියා බස් රියක් ලැබේය කියලා; ලැබුණේ නැහැ. බස් එහෙම නුදුන්නොත් මට තියා එක්සත් ජාතික පක්ෂයේ නායක අගමැති තුමාටවත් ඒ පැත්තට යන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඡන්දෙ දෙන්න බලාගෙන ඉන්නවා. වාරය එනකල්.

වෛද්‍යාචාර්ය සද්ධාසේන
(வைத்திய கலாநிதி சத்தாசேன)
(Dr. Saddhasena)

මට ඡන්දෙන් වුවමනාවක් නැහැ. මට බස් දුන්නොත් ඇති. මම ඒ මිනිසුන්ට පොරොන්දුවක් දුන්නා. ඒක දුන්නේ මට දුන් පොරොන්දුව උඩයි. ඒ උදවිය නොමිලයේ ඉඩම් දුන්නා; ශ්‍රමය යොදා වැඩ කළා; පාර හදලා දුන්නා; බෝක්කු එහෙමත් හැදුවා. බොරුවට බස් දෙකකුත් ධාවනය කෙරෙව්වා. නිකම් මිනිසුන්ට පෙනෙන්න. ඒ නිසා කරුණා කර මේ වැඩේ මට කරලා දෙන්න. පෞද්ගලිකව මා ගැන කල්පනා කරන විට මට මෙය ඉවසිය නොහැකි කරදරයක්. මගේ කථාව නරක නම්, ආණ්ඩුවට විරුද්ධ නම්, මා එක්සත් ජාතික පක්ෂයෙන් නෙරපන්න ඉල්ලමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

යාලෙගම මයා.
(திரு. யாலேகம)
(Mr. Yalegama)

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ආසනයේ පාරකට බස් සේවාවක් ඉල්ලා නොලැබීමක් ගැන සඳහන් කළා. 1969 ජූලි මස 15 දිනමින්, ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති තුමා විසින් මහජන මන්ත්‍රීවරුන්ට චක්‍ර ලේඛයකින් උපුටා ගත් කොටසක් සහිත ව ලිපි එවා තිබුණා. එහි සඳහන් වෙන්නේ අලුතෙන් කිසිම මාර්ගයකට බස් රථ ධාවනය පිණිස ඉඩ සලසා දෙන්න පුළුවන් කමක් නැත කියායි. නමුත් මෙම චක්‍ර ලේඛය අනුව අලුතෙන් කිසිම මාර්ගයක බස් රථ ධාවනය කර නැද්දැයි ගරු ජනසතු සේවා ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන්න කැමතියි. අගෝස්තු 1 වනදා එක්තරා ආසනයක නව බස් සේවාවක් විවෘත කළා. මාත් එම උත්සවයට සහභාගි වුණා. එය එසේ නම්, චක්‍ර ලේඛය යැවීමට පසුවත් නව බස් සේවාවක් විවෘත කළා නම්, චක්‍ර ලේඛය අනුව ක්‍රියා කරනවායයි අපට කිසි සේත් විශ්වාස කරන්න බැහැ. මේ අන්ද මට පසුගිය කාල සීමාව තුළදී ආසන ගණනාවකම අලුතෙන් බස් සේවාවන් ආරම්භ කර ඇති බව පෙන්නුම් කර දෙන්න පුළුවනි. මේ කාරණය ගැන මා මෙතරම් සඳහන් කරන්නේ එක්තරා අදහසක් ඇතුවයි. මා ගරු ඇමතිතුමාට දෙස් නගනවා නොවෙයි. එතුමා සමග මගේ ආසනයේ යම්කිසි බස් සේවයක් සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබෙනවා. රත්තොට ආසනයේ අල්වත්ත සිට මුවන් දෙණිය දක්වා බස් සේවාවක් ඉල්ලා සිටියේ 1958 අවුරුද්දේ සිටයි. ඒ සම්බන්ධයෙන්, ඒ කාලයේ මධ්‍යම දිසාව භාර දිසා කළමනාකාර මහතා විසින් මුවන්දෙණියේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් මහතාට 1958.12.23 දිනමින් යවන ලද ලිපියක සඳහන් වෙනවා, වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නැති නිසා අළුත් සේවයක් ආරම්භ කිරීමට නොහැකි බව. ඒ කාරණය මා පිළිගන්නවා. ඉන් පසුව 1965 දීත් මෙම මාර්ගයට බස් සේවාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. පහළොස් දහසක් පමණ පදිංචිව සිටින මෙම ප්‍රදේශයට බස් සේවාවකින් සැලසෙන ප්‍රයෝජන ඉතා විශාල බව සඳහන් කළ යුතුමයි. විශේෂයෙන්ම මෙම ප්‍රදේශවල පදිංචි උදවියට බස් ධාවනය කරන මාර්ගයකට පැමිණීමට සැතපුම් තුන හතර පයින්ම ගමන් කරන්නට සිදු වෙනවා. අප මෙම මාර්ගයට බස් සේවාවක් ලබා දෙන ලෙස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුලින්ම ඉල්ලුම් කළ අවධියේ යම් යම් අඩු පාඩුකම් තිබුණා වෙන්නට පුළුවනි. සෑහෙන බස් සංඛ්‍යාවක් නොතිබීම, මාගීය බස් ධාවනයට නුසුදුසු තත්ත්වයක තිබීම, වැනි හේතූන් නිසා ඒ කාලයේ පහසුකම් සලසා දෙන්න බැරි වුණත් අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇති බව පිළිගන්න ඕනෑ.

අ. භා. 7.30

ගරු සභාපතිතුමනි, මාතලේ මැදිසිය, උඩසිය උතුරු ගම්කාර්ය සභාවේ සභාපතිතුමාගේද සහයෝගය ඇතුව, අප ඉතා මත්ම වෙහෙස දරා, අවශ්‍ය තැන් පළල් කොට මාර්ගය සකස්කොට බස් ධාවනයට සුදුසු අන්දමින් තනා නිම කිරීම පිණිස රජයේ වැඩ දෙපාර්තමේන්තුවට භාර දුන්නා. දැන් එම මාර්ගය බස් ධාවනය කිරීමට සුදුසු තත්ත්වයක තිබෙන බව ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. 1967 මාර්තු 13 වනදා ජනසතු සේවා ඇමතිතුමාගෙන් මට ලිපියක් ලැබී තිබෙනවා. දැනට ඒ කාරණය සම්බන්ධයෙන් එතුමාගේ අවධානය යොමු වී ඇති බවත්, යථා කාලයේදී තවදුරටත් පිළිතුරක් එවීමට අපේක්ෂා කරන බවත් එම ලිපියෙන් මට දන්වා එවා තිබුණා. ඉන් පසුව 1967 අගෝස්තු මස 30 දිනමින්, වැඩ බලන ජනසතු සේවා ඇමතිතුමා විසින් මට ලිපියක් එවා තිබුණා. බස් ධාවනය කිරීම සඳහා සුදුසු පරිදි මාර්ගය සකස් කර ඇත්තේ සැතපුම් එකසි කාලක ප්‍රමාණයක් බව රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් ලංකා ගමනාගමන මණ්ඩලය වෙත දන්වා ඇති බැවින් මුවන්දෙණිය දක්වා බස් රථ ධාවනය කිරීමට මාර්ගය නුසුදුසු නිසා බස් සේවාවක් ලබා දීමට අපහසු බව එම ලිපියෙන් මට දන්වා තිබුණා. මෙයින් පසුව රුපියල් නිස් එක් දහසක වියදමින් රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් මෙම පාරේ ඉතුරු කොටසත් සකස් කර දුන්නා. ඊට පසුව නැවත වරක් මේ ගැන දන්වා යවන ලදුව, ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන ධාවන කළමනාකාර මහතා විසින්, 1967 අප්‍රේල් මස 25 වන දින මා වෙත එවන ලදි. එම ලිපිය මේ අවසථාවේදී කියවන්න කැමතියි. මෙන්න ඒ ලිපිය:

"ප්‍රිය මන්ත්‍රීතුමනි,

මාතලේ-ගොඩපොල හරහා මුවන්දෙණියට බස් සේවයක් ඉල්ලීම

ඔබ විසින් මා වෙත එවන ලද 67.4.20 දින දරණ ලිපිය හා බැඳේ. ඔබගේ ඉහත සඳහන් ඉල්ලීම ගැන ඉතා උනන්දුවෙන් සලකා බලන බව කරුණාවෙන් දන්වමි.

මීට හිතවත්,

ඊ. බී. ද සේරම්,
ප්‍රධාන ධාවන කළමනාකාර තැන."

මේ පාර පටන් ගන්නා තැන අඩි 5ක් පළල් කර දෙන්නය කියා මට ලිපියක් එවා තිබුණා. ඒ ලිපිය එවා තිබුණේ 1968 දෙසැම්බර් 29 වෙනි දිනයි. ඊටපසු මේ කාරණය සම්බන්ධයෙන්ම මට තවත් ලිපියක් එවා තිබුණා. එය එවා තිබුණේ 1969 පෙබරවාරි 10 වෙනි දිනයි.

"මගේ අංකය: ධාග/සේ/2012.
1969 පෙබරවාරි මස 10 වන දින,
ධාවන කොට්ඨාශයේදීය.

පාර්ලිමේන්තු මන්ත්‍රීධුරන්ධර
ඇස්. බී. යාලේගම මහතා,
ගොලහැන්වත්ත,
පලාපත්වෙල.

ප්‍රිය මහත්මයාණනි,

මාතලේ-ගොඩපල හරහා මුවන්දෙනිය

ඔබගේ ඉහත සඳහන් ඉල්ලීම පිළිබඳව අපි ඉතා උනන්දුවෙන් ක්‍රියා කරන බව පළමුවෙන්ම දන්වීමට කැමැත්තෙමි.

බස් සේවයක් ධාවනය කරවීමට පෙර සකස් කරගත යුතු කරුණු රාශියක් ඇති බව ඊට පෙරද ඔබ මෙම කාර්යාලයට ආවිට දන්වන ලදී. විශේෂයෙන්ම අදාල මාගීය මගින්ගේ සම්පූර්ණ ප්‍රවේශම් සහිත විය යුතු බව ඔබ පිළිගන්නවාට මට කිසිම සැකයක් නැත. 68.12.29 දින දරණ මගේ ලිපියෙන් ඔබට දන්වූ පරිදි ගොඩපොල හංදියෙන් මුවන්දෙනියට පිවිසෙන තැන පළල් කරලීමට දැනට අවශ්‍ය පියවර ගෙන ඇති බව නුවර දිසා කළමනාකාර තැන 69.1.27 දිනදී මට දන්වා ඇත. මෙය අවසන් වූ වහාම දන්වන සේ 69.2.6 දිනදී දිසා කළමනාකාර තැන වෙත උපදෙස් දී ඇත්තෙමි. මෙම කාර්ය ඉටු වූ පසු වැඩි දුර ඉක්මණින් ක්‍රියා කරන බව කරුණාවෙන් දන්වමි.

මීට හිතවත,

ප්‍රධාන ධාවන කළමනාකාර තැන,
ලංකා ගමනා ගමන මණ්ඩලය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

ගරු සභාපතිතුමනි, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට කියා මාළුයත් කරවා දුන්නා. මේ විධියට මේ සියල්ලම කර නිම කළාට පසුව, පාරේ වැඩ ඔක්කොම සම්පූර්ණ කළාට පසුව අන්තිමට කිව්වා, ඇමතිතුමාගෙන් නියෝගයක් අරගෙන දෙන්නය කියා. ඇමතිතුමා හමුවී මා මේ කාරණය ගැන කිව්වා. ඇත්ත වශයෙන්ම ඇමතිතුමා නියෝගයක් දුන්නා. මේ පාරට බස් සේවයක් අවශ්‍යය කියා එතුමා නියෝගයක් දුන්නා. ඊළඟට මට කිව්වා, ලංකා ගමනා ගමන මණ්ඩලයේ ධාවන කොමිටියට දමා මේ පාර අනුමත කරවා ගන්නය කියා. මා එයත් කළා. ඇත්ත වශයෙන්ම මේ පාර අනුමත කර ඒ ලේඛනයේ ඒ ලැයිස්තුවේ මේ පාරට ප්‍රමුඛස්ථානයක් ලබා දී තිබෙනවා. මෙය අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් බවට ඒ ලේඛනයේ සඳහන් කර තිබෙනවා. මෙය අවුරුදු ගණනාවක් තිස්සේ කරන ලද ඉල්ලීමක් නිසා මේ පාරට ප්‍රමුඛස්ථානයක් දී තිබුණා. ඒ විධියට කර තිබියදී තමයි, මීට පසුව අළුත් පාරවල්වල බස් ධාවනය කරවන්නෙ නැත කියා වක්‍ර ලේඛනයක් ඇවිත් තිබෙන්නෙ. නමුත් ගරු සභාපතිතුමනි, මට කරුණු සහිතව ඔප්පු කර පෙන්වන්න පුළුවනි, මේ වක්‍ර ලේඛනය ආවාට පසුවත් යම් යම් ආසන වල මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම උඩ ප්‍රමුඛස්ථාන ලේඛනයේ නැති පාරවල්වලට පවා බස් ධාවනය ඇති කර තිබෙන බව. [බාධ කිරීමක්] ගරු සභාපතිතුමනි, මා මේවා කියන්නේ කරුණු සහිතවයි. ගරු ජනසතු සේවා ඇමතිතුමා දන්නවා ඇති, මේ වක්‍ර ලේඛනය උල්ලංඝනය කර බස් සේවයක් ඇති කිරීමේ වරදට යම්කිසි නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීමට යෙදුන බවත්. වක්‍රලේඛනය උල්ලංඝනය කිරීමේ වරදට ඒ නිලධාරියාගේ වැඩ තහනම් කළා. තමුන්නාන්සේට එය නැහැයි කියන්න බැහැ. ඇත්තවශයෙන්ම මා සතුටු වෙනවා ඒ පාරට බස් සේවයක් දැමීම ගැන. ඒ නිසා ඒ ආසනය මොකක්ද, ඒ පාර මොකක්ද කියන එක මා සඳහන් කරන්නේ නැහැ. ඒ පාරට බස් සේවයක් දැමීම ගැන ඇත්ත වශයෙන්ම මා සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, සලකනවා නම් කාටත් සාධාරණ ලෙස සලකන්න ඕනෑ බවයි මා කියන්නෙ. මේ විධියේ වක්‍ර ලේඛනයක් එවා අන්තිමට මේ විධියට අසාධාරණ අන්දමට කටයුතු කිරීම ගැනයි මා චෝදනා කරන්නෙ. එසේ නැත්නම් යම් ආසනයකට බස් සේවයක් දැමීම ගැන මා අසන්තෝෂ වෙන්නේ නැහැ. ඒ ගැන මා සන්තෝෂ වෙනවා.

අවුරුදු ගණනාවක් තිස්සේ මා මේ ඉල්ලීම කරනවා. ජනසතු සේවා ඇමතිතුමාට මා එක් කාරණයක් පමණක් කියන්න කැමතියි. මේ පාර සම්බන්ධයෙන් කළ යුතු සෑම දෙයක්ම මා කර තිබෙනවා. 1965 න් පසු ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් මට කිව්වා, මාතලේ ඩිපෝ කළමනාකාර තැන ලවා, මේ පාර බස් ධාවනයට සුදුසු බවට සම්මත කර එවන්න කියා. මා එයත් කළා. ඊළඟට මට කිව්වා, මහනුවර මධ්‍යම කොට්ඨාශය භාර ධාවනා කළමනාකාරතැනගෙන් මේ පාර බස් ධාවනයට සුදුසු බවට සහතිකයක් ලබා ගෙන එන්නය කියා. මා ඒ කාර්යාලයට ගොස් ඒ සහතිකයත් ලබා ගත්තා. ඊට පසු කිව්වා, මාතලේ විධායක ඉංජිනේරු තැනගෙන් මේ පාරට ටොන් 7ක බස් එකක් දුවන්න සුදුසුය කියා සහතිකයක් අර ගන්නය කියා. මා එතුමා හමුවී එතුමා ලවා පාර පරීක්ෂා කරවා සහතිකයක් රැගෙන ලංගමයට එවුවා. අන්තිමට කිව්වා, ඇමතිතුමාගෙන් නියෝගයක් ඕනෑය කියා. ඇත්ත වශයෙන්ම ඇමතිතුමා ටෙලිෆෝන් කළා පමණක් නොව, මේ ගැන වහාම ක්‍රියා කරන්න ඕනෑය කියා ලියවිල්ලකටත් එතුමා අත්සන් කළා. ඒ ලියුමත් ලිපි ගොනුවේ තිබෙනවා.

මේ කටයුතු සියල්ල අවසන් කර තිබිය දීයි මේ විධියේ වක්‍රලේඛනයක් එවා තිබෙන්නෙ. නමුත් ඒ වක්‍රලේඛනය ආවාට පසුවත් යම් යම් පාරවල්වල බස් ධාවනය කරවා තිබෙනවා. ඒ නිසයි මා කියා සිටින්නේ මගේ මේ ඉල්ලීම ගැන කල්පනා කර බලන්නය කියා. මෙය මගේ පුද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ජනගහනය 10,000ක්, 15,000ක් පමණ සිටින ගම් ප්‍රදේශ රාශියකට සේවයක් සැලසෙන බස් සේවයක් ගැනයි මා ඉල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටින්නේ. මෙය අවුරුදු ගණනක් තිස්සේ මහජනතාව කරන ඉල්ලීමක්. එය මගේ පෞද්ගලික ඉල්ලීමක් නොවෙයි. ඒ වාගේම මගේ පෞද්ගලික ප්‍රයෝජනයා සඳහා කරන ඉල්ලීමක්ද නොවෙයි. මෙයට ප්‍රමුඛස්ථානය දෙනවාය කියා ප්‍රකාශ කර තිබෙන නිසාත්, මහජනතාව අවුරුදු ගණනක සිට කරන ඉල්ලීමක් නිසාත් මෙම බස් සේවය වහාම ලබා දීමට ගරු ඇමතිතුමා පියවරක් ගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing.

එස්. ද එස්. ජයසිංහ මයා.
(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)

I will speak later. There are other hon. Members on this side who wish to speak.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I do not mind, but you might lose your chance of speaking.

එස්. බී. හේරත් මයා. (හිරියාල)
(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)
(Mr. S. B. Herat—Hiriyala)

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පාර්ශ්වයෙන් සහ විරුද්ධ පාර්ශ්වයෙන්ද ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු කථා කළාට පසුව මෙම ශීර්ෂය යටතේ මට කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වන අතර ඒ මන්ත්‍රීවරුන් විසින් අපේ ජනසතු සේවා ඇමතිතුමාගේ ක්‍රියා ගැන කරන ලද විවේචන පිළිබඳව පළමුකොටම කරුණු ස්වල්පයක් සඳහන් කරන්න කැමතියි.

අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය සද්ධාසේන) ගරු ඇමතිතුමා විවේචනය කරමින් ප්‍රකාශ කරන්න යෙදුණ, නව මාර්ගයක බස් රථයක් ධාවනය කිරීමට ඇමතිතුමා පොරොන්දු වූ නමුත්, එය ඉටු කළේ නැත කියා. මා හිතන හැටියට තව ගරු මන්ත්‍රීන් කීප දෙනෙකුම ඒ විධියේ ප්‍රකාශ කරමින් ඇමතිතුමා විවේචනය කරන්න යෙදුණා. මගේ ආසනයේත් නව බස් මාර්ග 4ක් යෝජනා කරගෙන, ඒවා අනුමත කරවා ගෙන අවසන් වුනාට පසුව එම මාර්ගවල බස් සේවා ආරම්භ කරන්නට කලින්, බස් අඩුපාඩුවක් නිසා කැබිනට් තීරණයක් උඩ එය නවත්වන්න සිද්ධ වුණා. ගරු මන්ත්‍රීවරුන් මෙම ගරු සභාවේදී කොතෙක් කරුණු කිව්වත්, මෙම බස් රථ යොදවන්නේ කොයි විධියෙන්ද, ඒ නව මාර්ග බස් ධාවනයට කෙසේ ඔරොත්තු දේවිද, බෝක්කු පාලම් ආදිය සවිශක්තිමත්ද, ගාස්තු පිළිබඳ කොටස් කැඩිය යුත්තේ කෙසේද ආදී නොයෙකුත් කාරණා ගැන සිත් මෙහෙයවන්නට තිබෙන නිසා ඒ කාරණාවල ඇති විවිධ පැති දෙස අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බලන්නේ නම් මා හිතන්නේ නැහැ ඒ මන්ත්‍රීවරුන් ඔය අන්දමට කථා කරාවි කියා. ඒ ගැන සැලකිල්ලක් නොදක්වා කථා කිරීම මට පෙනී යන්නේ දුර්වල කමක් හැටියටයි. මට පුදුම විය යුතු තවත් කාරණයක් නම් ඒ දුර්වලකම උඩ ආණ්ඩු පාර්ශ්වයෙන් යම් කිසි ගරු මන්ත්‍රීවරයෙක් කථා කරන විට විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඒ ගැන සතුට පළවන විධියට සිනා මුහුණින් අත් පුඩි ගසා ඒ විවේචනයට සහභාගි වීමයි. ඒ මොකද? ඒ විධියේ බස් රථයක් පොරොන්දු වූ පරිදි ධාවනය කෙරෙව්වෙ නැත කියන විට ඊට පසු බිම් වී ඇති හේතු කිසිවක් ඒ මන්ත්‍රීවරුන් නොදන්න නිසයි.

බස් රථයක් ධාවනය කිරීමට යෙදවීමේදී, නොහොත් නව මාර්ගයක බස් රථ යෙදවීමේදී අර මා කලින් කිව්වා වගේ සලකා බැලිය යුතු බොහෝ දේවල් තිබෙනවා. මා හිතන්නේ ඒ කාරණා නිසා වෙන්න ඇති ඒ මන්ත්‍රීවරුන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

පාරවල් ඩාවනය කරන්න ගිය බස් නතර වුණේ. ඒ ගැන දන්නේ නැතුව, මේ මේ විධියට කැබිනට් තීරණ උඩ නව බස් මාර්ග නැවැත්තුවාය කියනවා. කෙසේ වෙතත් නව මාර්ගවල බස් ධාවනය කරවීමට දැන් ඉක්මනින්ම කටයුතු කරගෙන යනවා. පිටරටින් බස් රථ ගෙනා හැටියේම ඒවා මාර්ගවලට දාන්න බැහැ. ඒවාට බොඩි ගසා නොයෙක් අඩුපාඩු සකස් කර අවසන් වීමෙන් පසුවයි ඒවා ධාවනය කරවන්න පුළුවන් වන්නෙ.

ආසනයක දෙකක පමණක් නව බස් මාර්ග ඇති කරන්නෙ නැතුව පුලුල් වැඩ පිළිවෙළක් උඩ නව බස් මාර්ග ඇති කිරීමට ගත් කැබිනට් තීරණය ගැන මා සන්තෝෂ වෙනවා. ඒ මොකද? සෑම ආසනයක් ගැනම පරීක්ෂා කර බලා මොන ප්‍රදේශවලටද වැඩියෙන් අවශ්‍ය කියන එක පළමුවෙන් සොයා බලන්න ඕනෑ. දැන් හිරියාල වාගේ බොහොම දුෂ්කර ප්‍රදේශ තිබෙනවා. නගරවල නම් හැතැප්ම දෙකකට තුනකට බස් සේවා නොදැම්මට ඒ දුරප්‍රමාණ පහසුවෙන් යාමට නොයෙක් රථ නගරවල තිබෙනවා. නමුත් හිරියාල ආසනය ගැන බලන විට හැතැප්ම 10, 12, බස් නැතුව, කරත්ත වලින් හෝ පයින් යන්න එන්න ඕනෑ. එම නිසා, ඒ තීරණය ගැන මා සන්තෝෂ වෙනවා. ලංකාවේ සියලුම බස් ධාවන මාර්ග පිළිබඳව සොයා බලා, දැනට තිබෙන බස් රථ ප්‍රමාණය අනුව සාධාරණ අන්දමට ඒ ඒ ප්‍රදේශවල බස් ධාවනය කරවන්නට තීරණය අනුව පුළුවන්කම ලැබෙනවා. මගේ කොට්ඨාශයේ සමහර ප්‍රදේශවල රෝගීන් රෝහල් කරා ගෙන යෑම සඳහා බසයෙන් යන්නට සිදු වී තිබෙන්නේ, කරත්තයකින් සැතපුම් 10 ක් පමණ ඇවිත් බස් ධාවන මාර්ගයකට ළඟා වී එතැන් සිටයි. එවැනි දුෂ්කර ප්‍රදේශ පිළිබඳව අවබෝධයක් ඇතිව තමයි, ඒ තීරණය ගෙන තිබෙන්නේ.

සමහර ගරු මන්ත්‍රීවරුන්, ඇමතිතුමා හා මේ ගරු සභාවට පැමිණ පිළිතුරු දෙන්නට පුළුවන්කමක් නැති නිලධාරීන් විවේචනය කළේ, විවේචනය කරන්නන් වාලේ විනා තේරුමක් ඇතිව නොවෙයි. ඒ ගැන මා කණගාටු වෙනවා.

වර්තමාන රජය බලයට පත් වූවාට පසු බදවා ගත් ලංගම සේවකයන්ගෙන් සියයට 90 ක්ම පාහේ ලබන මහා මැතිවරණයෙදී එතුමන්ලාගේ පක්ෂයට ඡන්දය දෙනු ඇතැයි, අකුරණ පළමු වැනි ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) කීවා. එතුමා ඒ ප්‍රකාශය කර තිබෙන්නේ සියයට 90 කියන්නේ මොකටද කියා වත් දන්නේ නැතිවයි. හොඳ වෙළඳ ව්‍යාපාරිකයකු වන එතුමා සියයට 90 කියන්නේ මොකක්දැයි නොදැනීම ගැන මා කණගාටු වෙනවා.

අ. භා. 7.45

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

සියයට 90 කියන්නේ මොකාටදැයි තමුන්නාන්සේට උගන්වන්නටත් මට පුළුවනි.

එස්. බී. හෙරත් මයා.
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herat)

වෙළඳ ව්‍යාපාරිකයකු වුවත් ගණන් ශාස්ත්‍රය සම්බන්ධයෙන් මන්ත්‍රීතුමාගේ දැනීම බොහොම දුර්වලයි.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

ව්‍යාපාරිකයන් නිලධාරීන්ට වඩා හොඳින් ගණන් ශාස්ත්‍රය දන්නවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. First Member for Akurana should not disturb the hon. Member, please. You have already spoken. He is only replying.

එස්. බී. හේරත් මයා.
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herat)

සියයට 90 කියන්නේ මොකටදැයි නොදන්නාකමින් මන්ත්‍රීතුමාගේ දැනීමේ තරම හෙළි වෙනවා. ගණන් ශාස්ත්‍රය නොදන්නා මන්ත්‍රීවරුන් ගැන මා වැඩිය කතා කරන්න යන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

තමුන්නාන්සේගේ දැනීම සියට බිංදුවයි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Will the hon. First Member for Akurana please listen to me? The hon. Member has a right to reply to what you have said. Please do not interrupt the hon. Member.

එස්. බී. හේරත් මයා.
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herat)

බිංදු ගැන අප කියන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේට තමයි, බිංදුව ලැබෙන්නේ. අපේ කාලයේ බදවා ගත් අයගේ ඡන්දයෙන් සියයට 90 ක් තමුන්නාන්සේලාට ලැබෙන්නෙ නැහැ. ඒ පිරිස ගෙන් තමුන්නාන්සේලාට ලැබෙන්නේ ඡන්ද බිංදුවයි. තමුන්නාන්සේලාගේ කාලයේ බදවා ගත් අයගෙ ඡන්දයෙන් සියයට 90 ක් අපට ලැබෙනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிரிசேன)
(Mr. Hemachandra Sirisena)

මන්ත්‍රීතුමා අප ගැන විවේචනයක් කරන්න ඕනෑ නැහැ දැන් තිබෙන්නේ ජනසතු සේවා අමාත්‍යාංශය පිළිබඳ විවාදයක් මිස අප ගැන විවාදයක් නොවෙයි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member might leave the hon. First Member for Akurana alone and come back to the matter under discussion.

එස්. බී. හේරත් මයා.
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herat)

ඒ. වචනවලින්ම පෙනෙනවා, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගෙ තත්ත්වය මොකක්ද කියා. එහෙත් උසස් පෙළේ මන්ත්‍රීවරුනුත් විරුද්ධ පාර්ශ්වයේ ඉන්නවා. එ අය ගැන නම් අපි විවේචනය කරන්නේ නැහැ. මට නියමිත කාල වේලාවත් ඉක්ම යාගෙන එන නිසා ඒ පිළිබඳ විවේචන නවත්වා බස් සේවය පිළිබඳව වන ස්වල්පයක් කියන්නම්. බස් ධාවනය දුර්වල වී තිබෙන්නේ බස් හිඟය නිසයි. බස් හිඟ වී තිබෙන්නේ, අබලන් පාරවල ධාවනය කිරීම නිසයි. මුදල් නැතිකම නිසා අවුරුදු 10 ක් 15 ක් තිස්සේ පාරවල් අලුත්වැඩියා නොකර තිබුණා. පසුගිය ආණ්ඩුව ඒවා අතපසු කළා. අලුත්වැඩියා නොකර තිබීම නිසා ඒ පාරවල් කැඩී බිඳී ගියා. කැඩුණු පාරවල දිවීම නිසා බස් රථ අබලන් වී ගරාජයට දමන්නට සිදු වුණා. බස් ගැන මා කියන්නේ එපමණයි.

මීළඟට ක්‍රීඩා අංශය ගැන වචන ස්වල්පයක් කියන්නට ඕනෑ. මේ රටේ ක්‍රීඩාවල තත්ත්වය ඉතාම දුර්වල වී තිබුණා. එහෙත් අපේ ගරු ඇමතිතුමා ඒ දුර්වලකම් මඟ හරවා ක්‍රීඩා අංශයේ විශාල දියුණුවක් ඇති කළා. ලබන 10 වන දා මෝටර් සයිකල් තරඟයක් පැවැත්වෙන බව තමුන්නාන්සේලා කවුරුනුත් දන්නවා. කොළඹ නගරයේ ක්‍රීඩා අංශය ඉතාම උසස් තත්ත්වයකට දියුණු කර තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාට ලොකු මල් මාලාවක් පළඳවන්නට ඕනෑ. ලෝකයේ ඕනෑම රටක තරඟකරුවන් සමඟ තරඟ කළ හැකි තරම් දක්ෂ ක්‍රීඩකයන් දැන් අපට සිටිනවා. ඔවුන්ගේ දක්ෂතාවන් දැක්වීමට ඔවුන්ට අවස්ථාව ලබා දීම ගැන, සුළුවෙන් වුවත් මේ අංශවල යෙදෙන කෙනකු වශයෙන් මා ගරු ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. කාල වේලාව නැති නිසා මා මීට වඩා කතා කරන්නේ නැහැ. තමුන්නාන්සේටත් ගරු ඇමතිතුමාටත් එතුමාගේ නිළධාරි මණ්ඩලයටත් ස්තුති තරමින් මගේ කතාව අවසාන කරනවා.

කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.
(සොරනාතොට)
(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ගරු සභාපතිතුමනි, මට ලැබී තිබෙන කාලසීමාව දෙස බලා මා මෙම අමාත්‍යාංශය පිළිබඳ ඉදිරියට ප්‍රයෝජනවත් වන අන් දමේ අදහස් සුවල්පයක් ප්‍රකාශ කරන්නට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

බලාපොරොත්තු වෙනවා. සෞඛ්‍ය උප ඇමතිනි ගලිගමුවේ මන්ත්‍රීවරිය (විමලා කන්නන්ගර මිය.) ප්‍රකාශ කළ ආකාරයට, ලංකාගමනාගමන මණ්ඩලය පාඩු විදගෙන ගෙන යාම ගැන නම් අප කොහෙත්ම කැමැති වන්නේ නැහැ. මෙය ලාභ ලබා ගන්නට බැරි අන්දමේ ව්‍යාපාරයක් නම් එසේ කළත් කමක් නැහැ. ලංගමයෙන් විශාල ලෙස ලාභ ලැබිය හැකි බව පසුගිය ආණ්ඩුව විසින් පෙන්නුම් කර තිබුණා. ලංකා ගමනාගමන මණ්ඩලය 1964 වන විට විශාල ලෙස ලාභ පෙන්නූ බව තමුන්නාන්සේට මතක ඇති. එම නිසා, මෙම ව්‍යාපාරයෙන් ලාභ ලබන්නට බැරිය, එය ලාභ ලැබිය යුතු ව්‍යාපාරයක් නොවේයයි යම් කෙනකු කියනවා නම් ඒ ගැන කණගාටු වෙනවා මිස අපට වෙන කරන්නට දෙයක් නැ.

සෞඛ්‍ය පහසුකම් හා අධ්‍යාපනය නොමිලයේ දෙන බවද ගලිගමුවේ මන්ත්‍රීතුමිය කිව්වා. මේ රටේ සෞඛ්‍ය සේවයත් අධ්‍යාපනයත් නොමිලයේ සැපයෙන්නේ 1965 න් පසුව නොවෙයි. එය බොහෝ කාලයක් තිස්සේ කෙරෙන දෙයක්.

ගරු සභාපතිතුමනි, ගම්බද ජනතාව අද බස්වල ගමනාගමනය කරන්නේ ඉතාම අමාරුවෙන්. මෙම ගරු සභාවේ මන්ත්‍රීවරුන් අතුරෙන් වැඩිපුරම බස්වල ගමන් කරන මන්ත්‍රීවරයකු වශයෙන්, බස් සේවයේ දුර්වලකම් සම්බන්ධව සැහෙන තරම් දුරට කරුණු කියන්නට මට පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමා බස් ඩිපෝවලට ගොස් කෝටි එක පවා ගළවාගෙන බොහෝම මහන්සි වුණ බවක් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. උඹව ප්‍රදේශයටත් පැමිණෙන ලෙස ගරු ඇමතිතුමාටත් උප ඇමතිතුමාටත් මා ආරාධනය කරනවා. ඒ ප්‍රදේශයේ බස් සේවයේ ඇති දුර්වලකම් හා බස්වල පවතින තදබදය තමුන්නාන්සේලාට පෙන්වා දීමට අප නිතරම සූදානම්ව සිටිනවා. අප මේවා කියන්නේ තමුන්නාන්සේලා රවටන්නට හෝ මහජනයාගේ හිත් දිනා ගන්නට හෝ නොවෙයි. මාසයේ තිස් දවසෙන් විසි දවසකට වඩා බස් රියෙන් මා ගමන් කරනවා. ඒ විසි දවසෙන් දවස් තුනකට වඩා බස්රියේ හරිහැටි වාඩි වී යන්නට ඉඩක් ලැබෙන්නේ නෑ. මගින් 31 දෙනකු ගෙන යා හැකි බස් රියේ අනූ ගණන් පටවනවා. ඒ තරමට බස් අඩුයි. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පාසල් ප්‍රතිසංවිධානයෙන් පසු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බස් රියෙන් ගමන් කරන්නට සිදු වී තිබෙනවා. බස් රියෙන් නොගොස් මහා විද්‍යාලයවලට යන්න ඒ අයට පුළුවන් කමක් නැහැ. බස් රියෙන් යන්නට බැරි වුණොත් මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය කැඩෙන නිසා, බස් කොන්දෙස්තර මහත්වරුන් හා රියැදුරු මහත්වරුන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෙරෙහි අනුකම්පා කොට, ඇතැම් විට තමුන්නාන්සේලාගේ නීතිරීති පවා පැත්තකට දමා මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් බස්රථවල නංවා ගෙන යනවා. මහජන යහපත සඳහා ඒ විධියට වැඩ කරන්නට කොන්දොස්තර මහත්වරුන්ට හා රියැදුරු මහත්වරුන්ට සිදු වී තිබෙනවා.

බස් රථයක රාත්තල් 40 කට වැඩි බරක් ගෙන යාම තහනම් කොට පසුගිය දවසක චක්‍රලේඛනයක් නිකුත් වී තිබෙනවා. මේ නීතිය නිසා, ගම්බද සාමාන්‍ය පුද්ගලයකුට ඔහු වවා ගත් එලවලු ටික හෝ කුඹුරෙන් ගත් වී බුසල හෝ ඉරිඟු බුසල හෝ බස් රියක දමාගෙන යන්න බැහැ. බස් රියේ යන මගින් සියලු දෙනාම රාත්තල් 40 බැගින් උස්සා ගෙන යන්නා නිසා මේ චක්‍ර ලේඛනය නිකුත් කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

නිලධාරියා සිතා ගෙන සිටිනවා. ලංකා ගමනාගමන මණ්ඩලය ගැන තබා සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ පැවැත්ම ගැනවත් මේ නිලධාරීන්ට අවබෝධයක් නැති බව මෙවැනි දේවලින් පෙනෙනවා. නිකම් කඩ දාසි තිබුණු පළියට චක්‍ර ලේඛන පිට කර නවා. පසුගිය සතියේ ගොවි මහත්මයකු සොරනාතොට සිට බදුල්ලට ගෙන යන්නට ගෝවා ගෝනි හතරක් ගෙනැවිත් තිබුණා. නමුත් කොන්දොස්තර ඒවා ගෙන යන්නට ඉඩ දෙන්නට බැරිය කිව්වා. බස් රියේ ගෙන යන්නට තිබුණේ ඒ ගෝනි හතර පමණයි. නමුත් කොන්දොස්තර ඉඩ දුන්නේ නැහැ. "කරන්නට දෙයක් නැහැ. එක්කෙනෙකුට ගෙන යන්නට දෙන්නේ රාත්තල් හතළිහයි. මේ කැලි හතරට ටිකට් කැඩුවොත් උසස් නිලධාරීන් මාව අමාරුවේ දමයි" කියා ඒ කොන්දොස්තර තැන කිව්වා. මාත් ඒ අවස්ථාවේදී සිටියා. මේ තත්ත්වය ගැන මා කොන්දොස්තර තැනගෙන් ප්‍රශ්න කළා. එතකොට එක මගියකුට රාත්තල් 40 කට වඩා ගෙන යන්නට දෙන්නට එපාය කියා චක්‍ර ලේඛයක් නිකුත් කර තිබෙන බව ඔහු මට කිව්වා. පසුව ඒ අහිංසක ගොවියාට ඒ බස් රියෙන්ම බදුලු නගරය ට ගොස් කාර් එකක් ගෙනැවිත් අර ගෝවා ගෝනි හතර ගෙන යන්නට සිද්ධ වුණා. එයින් මොකක්ද වුණේ? ගොවියාට වැඩිපුර මුදලක් ගෙවන්නට සිද්ධ වුණා. ඒවාගේම ලංගමයට නිකම් ම ලැබෙන්නට තිබුණු ආදායමක් නැතිව ගියා. නිලධාරීන් කාර්යාලතුළට වී කිසිම කල්පනාවක් නැතිව කරන මෙවැනි ක්‍රියා වන් නිසා ලංගමයට පාඩුවීම පුදුමයක් නොවෙයි. තවත් එවැනි කරුණු රාශියක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. නමුත් කාලය නැති නිසා මා ඒවා ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අළුතෙන් බස් දැමීම නැවැත්වීමට ඇමති මණ්ඩලය තීරණය කර තිබෙනවාය කියා මටත් ලියුමක් ලැබුණා. ඒ ගැන අප පුදුමයෙනුත් පුදුමයට පත් වෙනවා. මේ රටට අහස් යාත්‍රා ගන්නට මුදල් තිබෙනවා. ලංකාවෙ වැඩ කරන ජනතාව අතරින් කී දෙනෙක් අහස් යාත්‍රාවෙන් ගමන් කරනවාද? ලක්ෂ 350 ක අහස් යාත්‍රාවක් ගෙනාවේ ලංකාවේ දුප්පත් ජනතාවට ගමනාගමනය කරන්නටද? දුකින් මිරිකෙමින් සිටින සාමාන්‍ය ජනතාව ගමක සිට තවත් ගමකට යන්නට, තම රැකීරක්ෂාවලට යන්නට, පාසැල් දරුවන්ට පාසැල් කරා යන්නට, බස් රථ කීපයක් ගෙන්වා ගන්නට බැරිව සිටගෙන අපි අහස් යාත්‍රාවලට මුදල් වියදම් කරනවා. අපි හදට ගිය අය ගැනත් කථා කරනවා. අන්න ඒ තත්ත්වයයි අප විවේචනය කරන්නෙ. විවේචනය කළ යුතු තැන මිස විවේචනය නොකළ යුතු තැන අප විවේචනය කරන්නේ නැහැ. ඊයේ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය ගැන අප සාකච්ඡා කළා. අපි ඇමතිතුමාට පුළුවන් තුරම් ස්තුති කළා. අද උදේ සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන සාකච්ඡා කළා. ඇමතිතුමාට පුළුවන් තරම් ස්තුති කළා. සමහර විට හෙට අනිද්දා සාකච්ඡාවට ගන්නා තවත් අමාත්‍යාංශ කීපයක් ගැනත් අපට ස්තුති මුඛයෙන් කථා කරන්නට අවස්ථාව එයි. අවංකව වැඩ කරනවා නම් උචිතව වැඩ කරනවා නම් අපි ලැස්තියි කාට වුණත් ඒ ප්‍රශංසාව කරන්නට. එහෙම නැතිව රටත් කාබාසිනියා කරමින් ජාතියත් විනාශ කරමින් දුප්පත් අහිංසක ජනතාවට පීඩා වන විධියට කටයුතු කරනවා නම් අපට බොරුවට ප්‍රශංසාවක් කරන්නට පුළුවන්කමක් නැහැ. අර මන්ත්‍රීතුමා මෙහෙම කළා, පසු ගිය ආණ්ඩුව මෙහෙම කළා කියා ප්‍රශ්න විසඳන්නට බැහැ. අද තිබෙන තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

කුමක්ද කියා අවබෝධ කරගෙන ඊට පිළියම් කිරීමයි කළයුතුව තිබෙන්නෙ. දුර්වලකම් පෙන්වා දී ඒවා මගහරවා ගැනීමටයි අප විවේචනය කරන්නෙ.

ගරු සභාපතිතුමනි, අසුවල් අසුවල් පාරට බස්රථ වුවමනාය කියා අප යෝජනා රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. අවසාන වශයෙන් කථා කළ හිරියාලේ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) ක්‍රීඩා අංශයෙන් ගරු ඇමතිතුමා ලෝකයේම ගෞරවයට පාත්‍ර වී තිබෙනවාය කියා මල් පොකුරක් පුද කළා. කන්නට නැතිව සිටින මේ රටේ තරුණ තරුණියන් ක්‍රීඩාවෙන් තෘප්තිමත් වුණොත් හොඳටම ඇති. පාරේ රස්තියාදු වන පිරිස දෙස බලන විට, ඔවුන් එල්ල කරන චෝදනා දෙස බලන විට අපට නම් මල් පොකුරු පුද කරන්නට පුළුවන්කමක් නැහැ. ක්‍රීඩාව අත්හැර දමන්නටය කියා මා ගරු ඇමතිතුමාට කියන්නේ නැහැ. නමුත් ඊට වඩා ඉක්මණින් කළයුතු වැඩක් තමයි බස් සේවය දියුණු කිරීම. සාමාන්‍ය ජනතාව බස්වලින් ගමන් බිමන් කරන්නේ පිනට නොවෙයි. මුදල් ගෙවලයි යන්නෙ. එමනිසා තවත් බස් රථ ටිකක් ගෙනැවිත් බස් සේවය දියුණු කරන්න. එමනිසා බස් ටිකක් ගෙනැවිත් දමා සම්බද්ධ ජනතාවට යහපතක් කරන මෙන් ඉල්ලමින්, ගරු සභාපතිතුමනි, මට කථා කරන්නට අවස්ථාව දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති තුමා මූලාසනයෙන් ඉවත්විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි: නැවත රැස්වීම 1969 සැප්තැම්බර් 7 වන ඉරිදා.

நேரம் பிற்பகல் 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனைபற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது ஞாயிற்றுக்கிழமை, 7 செப்டெம்பர் 1969.

It being 8P.M., THE CHAIRMAN *left the Chair to report Progress.*

Committee report Progress ; to sit again on Sunday, 7th September 1969.

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. Wanninayake—Minister of Finance)

Sir, there is a Supplementary Estimate—Item 9—which I think we have agreed to pass today.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What is it about ?—[*Interruption*]. We agreed to discuss this item, but we did not say we are going to pass it today. Anyway, let us know what it is about.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Sir, I shall explain the details of the proposals. This is for the Ministry of Health, under Head 80. The increases in provision asked for are under Sub-head 8 for payment of rent for the space occupied by the Finance Branch of this Ministry in Ceylinco House ; under Sub-head 13 —Contributions—for the payments of (1) last quarter of administrative budget 1968 to UNICEF ; (2) second half-year 1968 contribution to W.H.O., and (3) 1968 contribution to Bureau of Hygiene and Tropical Diseases, London, which were not paid due to the intimation of payment not being received by Crown Agents in time. There is also an increase in the contribution to the operational budget of the UNICEF.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is a big sum of money.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Sir, I was told that there was some agreement on this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There was an agreement to take up unopposed Business, but that does not mean that we were prepared to pass items without discussion and debate.—[*Interruption*].

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Then, will the Hon. Minister take this matter up tomorrow ?

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Yes.

කල් තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු වන්නිනායක]

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக."—[கௌரவ வன்னிநாயக்க] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு வினா எடுத்தியம்பப்பெற்றது.

Motion made, and Question proposed.

"That the House do now adjourn".—[*The Hon. Wanninayake.*]

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉදිරිපත් කරන කාරණයට ගරු මුදල් ඇමතිතුමාගෙන් පිළිතුරක් ලැබෙය කියා මා බලාපොරොත්තු වෙනවා. මේ අය වැය විවාදයේ කාරක සභා අවස්ථාව පටන් ගත් පසු හෙළි කරන ලද, මෙම ශත වසීයේ විශාලම වංචාව පිළිබඳ ප්‍රවෘත්තිය රටවැසියා දැනගත් පසු ඒ සිද්ධියට සම්බන්ධ එක්තරා ආයතනයක සේවය කරන එක්තරා සාමාජික මහත්මයකු ඒ පදවියෙන් ඉල්ලා අස්වුණා. මා සඳහන් කරන්නේ සංවර්ධන මුදල් සභාවේ

නමැති ආයතනයේ සභාපතිකම දැරූ, ලේක්හවුස් ආයතනයේ අධ්‍යක්ෂවර යකුව සිටි එක්තරා මහත්මයකුගේ ඉල්ලා අස්වීම පිළිබඳවයි. මේ සංවර්ධන මුදල් සංසථාව මේ රටේ තිබෙන පෞද්ගලික සංසථා අතරෙන් ඉතාම වැදගත් එකක් බවත්, එය විදේශ ණය පවා ලබාගැනීමට පුළුවන් තත්ත්වයක පවතින එකක් බවත් ඔබතුමා දන්නවා. අයි. බී. ආර්. ඩී. එකෙන් හෙවත් අන්තර්ජාතික සංවර්ධන ආයතනයෙන් කෙළින්ම ණය ලබාගෙන ඒ ණය මුදල් මේ රටේ ව්‍යාපාරිකයන්ට දෙන්නට පුළුවන් තරම් ශක්තියක් මේ ආයතනයට තියෙනවා. මේ තරම් වැදගත් ආයතනයක සභාපතිධුරය දරණ තැනැත්තා සැකයෙන් තොර අවංක භාවයේ ප්‍රතිමූර්තියක් වශයෙන් ක්‍රියා කළ යුතු පුද්ගලයකු විය යුතුයි. බේරේ ගෙදර නමින් හැඳින්වෙන ලේක් හවුස් ආයතනය විසින් කරන ලද රුපියල් කෝටි ගණනක විදේශ විනිමය වංචාවක් ගැන චෝදනාවක් ඉදිරිපත් වී තිබෙනවා. එම ආයතනයත් මෙම ආයතනයත් යන දෙකේම සාමාජිකත්වය මෙන්ම අධ්‍යක්ෂ නිලය දැරූ එක් මහත්මයෙක් ඉල්ලා අස් වී තිබෙනවා. එම ඉල්ලා අස්වීමෙන් දැන් ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ—සංවර්ධන මුදල් සංසථාවේ—සභාපති පදවියත් ඒ සමගම සාමාජික පදවියකුත් පුරප්පාඩු වී තිබෙනවා. දැනට හිස්ව තිබෙන මෙම පදවිය පිරවීමේදී එතැනට පත් කරන අළුත් සාමාජිකයා—

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

කවුද ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කවුදැයි නම කියන්නට වුවමනා නැහැ. නිසියාකාර සේවය ඉටු වන විධියේ සුදුසුකම් තිබෙන කෙනෙකු එතැනට පත් කරන්නට බලාපොරොත්තු වෙනවා දැයි අපට කිව්වොත් හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
එහෙම තමයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අර තැනැත්තා පත් කරන විටත් එහෙම හිතාගෙන තමයි කරන්නට ඇත්තේ. එහෙත් පේනවා නේද කර තිබෙන හැටි? මේ රටේ අන්ත ප්‍රතිගාමී ආයතනයකුත් මෙබඳු බලසම්පන්න මුදල් ආයතනයකුත් අතර ඇති සම්බන්ධය දැන් එළිදරව් වී ඉවරයි. මීළඟට ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් ආයතනයේ සභාපති පදවියට පත් වන පුද්ගලයා මුදල් පිළිබඳ වංචා සහගත මෙවැනි සිද්ධින්ට කිසිසේත් සම්බන්ධකමක් නැති කෙනෙකු විය යුතුයි. මෙම කාරණයෙහිදී බලය පාවිච්චි කළ හැක්කේ මුදල් ඇමතිතුමාටයි. එතැනට කෙනෙකු පත් කරන්නේ මුදල් ඇමතිතුමාගේ උපදෙස් අනුවයි. මෙම සංස්ථාවේ සභාපති පත් කරන්නේත් සාමාජිකයන් පත් කරන්නේත් ඒ පිළිවෙළටයි.

දැනට මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු සිටින බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ලංකා බැංකුවේත් මහ බැංකුවේත් ඉන්ඩියන් ඕවර්සීස් බැංකුවේත් නියෝජිතයන් තිදෙනෙක් ඒ අය අතර සිටිනවා. ඒ හැර මෙම ආයතනයේ හිටපු සාමාන්‍යාධිකාරීවරයා අද එම ආයතනයේ අධ්‍යක්ෂ ධුරයක් දරනවා. අපට දැනගන්නට ලැබී තිබෙන ආරංචිවල හැටියට, දැනට මෙහි සාමාජිකත්වය දරණ මේ මහත්වරුන්ගෙන් කෙනෙක් මෙම සංස්ථාවේ සභාපති ධුරයට පත් වීමට උත්සාහ දරා ගෙන යන බව පෙනෙනවා. මේ කියන තැනැත්තා වෙනත් පුද්ගලික මුදල් ආයතනයක බරපතළ වංචාවක් පිළිබඳ දැඩි සම්බන්ධකමක් ඇති කෙනෙකුගේ මාර්ගයෙන් එම පුද්ගලික ආයතනයේ අධ්‍යක්ෂ පදවියට මෑතදී පත් වුණු බව මුදල් ඇමතිතුමා දන්නවාදැයි මා අහනවා.

තමුන්නාන්සේ දන්නවා, කොළඹ සුප්‍රසිද්ධ වෙළඳ ආයතනයක් වන කොලට්ස් සමාගමේ අධ්‍යක්ෂ ධුරයකට මෙම ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ සාමාජිකත්වය දරණ එක්තරා මහතෙක් පත් වී සිටින බව. ඒ මහතා එම අධ්‍යක්ෂ ධුරයට පත් වුණේ කොලට්ස් සමාගමේ සිටින ප්‍රබල ධනකුවේරයකුගේ මාර්ගයෙනුයි. කොලට්ස් සමාගමේ කෝටි ගණනක මුදල් වංචාවක් පිළිබඳව පසුගිය දවස්වල රටේ හැමතැනම ආරංචි පැතිර ගියා. ඉංග්‍රීම් නමැති මහතෙක් රුපියල් කෝටි ගණනක් මුදල් වංචා කොට පැදුරටත් නොකියා ලංකාණ්ඩුවටත් නොදන්වා ඕස්ට්‍රේලියාවට පැන ගොස් තිබෙනවා. මෙම මහා මුදල් වංචාව පිළිබඳව වග කිවයුතු හරස්ගම නමැති මහතෙක් කොලට්ස් ආයතනයේ සිටිනවා. ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ දැනට හිස්ව තිබෙන සභාපති ධුරයට පත්වීමට ඔහුගේ මාර්ගයෙන් උත්සාහ දරණ එම මහත්මයා කොලට්ස් සමාගමේ අධ්‍යක්ෂවරයකු බවට පත්ව සිටින කෙනෙක්. මහ ජනතාවට බැලූ බැල්මට නොපෙනෙන මහා භයානක වංචාකාරී සිඩින් රාශියක් මෙයට සම්බන්ධයි. ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ හිටපු සභාපති මහතා ඉල්ලා අස් වෙද්දී ඉතා වටිනා කියමනක් කියා තිබෙනවා. උන්නැහේලා කියන දේවල් එතරම් ගණන් ගන්නට බැරි වුවත් මේ වර ටිකක් හරය ඇති කතාවක් තමයි කියා තිබෙන බව පෙනෙන්නේ. උන්නැහේලා වැදි බණ දේශනා කරනවා. ඔය පත්‍ර ආයතනයෙන් මීට පස්සෙ කියන දේවල් මේ රටේ මිනිස්සු මින් පසු විශ්වාස කරාවිද යන්න මට නම් සැක සහිතයි. මෙවැනි ආයතනයක සභාපති ධුරය හා සාමාජිකත්වය දරණ අධ්‍යක්ෂවරයකු සැකයෙන් තොර, පලිගු මෙන් පැහැදිලි, පිරිසිදු, අවංකත්වයට හිමිකම් කියන පුද්ගලයකු විය යුතු යයි උන්නැහේලා කියා තිබෙනවා. බොහොම හරි කථාවක්. එහෙම නම් මේ සභාපතිකම ගන්නට උත්සාහ කරන පුද්ගලයාට ඒ වර්ණනාව ගැළපෙන වාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමාත් මාත් ඒ වාගේම මේ රටේ බොහෝ නීතිඥයනුත් අදුනන විශිෂ්ට රාජනීතිඥයකු වූ එච්. වී. පෙරේරා මහත්මයා අකාලයේ මිය ගියේ මේ කොලට්ස් සමාගමේ කෝටි සංඛ්‍යාත වංචාව පිළිබඳව ඇති වූ සිත් වේදනාව නිසායයි සමහරුන් කියනවා. මේ සිද්ධියට සම්බන්ධ හරස්ගම මහතාගේ මාර්ගයෙන් සංවර්ධන මුදල් සංස්ථාවේ සභාපතිකම ගන්නට හදන පුද්ගලයා ඒ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයට පත් වුණා. එපමණක් නොව මේ කියන තැනැත්තා ගරු රාජ්‍ය ඇමතිතුමාගේ සහ එංගලන්තයේ ගුවන් සමාගමක සහයෝගයෙන් පිහිටුවන්නට යන හෝටලයට—Pegasus Reef Hotel—මේ ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එක මාර්ගයෙන් විශාල ණයක් දී තිබෙනවා. මේ ණය දීමේදී මේ කියන අධ්‍යක්ෂවරයා එවකට දැරූ සාමාන්‍යාධිකාරී පදවියේ අයිතිවාසිකම් අභිබවා ක්‍රියා කර තිබෙනවා. ඒ අයිතිවාසිකම් වැරදි විධියට පාවිච්චි කර තිබෙනවා. ඒ විධියට ඒ හෝටල් සමාගමට ණය මුදලක් දුන් බවට චෝදනාවක් තිබෙනවා.

අද ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ සාමාන්‍යාධිකාරී ධුරය දරන්නේ කලින් ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සිටි ලෝගනාදන් මහත්මයායි. ඒ කියන ලද හෝටල් සමාගමට මේ මුදල දීම ගැන ඒ මහතා බලවත් විරුද්ධත්වය දක්වා තිබෙනවා. දැනට ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ සාමාන්‍යාධිකාරී ධුරය දරන එදා ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සිටි ලෝගනාදන් මහතා කියන්නේ මොකක්ද? ඒ ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ ලේකම්වරයාගේ බලතල ඉක්මවා ගොස් එසේ නැත්නම් නීතිය කඩා දමා මේ ණය මුදල දී තිබෙන බවයි. ඒ ගැන පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පැමිණිල්ල ගැන දැන් පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. ඒ පරීක්ෂණයට ඉදිරිපත් වී නිදහසට කරුණු කියන හැටියට ඔය කියන ලද තැනැත්තාට නිවේදනයක් යවා තිබෙනවා. ඒ චෝදනා ලැබ සිටින පුද්ගලයාම ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ සභාපති තනතුරට එළැඹ පත් කර ගත්තොත් ඔහුට විරුද්ධව ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් ලැබෙන සැලකිල්ල කුමක්ද? ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් අංග සම්පූර්ණ අපක්ෂපාත පරීක්ෂණයක් ඇති වෙතැයි හිතන්නට පුළුවන්ද? මා නගන ප්‍රශ්නය අන්න ඒකයි. එපමණක් නොව. ඩෙවලප්මන්ට් fපිනෑන්ස් කෝපරේෂන් එකේ මීළඟ රැස්වීමේ න්‍යාය පත්‍රයට මේ කාරණය ඇතුළත් කර තිබෙනවා. ඉතින් යම්කිසි විධියකින් ඔය කියන පුද්ගලයා ඒ ආයතනයේ සභාපතිකමට පත් වුවහොත් ඒ න්‍යාය පත්‍රයේ ඇතුළත් වන ඒ කාරණය ගැන සාධාරණ පරීක්ෂණයක් සිදු වේද?

පසුගිය දවස්වල ලේක් හවුස් පත්තර මයිල්වාගනම් සිද්ධියක් ගැනත් බොහොම ලොකුවට කෑගැසුවා. මයිල්වාගනම් නමැති මහත්මයකු "ටුවරිස්ට් ක්ලාස්" ටිකට් පතක් ගෙන අහස් යාත්‍රාවක පළමුවැනි පන්තියේ ගමන් කළ බවට ලොකු කලබලයක් කළා. සංස්ථාවක නිලධරයකු හැටියට ඒ මහතාට එවැනි චෝදනාවක් තිබෙනවා. එහෙම නම් මේ කත් දෙවැනි මයිල්වාගනම් සිද්ධියක්. සංවර්ධන මුදල් සංස්ථාවේ ලේකම්ව සිටි මේ මහතාටත් එවැනි චෝදනාවක් තිබෙනවා. ඒ නිසා මුදල් වංචා සහ සැක සහිත ගනුදෙනු පිළිබඳව කළු වලාකුළකට යට වී සිටින පුද්ගලයකු සංවර්ධන මුදල් සංස්ථාවේ සභාපතිකම දීම වටිනවාද? දැන් මහජනයාට පැහැදිලි වී හමාරයි බේරේ ගෙදර නැත්නම් "ලේක් හවුස්" පත්තරත් මේ ආණ්ඩුවත් අතර තිබෙන සම්බන්ධය ගැන. එක එක්කෙනාට සහයෝගයෙන් වැඩ කරන හැටිත්, එක් කෙනෙක් අනික් එක්කෙනා ආරක්ෂා කරන්නට උත්සාහ කරන හැටිත්, එසේ කරන්නේ මොකටද කියන එකත් මහජනයා දැන් දන්නවා.

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோர்ஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)
පරීක්ෂණය ඉවර වන තුරු ඉන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

තවම පරීක්ෂණය පටන් ගත්තෙත් නැහැනේ. එය පස්සෙ බලා ගනිමු. දැනට හිස් වී තිබෙන මේ පදවියට කෙනෙකු පත් කිරීමේදී කරුණාකර මේ විධියට චෝදනාවලට ලක්වන පුද්ගල යෙකුට පත් වන්නට ඉඩ තබන්න එපා. මා මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ පෞද්ගලික අංශයේ ඉතාම ප්‍රබල ආයතනයක් වන "ඩෙලප්මන්ට් ෆිනෑන්ස් කෝපරේෂන්" එකේ සභාපති ධුරයට අවංක භාවයේ හා කාර්යක්ෂම භාවයේ ප්‍රතිමූර්තියක් බදු කෙනෙක් පත් කරන හැටියටයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධන මුදල් ආයතනයේ පුරප්පාඩු ඇති වුණාම ඒවා පිරවීම සඳහා සංස්ථාවේ නීති රීති තිබෙනවා. ඒ නීතිරීති අනුව ඒ කාර්යය කෙරෙනවා ඇති. ළමයා උපදින්න ටත් කලින් හදහන් බලන්නට යනවා හබරාදුව ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා ඒ හදහන හරියන්නේ නැහැ. ළමයා ඉපදුණාට පසුව හදහන් ලියන්නට ලැහැස්ති වන එකයි තිබෙන්නේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඛිණු விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.15 ට, 1969 සැප්තැම්බර් 1 වන දින සභා සම්මතිය අනුව, 1969 සැප්තැම්බර් 7 වන ඉරිදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 8.15 மணிக்கு, சபை அதனது 1969 செப்ரம்பர் 1 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1969 செப்ரம்பர் 7, ஞாயிற்றுக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.

Adjourned accordingly at 8.15 P.M. until 10 A.M. on Sunday, 7th September 1969, pursuant to the Resolution of the House of 1st September 1969.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දයක ගුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදෙර, මහලේකම් කාර්යාල ය් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00), 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org